Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

**E-Repository of Humanities and Social Sciences**
Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Author Consent Form

ease provide the following information of your book/publication (please note that
ıe consent form needs to be filled for each publication if you have more than one).

1. Title of the publication : ශ්‍රී ලංකාවේ ශිල්ප සංවිධානයේ ක්‍රියාකාරීත්වය (සාහිත්‍යගත ඇසුරින්)
2. Author/ Authors : A.M.N. වසන්ත මෙන්ඩිස්
3. Publisher : උදාර අධ්‍යාපන පර්යේෂණ හා ප්‍රකාශන මධ්‍යස්ථානය, 247/6, ශාන්ත ජේම්ස් පාර, ගාල්ල
4. Year of Publication : 2015
5. ISBN (if applicable) : 978 - 955 - 4980-08-2
6. Access option : Open Access

**uthor/copyright owner consent:**

we Prof. Wasantha Mendis

'our name/names), as the author/s or copyright owner/s, would like to provide .y/our consent for making available the above publication on the E-Repository of ׀umanities and Social Sciences of the University of Sri Jayewardenepura. I also would ‹e to provide my consent to allow the E-Repository Management Committee to make ıe publication accessible to the students of University of Sri Jayewardenepura and ıblic.

gnature of the Author/~~s or Copyright owner/s~~: [signature]

ate: 2023/09/15

CamScanner

# ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානයේ කළමනාකරණය

## (කතිකාවත් ඇසුරින්)

වසන්ත මෙන්ඩිස්

# ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානයේ කළමනාකරණය

(කතිකාවත් ඇසුරින්)

CamScanner

# ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානයේ කළමනාකරණය

## (කතිකාවත් ඇසුරින්)

ඒ. එම්. නිමල් වසන්ත මෙන්ඩිස්

(B.A(special),PGDIA, M.SC, M.Phil, Ph.D)

anner

CamScanner

මෙම කෘතිය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් මුද්‍රාපිතයි. මෙහි අන්තර්ගතය මණ්ඩලයේ අදහස් පිළිබිඹු නොකරන බව සැලකුව මනාය.

# ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානයේ කළමනාකරණය
## (කතිකාවත් ඇසුරින්)

© ඒ.එම්.නිමල් වසන්ත මෙන්ඩිස්

පළමු මුද්‍රණය : 2015

ISBN 978-955-4980-08-2

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද
ප්‍රකාශනගත සුචිකරණ දත්ත

මෙන්ඩිස්, ඒ. එම්. නිමල් වසන්ත
ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානයේ කළමනාකරණය (කතිකාවත් ඇසුරින්)/
ඒ. එම්. නිමල් වසන්ත මෙන්ඩිස්. - රනාල : දකුණු ආසියානු පර්යේෂණ හා
පුහුණු මධ්‍යස්ථානය, 2015
පි. 263 ; සෙමී. 21

ISBN 978-955-4980-08-2

I. 294.3657 ඩීවී 23 | II. ග්‍රන්ථ නාමය
1. භික්ෂූන් | 2. බෞද්ධ ආරාම

පරිගණක පිටු සැකසුම හා
කවරයේ නිර්මාණය : සරසවි ක්‍රියේෂන් 0718581279

ප්‍රකාශනය : දකුණු ආසියානු පර්යේෂණ හා
පුහුණු මධ්‍යස්ථානය
247/6, ශාන්ත ජේම්ස් මාවත
රනාල

මුද්‍රණය : ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
27, පැපිලියාන පාර, නැදිමාල,
දෙහිවල.
දු.ක. 0112716709

## පිදුම

මා මෙලොවට බිහිකල
දෙමාපියන්ට.
සහ
මට අධ්‍යාපනය ලබාදුන්
ගුරු මැණිවරුන්ට හා
ගුරු පියවරුන්ට.

# හැඳින්වීම

මිනිසාට තම මූලික අවශ්‍යතාවන් තනිව සපුරාගත නොහැකි හෙයින් සාමූහිකව සිය අභිප්‍රායයන් සඵල කර ගැනීමට උත්සාහ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස "මිනිස් සමාජ" නිර්මාණය කර ගනියි. පොදු අරමුණක් උදෙසා මෙලෙස බිහි වන සමාජ කණ්ඩායම් එකී කණ්ඩායම්වල මූලික අභිමතාර්ථ ඉටුකර ගැනීම උදෙසා "සංවිධාන" (Organization) නිර්මාණය කර ගනියි. සංවිධානයක් වූකලී එකිනෙකට සම්බන්ධ ක්‍රියාවන් මගින් අභිමත පරමාර්ථ මුදුන්පත් කර ගැනීම අරභයා බිහිවන මනුෂ්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් ඒකරාශී වූ ක්‍රමයකි. ඒ අනුව අරමුණු පරමාර්ථ සහිත පුද්ගලයන්ගෙන් සමන්විත, විධිමත් නීතිරීති පද්ධතියක් තිබීම සංවිධානයක නව පොදු වූ මූලික ලක්ෂණ වේ. එකී සංවිධානයන්හි පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන විධිමත් ක්‍රියාපිළිවෙළ"කළමනාකරණය" (Management) ලෙස සරලව හැඳින්විය හැකි ය.

මේ අනුව, ආයතනයේ අරමුණු පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආයතනය සතු මානුෂික හා ද්‍රව්‍යාත්මක සම්පත් වඩාත් කාර්යක්ෂමව හා වඩාත් සඵලදායීව යෙදවීමේ ක්‍රියාවලිය කළමනාකරණය නම් වේ. ඒ සඳහා පැහැදිලි සැලැස්මක්, සංවිධා- නය කිරීමත්, නායකත්වයක් හා පාලනයක් තිබීමත් අත්‍යවශ්‍ය ය. එලෙස සමාජයක් සංවිධානාත්මක බවට පත්කරනු ලබන බලය වනුයේ ද කළමනාකරණයයි. කළමනාකරණයක් නොමැති නම් හොඳ සංවිධානාත්මක සමාජයක් ද දැකගත නො හැකිය. මේ අනුව කළමනාකරණය යනු (Management) පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම උදෙසා දක්ෂ හා විචක්ෂණාත්මක ලෙස ඊට අදාළ සම්පත් මැනවින් යොදාගැනීම/ මෙහෙයවීම බව පැහැදිලි ය.



CamScanner

කළමනාකරණය (Management) ක්‍රමිකව විකාශය වීමේ ප්‍රතිඵලයක් ලෙස එය විෂයයක් සේ සකස් වූයේ 19 වන සියවසේ මුල් භාගයේදී පමණ ය. මෙම විෂයයෙහි දක්නට ලැබෙන එක් මූලික ලක්ෂණයක් වනුයේ කළමනාකරණ ක්‍රියාවලියක් වීමයි. එම ක්‍රියාවලිය තුළ සැලසුම්කරණය (Planning), සංවිධානකරණය (Organization), මාණ්ඩලීකරණය (Staffing), මෙහෙයවීම (Directing) හා පාලනය (Control)යන මූලධර්ම ප්‍රධාන අංග ලෙස සැලකේ. විධිමත් විෂයයක් ලෙස වර්ධනය වීමෙන් අනතුරුව මෙම මූලධර්ම හඳුන්වා දෙනු ලැබුවත් මිනිසා සංවිධානගත වූයේ කවදා ද එතැන් සිට ම මෙම ක්‍රියාවලිය සෑම සමාජයක් තුළ ම පැවති බවට ඉතිහාසය සාක්ෂි දරයි.

ශ්‍රී ලංකාවේ බුද්ධ සසුනෙහි ඉතිහාසය පිරික්සීමේදී වැදගත්වන ප්‍රධාන එක් සාධකයක් වනුයේ "කතිකාවත්" ය. මන්ද ථේරවාද බුද්ධසමය ශ්‍රී ලංකාවේ රෝපණය කරන ලද නමුත්, පසු කාලයේ සඟ සසුන ව්‍යාප්ත වීමේදී භික්ෂූන් වහන්සේලා අතර ම ඊට පටහැනිව විෂම අදහස් ආකල්ප හා ක්‍රියාකාරකම් ඇති වීමයි. ඒ ඒ කාලවල වැඩ විසූ සුපේශල ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේගේ හා රජවරුන්ගේ දායකත්වයෙන් එවැනි හේතු සාධක සමාලෝචනය කොට, භික්ෂු දුෂ්ප්‍රතිපත්ති ඉවත් කිරීමත් භික්ෂුව භික්ෂුවක් ලෙස සකස් කළ යුත්තේ කෙසේද යන්නත් සාකච්ඡා කොට එසේ කතිකා කරගත් පරිදි භික්ෂුව සකස් විය යුතු බවත්, ඒ අනුව පාලනය විය යුතු බවත් තීරණය කරන ලදි. එලෙස භික්ෂුව අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙත් සෙල් ලිපියක් වශයෙන් හෝ පුස්කොළ පොතක් වශයෙන් ලියා තබන ලද අතර ඒවා හඳුන්වනු ලබන පොදු නාමය වූයේ "කතිතාවත්" යන්නයි.

ක්‍රි. පූ. 3 වන සියවසේ සිට ක්‍රි. ව. 2 වන සියවස දක්වා ම පමණ භික්ෂුව වාසය කරනු ලැබුවේ ගල් ලෙන්වල ය. ක්‍රි. ව. 6 වන සියවසෙහි පැවති ආර්ථික, දේශපාලනික අස්ථාවර භාවයන්හිදී භික්ෂු සංස්ථාව ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා බුද්ධ දහම කෙරෙහි පැහැදුණු රජවරු, දායක දායිකාවන් විශාල ප්‍රමාණයේ



ප්‍රත්‍ය පහසුකම් ලබා දෙනු ලැබූ නිසාම විශාල ප්‍රමාණයේ ආරාමවල වාසය කිරීමටත්, බුද්ධ දහම හා සසුන ආරක්ෂා කිරීම රජුගේ ක්‍රියාවක් වූ හෙයින් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ප්‍රත්‍ය පහසුකම් ලබාදීම වෙනුවට රජය සතු ඉඩම්, වැව්, කුඹුරු ආදිය පමණක් නොව මුදල් ද පරිත්‍යාග කිරීමත් නිසා විශාල ඉඩම් ප්‍රමාණයකුත්, එම භෞතික සම්පත්වලින් ලැබෙන ආදායම ද වර්ධනය වීම නිසාත් ඇතැම් භික්ෂූන් වහන්සේලා භික්ෂු ප්‍රතිපත්ති අමතක කොට ලෞකික ජීවිතයට හුරුවන්නට උත්සාහ කළහ. බුද්ධ සසුනෙහි පැවැත්ම උදෙසා ලබා දී ඇති භෞතික දේපළ පිළිබඳව ඇති වූ ගැටලුවට විසඳුමක් ලෙස ඉදිරිපත් වූ සැලැස්ම වූයේ ද මේ කතිකාවත් ය.

මේ අනුව භික්ෂු ජීවිතය හා බුද්ධ සසුනෙහි පැවැත්ම උදෙසා පවතින දේපළ පාලනය කිරීම සඳහා සැලසුම්කරණය හා පාලනය කිරීමට උපයෝගී කොට ගෙන ඇත්තේ කතිකාවත් ය. කළමනාකරණයෙහි මූලික ලක්ෂණ හා කතිකාවත් අන්තර්ගත ක්‍රියාපිළිවෙළ අතර සමානත්මතාවක් දැක්වෙන හෙයින්, ක්‍රි.ව. 8 වන සියවසේ සිට 15 වන සියවස දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ බිහි වූ කතිකාවත් මූලික කර ගෙන, "ශ්‍රී ලංකාවේ කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය" නම් වූ මාතෘකාව යටතේ පර්යේෂණ අධ්‍යයනය කරන ලදි.

මෙම අධ්‍යයනයෙහි මූලික අභිප්‍රාය වූයේ, කතිකාවත්හි අන්තර්ගත කරුණු අනුව එය තත්කාලීන කළමනාකරණ ප්‍රතිපත්තියක් බව අධ්‍යයනය කිරීමයි. ක්‍රි. ව. 8 වන සියවසේ සිට 15 වන සියවස දක්වා සකස් කරන ලද පොළොන්නරු කතිකාවත, දඹදෙණි කතිකාවත, පොළොන්නරු හැටදාගෙයි පුවරු ලිපිය, V වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය, වෙස්සගිරි පුවරු ලිපිය අංක 1 හෙවත් විරංකුරාරාම ලිපිය, උදයමහයාගේ පුලියන්කුලම ලිපිය, IV වන සේන රජුගේ කළුදිය පොකුණු ලිපිය, IV වන මිහිඳු රජුගේ අභයගිරි පුවරු ලිපිය අංක 2, IV වන මිහිඳු රජුගේ වෙස්සගිරි පුවරු ලිපිය අංක 2, IV වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිය



CamScanner

හා වෙස්සගිරි සංස්කෘත ලිපිය යන කතිකාවත් ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානකරණය කළමනාකරණය කිරීමට උපයෝගී කොටගත් බවත්, විධිමත් ලෙස කළමනාකරණ මූලධර්ම ඉදිරිපත්ව නොතිබූ කාල පරිච්ඡේදයක කළමනාකරණයේ මූලික මූලධර්ම මැනවින් උපයෝගී කොටගෙන වඩාත් සාර්ථක අන්දමින් භික්ෂුව හා ආරාම පාලනය සිදුකර තිබේ ද යන්න අධ්‍යයනය කිරීමයි.

ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා, 1922 වර්ෂයේදී "කතිකාවත් සඟරා" නමින් ප්‍රථම වරට කතිකාවත් සම්බන්ධයෙන් ග්‍රන්ථයක් සම්පාදනය කරනු ලැබීය. ඊට පසුව මහාචාර්ය ඒ. වී. සුරවීර මහතා ද "සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය" යන මාතෘකාව යටතේ ද මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ද "The Katikavatas" කෘතිය සම්පාදනය කොට තිබේ. මෙම ග්‍රන්ථ දෙකම සම්පාදනය වූයේ 1971 වර්ෂයේදී ය. ඉන් අනතුරුව 1974 දී මැන්දිස් රෝහණදීර මහතා "ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය" නම් වූ මාතෘකාව යටතේ, ක්‍රි. ව. 12-14 සියවස්වල ලියැවුණු කතිකාවත් ඇසුරු කරගෙන තොරතුරු ගවේෂණය කර ඇති අතර යටදොළවත්තේ ධම්මවිසුද්ධි හිමියන් ද පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් මගින් පොළොන්නරු හා දඹදෙණි යුගවල භික්ෂු සමාජය පිළිබඳව අධ්‍යයනය කොට තිබේ.

කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන කරුණක් වනුයේ ඒ පිළිබඳව විවිධ අංශවලින් පර්යේෂණ සිදුකර තිබුණත් තවදුරටත් අධ්‍යයනය කළ හැකි ක්ෂේත්‍ර දක්නට ලැබෙන බවයි. ඒ අනුව ක්‍රි. ව. 8 වන සියවසේ සිට 15 වන සියවස දක්වා ලියැවුණු කතිකාවත් උපයෝගි කොට ගෙන, භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය පිළිබඳව මෙතෙක් පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කොට නො තිබේ. එබැවින් මෙම මාතෘකාව මාගේ පර්යේෂණ සඳහා තෝරා ගත්තෙමි.

මෙම නිබන්ධනය පරිච්ඡේද පහකින් සමන්විත වන අතර පළමු පරිච්ඡේදයේ දී කළමනාකරණය, එහි ආරම්භය හා විකාශය පිළිබඳව අධ්‍යයනයට ලක් කර ඇත. එහි දී "කළමනාකරණය"



යන වචනයෙහි අර්ථය, ශබ්ද කෝෂ, විශ්ව කෝෂ හා මෙම විෂයෙහි විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද මත සමාලෝචනය කොට, පොදු විෂයයක් වන බව ගවේෂණය කරන ලදි. නූතන කළමනාකරණයෙහි ප්‍රධානතම මූලධර්ම මත සැලසුම් කිරීම, සංවිධාන කිරීම, නායකයෙකු හා පාලනය යන සංකල්ප අතීතයේදීත් භාවිත වූයේ ද යන්න මෙහිදී පර්යේෂණයට ලක් කෙරිණි. සෑම කටයුත්තකම සාර්ථකත්වයට කළමනාකරණය යොදා ගැනීම හේතුවන බවට අවධානය යොමු කරමින්, අතීතයේ ආගමික, දේශපාලනික හා ආර්ථික ක්ෂේත්‍රයන්හි දියුණුවක් ඇති වූයේ මේ විෂයයෙහි දායකත්වය නිසා බවත්, විශේෂයෙන් ම ආගමික අංශයන් හි මෙම ලක්ෂණය විද්‍යමාන වන බවත් පළමුවන පරිච්ඡේදයේ අධ්‍යයනය කොට ඇත.

දෙවන පරිච්ඡේදයේ දී අවධානය යොමු කරන ලද්දේ කතිකාවත් හැඳින්වීම සඳහා ය. එහි දී කතිකාවත්වල ආරම්භය හා විකාශය පිළිබඳවත්, කතිකාවත් හා කළමනාකරණය අතර ඇති සම්බන්ධය කෙසේ ද යන්න පර්යේෂණයට ලක් කිරීමට උත්සාහ ගෙන තිබේ. කතිකාවත් යනු කවරක් ද යන්න අධ්‍යයනය කිරීමේ දී ශබ්ද කෝෂ, විශ්ව කෝෂ, ආගමික ග්‍රන්ථ මෙන් ම විද්වතුන් ඉදිරිපත් කර ඇති මතයන් සමාලෝචනයට ලක් කරමින් මෙය 'අනාගත සැලැස්මකි' යන්න අධ්‍යයනය කොට ඇත.

කතිකාවත්වල අන්තර්ගත කරුණු අනුව ශාසන කතිකාවත් හා විහාර කතිකාවත් යනුවෙන් වර්ග දෙකකට බෙදනු ලැබේ. භික්ෂූන් වහන්සේලා උදෙසා පනවන ලද ව්‍යවස්ථා ශාසන කතිකාවත් යනුවෙනුත් විහාර සේවකයන් හා රජයේ නිලධාරීන් සඳහා පනවන ලද ව්‍යවස්ථා විහාර කතිකාවත් යනුවෙනුත් විග්‍රහ කෙරේ. එහෙත් මෙය පර්යේෂණයට ලක් කිරීමේ දී භික්ෂූන් වහන්සේලා උදෙසා ම පැනවූ ව්‍යවස්ථා දෙකක් දක්නට ලැබෙන නමුත් ආරාම සේවකයන් හා නිලධාරීන් සඳහා ම සකස් කළ කතිකාවත් දක්නට නො ලැබෙන බව ගම්‍ය විය. භික්ෂූන් වහන්සේලා සකස් කරන ලද කතිකාවත්වල ආරාම සේවකයන් සඳහා ද ව්‍යවස්ථා සකස්



CamScanner

කොට තිබෙන හෙයින් කතිකාවත් යනු එකම වර්ගයක් ලෙස මෙහිදී පෙනී යන්නකි.

කතිකාවත්වල ඉතිහාසය සෙවීමේ දී ක්‍රි. ව. 3 වන සියවස වූ මහසෙන් රාජ්‍ය සමය දක්වා දිවෙන බවත්, මෙතෙක් ප්‍රසිද්ධියට පත් නොවූ එහෙත් මතයක් පමණක් වූ "ධම්ම කම්ම" හෙවත් මහසෙන් රජුගේ හේරත් හල්මිල්ලෑව ලිපිය කතිකාවත්වල ආරම්භක කතිකාවත ලෙසත් සැලකිය හැකිය. ඊට පෙරත් එබඳු ලිපි තිබිය හැකිය.

දැනට සොයා ගෙන ඇති අන්දමට ලක්දිව සමස්ත භික්ෂූන් වහන්සේලා කෙරෙහිම බලපාන පරිදි කතිකාවතක් සකස් වූයේ පොලොන්නරුවේ පරාක්‍රමබාහු රජ දවස ය. කතිකාවත්වල අන්තර්ගත කරුණුවල ස්වභාවය අනුව ඒවා සකස් වූයේ භික්ෂු සංස්ථාව තුළ හා ආරාම පාලනයේ දී ඇති වූ ගැටලුවලට විසඳුමක් වශයෙනි. එසේ නම් කතිකාවත් යනු අනාගත වැඩපිළිවෙළකි. එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරවන ආකාරයත් ක්‍රියාත්මක වීමේ දී කෙසේ පාලනය කළ යුතු ද යන්න දැක්වෙන පාලනමය නීතිරීති ද ඇතුළත් ය. භික්ෂුව හා ආරාම නිලධාරීන් - සේවකයන් විධිමත් ලෙස සංවිධානගත කිරීමක්, මෙහෙයවීමක් සිදුකිරීම සඳහා සකස් කළ සැලැස්මකි. එම නිසා කතිකාවත් පැවැත්වීම කළමනාකරණ මූලධර්මවලට අනුකූලව කටයුතු කිරීමක් ලෙස ද මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනය කොට තිබේ.

කතිකාවත් මගින් භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමට පසුබිම සකස් වූයේ බුදුන් වහන්සේගේ කළමනාකරණ න්‍යාය පදනම් කරගෙන බව උපකල්පනය කරමින් පර්යේෂණය කිරීම, තෙවන පරිච්ඡේදයේ දී සිදු කරන ලද අතර එහිදී මූලික කරගනු ලැබුවේ සංවිධානයක් වශයෙන් භික්ෂු සමාජය කළමනාකරණය කර ඇති ආකාරයයි. බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් පරමාර්ථ දෙකක් සඳහා මෙහෙයවනු ලැබූ හ. එනම්, නිවන් ලබා ගැනීම හා ගිහි ජනතාවට එකී ධර්මය පහදා දීමට ක්‍රියා කිරීම යි.



අරමුණු දෙකක් වුව ද, සංවිධානයක් වශයෙන් සිය ශ්‍රාවකයන් කටයුතු කිරීමේ දී හැසිරිය යුතු, ක්‍රියා කළයුතු පිළිවෙළ කෙරෙහි අවධානය යොමු කරමින් භික්ෂුවගේ කාර්යභාරය සැලසුම් කොට පාලනය කිරීම උදෙසා බුදුන් වහන්සේ මැනවින් තම භික්ෂු සංවිධානය කළමනාකරණය කොට ඇත.

එලෙස කළමනාකරණය කිරීමේ දී තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැදගත් කොට සැලකෙන අතර, භික්ෂු සංවිධානයෙන් හා බාහිර සමාජයෙන් බලපෑ සාධක ප්‍රධාන වශයෙන් ම ඒ සඳහා හේතු වූ බවත් ඒවාට විසඳුම් ලෙස තම ශ්‍රාවක සමාජය කළමනාකරණය කිරීමේ දී කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් අනුගමනය කර ඇති බවත්, ක්‍රි. පූ. 6 වන සියවසේ බුදු සසුනෙහි කළමනාකරණය කෙසේ පැවතියේ ද යන්න අධ්‍යයනය කරනු ලැබ ඇත.

"කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංවිධානකරණය පිළිබඳ කළමනාකරණය" පිළිබඳ සිවුවන පරිච්ඡේදයේ දී අධ්‍යයනය කරනු ලැබේ. ලාංකේය භික්ෂු සමාජය විකාශනය වීමේ දී දේශපාලන, ආර්ථික හා සමාජයීය හේතු මෙන් ම භික්ෂූන් වහන්සේලා තුළ බුද්ධ විනයට හා ධර්මයට පටහැනිව විවිධ විෂම අදහස් මතු වන්නට විය. බුදු දහම ලංකාවට පැමිණීමෙන් අනතුරුව මිනිසාගේ සෑම ක්ෂේත්‍රයකට ම මූලික වූයේ බුදු දහමයි. මෙලෙස භික්ෂු ප්‍රතිපත්ති බුද්ධ විනයට විරුද්ධ වන විට ඒවා මැඩපැවැත්වීම උදෙසා සකස් කරන ලද කතිකාවත්වල අන්තර්ගත වනුයේ අනාගත භික්ෂු සංවිධානය ක්‍රමවත් කිරීමේ වැඩපිළිවෙළකි. මෙහි මූලික අරමුණ වූයේ එතෙක් පැවති භික්ෂු දුෂ්ප්‍රතිපත්ති මැඩපැවැත්වීම සඳහා සකස් කරන ලද නීතිමය සංග්‍රහයක් නොව අනාගත භික්ෂු සංවිධානය මනා ලෙස පවත්වාගෙන යාම සඳහා නිර්මාණය කරන ලද ක්‍රමවේදයකි.

ඒ තුළ සමාජය මැනවින් සැලසුම් කිරීමත්, එකී සැලැස්මට අනුකූලවන ආකාරයට සංවිධානගත කිරීමත්, අභිමත පරමාර්ථයන්ට සරිලන සේ මෙහෙයවීමත් හා සැලසුම් කරගත් පරිදි පාලනය කිරීමට අවශ්‍ය වන ප්‍රතිපත්ති මාලාවක් වන හෙයින් එහි දක්නට



CamScanner

ලැබෙන්නේ කළමනාකරණයක් ය, යන්න මෙහි පර්යේෂණයට ලක් කොට ඇත.

කිසියම් ගැටලුවක් සඳහා විසඳුමක් සෙවීමේ දී පවතින සමාජ තත්ත්වයන් හා අනාගතයෙහි ඇති විය හැකි තත්ත්වයන් පිළිබඳව අධ්‍යයනය කොට තීරණයන්ට එළඹෙන්නේ නම් එය වඩාත් ම නිවැරදි කළමනාකරණයක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව ලාංකේය භික්ෂු සමාජයෙහි ඇතිව තිබූ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා බුද්ධ විනය මූලික කර ගැනීමට තීරණය කිරීම කතිකාවත්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන අතර ම තත්කාලීන සමාජ රටාවට සරිලන ආකාරයට ද තීරණයක් ගෙන ඇති බව පැහැදිලි ය. ඒ අතර භික්ෂූන් වහන්සේලා උදෙසා නායකත්වයට භික්ෂුවක් පත් කර ගැනීමට දඹදෙණි කතිකාවතෙහි තීරණය කිරීම විශේෂ අවධානයට ලක්වන කරුණක් වන අතර ම, ඒ අනුව සැකසුණු සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරීම තවත් වැදගත් වෙයි. බුදුන් වහන්සේ භික්ෂුව අභිප්‍රේරණය හෙවත් උනන්දු කරවනු ලැබුවේ නිවන් ලබා ගැනීමට වුවත් කතිකාවත් මගින් උනන්දු කොට ඇත්තේ විදර්ශනා ධුරයට වඩා ග්‍රන්ථකරණය හෙවත් ග්‍රන්ථධුරය සඳහා ය. එම කර්තව්‍ය සඳහා දීමනා ලබාදීමට තීරණය කිරීමත්, විවිධ තනතුරු නාම ඇති කිරීමත්, එම තනතුරුවලට පත්විය හැකි ආකාරය පිළිබඳව තොරතුරු දක්වා තිබීමෙනුත් පැහැදිලි වනුයේ බොහෝ සෙයින් මූලධර්මවලට අනුකූලව වැඩ කටයුතු සිදුකොට ඇති කළමනාකරණයක් බවයි. ඒ අනුව කතිකාවත්වල අන්තර්ගත කරුණුවලින් පැහැදිලි වනුයේ එය තත්කාලීන කළමනාකරණ ප්‍රතිපත්තියක් බවයි. එය මෙහි දී අධ්‍යයනය ට ලක් කොට ඇත.

ක්‍රි. ව. 8 වන සියවස වනවිට සසුන වෙනුවෙන් පරිත්‍යාග කරනු ලැබූ භෞතික හා අභෞතික සම්පත්හි වර්ධනය නිසා ඒවා ද විධිමත් සැලැස්මකට අනුකූලව පාලනය කිරීමේ අවශ්‍යතාව ද පැන නැගී තිබුණි. ඒ අනුව පස්වන පරිච්ඡේදයේ දී අවධානය යොමු කොට ඇත්තේ, "කතිකාවත් තුළින් හෙළිවන ආරාම කළමනාකරණය" කෙරෙහි ය. භික්ෂු ප්‍රතිපත්ති කෙරෙහි අවධානය



යොමු කිරීමෙන් පමණක් සසුනෙහි අනාගතය සැකසිය නො හැකි බව වටහාගත් කතිකා කාරක භික්ෂූන් වහන්සේලා හා රජවරු භික්ෂු ප්‍රතිරූපයට බෙහෙවින් බලපාන භෞතික හා අභෞතික සම්පත් ද කළමනාකරණය කළයුතු යැයි තීරණය කරන්නට ඇති බව මිහින්තලා පුවරු ලිපිය අභයගිරි සංස්කෘත ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නකි එහි පළමුව භික්ෂුව කෙරෙහිත් දෙවනුව ආරාම පාලනය කෙරෙහිත් අවධානය යොමු කොට ඇත.

බුද්ධ කාලීන භික්ෂු සමාජය තුළ මතු නොවුණු මෙම ගැටලුව නිරාකරණය කරගැනීමට තීරණය කරනු ලැබ ඇත්තේ ආරාම පාලනයෙන් භික්ෂුව ඉවත් කිරීමයි. එසේ ඉවත් කිරීම විසඳුමක් නො වන බවත්, ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් හා සේ-වකයන් යෙදවීමට සැලසුම් කිරීම, ආරාම පාලනය සඳහා පිළිගත හැකි වැඩපිළිවෙළක් සකස් කිරීමක් ලෙස සැලකිය හැකි අතර ම, එම නිලධාරීන් හා සේවකයන් විධිමත් ක්‍රමයට සංවිධානගත කිරීමත් සිදුකොට තිබෙන බව කතිකාවත්වලින් ම අනාවරණය කර ගත හැකි ය. නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සේවකයන් සේවය කිරීමත්, සංවිධාන සැලැස්මකට අනුකූලව ඔවුන්ගේ සේවය ලබා ගැනීමට හැකිවන අයුරින් නීති රීති සකස් කිරීමත් වැදගත් වේ. ආරාම කළමනාකරණය සඳහා වන සැලසුම් සකස් කොට ඇත්තේ ඒ වනවිට සමාජයෙහි පැවති සිරිත් විරිත් හා සම්ප්‍රදායන් පදනම් කරගෙන බවත්, මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනයට ලක් කොට ඇත.

ආරාම කළමනාකරණයෙහි වැදගත් ම ලක්ෂණය වනුයේ, අයවැය ලේඛනයි. අයවැය පාලනයයි. ඒ ඒ විහාරාරාමවලට ලැබෙන ආදායම් සටහන් කිරීමත්, ආරාම ප්‍රතිසංස්කරණ කටයුතු මෙන් ම විහාර සේවකයන්ට ගෙවනු ලබන දීමනා ආදිය ලේඛනගත කිරීමට තීරණය කිරීමත්, එම කාර්යභාරය ගිහියෙකුට පවරනු ලැබුවත් භික්ෂුවගේ අධීක්ෂණය යටතේ සිදුකළයුතු යැයි සැලසුම් කිරීමත් අධීක්ෂණය හා පාලන මූලධර්මවලට අනුකූලව ඉතා ම වැදගත් ය. මේ අනුව ආරාම පවත්වාගෙන යාම සඳහා විධිමත්



CamScanner

කළමනාකරණයක් අනුගමනය කොට ඇති බවට කතිකාවත්වලින් සාක්ෂි ලැබේ.

පර්යේෂණයට ලක් කරන ලද තොරතුරුවලට අනුව කතිකාවත් යනු ක්‍රි. ව. 8 වන සියවසේ සිට 15 වන සියවස දක්වා වූ කාලය තුළ ක්‍රියාත්මක වූ කළමනාකරණ ප්‍රතිපත්තියක් බවත්, ඒ තුළ කළමනාකරණයෙහි මූලික ලක්ෂණයන් ක්‍රියාත්මකව පැවති බවත් නිගමනය කිරීම හයවන පරිච්ඡේදයේ දී සිදුවන අතර, ලාංකේය බුදුසසුන අඛණ්ඩව ක්‍රියාත්මක වූයේ කතිකාවත් තුළ කළමනාකරණ ලක්ෂණයන් ක්‍රියාත්මක වූ නිසා බවත් පෙනී යයි.



# ස්තුතිය

අතීත ශ්‍රී ලංකාවේ භික්ෂු සංස්ථාව පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමේදී කතිකාවත්වලින් මනා පිටුවහලක් සපයයි. කතිකාවත් ඇසුරු කරමින් ශ්‍රී ලංකාවේ භික්ෂු සංවිධානයේ කළමනාකරණය නම් වූ මාතෘකාව යටතේ පර්යේෂණයක් සිදු කරන ලෙස මා දිරි ගන්වමින් අවශ්‍ය කතිකාවත් සහ සෙල්ලිපි සපයා දෙමින් පර්යේෂණය කිරීමට මා දිරිගැන්වූයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ, අභිලේඛන හා නාණක විද්‍යා අංශයේ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ ආචාර්ය මාලිනි ඩයස් මහත්මියයි. එම අංශයේ ම සහකාර අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ නාමල් කොඩිතුවක්කු මහතා ද මා උනන්දු කළ බව ගෞරවයෙන් සිහිපත් කරමි.

මාහට නිරතුරුව උපදෙස් ලබාදෙමින් කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතා හා මෙම විශ්වවිද්‍යාලයේම කළමනාකරණ පීඨයේ ආචාර්ය එච්. එම්. ඒ. හේරත් මහතා ද, මෙම පර්යේෂණය සිදුකිරීම සඳහා දිරිමත් කළ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්. එම්. මොරටුවගම මහතාට සහ මහාචාර්ය ආරියපාල මහතාට ද මගේ කෘතඥතාවය හිමි විය යුතු ය. මේ සඳහා නිරතුරුවම සහයෝගය ලබාදුන් කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චන්දිම බෝගහවත්ත මගේ මිත්‍රයාටත්, පරිගණක කටයුතු කරදෙමින් සහාය දැක්වූ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ පරිගණක නිලධාරිනී දමිතා අමරතුංග මහත්මියටත්, පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ අභිලේඛන හා නාණක විද්‍යා නිලධාරි ධම්මිකා ගමගේ මෙනෙවියටත්, මාගේ ස්තුතිය හිමි වේ.

මෙම කෘතිය ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ මුද්‍රණය කිරීමට සුදුසු කෘතියක් ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන



amScanner

CS CamScanner

සේවා මණ්ඩලය විසින් පිළිගැනීම මාගේ සතුටට කරුණකි. එහි සභාපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලයටත් විශේෂයෙන් ම ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයෙහි අංශ ප්‍රධානතුමියටත් මාගේ ස්තුතිය හිමි විය යුතුය. මෙම ග්‍රන්ථයෙහි ප්‍රකාශ කටයුතු භාරගත් දකුණු ආසියානු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂතුමියටත්, සැලකිල්ලෙන් යුතුව මුද්‍රණය කරවා දුන් සීදේවි ප්‍රකාශන ආයතනයෙහි අධ්‍යක්ෂතුමාට සහ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කරමි.

2015 දෙසැම්බර් 26
ඒ.එම්.නිමල් වසන්ත මෙන්ඩිස්
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.



## සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| අ. නි. | - | අංගුත්තර නිකාය |
| අ. වි. | - | අභිධම්මත්ථවිකාසිනිය |
| ක.ටී. | - | කංඛාවිතරී ටීකාව |
| ම.ව. | - | මහාවංශය |
| ම.ව.පා. | - | මජ්ඣිම නිකාය |
| ම.ව.පා. | - | මහාවග්ගපාලිය |
| පා.පා. | - | පාරාජිකා පාලිය |
| සං.නි. | - | සංයුක්ත නිකාය |
| ස.පා. | - | සමන්ත පාසාදිකාව |
| ස.ර.ක. | - | සද්ධර්මරත්නාකරය |
| පූ.ව. | - | පූජාවලිය |
| සී.ව. | - | සීහලවත්ථුපකරණය |
| ස.ව. | - | සහස්ස වත්ථුපකරණය |
| A.S.C.A.R. | - | Archaeological Survey of Ceylon-Annual Report |
| C.V. | - | Culavamsa |
| E.Z. | - | Epigraphia in Zeylanica |
| I.C. | - | Inscription of Ceylon |



CamScanner

| | | |
|---|---|---|
| M.P. | - | Manorathapurani |
| S.V. | - | Sumangala Vilasini |
| V.P. | - | Vamsatthappakasini |



# පටුන

හැඳින්වීම iii - xiii

ස්තුතිය xiii

සංකේත නිරූපණය xv

**පළමු පරිච්ඡේදය**

කළමනාකරණය හැඳින්වීම 1-15

1.1 කළමනාකරණය හැඳින්වීම 1

1.1.1 සැලසුම්කරණය - Planning 4

1.1.2 සංවිධානකරණය - Organization 4

1.1.3 මාණ්ඩලිකරණය - Staffing 5

1.1.4 අභිප්‍රේරණය - Mortivation 5

1.1.5 පාලනය - Controling 5

1.2 කළමනාකරණ චින්තනයේ ආරම්භය හා විකාශය 6

1.2.1 ශිෂ්ටාචාරයන් හි කළමනාකරණ ලක්ෂණ 8

1.2.2 ආගමික කළමනාකරණය 10

**දෙවන පරිච්ඡේදය**

කතිකාවත් හැඳින්වීම 17-33

2.1 ලංකාවේ කතිකාවත්වල ආරම්භය හා විකාශය 21

2.2 කතිකාවත් හා කළමනාකරණය අතර ඇති සබඳතාව 28

with CamScanner
CamScanner

### තෙවන පරිච්ඡේදය

කතිකාවත්වලට පසුබිම් වූ බුද්ධ කාලීන භික්ෂු කළමනාකරණය 35-79

3.1 බුදු සසුනෙහි අභිමතාර්ථය 36

3.2 භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමට බල පෑ සාධක 36

3.2.1 විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුද්ගලයන් මහණ වීම 38

3.2.2 භික්ෂු ප්‍රතිරූපයට පටහැනි ක්‍රියා සිදුවීම 38

3.2.3 භික්ෂූන් අතර එක්සත් බව නො මැතිවීම 38

3.2.4 ඇතැම් භික්ෂූන් වහන්සේලා ලෞකික ජීවිතයකට හුරුවීම 39

3.2.5 භික්ෂූන් වහන්සේලා සඳහා ලාභසත්කාර බහුල වීම40

3.2.6 අන්‍ය ශ්‍රමණ සංස්ථාවල සාමාජිකයන් හා විවිධ ප්‍රදේශවල පිරිස් සසුනෙහි සාමාජිකත්වය ලබා ගැනීම 40

3.2.7 තත්කාලීන සමාජ චින්තනයෙහි බලපෑම 41

3.3 බුදු සසුනෙහි තීරණ ගැනීමේ ස්වභාවය 41

3.4 බුද්ධ කාලීන භික්ෂු සමාජයේ සැලසුම්කරණය 46

3.5 භික්ෂු සංවිධානකරණය 50

3.6 භික්ෂූන් වහන්සේලා මෙහෙය වීම 63

3.6.1 බුදුන් වහන්සේගේ නායකත්වය 64

3.6.2 සන්නිවේදනය 65

3.6.3 ශ්‍රාවක අභිප්‍රේරණය 67

3.7 බුද්ධ කාලීන භික්ෂු පාලනය 68

### හතරවන පරිච්ඡේදය

කතිකාවත් තුළින් හෙළිවන භික්ෂු සංවිධානය පිළිබඳ කළමනාකරණය 81-134

4.1 කතිකාවත්වල අන්තර්ගත කළමනාකරණ පසුබිම 82

4.2 කතිකාවත්වල දැක්වෙන භික්ෂු සැලසුම්කරණය 91

4.2.1 පණ්ඩුපලාස අධ්‍යාපන - (ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා) 92

4.2.2 මහණ කිරීම විධිමත් කිරීම 94

4.2.3 සාමණේර අධ්‍යාපනය 97

4.2.4 මහලු පැවිද්ද 97

4.2.4.1. මහලු උපසම්පදාව ලබා දීම 98

4.2.4.2 මහලු පැවිදි වූවන්ගේ අධ්‍යාපනය 100

4.2.5 උපසම්පදා භික්ෂු අධ්‍යාපනය 101

4.2.5.1 නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය දක්වා ඉගෙන ගැනීම 103

4.2.5.2 නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය දක්වා ඉගෙන ගැනීම 104

4.2.5.3 නිශ්‍රයමුක්ත සම්මුතිය සඳහා වූ අධ්‍යාපනය (භික්ඛුනෝවාද) 104

4.2.5.4 ස්ථවිර තත්ත්වයට පත්වීමට අවශ්‍ය මූලික සුදුසුකම්. 105

4.3 භික්ෂු සංවිධානකරණය 107

4.3.1 මාහිමි තනතුරට පත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් 108

4.3.1.1 මහථෙර තනතුර 109

4.3.1.2 අයතැන 110

4,3.1.3 අයතැන් වැළත තනතුර 111

CamScanner

CamScanner

4.3.1.4 ප්‍රධාන පරිවේණාධිපති තනතුර සඳහා තිබිය යුතු සුදුසුකම්: 112
4.3.1.5 පරිවේණාධිපති 113
4.3.1.6 ගණදෙටු තනතුර 113
4.3.1.7 කාරක සංඝ සභාව 114
4.4 භික්ෂූන් වහන්සේලා මෙහෙයවීම 115
4.4.1 භික්ෂු අභිප්‍රේරණය 116
4.4.2 වැටුප් 116
4.5 භික්ෂු පාලනය 118
4.5.1 දඬුවම් 123

**පස්වන පරිච්ඡේදය**

කතිකාවත් තුළින් හෙළිවන අරාම කළමනාකරණය 137-168
5.1 අරාම කළමනාකරණය කිරීමට බලපෑ සාධක 137
5.2 ආරාම සැලසුම්කරණය 142
5.3 ආරාම සංවිධානකරණය 147
5.4 ආරාම මෙහෙයවීම 153
5.4.1 වැටුප් ගෙවීම 153
5.5 ආරාම පාලනය 157

**නිගමනය** 169 -180

**සැලසුම්**

(දඹදෙණි කතිකාවතෙහි භික්ෂු සංවිධාන සැලැස්ම) 181
උපග්‍රන්ථ 183 - 151
ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 253 - 260
සූචිය 261 - 263

# පළමුවන පරිච්ඡේදය

## කළමනාකරණය හැඳින්වීම

මානව සම්භවයේ සිට මෑත යුගය දක්වා ම "කළමනාකරණය" නම් වූ විෂයය, පොදු ක්‍රියාවලියක් ලෙස පැවත තිබේ. මිනිස් ක්‍රියාකාරකම් සංවර්ධනය වෙමින් ඉදිරියට පැමිණීමේ දී විෂයයක් ලෙස සකස් නො වුණත් මිනිස් සංවිධානයේ සෑම අභිමතාර්ථයක් ම ක්‍රියාත්මක වූයේ (ක්‍රි. ව. 18 වන සියවස දක්වා) කළමනාකරණය සමග ය. තනි පුද්ගලයෙකු වශයෙන් මිනිසෙකුගේ දියුණුවටත්, සමාජ සංවිධානයක් ලෙස ආයතනයක අරමුණු සඵල කර ගනිමින් සංවර්ධනය වීමටත් ප්‍රධානතම සාධකය වනුයේ මෙම විෂයයයි. ක්‍රි. පූ. 6 වන සියවසේ පැවති බුදු සසුන ද නූතනය දක්වා ම ක්‍රියාත්මක වෙමින් පැවත එන්නේ කළමනාකරණයක් ඒ තුළ අන්තර්ගතව පැවති නිසා ය. ඒ අනුව මෙම පරිච්ඡේදයේ දී "කළමනාකරණය" යනු කුමක් ද යන්න අධ්‍යයනය කිරීම සඳහා ශබ්ද කෝෂ, විශ්ව කෝෂ හා කළමනාකරණ චින්තනයෙහි ආදි කර්තෘවරුන්ගේ නිර්වචන ආශ්‍රයෙන් අධ්‍යයනය කෙරේ. එහි ආරම්භය, විකාශය පිළිබඳව හා කළමනාකරණයෙහි දැක්වෙන සැලසුම්කරණය, සංවිධානකරණය, මාණ්ඩලිකරණය, නායකත්වය හා පාලනය යන පොදු ක්‍රියාවලින් අතීතයේ සිට ම ක්‍රියාත්මක වූ බව ද පර්යේෂණය කොට ඇත.

### 1.1 කළමනාකරණය හැඳින්වීම

කළමනාකරණය යන වචනයෙන් ධ්වනිත වනුයේ යමක් කිරීම හා කරවීමයි. එය කටයුතු කිරීම යන අර්ථය ගෙන දෙයි.[1] "කළ මනා කරණ" යන්නෙන් සකස් වී ඇති මෙහි, "කළ" යන්නෙන් "කරන්නට" යන අර්ථයත්, "මනා" යනු, "කරන්නට

CamScanner

සුදුසු, කටයුතු දෙය, කාරණය" යනුවෙනුත්, "කරණ" යන්නෙහි "හේතුව"[2] ලෙසත් විග්‍රහ කෙරේ. කළමනාකරණයක් සිදු කිරීමට පෙර තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් කළ යුතු ය. මෙමගින් එකී අර්ථය ධ්වනිත වේ.

"කළමනා" යන විශේෂණ පදයට "කරණ" යන නාමය (විභක්ති ප්‍රත්‍යය) එකතු වීමෙන් කළමනාකරණය නම් වචනය සකස් වී ඇත. "කළමනා" යනු, "කිරීමට සුදුසු, කළයුතු හා අවශ්‍ය" යනුවෙන් අමාවතුරෙහි[3] මෙන් ම මහාවංශයෙහි[4] ද සඳහන් ය.

ක්‍රි. ව. 10 වන සියවසේ දී පමණ ලියැවුණු වෙස්සගිරි සෙල්ලිපියෙහි[5] ද මේ බව සඳහන්ව ඇත. "මෙ හැමැ කටැයුතු කළ කළමනා කාලයෙහි නොකටැ දිව" මේ හැම කටයුත්තක් ම කළයුතු කාලයෙහි කිරීමට නොදී වළකන භික්ෂූන් වහන්සේට මෙම ආවාසයෙහි වාසය කිරීමේ අයිතියත්, ලාභ ප්‍රයෝජනත් අහිමි වේ යනුවෙන් සඳහන් වීමෙන් මෙය සනාථ වේ. මෙම අදහස ම දඹදෙණි කතිකාවතෙහි[6] ද දක්වා ඇත. "කරණ" යනු කිරීමයි.[7] මෙයින්, කළමනාකරණය යනු, "කළයුතු දේ කිරීම" යන අර්ථය ලැබේ.

පාලි භාෂාවෙහි "කළමනා" ලෙස නිර්වචනය කරනුයේ "පාලේති"[8] යනුවෙනි. එය "පරිපාලනය කරන්නා" වශයෙන් සිංහලයට පරිවර්තනය කෙරේ. ඉංග්‍රීසි - පාලි ශබ්ද කෝෂයෙහි "කළමනාකරණය" යන්න "පරිපාලන"[9] යනුවෙන් සඳහන් කිරීමෙන් පැහැදිලි වනුයේ "පරිපාලනය"[10] යන වචනය, කළමනාකරණය යන්නට සමාන වචනයක් ලෙස භාවිත කොට ඇති බවයි.

කළමනාකරණය යනු සෑම විෂයයකට ම සෑම ක්ෂේත්‍රයකට ම පොදුවේ බලපාන්නකි. එය මැනවින් පැහැදිලි වනුයේ "පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා දක්ෂ හා විචක්ෂණාත්මක ලෙස සම්පත් පාවිච්චි කිරීම" යනුවෙන් කළමනාකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහයේ[11] සඳහන් වීමෙනි. යහපත් වූ අරමුණක් සාක්ෂාත් කර ගැනීමේ දී, සංවිධානයක් තුළ කළමනාකරණය අත්‍යාවශ්‍ය අංගයක් බව පැහැදිලි ය. එය වඩාත් තහවුරු වනුයේ පුද්ගලයන් තුළ, සංවිධාන තුළ මෙන්



ම කණ්ඩායම්වලට අවශ්‍ය වන අරමුණු තීරණය කිරීම හා එකී අරමුණු මුදුන් පමුණුවා ගැනීම අරබයා, මානව සම්පත් හා භෞතික සම්පත් මෙහෙයවීම, කළමනාකරණය ලෙස පැහැදිලි කිරීමෙන් වඩාත් තහවුරු වේ.

ඉංග්‍රීසි භාෂාවෙහි "Manage" යන්න සිංහලයෙහි "කළමනා" ලෙස ව්‍යවහාර වේ. මෙහි අර්ථය වනුයේ, හසුරුවනවා, හික්මවනවා, පිරිමසනවා හා උපායකින් ඉෂ්ට කර ගන්නවා[12] යනුවෙනි. එහෙත් මලලසේකර ශබ්ද කෝෂයෙහි විග්‍රහ වනුයේ, "සංවිධානය කරනවා" යන්නයි. "Management" හෙවත් කළමනාකරණය ලෙස විග්‍රහ කොට ඇත්තේ, හැසිරවීම, උපාය යොදා ගැනීම[13] ලෙස ය. මේ තුළින් ද කළමනාකරණය, ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළ වන්නා වූත්, අදාළ කරගත හැකි වූත් විෂයයක් ලෙස සැලකිය හැකි වේ.

මෙහිදී වඩාත් වැදගත් නිර්වචනය වනුයේ, ඩොනල්ඩ් ක්ලෂ්ගේ මතයයි.[14] ඔහු කළමනාකරණය යන්න, "පොදු පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා මිනිසුන් කණ්ඩායමකගේ කටයුතු මෙහෙයවීමේ කලාව" ලෙස අර්ථ දක්වා ඇත. කළමනාකරණය වූ කලී ක්‍රියාවලි ප්‍රවේශනයක් ලෙස විග්‍රහ කරනු ලැබූ අතර, එහි ආරම්භකයා වූයේ ප්‍රංශ ජාතික හෙන්රි ෆෙයෝල්[15] ය. ඔහුගේ නිර්වචනය වනුයේ, "කණ්ඩායම් ගත අරමුණු මුදුන්පත් කර ගැනීමට උචිත අභ්‍යන්තර හා බාහිර පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීම පිළිබඳ ක්‍රියාවලිය" කළමනාකරණය බවයි.

කළමනාකරණය යනු ක්‍රියාවලියකි.[16] එය තනි ක්‍රියාවක් ලෙස ක්‍රියාත්මක නො වන අතර, ප්‍රධාන අංග පහක් යටතේ විග්‍රහ කෙරේ. එනම්,

1. සැලසුම්කරණය
2. සංවිධානකරණය
3. මාණ්ඩලිකරණය
4. අභිප්‍රේරණය
5. පාලනය යි.

CamScanner

CS CamScanner

අභිමත අභිලාෂයන් මුදුන්පත් කර ගැනීම අරබයා සෑම සංවිධානයක් ම මෙම අංග කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

### 1.1.1 සැලසුම්කරණය - Planning

සැලසුම්කරණය යනු අනාගත වැඩපිළිවෙළක් වන අතර එය රඳා පවතිනුයේ තීරණ ගැනීමේ ස්වභාවය අනුව ය. මෙය කෙටිකාලීන සැලසුම් හා දීර්ඝකාලීන සැලසුම් යනුවෙන් වර්ග කොට දැක්වේ. කුමන ආකාරයේ සැලැස්මක් නිර්මාණය කළ ද එයට අභිමත අරමුණ මූලිකම සාධක වන අතර සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිම බලපායි. සංවිධානයක එහි අනාගතය උදෙසා විකල්ප ක්‍රියාමාර්ගය අතුරින් වඩා හොඳ විකල්ප තීරණය කරනුයේ සැලසුම්කරණය මගිනි.[17] මෙයින් කළ යුතු දෙය, කළයුතු ආකාරය, කළයුතු අවස්ථාව, කළයුතු තැනැත්තා යන කරුණු තීරණය කරනු ලබයි.

මෙලෙස සැලැස්මක් සකස් කිරීමට නම් ගැටලු හඳුනා-ගැනීම, විකල්ප ක්‍රියා මාර්ග යෝජනා කිරීම, විසඳුම්වල සාර්ථක අසාර්ථක ප්‍රතිඵල නිර්ණය කරගැනීම, වඩාත් ම හොඳ විසඳුම තෝරා ගැනීම හා එය ක්‍රියාවට නැංවීම කළ යුතු වෙයි.

### 1.1.2 සංවිධානකරණය - Organization

සංවිධානයක අරමුණු සාධනය කරගැනීම උදෙසා කටයුතු සංවිධානය කළ යුතු ය. ඵලදායී ලෙස ක්‍රියා කිරීමේ හැකියාව ලබා දීමත්, සාමාජිකයන් අතර තිබිය යුතු සම්බන්ධතාව සඳහා ව්‍යුහයක් නිර්මාණය කිරීම, වගකීම් හා බලතල නියම කිරීම, ඒ ඒ තනතුරුවලට අදාළ වන සුදුසුකම් නිර්ණය කිරීම සංවිධාකරණය ලෙස විග්‍රහ කෙරේ.[18]

### 1.1.3 මාණ්ඩලිකරණය - Staffing

ඒ ඒ තනතුරු සඳහා සාමාජිකයන් තෝරා පත්කර ගැනීම මාණ්ඩලිකරණයට අයත් ප්‍රධානතම කාර්යභාරයයි. සංවිධාන



ව්‍යුහයට මිනිස් බලය ආයෝජනය කිරීම සිදු විය යුතු බැවින් සංවිධානකරණය හා මාණ්ඩලීකරණය එකිනෙක සම්බන්ධතාවකින් ද යුක්ත වන බැවින් මාණ්ඩලීකරණය සංවිධානකරණ කාර්යයට අදාළ කිරීමට හැකියාව තිබේ.[19] තනතුරු සඳහා සුදුස්සන් පත්කර ගැනීම, වැටුප් දීමනා ලබා දීම සඳහා සැලැස්මක් නිර්මාණය කිරීම මෙයට අයත් අනෙක් කාර්යභාරයන් ලෙස සැලකේ.

### 1.1.4 අභිප්‍රේරණය - Mortivation

සංවිධානයෙහි අරමුණු මුදුන් පමුණුවා ගැනීමට හැකි වන පරිදි, සාමාජිකයන් තුළ උද්‍යෝගයක් ඇති කිරීම සඳහා දිරි ගැන්වීම සිදුකරන්නේ නම් එය අභිප්‍රේරණය ලෙස සැලකේ.[20] මේ පිළිබඳව ඒබ්‍රහම් මාස්ලෝගේ[21] "අවශ්‍යතාවලිය" නමින් අදහස් ඉදිරිපත් කරන අතර, එය ශාරීරික අවශ්‍යතා, ආරක්ෂක අවශ්‍යතා, සමාජයීය හා ආදර අවශ්‍යතා, අභිමානතා (ආත්ම ගෞරවය, ආත්ම විශ්වාසය) යනුවෙන් මානව අවශ්‍යතාවන්ට අනුව කොටස් පහකට බෙදා දක්වයි. ශ්‍රමය ආයතනයට වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීමට යත්න දැරීම ද මෙයින් සිදු වේ. විශේෂ වරප්‍රසාද ලබා දීම, දීමනා ආදිය වැඩි කිරීම, නිවාඩු ලබා දීම ආදිය මෙයට අයත් ය. මෙයින් බලාපොරොත්තු වනුයේ අපේක්ෂිත අරමුණු කරා සේවකයන් හැසිරවීමයි.

### 1.1.5 පාලනය - Controling

සංවිධානයක සිදුවන සමස්ත කාර්යය සමුදාය සැලසුම් පරමාර්ථවලට අනුකූලව සිදුකිරීම පාලනය ලෙස විග්‍රහ කෙරේ. එසේ ක්‍රියාකිරීමේ දී පරමාර්ථයට ම අනුව තම සංවිධානය මෙහෙය වීම, සිය සාමාජිකයන් එකී අරමුණු වෙත තබා ගැනීම සඳහා නීති රීති සකස් කර ගැනීම හා මූල්‍ය පාලනයක් ඇති කර ගැනීම උදෙසා අයවැය ලේඛනයක් සකස් කිරීම "පාලනයෙහි" දක්නට ලැබෙන ප්‍රධාන කාර්යයන් වේ.

CamScanner

කිසියම් වූ ආයතනයක හෝ සංවිධානයක අරමුණු කරා ළඟාවීමට කළමනාකරණයක් සිදුකරන්නේ නම්, මෙම අංග පහ අනිවාර්යයෙන් ම සිදු විය යුතු අතර, එයින් එකක් හෝ දෙකක් පමණක් ක්‍රියාවට නැංවීමට නො හැකි අතර, සාර්ථක කළමනාකරණයක් සිදු වන්නට නම් පොදු ක්‍රියාවලිය වූ මෙම අංග පහ ම මැනවින් සකස් කර ගත යුතු බව ද වැඩිදුරටත් සඳහන් කළ හැකි ය.

## 1.2 කළමනාකරණ චින්තනයේ ආරම්භය හා විකාශය

"කළමනාකරණය" විෂයයක් ලෙස සකස් වූයේ 20 වන සියවසේ අග භාගයේ දී ය.[22] 19 වන සියවසේ සිදු වූ කාර්මික විප්ලවයත් සමග නව ආර්ථික රටාවන් සකස් වූ අතර, එයට මුහුණ දීම සඳහා එතෙක් පැවති කළමනාකරණ මූලයන් නව ක්‍රමයක් යටතේ සකස් විය.[23] එය කළමනාකරණය, අතීතයේ සිට ම පැවති බවට සාධකයකි.

මෙම කාලපරිච්ඡේදය තුළ එංගලන්තයේ සිදු වූ විපර්යාසයට මුහුණ දෙන්නට පැවති කළමනාකරණයන් ප්‍රමාණවත් නො විය. ශ්‍රම හමුදාවක් බිහි වීමත්, විශාල ප්‍රාග්ධනයක් මෙන් ම, යන්ත්‍ර සූත්‍ර පාලනය කිරීමට න්‍යායයන් සකස් කර ගැනීමටත් අවශ්‍ය විය. එලෙස එතෙක් පැවති සරල අර්ථ ක්‍රමය, සංකීර්ණවීමත් සමග, කළමනාකරණ විෂය වෙන ම විෂයක් ලෙස ඇමරිකාවේ දී එෆ්. ඩබලිව්. ටෙලර්ගේ[24] මූලිකත්වයෙන් සිදු විය. මේ අනුව, කළමනාකරණය විවිධ ස්වරූපයෙන් මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම පැවත තිබේ.[25] විධිමත් ක්‍රියාවලියක් ලෙස නො පැවතියේ නම් මානව ශිෂ්ටාචාරය ගොඩනැඟෙන්නේ ද නැත.26මූලධර්ම නූතනයේ සකස් වුවත්, කළමනාකරණය ක්‍රි. පූ. 4000 - 3000 දක්වා දිව යයි.[27] එහෙත් එහි සමාරම්භය ක්‍රි. පූ. 10,000 ට පෙර සිදු වූ බවට සාධක සොයා ගෙන ඇත.

මානව පරිණාමයේ දී මුල්වරට නිෂ්පාදනයක් සිදුවූයේ හෝමෝ හැබිලස් අතිනි.[28] ගල් ආයුධයක් නිෂ්පාදනය කිරීමත් සමග



ම එය ආරම්භ විය. භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට අවශ්‍යතාවක් තිබිය යුතු ය. එහි දී කෙසේ නිෂ්පාදනය කළ යුතු ද? කුමන අමුද්‍රව්‍ය භාවිත කළ යුතු ද? යන ගැටලුවලට විසඳුම් සොයා ගත යුතු ය. කළමනාකරණයේ අවශ්‍යතාව ද කළමනාකරණයේ යෙදුම් ද මෙයට ම අදාළ වේ. භාණ්ඩ නිෂ්පාදනයට භෞතික සම්පත් සේ ම මානව සම්පත්හි ද එකසේ දායකත්වයක් ලැබී ඇති බව පෙනේ. මේ තුළින් කළමනාකරණ චින්තනයේ ආරම්භය මිනිස් ඉතිහාසය තරම් ම ඈතට දිව යන බව සඳහන් කළ හැකි ය.

කළමනාකරණ චින්තනයේ විකාශය ආරම්භ වනුයේ ආහාර සපයා ගැනීම, කල් තබා ගැනීම හා බෙදා හැරීමත් සමග ය. මුල් යුගයෙහි විසූ මිනිසා කිසිදු නිෂ්පාදනයක් නො කළ අතර ස්වභාව ධර්මයෙන් ලද ද්‍රව්‍ය ආහාරපාන වශයෙන් ලබා ගන්නා ලදී.[29]

මිනිස් පරිභෝජනය වැඩිවීමත්, සොයාගන්නා වූ ආහාරපාන ද්‍රව්‍ය හිඟවීමත් නිසා ගල් යුගයේ වාසය කළ මිනිසා එයට විකල්ප ක්‍රියාමාර්ග විය. එහි ප්‍රතිඵලය වූයේ සතුන් දඩයම් කර ගැනීම සඳහා ගල් ආයුධ නිෂ්පාදනය කිරීමත්,[30] ආහාර ද්‍රව්‍ය වේළා, පුළුස්සා ගැනීමට උපාය මාර්ග සකසා ගැනීමත් ය. කිසියම් වූ කළමනාකරණයක් නො තිබුණේ නම්, මේ සියල්ල සකස් වන්නට හැකියාවක් නො මැත.

එසේ ආරම්භ වූ කළමනාකරණයෙහි සන්ධිස්ථානයක් වනුයේ ආසන්න ලෙස දැනට වසර 10,000ට පෙර ලෝකයේ සිදු වූ "ගෘහස්ථකරණය" යි.[31] (omestic) මෙමගින් සිදු වූයේ මානවයා එතෙක් තමා අනුභවයට ගත් සතුන් හීලෑ කර ගැනීමත්, ඔවුන් තම නිවසේ ඇති දැඩි කිරීමත්, ශාක තම නිවෙස් අසල වගා කර ගැනීමත් ය. මෙලෙස සිදු කිරීමේ දී පළමුව හීලෑකර ගත යුතු සතුන් කවරහු ද යන්න ඔවුන් පළමුව සොයා බලන්නට ඇත. එහි දී මූලික වශයෙන් සිදු වූයේ අවශ්‍යතාව යි. හීලෑකර ගැනීමේ දී කෙසේ, කුමන කාලයක සිදු කළ යුත්තේ ද? යන්න තීරණය කිරීමේ දී ඒ සඳහා සැලසුමක්, සංවිධානගත කිරීමක්, මෙහෙයවීමක් සහ පාලනය කිරීමක් තිබිය යුතු ය. ඒ අනුව ගල් යුගයේ දී ද කළමනාකරණ ලක්ෂණ විද්‍යමාන වන බව පැහැදිලි ය.

CamScanner

## 1.2.1 ශිෂ්ටාචාරයන් හි කළමනාකරණ ලක්ෂණ

මිනිසා ශිෂ්ටාචාර ගතවීමත් සමග ම බිහි වූ ශිෂ්ටාචාරයන්හි ද කළමනාකරණ ලක්ෂණ දක්නට ලැබේ. එහෙත් ඒවා නූතනයේ තරම් පැහැදිලි ලෙස විද්‍යමාන නොවේ. එසේ වුව ද නූතනයේ කළමනාකරණයෙහි අඩංගු ඇතැම් ලක්ෂණ අතීතයේ මානව ශිෂ්ටාචාර තුළ ද දක්නට ලැබේ. ක්‍රි. පූ. 3250 - 2750 අතර ගොඩනැඟුණා යැයි විශ්වාස කෙරෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය[32] පැරණි මානව ශිෂ්ටාචාර අතරින් එකකි. මොහොන්දාජාරෝ - හරප්පා ශිෂ්ටාචාරයන්ගෙන් සොයා ගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව, සැතපුම් 1,000 ක් පමණ භූමි භාගයක ව්‍යාප්ත වී ඇති මෙහි නගරයන් නිර්මාණය කොට ඇත්තේ පූර්ව සැලැස්මකට අනුකූලව ය. මහල් සහිත ගොඩනැගිලි,[33] ඒවාට අවශ්‍ය කරන කාමර, පහසුවෙන් එහා මෙහා යා හැකි, අඩි 30ක් 20ක් පමණ පළල් වූ මංමාවත්, විධිමත් ලෙස ජලය බැස යාම සඳහා සකස් කර ඇති ජලාපවහන පද්ධති[34] එහි විශේෂ වේ. නගර නිර්මාණය කිරීමේ දී වැඩි අවධානයක් යොමු කොට ඇත්තේ ස්වභාවික ජල ගැලීම් පාලනය කිරීමට ය. ඒ සඳහා ආරක්ෂිත ගල් වැටි ඉදිකොට ඇත. මෙවන් නිර්මාණයක් සිදු කරන්නට නම් පැහැදිලි සැලැස්මක් හා පාලනයක් එනම්, කළමනාකරණයක් තිබීම අත්‍යවශ්‍ය ය.

ග්‍රීක ශිෂ්ටාචාරය ද කළමනාකරණ ලක්ෂණ අන්තර්ගතව ඇති ඉපැරණි ශිෂ්ටාචාරයකි. ක්‍රි.පූ. 8 වන සියවස සිට ක්‍රි. පූ. 4 වන සියවස දක්වා වූ දියුණු ලක්ෂණ පෙන්නුම් කරන මෙහි[35] "ග්‍රීක පුර" සංකල්පය මැනවින් ක්‍රියාත්මක විය. ජනගහනය 20,000ට නො අඩු ප්‍රාදේශීය නායකයන්ගෙන් මෙය සැදුම් ලද්දකි.[36] පැවති පාලන තන්ත්‍රයෙහි අඩුපාඩු හා දුර්වලකම් සිදුවන විට එයට විසඳුමක් ලෙස සකස් කරනු ලැබූවක් විය හැකි ය. මෙලෙස පාලන ව්‍යුහය ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය වන්නා වූ බලතල ආදිය ද පවරන්නට ඇත.

ක්‍රි. පූ. 300 දී පමණ ග්‍රීක පුර රාජ්‍යයන් තුළ සංගම් බිහිවේ.[37]* ඔසෝනියානු ශිල්පීන්ගේ සංගමය ඊට උදාහරණ වේ. ක්‍රි. පූ. 200 දී



ආරම්භ වූ කුටුම්බ සංගමය, ක්‍රි. පූ. 317-307 කාල පරිච්ඡේදය තුළ බිහි වූ ව්‍යාපාර සංගම්[38] මේවා අතර ප්‍රධාන ය.

ග්‍රීක පුර රාජ්‍යයෙහි මූලික ම අරමුණ වී තිබුණේ ආර්ථිකය පාලනය කිරීම යි. ධාන්‍ය හිඟ වූ අවස්ථාවන්හි දී, ඇතැන්ස් හි (ක්‍රි. පූ. 329-325) රජයේ මැදිහත්වීමෙන් අරමුදලක් පිහිටුවාගෙන[39] ධාන්‍ය මිලට ගෙන, ඒවා ජනතාව අතර මැන බෙදා දීම සඳහා සලාක ක්‍රමයක්[40] ඇති කොට ගෙන තිබුණි.

නීති පද්ධතියක් ද ක්‍රි. පූ. 8 වන සියවස වන විට ග්‍රීකය තුළ ක්‍රියාත්මක වී තිබේ.41 බදු අය කරගැනීමේ නීතියට අනුව අස්වැන්නෙන් 10%ක් ද, ගෙවල් කුලීවලින් 10%ක් ද සෘජු බදු ලෙස අය කර ගෙන ඇත. අපනයනයේ දී හා ආනයනයේ දී 2%ක් ද සතුන් සඳහා තණබිම් බද්දක් ද, නැව්තොට බද්දක් ද වක්‍ර බදු ලෙස පනවා තිබුණි. ඊට අමතරව සෞඛ්‍ය නීති පනතක් ද, ගෙවල් හිමියන්, වීථිවලට කසළ බැහැර කිරීම සඳහා වූ පනතක් ද පනවා ගෙන තිබේ.

මේ තුළින් ග්‍රීක රාජ්‍යයෙහි සැලැස්මකට අනුකූලව රට පාලනය කර ඇති බවත්, එය අවශ්‍යතාවට අනුකූල වන ලෙස සකස් කරගෙන ඇති බවත් දක්නට ලැබේ. ක්‍රි. පූ. 2000-300 අතර පැවති පර්සියානු* ශිෂ්ටාචාරය අධ්‍යයනය කිරීමේ දී සැතපුම් 1600ක් පමණ දිවෙන තවලම් මාර්ග ඉදි කිරීම වැදගත් වේ.[42] මෙය එම මාර්ග ඔස්සේ චීන රෙදි බටහිරට ප්‍රවාහනය කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයකි.

සුළු ආසියාව නම් පෙදෙසෙහි පිහිටි "ලිඩියා" රටේ මුල් ම කාසි තනන ලද අතර, භාණ්ඩ වෙළඳාමේ දී ඇති වන්නා වූ ගැටලුවලට විසඳුමක් ලෙස කාසි භාවිත කිරීමට සැලසුම් කරන්නට ඇත. ක්‍රි. පූ. 600 දී පමණ අසල්වැසි මීඩ්ස්වරු යටත් කර ගැනීම සඳහා හමුදාවක් නිර්මාණය කොට ගෙන ඇති අතර, රටේ ජනතාවගේ ජීවන තත්ත්වය පිළිබඳව සොයා බලන්නටත්, ඔවුන්ට අයබදු ගෙවිය හැකි ද යන්න විමර්ශනය කිරීම සඳහාත් පරීක්ෂක කණ්ඩායමක් පත්කොට ගෙන තිබේ. මෙමගින් ද විශද වනුයේ පූර්ව සැලැස්මකට අනුව පර්සියාව ද පාලනය කොට ඇති බව යි.

## 1.2.2 ආගමික කළමනාකරණය

ක්‍රි. පූ. 6 වන සියවස වන විට භාරතයෙහි පැවති ආගම් ගණන හැට දෙකකි.[43] ඒ ඒ ආගමික කෘතිවලට අනුව එම ආගම් අතරෙන් විධිමත් සැලැස්මකට අනුකූලව ක්‍රියාත්මක වූ ආගම් ගණන තුනකි. එනම්,

- බ්‍රාහ්මණ දහම
- ජෛන දහම
- බුද්ධ දහම යනුවෙනි.

වෛදික දහමෙහි සමාරම්භය නිශ්චිත නොවූවත් ක්‍රි. පූ. 1500-900 අතර ලියැවුණු ඍග් වේදය වෛදික ආගම් සැලසුම් සහගත බව ප්‍රකට කරන නිදසුනකි. බ්‍රාහ්මණ දහම සමාජය තුළ ක්‍රියාත්මකවීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත්, නීති රීති පමණක් නොව සමාජාර්ථික න්‍යායන් ද එහි අන්තර්ගත කොට ඇත. සමාජය සකස් කිරීමේ දී එය ප්‍රධාන සමාජ රටා හතරකට බෙදා දැක්වීමත්, එකිනෙක කුලයන්ට වෙනස් වූ කාර්යයන් හඳුන්වා දීමත්[44] සමාජයෙහි ඉහළ ම සමාජය ලෙස බ්‍රාහ්මණයන් හඳුන්වා දීමෙන්, එකී සමාජයෙහි පාලනය තමන් අතට ගැනීමත්, පාලනය සඳහා විවිධ නීති රීති සකස් කර ගැනීමත් සිදු කොට තිබුණි.

පුරෝකථනය, නූතන කළමනාකරණයෙහි ද වැදගත් අංගයකි. එකී සංකල්පය, බ්‍රාහ්මණ දහම තුළ ද අන්තර්ගතව තිබූ බවට සාධක වනුයේ, බ්‍රාහ්මණයන්ගේ වෘත්තීන් වන "ස්වධර්ම" පසුකාලීනව පිරිහෙන විට ඒ වෙනුවට "ආපද් ධර්ම" හඳුන්වාදීමයි. මොවුන් ස්වකීය පාලනය උදෙසා නීති රීති ද හඳුන්වා ද ඇත.[45] වර්ණ භේදයට අමතරව ජීවිතය ද අවස්ථා හතරකට බෙදා එය ආශ්‍රම ධර්ම නමින් නම් කොට තිබේ.

එහි අරමුණ වූයේ ශ්‍රමණ සංස්කෘතියේ අංග ලක්ෂණයන් වූ පැවිදි ජීවිතය බ්‍රාහ්මණයන් අතර ප්‍රචලිත වීම වැළැක්වීමයි. මෙය ඇති කර ගැනීමට ඔවුන් පෙළඹී ඇත්තේ පසුකලෙකය.[46] බ්‍රාහ්මණ දහම සමාජය තුළ ක්‍රියාත්මක කිරීම ඔවුන් කිසියම් පූර්ව සැලැස්මකට අනුකූලව සිදු කොට තිබේ.



ක්‍රි. පූ. 6 වන සියවස වන විට භාරතයේ පැවති ආගම අතුරෙන් ප්‍රචලිතව පැවති ජෛන දහම ද ජෛන අනුගාමිකයන් විසින් සකස් කිරීමේ දී පූර්ව සැලැස්මක් භාවිත කොට තිබුණි. චතුයාම සංවරයකින් යුක්ත කිරීම,[47] වස්ත්‍ර භාවිතයෙන් තොර කිරීම, දත් නො මැදීම, නො නෑම, ශාකවලට පවා ජීවයක් ඇතැයි ප්‍රකාශ කරමින් ඒවා විනාශ කිරීම සිය ශ්‍රාවකයන්ට තහනම් කිරීම පෙන්වා දී ඇත.

බුද්ධ දහමෙහි ද කළමනාකරණ ලක්ෂණ දක්නට ලැබේ. බුද්ධ සසුන සංවිධානාත්මක ආගමක් ලෙස සැලකෙන අතර, බුද්ධ සසුනෙහි සාමාජිකයන් සැලසුම් කිරීමේ දී අන්‍ය ශ්‍රමණ සංස්ථාවන්ට වෙනස් වූ. ඔවුන්ගේ ඌනපූරණතා ඉවත් කොට සකස් කිරීමට සැලසුම් කිරීමත්, ධර්මය හා විනය මූලිකත්වයෙහි තබාගෙන භික්ෂුව, බුදුන් වහන්සේගේ නායකත්වය යටතේ සංවිධානගත කිරීමත්, ලෝකයාට හිත සුව පිණිස හැසිරීමේ දී අල්පේච්ඡ ගුණයෙන් යුක්ත කිරීමත්, බුද්ධ දහමෙහි මූලික පරමාර්ථයන්ගෙන් බැහැරව ක්‍රියා කරනු ලබන සාමාජිකයන් අරමුණු කරා තබා ගැනීමටත්, එසේ නො හැකි සාමාජිකයන් සසුනෙන් නෙරපා හැරීම සඳහා 220ක් වූ විනය නීති පාදක[48] කර ගැනීමත්, කළමනාකරණ ලක්ෂණයන්ගෙන් යුක්ත බැව් සඳහන් කිරීමට සාධකයන් ය. එකී බුද්ධ සසුනෙහි කළමනාකරණය පිළිබඳව දෙවන පරිච්ඡේදයෙහි සාකච්ඡා කෙරෙන බැවින් මෙහි දීර්ඝ වශයෙන් අධ්‍යයනය නො කෙරේ.

මේ අනුව, ආගමික සංස්ථා සංවිධානාත්මක ලෙස භාරතය පුරා ව්‍යාප්තව පැවති අතර, එය කළමනාකරණයක් තුළින් සිදුවූවක් බව සැලකිය හැකි ය.

මෙම විෂයෙහි විකාශය අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන අවධි හතරකට බෙදා දැක් වේ. එනම්,

- සාම්ප්‍රදායික පිවිසුම
- විද්‍යාත්මක කළමනාකරණය
- චර්යාත්මක කළමනාකරණ යුගය
- නූතන කළමනාකරණ යුගය යනුවෙනි.

සම්ප්‍රදායික පිවිසුම් කළමනාකරණය එෆ්. ඩබ්ලිව්. ටේලර්ගෙන්[49] (F. W. Taylor) ආරම්භ වූ අතර, විද්‍යාත්මක කළමනාකරණය හෙන්රි ෆෙයොල්ගෙන්[50] ආරම්භ විය. චර්යාත්මක කළමනාකරණයෙහි නියමුවා වනුයේ එල්ටන් මායෝ[51] ය.

නූතනයේ මෙම විෂය සංවර්ධනයට පත්ව ඇති බව පැහැදිලි වන නමුත්, එය ද කළ යුතු දේ මැනවින් කිරීම යන සංකල්පය පදනම් කරගෙන සිදු වී තිබේ. කළමනාකරණය යනු, "කණ්ඩායම්ගත අරමුණු මුදුන්පත් කර ගැනීම උදෙසා සුදුසු අභ්‍යන්තර පරිසරයක් නිර්මාණය කිරීම හා එය පවත්වා ගැනීම පිළිබඳ ක්‍රියාවලියක් ලෙස නිගමනය කළ හැකි ය."

කළමනාකරණය විෂය 19 වන සියවසෙන් පසුව විකාශයට පත්වූ එහෙත් මිනිසාගේ ආරම්භයේ සිට ම ක්‍රමිකව විකාශනය වූ විෂයයක් වන අතර ම පොදු ක්‍රියාවලියක් වශයෙන් කළමනාකරණය අතීතයේ සිට ම ක්‍රියාත්මක වූ බවත්, නිගමනය කළ හැකි ය. එනිසා ඕනෑම සමාජයක් හෝ සංවිධානයක් අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ දී පොදු ක්‍රියාවලිය අනිවාර්යයෙන් ම අනුගමනය කළ යුතු ය. එයින් ද සැලසුම්කරණය හා පාලනය වඩාත් ම වැදගත් වනුයේ, නිවැරදි සැලැස්මක් ඇති කර ගැනීමට අපොහොසත් වුවහොත් එම සංවිධානයට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නො හැකි වන අතර ම, අරමුණු ගත වූ පාලනයක් සිදු නො වුණහොත් එය ද බිඳ වැටෙන හෙයිනි. ඒ අනුව, සාර්ථක කළමනාකරණය, සංවිධානයක් සාර්ථකව පවත්වා ගෙන යාමට අනුගමනය කළ යුතු ඉතා නිවැරදි ක්‍රියා මාර්ගය ලෙස අපට අධ්‍යයනය කළ හැකි ය.



## ආන්තික සටහන්


1 සිංහල ශබ්ද කෝෂය, 5 වන කාණ්ඩය, සංස්කෘතික අමාත්‍යාංශය, ලේක් හවුස් ප්‍රින්ටර්ස්, 1982,2511 පි.

2 ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ප්‍රථම භාගය, වැලිවිටියේ සෝරත ස්වාමීන්ද්‍රයන් වහන්සේ, හේමසිරි අභයවික්‍රම,අනුලා මුද්‍රණාලය, බු. ව. 2507, 253 පි.

3 අමාවතුර, ගුරුළුගෝමීන්, සංස්. කෝදාගොඩ ඥානාලෝක හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. 1959, 62,68 පි.

4 ම. ව.,59 පරිච්ඡේදය, 3, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, 1959,

5 E. Z., Vol. 1.,Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 25P.

6 කතිකාවත් සඟරා, ඩී. බී. ජයතිලකලගුණසේන සහ සමාගම, 1984, දෙවන මුද්‍රණය, කොළඹ, 22 පි.

7 සිංහල මහාඅකාරාදිය, බෝරුග්ගමුවේ සිරිරේවත නායක හිමි,රෝහණ මුද්‍රණ ශිල්පියෝ, ගම්පොල,1954,159 පි.

English – Pali Dictionary, Aggamahapandita A.P. Buddhadatta Mahathera, Printed for the Pali Text Society the Colombo, Apothergaries Co. L.T.D. 1995, 320P.

9 -Do-

10 "පරිපාලන" යනු, ආරක්ෂා කරන, රැක බලා ගන්නා හා පවත්වාගෙන යන අර්ථය ගෙන දෙයි. "පරිපාලනය" යන්නෙන් ධ්වනිත වනුයේ ආරක්ෂා කිරීම, රැක බලා ගැනීම හා පවත්වාගෙන යාම යනුවෙනි. සිංහල ශබ්ද කෝෂය, 14 වන කාණ්ඩය,34 වන භාගය

11 කළමනාකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය,සම්පාදක ධර්මසේන සිල්වා, 690 පි

12 English – Sinhala Dictionary, Sri Sudharman Dharmadasa De Silva Valisinghe, M. D. Gunasena, Colombo. 1966, 601P.

13 Malalasekara English- Sinhala Dictionaries, G. P. Malalasekara, M. D. Gunasena, Colombo, 2000, 616P.

14 Donald Clush, the Human Problems of an Industrial Civilization Macmillan, London, 1933, 75P.

15 Fayol, Henry, General and Industrial Management, Translated by Constance Storrs, Pitman, London, 1949

16 විශ්වකෝෂය, 6 වැනි කාණ්ඩය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ, 1978, 47 පි.

17 විශ්වකෝෂය "ක" කාණ්ඩය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, 1978, 549 පි.

18 විශ්වකෝෂය "ක" කාණ්ඩය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ,


ith CamScanner

CS CamScanner

1978, 551 පි.
19 විශ්වකෝෂය "ක" කාණ්ඩය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, 1978, 556 පි.
20 උඩරාපොල, නන්දසේන, ව්‍යාපාර කළමනාකරණය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 41 පි.
21 Abraham Maslo, Mortivation and Personality, Harper and Row, New York, 1970, 03 P.
22 Sharma, R. K., and Shashik Gupta, Industrial Organization and Management, Culcutta, 1988, 392 P.
23 විශ්ව කෝෂය, 6 වැනි කාණ්ඩය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ, 1978, 549 පි.
24 F. W. Taylor, principles of Scientific Management, Harper and Row, New York, 1941 P.
25 Sharma, R. K. and Shashik Gupta, Industrial Organization and Management, Cilcutta, 1988, 391 P.
26 ජයසිංහ, ශ්‍යාමන්, "කළමනාකරණය හැඳින්වීම", ලේක් හවුස්, කොළඹ, 1989, 01 පි.
27 Graham Richards, Human Evolution, New York, London, 1987, 78 P.
28 - Do –
29 - Do -
30 Graham Richards, Human Evolution, New York, London, 1987, 78 P.
31 Smith Andrew, Domestication of Animals, The oxford company of Archaeology, Oxford University Press, 1996, 181 P.
32 Majunder, R. C., Ancient India, Banaras, 1952, 98 P.
33 Brown, P. Indian Architecture, Bombay, 1949, 35 P.
34 Wheeler, Sir Motimor, the Indus Civilization, Cambridge,1953,25p.
35 ඩයස්, ගුණරත්න, ග්‍රීක දර්ශනය, ගුණසේන සහ සමාගම, කොළඹ, 1963, 7 පි.
36 සිල්වා, සී. ආර්. ද. "ග්‍රීක ශිෂ්ටාචාරය" පේරාදෙණිය, 1970, 4 පි.
37 ටාර්න්, ඩබ්ලිව්. ඩබ්ලිව්., "හෙලනිස්තික ශිෂ්ටාචාරය" අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 1971, 80 පි.
* කිසිවෙකුගේ පෙළපත නො කියා පවත්වාගෙන ගිය සංගමයක් ලෙස සැලකේ.
38 Tarm, W. W. Greeks in Infia and Barcia, 2nd Edition, Cambridge, 1957 78 P.
39 Gomperz, Theoder., The Greek Thinkers, 6th Edition, London, 1964, 30 P.



40 ටාර්න්, ඩබ්ලිව්. ඩබ්ලිව්., "හෙලනිස්තික ශිෂ්ටාචාරය" අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 1971, 91 පි.
41 Gomperz, Theoder., The Greek Thinkers, 6th Edition, London, 1964, 65 P.
)) මධ්‍යම ආසියාවේ එඬේර ජීවිතයක් ගත කළ මොවුන් ක්‍රි. පූ. 2000 දී පමණ ආර්ය ජනතාවගෙන් වෙන් ව තම සතුන්ට තෘණ බිම් සොයා ගෙන පර්සියන් බොක්ක හා කැස්පියන් මුහුද අතර පිහිටි උස් තැන්තලාවේ පදිංචි වූ හෙයින් පර්සියානුවන් යන නාමයෙන් හඳුන්වනු ලැබේ. වර්තමානයේ ඉරාන ජාතිකයන් ලෙස හඳුන්වනු ලබන්නේ එම පර්සියානු ජාතිකයන් ය.
42 රණවීර, සරත්, ලොව ඉපැරණි ශිෂ්ටාචාර, ගුණසේන සහ සමාගම, කොළඹ, 2000, 278 පි.
43 දී. නි., බ්‍රහ්මජාල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 1-80 දක්වා පිටු
44 ම. නි. 11 බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 1964, 179-180 පිටු
45 බෂාම්, ඒ. එල්., අසිරිමත් ඉන්දියාව, ප්‍රථම මුද්‍රණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තව, කොළඹ, 1962, 183 පි.
46 Dutt, Sukumar, Early Buddhist Manachism, trench truobner & Company, London, 1924, 47 P.
47 සබ්බවාරි වාරිතෝ ච හෝති - සබ්බවාරි යුතෝ ච හෝති
සබ්බවාරි ධුතෝ ච හෝති - සබ්බවාරි ඵුටෝ ච හෝති
දී. නි. 1 බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 1962, 57 පි.
48 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 1959, 62 පි.
49 Taylor, F.W. Principles of Scienfific Management, Edit by Harper and Row, New York, 1941, 26 P.
50. Fetyal,Henry., General Industrial Management, Translated by Constance Stores, Pitman, London, 1949
51. Mayo Elton, The Human Problems of an Industrial Civilization, Macmillan, London, 1933

CamScanner

# දෙවන පරිච්ඡේදය

## කතිකාවත් හැඳින්වීම

ලාංකේය භික්ෂුවගේ භික්ෂු පිළිවෙත් වරින් වර පිරිහුණු අවස්ථාවලදීත්, විහාර සතු දේපළ පාලනය පිළිබඳව ගැටලු මතු වූ අවස්ථාවලදීත් එහි අනාගත තීරණය ගනු ලැබුවේ භික්ෂු සංඝයාගේ මැදිහත් වීම හා රජුගේ දායකත්වය මත ය. එහෙත් ඇතැම් අවස්ථාවල රජු භික්ෂූන් වහන්සේලා සම්බන්ධව නීති රීති සකස් කොට ඒවා කතිකාවත් ලෙස සෙල්ලිපිවල ලියා තබා ඇත. කතිකාවත් ආරම්භ වී විකාශය වීමේ දී ඒ ඒ කාලයෙහි සමාජ, ආර්ථික හා ආගමික සිරිත් විරිත්වලට අනුගත වෙමින් සකස් වී ඇති හෙයින්, එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනු ලබන බවත් ඒ තුළ පරිණාමීය ලක්ෂණයන් ද විද්‍යමාන වන බවත් දැකිය හැකිය.

කතිකාවත් සකස් වූයේ භික්ෂු ශාසනය තුළ සිදු වූ ගැටලුවලට විසඳුමක් වශයෙනි. එය අනාගතයෙහි භික්ෂුව හා ආරාම මැනවින් සකස් කිරීම සඳහා වූ සැලැස්මකි. සැලැස්මෙහි දැක්වෙන ආකාරයට භික්ෂුව හා ආරාම නිලධාරීන් මෙන් ම සේවකාදීන් ද පාලනය කිරීමට උත්සාහ ගෙන තිබේ. කළමනාකරණයෙහි මූලික ම ලක්ෂණ දෙකක් වන සැලසුම්කරණය හා පාලනය මෙහි දක්නට ලැබෙන අතර කතිකාවත් යනු තත් කාලයෙහි "කළමනාකරණය" බව සලකා ඒ පිළිබඳව මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනය කෙරේ.

පාලි භාෂාවෙහි "කතික" හෝ "කතිකා" යන පදයට පාලි "වත්ත" යන්න එකතු වීමෙන්, "කතිකාවත්" යනුවෙන් සකස් වී සිංහලයට එක් වී' ඇති අතර, කිසියම් වූ ගැටලුවක් මතු වූ අවස්ථාවක, පිරිසක් එකතු වී, සාකච්ඡා කොට ඒ සඳහා ඇති කරගනු ලබන විසඳුම යන්න එහි සරල අර්ථය ලෙස ගත හැකි ය.

CamScanner

"කතිකා" යනු "කත" යන ක්‍රියා රූපයට, ස්ත්‍රී වාචක හෝ ක්ෂුද්‍ර වාචක ප්‍රත්‍යයක් වන "ක" යන්න එකතු කිරීමෙන් සාදා ගනු ලබන වචනයක් ලෙස සැලකේ.[2] එහි "ක්‍රියාව" යන අර්ථය ගැබ් වී ඇත. මෙය දේශපාලන හෝ ආගමික සභාවක තීරණයන්ට යෙදූ පාරිභාෂිත ශබ්දයකි[3]. මලබාරයේ ගම් සභාවලට අදාළ තීරණ, ශිලා ලිපිවල "කච්ච" යනුවෙන් දක්වා තිබේ. කෙසේ වෙතත් ආදි පාලි ලේඛනවල මෙම "කතිකා" යන වචනය සඳහා ගිවිසුම, කොන්ත්‍රාත්තුව හා පොරොන්දුව යන අර්ථ දක්වා තිබේ.

පාලි භාෂාවෙහි "වත්ත" යනුවෙන් ද සිංහලයෙහි "වත්" ලෙස ද, සංස්කෘතයෙහි "වෘත්ත" යනුවෙන් ද භාවිත වන මෙයින් ජීවන ක්‍රමය, චර්යාව හා හැසිරීම යනුවෙන් අර්ථ විවරණය කෙරේ[4]. "වත්" යනු සංස්කෘත භාෂාවේ "භූ" ධාතුවේ රූපයක් වන "යී" යන්නට ශාබ්දිකව එකතු වීම කි[5]. එහෙත් "වත" යනු "පැවැත්ම" ලෙස කව්සිළුමිණෙහි[6] සඳහන් වෙයි. පරණවිතාන පවසනුයේ එය "ව්‍යවස්ථාව" බව යි[7].

"කතිකා" යනු කතාබහ යි. එය නියමයන් කර ගැනීම සඳහා භාවිත වන්නක්[8] වන අතර එය සාකච්ඡා කොට නියමයන් ඇති කර ගැනීම් ලෙස, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය[9] විවරණය කරයි. "කටයුතු යැයි සම්මත ව්‍යවස්ථාව මෙනමින් හැඳින්වෙන බව" ධම්පියා ගැටපද අටුවාවෙහි[10] සඳහන් වෙයි. මෙමගින් පැහැදිලි වනුයේ, ගැටලුවක් මතු වූ අවස්ථාවක, එය සමාලෝචනය කොට, එකී ගැටලුව අනාගතයෙහි ඇති වීම වැළැක්වීම උදෙසා කරනු ලබන සැලැස්මක් බව ය.

ඒ බව, "තීරණය කිරීමේ අර්ථයත්, කතා කිරීම හෝ සාකච්ඡා කිරීමේ අර්ථයත්" කතිකා තුළ අන්තර්ගත වන බවත්, 'සැමදා මෙලෙස පවතිමු' යනුවෙන් ඇති කරගන්නා සම්මුතිය" වශයෙන් ද ධම්මවිසුද්ධි හිමියන් පැහැදිලි කර ඇත.[11] කටයුතු වූ දේ ගැන කර ගන්නා නියමය කතිකා බැවි, ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ කතිකාවතෙහි[12] ද සඳහන් වීමෙන් මෙය බව සනාථ වේ. කතිකා යන වචනයෙහි අරුත විවිධාකාරයෙන් දක්වා තිබුණ ද "විසඳුමක් අවශ්‍ය වූ අවස්ථාවක, එළැඹි තීරණයන් හා එම තීරණයන්



ගැනීමට ප්‍රථම ඒ සඳහා පවත්වන ලද සමාලෝචනයක්" ය යන්න සියල්ලෙහි හරය ලෙස අපට කැටිකර ගත හැකි ය. ඒ අනුව, මෙහි අවධාරණය කරනු ලබන්නේ අනාගත සැලැස්මක් පිළිබඳව යි.

පාලි භාෂාවෙහි "කතිකාවත්ත" යන්නෙන් බිඳී ආ වචනයක් ලෙස, කතිකාවත හෝ කතිකාවත් සැලකෙන අතර, එය "පොරොන්දු වූ සේ පැවැත්ම[13]" යන්නෙන් විග්‍රහ කෙරේ.මේ තුළ "ගිවිසුම" යන අරුත ගැබ් වී ඇත. "ගිවිසුම" කතිකා ලෙස පරණවිතාන ප්‍රකාශ කරයි.[14] එමඟින් කතිකා හා කතිකාවත් යනු, සමානාර්ථයන් ඇති වචන දෙකක් බව සැලකිය හැකි අතර, මේ බව වඩාත් තහවුරු වනුයේ කතිකාවත යනු "සාකච්ඡා කොට, එළඹගත් ගිවිසුම සම්මුතිය" ලෙස ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂයෙහි[15] දැක්වීමෙනි. පන්සිය පනස් ජාතක පොත[16] ද මෙය ම පැහැදිලි කරයි.

කතිකාවත යනු, බුද්ධ ශ්‍රමණයන්ගේ නීති ග්‍රන්ථය සේ, සිංහල - ඉංග්‍රීසි ශබ්ද කෝෂය[17] හඳුන්වයි. මහසෙන් සමයට අයත්, හේරත් හල්මිල්ලෑව සෙල්ලිපිය[18] ද භික්ෂූන් වහන්සේලාගේ පාලනය පිළිබඳ ව්‍යවස්ථා ඇතුළත් ලිපියක් වන අතර, මෙහි සඳහන් වනුයේ "කතිකාවත්" යන වචනය නොව, "ධම්ම කම්ම" යන වචනය යි. "ධම්ම" යන වචනයෙහි සංස්කෘත භාෂාවේ දී[19] අර්ථකථනය කරනු ලබන්නේ "නීතිය" ලෙස ය. මේ අනුව "ධම්ම කම්ම" යනු නීතිමය පණතක් වශයෙන් සැලකිය හැකි අතර, එමගින් ද කතිකාවත් භික්ෂූන් වහන්සේලාගේ නීති ග්‍රන්ථයක් යන අදහස සනාථ වේ. පස්වන කාශ්‍යප රජු ද ධම්ම කම්ම සිදු කොට ශාසන ශුද්ධියක් කළේය.[20] මේ අනුව ධම්ම කම්ම යනු ද කතිකාවත් වර්ගයට අයත් වූවක් ලෙස සැලකිය හැකි ය.

භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම පිළිබඳ උපදෙස් පොත[21] ලෙස කතිකාවත අර්ථකථනය කළ හැකි අතර, එය භික්ෂූන් වහන්සේලාට ම පමණක් ආවේණික වූවක් ලෙස සලකා ඇත. මේ අදහස ම සිංහල විශ්ව කෝෂය[22] ද සඳහන් කරයි. එහි සඳහන් වනුයේ, "සම්බුද්ධ ශාසනයාගේ චිරස්ථිතිය සඳහා ශාසනය පිරිහුණු සමයන් හි ධර්ම විනය සසඳා ප්‍රමාද විහාරීන්ට

CamScanner

අවකාශ නො ලැබෙන පරිද්දෙන් මහා සංඝයා වහන්සේ විසින් කාලානුරූපව පනවනු ලබන සංඝ සම්මත ව්‍යවස්ථා" කතිකාවත් බව යි. රාජාධිරාජසිංහ කතිකාවතෙහි ද "උභය විහාර වාසී මහා සංඝයාවහන්සේ මංගලමණ්ඩපයට රැස් කරවා එබඳු දුෂ්ප්‍රතිපත්ති හරවන පිණිස යෙදුණු ධර්මවිනයානුකූල මහ ආඥාව මුල් කොට උභයවිහාරවාසී මහාසංඝයා වහන්සේ විසින් ව්‍යවස්ථා කරන ලද කතිකාවත[23]" යනුවෙන් සඳහන් වීමෙන්, මේ බව වැඩිදුරටත් සනාථ කෙරේ.

බුදු සසුනෙන් බැහැර ලාංකේය සමාජයෙහි මනා පැවැත්මක් ඇති කිරීම උදෙසා ද කතිකාවත් සකස් කොට ඇති බව, බදුලු ලිපිය[24] ලිපිය සාක්ෂි දරයි. එනමුත්, බදුලු ලිපිය හැර සියලුම කතිකාවත් උපයෝගී කොට ගෙන ඇත්තේ, භික්ෂූන් වහන්සේලා හා ආරාම පාලනය සඳහා ය.

භික්ෂූන් වහන්සේලාගේ මනා හැසිරීමක් සිදු කිරීමේ අභිලාෂයෙන් කතිකාවත් සකස් වූ හෙයින්, "හැසිරවීම[25]" යන අර්ථය ද ඉන් ගම්‍ය වේ. කතිකා යනු කතා කර, සාකච්ඡා කර, එළැඹෙන්නා වූ තීරණයන් ය. එලෙස එළඹ ගත් තීරණයන්ට අයත් වන "වත් සිරිත්" කතිකාවත් ලෙස සැලකෙන අතර, ඒවා ඇතුළත් ලියවිලි ද එනමින් හඳුන්වනු ලැබේ. මෙයින් පැහැදිලි වනුයේ සැලසුම් කොට ගෙන ඇති ආකාරයට ජීවත්වීම හා පාලනය වීම යි.

මේ ව්‍යවස්ථා සකස් කරනු ලැබුවේ භික්ෂූන් වහන්සේලා සඳහා ම පමණක් නොවේ. ආරාම පාලනය කිරීම සඳහා ද යොදා ගෙන ඇති බව, මිහින්තලා පුවරු[26] ලිපිය, අභයගිරි සංස්කෘත ලිපිවලට[27] අනුව ආරාමවල සේවය නිලධාරීන්, සේවකයන් විධිමත් ලෙස හැසිරවීම සඳහා ද යොදා ගෙන ඇති බව පෙනීයන්නකි. කතිකාවත් උපයෝගී කොට ගෙන භික්ෂුව හා ආරාමවල සේවකයන් පිළිගත් රටාවකට අනුව පාලනය කිරීමට උත්සාහ ගෙන ඇති බව පැහැදිලි ය.

කතිකාවත්වල මූලික ම ලක්ෂණය නම්, ඒවා භික්ෂූන් වහන්සේලා විසින් සකස් කරනු ලැබීම යි. ආරාමයක හෝ නිකායක



හෝ පොදුවේ සමස්ත භික්ෂූන් වහන්සේලාගේ පවිත්‍රත්වය උදෙසා, භික්ෂූන් වහන්සේලා සම්මත කළ නීති, නීතිගත කරවීමට අවශ්‍යය රාජ්‍ය අනුග්‍රහය රජතුමා ලබා දුන්නේ ය. මෙයින්, බුද්ධ නීතියට අකීකරු වුව ද රාජ නීතියට අකීකරු වීමට භික්ෂුවට අපහසු ය. කතිකාවත් යනු, "ලාංකේය භික්ෂු සංවිධානය තුළ ක්‍රියාත්මක වූ අප්‍රතිපත්ති හා දුෂ්ප්‍රතිපත්ති ඉවත් කොට, අනාගත බුදු සසුනෙහි පැවැත්ම සඳහාත්, මනා භික්ෂු පාලනයක් ඇති කිරීම සඳහාත් ආරාමවල සේවය කරනු ලබන නිලධාරීන් හා සේවකයන් කිසියම් සැලැස්මකට අනුව සකස් කිරීමට හා ඒ අනුව පාලනය කිරීම සඳහා, පොදු එකඟතාවකින් යුක්තව, පැනවූ ව්‍යවස්ථා" කතිකාවත් නමින් හැඳින්විය හැකි ය. මේ තුළින් පැහැදිලි වනුයේ, කතිකාවත් යනු අනාගත සැලැස්මක් හා පාලනයක් සඳහා සකස් කළ ප්‍රතිපත්ති මාලාවක් බව යි.

## 2.1 ලංකාවේ කතිකාවත්වල ආරම්භය හා විකාශය

ශ්‍රී ලංකාවේ පළමු වන කතිකාවත ලෙස සලකනු ලබන්නේ, ක්‍රි. ව. 11 වන සියවසේ මහා පරාක්‍රමබාහු රජුගේ පාලන සමයෙහි කරන ලද, ගල් විහාර කතිකාවත යි.28 සමස්ත භික්ෂූන් වහන්සේලා උදෙසා කරන ලද ආරම්භක කතිකාවත ලෙස ද සලකනු ලබන්නේ මෙම කතිකාවත යි. එම ලිපිය හා ධර්මාශෝක රජතුමාගේ භාබ්‍රෑ ලිපිය[29] අතර කිට්ටු සම්බන්ධයක් ඇති බව, යටදොළවත්තේ ධම්මවිසුද්ධි හිමියෝ[30] පවසති. ගල්විහාර කතිකාවතෙහි දොළොස්වන පේළියෙහි[31] ද මේ බව සඳහන් ව ඇත. භාබ්‍රෑ ලිපියෙහි පරමාර්ථය වනුයේ, සද්ධර්මයේ චිරස්ථිතිය යි. ශාසනයේ චිරස්ථිතිය ඇති කිරීම පොළොන්නරු ගල් විහාර කතිකාවතෙහි අරමුණ යි. ලිපි දෙක ම එක හා සමාන අරමුණු උදෙසා සකස් කොට ඇති බව පෙනේ.

ගල් විහාර කතිකාවත මුල් ම කතිකාවත ලෙස සැලකිය හැක්කේ, ලංකාවේ වාසය කළ සියලු ම භික්ෂූන් වහන්සේලාට එම කතිකාවත අදාළ වූ හෙයිනි. ඊට පෙර ද කතිකාවත් දක්නට නො ලැබෙන්නේ නොවේ. දැනට සොයා ගෙන ඇති කතිකාවත්වලට

අනුව, පැරණි ම කතිකාවත වනුයේ, ක්‍රි. ව. නමවන සියවසේ ලියැවුණු අභයගිරි සංස්කෘත ලිපිය යි.[32] සංඝ සංශෝධනයක් ගැන පළමුවෙන් ම සඳහන් වන ආදිම සෙල්ලිපිය ලෙසට මෙය සැලකේ.[33] එහෙත්, ක්‍රි. ව. තුන්වන සියවස මහසෙන් රජ දවස ලියැවුණ, හේරත් හල්මිල්ලෑව සෙල්ලිපිය[34] භික්ෂු විනය සම්බන්ධයෙන් ලියැවුණු පැරණි ම සෙල්ලිපිය වේ. මෙබඳු ලිපියක් සොයා ගෙන ඇති බවත්, එය කියවා තේරුම් ගෙන නොමැති බවත්, කොත්මලේ අමරවංශ හිමි, ලක්දිව සෙල්ලිපි[35] කෘතියෙහි දක්වා ඇත.

මේ සෙල් ලිපියෙහි, "අවත (කොටු) මපුරුමක මහාසේන මහාරජ අපයෙහි.....[36]" යනුවෙන් සඳහන් වීමෙන්, මෙය මහසෙන් රාජ්‍ය සමයෙහි සකස් කළ කතිකාවතක් බවට නිගමනය කළ හැකි ය. හේරත් හල්මිල්ලෑව සෙල් ලිපිය, පැරණි තාපසාරාමවල භික්ෂූන් වහන්සේලාගේ චරිත යාමනය පිළිබඳව හා මනා ලෙස ආදායම් පාලනය කිරීමට සකස් කළ ව්‍යවස්ථාවකි.[37] එහි සඳහන් කරුණු නො පිළිපදින භික්ෂූන් වහන්සේලා පිළිබඳව මහසෙන් රජතුමාට දැන්විය යුතු යැයි සඳහන් කර තිබීම, මේ කතිකාවත ක්‍රි. ව. තුන්වන සියවසෙහි ලියැවුණා යැයි නිගමනය කිරීමට සාධකයකි. "ධම්ම කම්ම" පිළිබඳව චූලවංශයේ ද දක්නට ලැබේ.[38] මෙයින් පැහැදිලි වනුයේ කතිකාවත්, ක්‍රි. ව. තුන්වන සියවසේ සිට ම ලාංකේය භික්ෂු ශාසනය තුළ දක්නට ලැබෙන බව යි.

කතිකාවත්වල අන්තර්ගත කරුණු අනුව, ඒවා කොටස් දෙකකට බෙදේ. එනම්,

- විහාර කතිකාවත්
- සාසන කතිකාවත් යනුවෙනි.

විහාරාරාම පාලනය සඳහා ලියැවුණු ව්‍යවස්ථා ලිපි ඇතුළත් විහාර කතිකාවත් වශයෙන් සැලකෙන අතර, භික්ෂූන් වහන්සේලාගේ පවිත්‍රත්වය සඳහා සකස් වුණු ව්‍යවස්ථා සාසන කතිකාවත් ලෙස සැලකේ. ඇතැම් ලිපි මේ ලක්ෂණ දෙකින් ම යුක්තව ද ඇත. මිහින්තලා සෙල්ලිපිය, අභයගිරි සංස්කෘත ලිපිය මෙයට



උදාහරණයකි.[40] විහාරාරාම පාලනය පිළිබඳ ලියැවුණු කතිකාවත් මෙතෙක් සොයා ගෙන නොමැති අතර එම කතිකාවත්වල භික්ෂු විනය හා වත්පිළිවෙත් පිළිබඳව අන්තර්ගත ය.

කතිකාවත් සියල්ල ම "ශාසන කාරක කතිකාවත්" යනුවෙන් හැඳින්වීම වඩාත් උචිත ය. "ශාසනය" යනු බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ යන ත්‍රිවිධ අංගයන්ගෙන් හෙබි ධර්මය ඇතුළත් සසුන යි. "ශාසන කාරක" යන්නෙහි "බුදු සසුන පවත්වා ගෙන යන සහ බුද්ධ ශාසනය කරවන" යන අරුත්[41] ගැබ් වන අතර, කතිකාවත් පනවන අවධීන් වන විට බුද්ධ ශාසනය පවත්වා ගෙන යාමේ ප්‍රධානතම වගකීම භික්ෂුව සතු වූ අතර, ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමඳව ම ලැබිය යුතු ය. රජවරුන් තමන් සතු එම වගකීම රාජ්‍ය නිලධාරීන් ලවා ක්‍රියාත්මක කරවනු ලබන අතර, භික්ෂූන් වහන්සේලා වාසය කරනු ලබන විහාරයන් මැනවින් පවත්වාගෙන යාම උදෙසා සේවකයන් යොදවා එය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ දරා ඇත. එබැවින් කතිකාවත් සියල්ල ම ශාසන කාරක කතිකාවත් ලෙස සැලකිය හැකි ය.

## අභයගිරි සංස්කෘත සෙල් ලිපිය[42]

ක්‍රි. ව. 9 වන සියවසට පමණ අයත් වන මේ ලිපියෙහි,[43] කතෘ කවුරුන් ද යන්න අවිනිශ්චිත ය. ඉදි කරන ලද නව විහාරයට සිවු මහනිකායන් එකකින් විසිපහ බැගින් භික්ෂූන් වහන්සේලා සියයක් නමක් වැඩම කර වාසය කළ යුතු යැයි මේ සෙල් ලිපියෙහි සඳහන් වෙයි. අභයගිරි සංස්කෘත සෙල් ලිපිය කොටස් දෙකකින් යුක්ත ව පැවති බවට සාධක ලැබෙන අතර, එහි මුල් කොටස තවමත් සොයා ගෙන නැත. දෙවෙනි කොටසෙහි, පේළි හතළිහක් දක්නට ලැබෙන නමුත්, විද්‍යමාන වනුයේ පේළි තිස් අටක් පමණි. කෙසේ නමුත්, මේ නව විහාරයෙහි වාසය කරන භික්ෂූන් වහන්සේලා විසින් පිළිපැදිය යුතු නීති රීති හා වත් සිරිත් පමණක් නොව, රජයේ නිලධාරීන් විහාරය සම්බන්ධව ක්‍රියා කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීති ද ප්‍රස්තුත ශිලා ලේඛනයෙහි ඇතුළත් ය.[44] මේ

ලිපියෙහි ප්‍රධාන වශයෙන් ම සඳහන් වනුයේ "හුණාලා" "ලහසිකා" යන ආරාම කිපයක හා ඒවාට අයත් ගම් බිම් ආදිය පාලනය කිරීම සඳහා පැනවූ ව්‍යවස්ථා වුවත්, එමගින් ක්‍රමවත් පාලන රටාවක් පැවති බව සිතිය හැකිය.

## V වන කාශ්‍යප රජුගේ (ක්‍රි. ව. 929- 939) අනුරාධපුර පුවරු ලිපිය

අභයගිරි විහාරයට අයත්, කපාරාමූලයට සිලිමේඝපබ්බත විහාරයක් කරවා, සංඝයා වහන්සේලා එහි වාසය කරවමින්, එකී ආරාමය හා සම්බන්ධ වූ ආවාස සඳහා මේ ව්‍යවස්ථාව පැනවූ බව උක්ත ලිපියෙහි සඳහන් ව ඇත.[45] මීට අමතරව මෙහි අභයගිරි - චේතියගිරි ආදී විහාරස්ථානවල හා පධානඝර, මෙහෙණවර ආදියෙහි අභ්‍යන්තර පාලනය, පැවිදි කිරීම පිළිබඳ නීති හා විශේෂ වරප්‍රසාද සහ "පඤ්චමහාසාවද්‍ය" කළවුන්ට දියයුතු දඬුවම් පිළිබඳව සඳහන් වේ. පේළි පනස්සයකින් සමන්විත වන මෙහි, 14 - 38 දක්වා ව්‍යවස්ථා, විහාරය හා සම්බන්ධව ක්‍රියා කරන රාජ්‍ය නිලධාරීන් සඳහා පැනවූ නීති වෙනුවෙනුත්, 39 - 56 දක්වා ව්‍යවස්ථා විහාරවාසී භික්ෂූන් වහන්සේලාට අදාළ වන නීති වශයෙනුත් වර්ග කළ හැකි ය. ලිපියෙහි ඇතුළත් වන ව්‍යවස්ථාවන් හි, රාජ්‍ය නිලධාරීන් විහාර සම්බන්ධව ක්‍රියා කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාදාමයන් දක්වා තිබේ. විහාරයට ඇතුළුවීමට අවස්ථාව ලැබුණේ මිනී මරුවන් අල්ලා ගැනීම සඳහා පමණි.

## විරංකුරම සෙල් ලිපිය (වෙස්සගිරි පුවරු ලිපිය අංක 02 B)

මෙය V වන දප්පුල රජුගේ (ක්‍රි. ව. 979 - 991)[46] රාජ්‍ය වර්ෂයෙන් දෙවන වර්ෂයෙහි, 'පුල්ලා' නමැති උපාසකතුමා විසින්, වෙස්සගිරි ප්‍රදේශයේ පිහිටි "විරංකුරාම අරමැ" නම් විහාරයේ භික්ෂූන් වහන්සේලාගේ ලාභ සත්කාර සඳහා රන් කළං දෙසීයක් පරිත්‍යාග කොට, එම මුදල් පරිහරණය කරන ආකාරය පිළිබඳව සැකසුණු ව්‍යස්ථාවකි. මේ සෙල් ලිපිය කොටස් දෙකකින් යුක්ත ය. 1-10 දක්වා රාජ වර්ණනා ඇතුළත් වන අතර, 11-25 දක්වා ව්‍යවස්ථා අන්තර්ගත වනුයේ, විරංකුරාම ආරාමයේ භික්ෂූන් වහන්සේලා සඳහා පැනවූ නීති ය.



## පුලියන්කුලම සෙල් ලිපිය

පුලියන්කුලම විහාරයේ නටබුන් අසලින් හමු වී ඇති මේ සෙල් ලිපිය, උදය මහයා නම් වූ ඇමතියෙකු විසින් සකස් කරන ලද ව්‍යවස්ථාවකි.[47]* පේළි 44 කින් සමන්විත මෙහි, 26-28 දක්වා ඇති පේළිවල, රාජ්‍ය නිලධාරීන්ට අදාළ නීති ඇතුළත් වේ. 29-33 දක්වා ඇති පේළිවල ව්‍යවස්ථා අයත් වනුයේ, සංඝයා වහන්සේලා සඳහා ය. 34-44 තෙක් ඇති ව්‍යවස්ථා, උදය මහයාගේ බලැතුන් දහස විසින් කළ යුතු දෑ දක්වා ඇත.[48]

## කළුදිය පොකුණ සෙල් ලිපිය

IV වන සේන රජුගේ රාජ්‍ය සමයට (ක්‍රි.ව. 954-956) අයත් කළුදිය පොකුණ ලිපියෙන්, විහාර නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් හා භික්ෂූන් වහන්සේලා යන පක්ෂ තුන උදෙසා ව්‍යවස්ථා පනවා ඇත.[49] පේළි 46කින් සමන්විත මෙහි, 32 ව්‍යවස්ථා තෙක් දක්වා ඇත්තේ, භික්ෂූන් වහන්සේලාට ය. 33-40 දක්වා ඇති ව්‍යවස්ථා අදාළ වනුයේ, විහාර නිලධාරීන් සඳහා ය.(වෙහෙර් කැමියන්) රාජ්‍ය නිලධාරීන්ට පනවා ඇති ව්‍යවස්ථා අන්තර්ගත වනුයේ, 41 ව්‍යවස්ථාවෙහි පමණි.

## වෙස්සගිරි පුවරු ලිපිය

IV වන මහින්ද (ක්‍රි. ව. 1026-1042) රාජ්‍ය සමයෙහි (සිරිසඟ්බෝ අභා මිහිඳු) සකස් කරන ලදැයි මේ ලිපිය,[50] රාජ්‍ය වර්ෂයෙන් නව වන වස, බිනර මස පුර දසවක්හි පනවන ලද්දකි. වෙස්සගිරි ව්‍යවස්ථාව, ඉසුරමෙණු බොඋපුල්වන් කසුබගිරි රද්මහවෙහෙර යාබද කුඹුරු යායට තිසා වැවෙන් දිය සැපයීම හා ඒ ගොවිතැන් කටයුතු සම්බන්ධ ව්‍යවස්ථාවකි.[51]

පේළි 37කින් සමන්විත මෙය, මඟුල් මහ උයන්හි සේවය කරන සේවකයන් හා රාජ්‍ය නිලධාරීන් උදෙසා ව්‍යවස්ථා පනවා ඇත. මේ ව්‍යවස්ථාවෙහි විශේෂත්වය වනුයේ, භික්ෂූන් වහන්සේලාට පැනවූ නීති ඇතුළත් නො වීම යි. ඇතුළත් වන

Scanner

CamScanner

නීති වනුයේ, ජලය බෙදා දීම, ගොවිතැන් කටයුතු හා විහාර බිම් පාලනය පිළිබඳ නීති ය.

## මිහින්තලා පුවරු ලිපිය

IV වන මිහිඳු පාලන සමයෙහි (ක්‍රි. ව. 1015-1031) චේතිය ගිරි විහාරයෙහි අභ්‍යන්තර පාලනය සඳහා පැනවූ ව්‍යවස්ථාවකි. එය අභයගිරි විහාරයෙහි කපාරාමූල ගණයට අයත් ආරාමයකි.[52] ලිපියෙහි දැක්වෙන සෑගිරිය හා ඇත් වෙහෙර ද මේ මූලයට අයත් ය.

පුවරු දෙකකින් සමන්විත ලිපියෙහි, "A- ලිපියෙහි පේළි 58 ක් ද, "B" ලිපියෙහි ද පේළි 58ක් අන්තර්ගත ය. "A- පුවරුවෙහි, 10-20 දක්වා ව්‍යවස්ථා භික්ෂූන් වහන්සේලාට අදාළ වන අතර, 21-58 දක්වා ව්‍යවස්ථා භික්ෂූන් වහන්සේලාට අදාළ වන අතර, 21-58 දක්වා ඇති ව්‍යවස්ථා විහාරයෙහි සේවය කරන කාර්මිකයන් සඳහා පනවා ඇත.

"B" පුවරුවෙහි, 1-55 ව්‍යවස්ථාවලින් ආරාමයෙහි සේවය කරන භික්ෂූන්ට හා සේවකයන්ට ගෙවන වැටුප් ප්‍රමාණයන් ද 56-58 ව්‍යවස්ථාවලින් වෙහෙරට අය විය යුතු බදු ප්‍රමාණයන් ද දක්වා ඇත.

## පොළොන්නරු ගල් විහාර සෙල් ලිපිය[53]

ක්‍රි. ව. 1153-1186 අතර, ශ්‍රී ලංකාවේ රජ කළ, පැරකුම්බා රජතුමා විසින් ක්‍රි. ව. 1164-1165 වකවානුව තුළ සිදු කළ සංඝ සංශෝධනයෙන් පසුව, අනාගත සසුනෙහි පැවැත්ම උදෙසා, දිඹුලාගල කාශ්‍යප හිමියන් ප්‍රමුඛ සංඝ සම්මතයෙන් පිහිටුවන ලද කතිකාවත, ගල්විහාර සෙල් ලිපිය ලෙස හැඳින්වේ. පේළි 52ක් සහිත මෙය, ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත ය. 1-18 දක්වා පේළි අයත් වනුයේ ඓතිහාසික වර්ණනාවට ය. 19-51 දක්වා ඇත්තේ භික්ෂූන් වහන්සේලාට අදාළ නීති ය.[54]



## කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල සෙල් ලිපිය (පොළොන්නරුවේ හැටදාගෙයි ලිපිය)

ක්‍රි. ව. 1187-1196ත් අතර, රජ පැමිණි, නිශ්ශංකමල්ල රජතුමා, භික්ෂු සංඝයා සඳහා සකස් කළ ව්‍යවස්ථා පන්තිය, පොළොන්නරුවේ හැටදාගේ ලිපිය නම් වේ[55]. කොටස් දෙකකින් සමන්විත වන මෙහි පළමු කොටස, රජතුමා විසින් සංඝයාට දෙනු ලැබූ අවවාද පන්තියකින් යුක්ත ය. "......... සංඝයා වහන්සේ ධර්ම විනය වූ පරිද්දෙන් පුරන පිළිවෙත් ඇත ද ශාසනාරක්ෂාව ලක්දිව රජුනු අයැති හෙය් ශාසනාරක්ෂාවට සුදුසු අවවාද මෙසේ වදාරන යෙහෙකි" යනුවෙන් එහි සඳහන් ව ඇත.

මෙහි දෙවන කොටස වනුයේ, සංඝයා වහන්සේලා සඳහා වූ ව්‍යවස්ථාවයි. පොළොන්නරු කතිකාවත මෙන්, විනයධර, ධර්මධර භික්ෂූන් වහන්සේලාගෙන් සමන්විතව පැවැත්වූ බවට සාධක නො ලැබුණ ද නිශ්ශංකමල්ල සෙල්ලිපියෙහි ද භික්ෂූන් වහන්සේලාට නීති මාලාවක් දක්නට ලැබේ. "ආචාර්‍ය්‍ය උපාධ්‍යායවැ සිටිනා වහන්සේ වරුන්දෑ ශටකුට කෛරාටික ගුණ නුවණ නැති පාපසත්ත්වයන් නොවිචාරා මහණ නොකටයුතු" යනුවෙන් දක්වා තිබීමෙන් ඒ බව පැහැදිලි වේ.

## දඹදෙණි කතිකාවත

IIවෙනි පරාක්‍රමබාහු රජතුමා විසින්, (ක්‍රි. ව. 1236-1270) ශත වර්ෂයකට ආසන්න කාලයක් භික්ෂු ශාසනයේ දුශ්ශීල භික්ෂූන් නෙරපා දමා, වනරතනාභිධාන බුද්ධවංශ මහාස්ථවිරපාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයෙකු වූ ආරණ්‍යයක මේධංකර මහාස්වාමි ප්‍රමුඛ ග්‍රාමරණ්‍යවාසී කාරක මහා සංඝයා වහන්සේ මුල් වී සංඝ ශෝධනයක් සිදු කර, දඹදෙණි කතිකාවත පිහිටුවා තිබේ.[56]

දඹදෙණි කතිකාවතේ සඳහන් වන ග්‍රාම හා ආරණ්‍ය යන දෙපාර්ශ්වය ම නිකාය සංග්‍රහය ද වාර්තා කරන අතර, මේ කතිකාවත තුළ කුල දරුවන් පැවිදි කිරීම, තනතුරු ප්‍රදානය, උපසම්පදාව විධිමත් කිරීම සඳහා වූ නීති ව්‍යවස්ථා සියයක් පමණ අන්තර්ගත ව ඇත.[58]

CamScanner

## 2.2 කතිකාවත් හා කළමනාකරණය අතර ඇති සබඳතාව

කළමනාකරණය යනු යම් දෙයක් මනා ලෙස කිරීම නැතහොත් හොඳින් කිරීමයි.[59] කතිකාවත්වල මූලික අරමුණ ද භික්ෂුව, ආරාම, නිලධාරීන් හා සේවකයන් අභිමත අරමුණු කරා ගමන් කරවීම උදෙසා සකස් කළ සැලැස්මක් හා පාලන ව්‍යූහයකි. මේ අනුව, වචන දෙකක් වුව ද කතිකාවත් හා කළමනාකරණය තුළ මූලික අපේක්ෂාව එකක් බව පැහැදිලි ය.

කතිකාවත්වල අන්තර්ගත තොරතුරු පිළිබඳව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ තත් කාලීන සමාජයන් හි භික්ෂු සමාජයේ ඇති වූ විවිධ ගැටලුවලට විසඳුමක් ලෙස සකස් වූවක් බව යි. මෙහි මූලික ම අරමුණු වූයේ ධර්ම විනය ආරක්ෂා කර ගැනීමත්, සංඝ සාමග්‍රිය ඇති කිරීමත්, බෞද්ධ රජවරුන්ගේ වගකීම් ඉටු කිරීමත්, සසුන තුළ අනුක්‍රමයෙන් වර්ධනය වූ දේපළ ඉඩකඩම් හා එහි සේවය කරන්නාවූ සේවකයන් සැලැස්මක් යටතේ සකස් කිරීමත් එයට අනුකූලව පාලනය කිරීමත් ය. කතිකාවත් අරමුණක් උදෙසා ක්‍රියාත්මක කරනු ලැබූවක් වන හෙයින් ද එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම අරබයා විධිමත් සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කොට තිබෙන හෙයින් ද මෙහි විද්‍යමාන වනුයේ තත්කාලීන කළමනාකරණයක් බව පැහැදිලි ය.

කළමනාකරණය සෑම විෂය ක්ෂේත්‍රයකම පවතින්නක් වන අතර එය ක්‍රියාවලියක් වශයෙන් ක්‍රියාත්මක වෙයි. එහි ප්‍රධානත ම අංග දෙක වනුයේ සැලසුම් කිරීම හා පාලනය කිරීම යි. අපේක්ෂිත අරමුණු ඉටු වන අන්දමට එයට යෝග්‍ය හා ක්‍රියාත්මක කළ හැකි සැලැස්මක් සකස් කිරීම වඩාත් ම යෝග්‍ය ය. අරමුණු කරා ගමන් කිරීමේ දී සේවකයන්ගෙන් වඩාත් කාර්යක්ෂම ලෙස සේවය ලබා ගැනීම සඳහා සේවයෙහි ස්වභාවය අනුව දිරි ගැන්වීම් ද ලබා දෙන්නේ නම් වඩාත් උචිත ය. එසේ නො වුණහොත් විධිමත් කළමනාකරණයක් ලෙස සැලකිය නො හැකි ය. එමෙන් ම අපේක්ෂිත අරමුණු සඵල කර ගැනීමට නම් මනා වූ පාලනයක් ද තිබිය යුතු ම ය.



"කතිකාවත්" යනු භික්ෂු සංවිධානකරණයේ සැලසුම්කරණ ප්‍රතිපත්තිය යි. ලාංකේය භික්ෂූන්, පිළිගත් හැසිරීම් රටාව තුළ සකස් කිරීමට සැලසුම් කරනු ලැබුවේ කතිකාවත් මගිනි. බුද්ධ විනය හා ඒ ආශ්‍රයෙන් ඒ වන විට සකස් කරගෙන සිටි ලාංකීය විනය ග්‍රන්ථ වන සිඛවළඳ විනිස, සිඛ කරණී හා හෙරණසිඛ ආදී ග්‍රන්ථවල දැක්වෙන ආකාරයට භික්ෂු ක්‍රියා කලාපය සැලසුම් කිරීම, මගින් සිදු කරන ලද ප්‍රධානත ම කාර්යභාරය යි. එමෙන් ම සැලසුම්කරණයේ දී සම්ප්‍රදායට ම ගරු කිරීමත් අවශ්‍ය නො වන අතර එම කාලයෙහි සමාජ පසුබිම කෙරෙහි ද අවධානය යොමු වීම අනිවාර්යයෙන් ම සිදු විය යුත්තකි. ඒ අනුව, ලාංකේය භික්ෂු සංවිධානකරණය තුළ මතු වූ ගැටලුවක් බවට පත් ව තිබුණේ නායකත්වය යි. බුදුන් වහන්සේ ජීවමාන අවධියේ මෙන් ම පිරිනිවන් පෑමෙන් පසුව ද නායකයා ලෙස තබා ගන්නට යෝජනා කරනු ලැබුවේ ධර්මය හා විනය යි. එහෙත් එය එලෙසින් ම ක්‍රියාත්මක කිරීම ක්‍රි. ව. 8 සිට 15 වන සියවස දක්වා භික්ෂූන් අතහැර දැමූ බව කතිකාවත් ම සාක්ෂි දරයි. ඒ අනුව ලාංකේය භික්ෂු සමාජයට පොළොන්නරු කතිකාවතෙන් පසුව නායකත්වයට භික්ෂුවක් පත් කර ගැනීමත් උන්වහන්සේගේ අධීක්ෂණය යටතේ භික්ෂූන් සමාජ සංවිධානය ක්‍රියාත්මක කරවීමට කතිකාවත් උත්සාහ කිරීමත් එහි කළමනාකරණය දක්නට ලැබුණු බවට තවත් සාධකයකි. ඉහත දැක්වෙන කරුණුවලට අනුව කතිකාවත්වල අන්තර්ගත වනුයේ කළමනාකරණ ලක්ෂණයන් බව අධ්‍යයනය කළ හැකි ය.

CS CamScanner

## ආන්තික සටහන්

1 සුරවීර ඒ. වී., කතිකාවත් විමර්ශන, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08, 1998, පි. 1

2 Epigraphia in Zeylanica, Vol. 111, No. 27.S. Paranavithana, Oxford University Press, London, 1933, 267 P.

3 – Do –

4 ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, වැලිවිටියේ සෝරත හිමි, සංස්කරණය, පී. අභයවික්‍රම, අනුලා මුද්‍රණාලය, කොළඹ 10, බු. ව. 2507, 54 පි.

5 Epigraphia in Zeylanica, Vol. V, Part 11, by S. Paranavithana, Edit by Malini Dias, Archaeological Survey Department, 2001, 196 P.

6 කව්සිළුමිණ, සංස්කරණය, ඇම්. බී. ආරියපාල, ගුණසේන සහ සමාගම, කොළඹ, 1965, 94 පි.

7 Epigraphia in Zeylanica, Vol. V, Part 11, by S. Paranavithana, Edit by Malini Dias, Archaeological Survey Department, 2001, 198 P.

8 විශ්ව කෝෂය, 5 වන කාණ්ඩය, සංස්කෘතික අමාත්‍යාංශය, ලේක් හවුස් ආයතනය, 1982, 2220 පි.

9 ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, 1 වන කාණ්ඩය, හරිස්චන්ද්‍ර විජේතුංග, සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ, 1982, 417 පි.

10 ධ. අ. ග. සංස්කරණය, ඩී. බී. ජයතිලක, ලංකාභිනව විශ්‍රැත යන්ත්‍රාලය, කොළඹ, 1932, 254 පි.

11 ධම්මවිසුද්ධි හිමි, යටදොලවත්තේ, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කරුණාරත්න සහ පුත්‍රයෝ, කොළඹ 10, 1995, 2-3 පි.

12 ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ කතිකාවත, ජො. වී. පෙ. සමරසේකර, ඩබ්ලිව්. ඊ. බැස්ටියන් සහ සමාගම, 1925, ංස පි.

13 පාලි - සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960, 143 පි.

14 E.Z., Vol. 111, No. 27.S. Paranavithana, Oxpord University Press, London, 1933,267 P.

15 ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, 1 වන කාණ්ඩය, හරිශ්චන්ද්‍ර විජේතුංග, සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ, 1982, 417 පි.

16 පන්සිය පනස් ජාතක පොත, 2 වන කාණ්ඩය, සංස්කරණය වේරගොඩ අමරමෝලි හිමි, ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම, 1961, 1350

17 Sinhala – English Dictionary by Rev. Charles Carter, Published by the Baptist Missionary Society - Ceylon, Observer Printing Works, 1924, 147 P.

18 I. C., Volome 11 part 11 (Late Brahmi Inscription) S. Paranavithana, Edit by Malani Dias, Archaeological Survey Department, Colombo, 2001, 195 P.



19 සිංහලාර්ථ සහිත සංස්කෘත ශබ්දාර්ණවය, පණ්ඩිත වැලිවිටියේ සෝරත ස්ථවිර, ඩී. ඒ. හේවාවිතාරණ සංස්කරණය, 1929, 254 පි.

20 ම. ව., 52 පරිච්ඡේදය 44 ගාථාව, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959

21 සිංහල ශබ්ද කෝෂය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, 1992, 542 පි.

22 සිංහල විශ්ව කෝෂය, 6 වන කාණ්ඩය, සංස්කරණය ඩී. ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික දෙපාර්ත41මේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1978, 112 පි.

23 ත. ස., ඩී. බී. ජයතිලක, ඩී. සී., සහ ඩී. ඇස්. ජයතිලක, කැළණිය, 1955, 37 පි.

24 E.Z.,, Vol.111, Edit by, S. Paranavithana, Oxford University Press, London, 1933, 71 P.
"හෝපිටිගමු" ගමේ සහ වෙළඳපොළේ පෙර සිරිත් කඩ කොට, දඩ ගැසීම සිදු කිරීම පිළිබඳව iv වන උදය (ක්‍රි. ව. 946-954) (සිරිසඟබෝධි උදය) රජුට පැමිණිලි කළ අවස්ථාවේ දී රජතුමා විසින් ඒ පිළිබඳව රාජ සභාවේ ලේකම් කාර්යාලයේ ප්‍රධාන නිලධාරීන් රැස්ව, සාකච්ඡා කොට පිහිටුවන ලද ව්‍යවස්ථාවකි.

25. Sinhala -English Dictionary by Rev. Clough, Educational Services, New Delhi, Madras, 1999, 113 P.

26. E. Z., Volume 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 75 P.

27. - D0 - 1 P.

28 ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, පොළොන්නරු කතිකාවත් හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කරුණාරත්න සහ පුත්‍රයෝ, කොළඹ 10, 1995, 14 පි.

29 Smith. Vincent, A., Asoka Clarendon Press Oxford, 1919, 35 P.

30 ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, පොළොන්නරු කතිකාවත් හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ, 1995, 24 පි.

31 E. Z., Volume 11, Edit by Don Martino De Silva Wickremasinghe, Oxford University Press, 257 P.

32. E. Z., Volume 11, Edit by Don Martino De Silva Wickremasinghe, Oxford University Press, 1912, 1 P.

33 ලියනගමගේ, අමරදාස හා ගුණවර්ධන, රණවීර, අනුරපුර යුගය, තෙවැනි මුද්‍රණය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ 07, 1987

34 I. C., Volume 11 part 11, S. Paranavitana, Edit by Malini Dias, Archaeological Survey Department, Sri Lanka, 2001, 194 P.

35. අමරවංශ හිමි, කොත්මලේ., ලක්දිව සෙල්ලිපි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1969, 378 පි.

36 I. C., Volume 11 part 11, [Late Brahmi Inscription] S. Paranavitana,

Edit by Malini Dias, Archaeological Survey Department, Colombo, 2001, 197 P.

37 - Do - 195 P.

38 C.V., Part 1, chapter 6 translated by Wilhelm Geiger, Published by the Ceylon Information Department, 1953, Colombo

39 සන්නස්ගල, පුංචිබණ්ඩාර, සිංහල සාහිත්‍ය වංශය, ලේක් හවුස් ආයතනය, කොළඹ, 1961, 112 පි.

40 E. Z., Vol. 1., Edit by Don Martino De Silva Wickremasinghe, Oxford University Press, 1912, 41 P.

41 සිංහල ශබ්ද කෝෂය, "ශ" කාණ්ඩය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1991, 93 පි.

42 1933 වර්ෂය වන තුරු ම, ජේතවනාරාමය අභයගිරිය ලෙසත්, අභයගිරිය ජේතවනාරාමය ලෙසත් වරදවා තේරුම් ගෙන තිබුණි. මහසෙන් මහ රජ, ජේතවනාරාමය ලෙසත් වරදවා තේරුම් ගෙන තිබුණි. මහසෙන් මහරජ, ජේතවනාරාමය ඉදි කරනු ලැබුවේ මහා විහාරයට නැගෙනහිර දෙසිනි, (නිකාය සංග්‍රහය, වේරගොඩ අමරමෝලි, කොළඹ, 1955, 31 පි.) අභයගිරි විහාරය පිහිටුවා ඇත්තේ මහා විහාරයට බටහිර දෙසිනි. (වනරතන හිමි, කඹුරුපිටියේ, අනුරපුර නටබුන්, මාතර, 1970, 111 පි.) මෙම වරද නිවැරදි කිරීමට, අයර්ටන් මහතා උත්සාහ කරනු ලැබූ අතර, ඔහු ඒ සඳහා අභයගිරි විහාරය(එවකට ජේතවන විහාරය) මළුවේ දකුණු දොරටුවෙහි තිබූ මළුතිස (කණිට්ඨතිස්ස) රජුට අයත් සෙල් ලිපියක් (E.Z., Volume 1, Edit by Don Tartino De Silva Wickramasinghe Oxford University Press, london, 1912, 25 P.) සොයා ගැනීමෙනි. එහි "උතර මහ වෙත" යනුවෙන් සඳහන් වීමෙන් නිසැකව ම අභයගිරි විහාරය විය යුතු ය. එහෙත්, එච්. සී. පී. බෙල් මහතා ඒ පිළිබඳව අවිනිශ්චිතව ක්‍රියා කළ බව දැක් වේ. (A.S.C.A.R., 1890, Colombo, 1904, 9 P.) සෙනරත් පරණවිතාන, මළුතිස රජුගේ එම සෙල් ලිපිය හා අභයගිරි විහාරයේ (ජේතවන විහාරය) පිය ගැට පෙළේ ලිපි අටක් ද (අමරසේකර, බන්දුල, සිංහල ශිලා ලේඛන විවරණය, 1 වන කාණ්ඩය, කොළඹ, 1937, 122 පි.)උපයෝගී කරගෙන, එම මාරුව වෙනස් කරන ලදි.

43 E. Z., Volume 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1923, 1 P.

44 - Do -

45 - D0 -41 P.

46 - Do -24 P.

47 - D0 -175 P

47* පුවරු ලිපියෙහි, "අබා සලමෙවන් මහරදහු සත්ලැගු දොළොස්වන හවුරුදුයෙහි......" යනුවෙන් සඳහන් වන බැවින්, අබා සලමෙවන් නමින් හැඳින්වෙන පස්වන දප්පුල රජුගේ රාජ්‍ය වර්ෂයේ 12 වන වර්ෂයෙහි මෙම ව්‍යවස්ථාව කළ බවයි. එසේ නම් මෙම ලිපිය ද, ක්‍රි.ව. 979 - 991 අතර



විය යුතු ය. ලිපියෙහි වැඩිදුරටත් සඳහන් වනුයේ, ඔහු යුවරජ තනතුර දප්පුලගේ අවසාන රාජ්‍ය වර්ෂයෙහි දැරූ බවත් ය. ඒ අනුව උදාමහයා ඊළඟ රාජ්‍ය වර්ෂයෙහි රාජ්‍යත්වය ලබන්නට ඇත. මෙම ලිපිය ක්‍රි.ව. 991දි සකස් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

48 උපග්‍රන්ථය 224 - 226 පිටු බලන්න.

49 E. Z., Volume 111, No. 27, Edit by S. Paranavithana, Government of Ceylon, 1933, 253 P.

50 A. I. C., Volume 11, by Dr. E. Muller London, 1883, 55-56 P.

51 E. Z., Volume 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1912, 31 P.

52 E. Z., Volume 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1912, 18 P.

53 E. Z., Volume 11, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, 256 P.

54 උපග්‍රන්ථය 185 - 189 පිටුව බලන්න.

55 E. Z., Volume 11, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, 96 P.

56 ක. ස., සංස්කරණය ඩී. බී. ජයතිලක, වී. සී. සහ වී. එස්. ජයතිලක, කැලණිය, 1955, 9 පි.

57 ම.ව., 11 සංස්කරණය ශ්‍රී සුමංගල හිමි, 82 පරිච්ඡේදය, 9-10 ගාථා

58. Ray, H. C. and Paranavitana, S. University of Ceylon History of Ceylon Vol. 1. Part 1 and 11, Ceylon University Press, 1960, 747 P.

59 මෙහි 1 පිටුව බලන්න.

CamScanner

# තෙවන පරිච්ඡේදය

## කතිකාවත්වලට පසුබිම් වූ බුද්ධ කාලීන භික්ෂු කළමනාකරණය

සුවිශේෂ පරමාර්ථ හා ප්‍රතිපත්ති ඇතුළත් පරමාදර්ශී සමාජයක් ලෙස සංඝ සමාජය හැඳින්විය හැකි ය. ශ්‍රාවකයන් පස් දෙනෙකුගෙන් ආරම්භ කළ, සරලවූත්, සංචාරකවූත් සංඝ සමාජය, කාලයට හා දේශයට අනුකූල වන අයුරින්, විවිධ ප්‍රවණතාවන් හි ප්‍රතිඵලයක් ලෙස ක්‍රමික ව සංවර්ධනයට පත් වූ සංවිධානයකි. සසුනෙහි සාමාජිකත්වය ලැබූවන්, තම අරමුණු කරා මෙහෙයවීමට හා භික්ෂු පාරිශුද්ධිය ඇති කිරීම උදෙසා බුදුන් වහන්සේ විධිමත් වැඩපිළිවෙළක් සකස් කළහ. එය බුදුන් වහන්සේගේ කළමනාකරණය ලෙස සැලකිය හැකි ය.

ක්‍රි. පූ. 6 වන සියවසේ භාරතයේ පැවති ආගමික සංස්ථා අතර, ශ්‍රේෂ්ඨත ම සංවිධානය වූයේ බුද්ධ ශ්‍රමණ සංස්ථාව යි. කල් ගතවීමත් සමග ම සාමාජික සංඛ්‍යාව වර්ධනය විය. විවිධ ප්‍රදේශයන් හි, විවිධ පුද්ගලයන් ශාසනයට ඇතුළු වීමත්,භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වීමත් නිසා, භික්ෂූන් වහන්සේලා විධිමත් ලෙස සකස් කිරීමේ අවශ්‍යතාව පැන නැඟුණි. බෞද්ධ සමාජ සංවිධානය සකස් වී තිබුණේ භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිවුවණක් පිරිස, ගිහි හා පැවිදි යනුවෙන් කොටස් දෙකකට බෙදීමෙනි. එසේ කොටස් කර, භික්ෂූන් වහන්සේලා හැසිරිය යුතු, ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ විධිමත් වැඩපිළිවෙළක් සසුන තුළ ඇති කිරීම, බෞද්ධ කළමනාකරණයේ විශේෂ ලක්ෂණයකි.

ith CamScanner
CamScanner

## 3.1 බුදු සසුනෙහි අභිමතාර්ථය

බුදු දහමෙහි මූලික ම පරමාර්ථය වනුයේ, සසර සැරි සැරීමට හේතු වන්නා වූ දුක ක්ෂය කොට, නිර්වාණය ලබා ගැනීම යි. බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් මෙහෙයවනු ලැබුවේ එකී අරමුණු මුදුන් පමුණුවා ගැනීම අරබයා ය. සාමාජිකයන් එසේ නිවන් ලබා ගැනීම අරමුණු කර ගන්නා අතරතුර, "චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය......." වශයෙන් ප්‍රකාශ කරමින්, ලෝකවාසී ජනතාවට හිත පිණිස, ලෝකවාසී ජනතාවට සුව පිණිස, ධර්ම චාරිකාවෙහි හැසිරිය යුතු ය. භාරතය පුරා දහම ව්‍යාප්ත කිරීම බුදුන් වහන්සේගේ අභිමතාර්ථය[2] වූ අතර, එය සාධනය කර ගැනීමේ දී, භික්ෂුව ප්‍රධානතම සාධකය විය. එහි දී එක ම භික්ෂු පරපුරක් ලෙස ක්‍රියා කිරීම, සැහැල්ලු දිවි පැවැත්ම හා පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, බුදුන් වහන්සේගේ මුල් ම අපේක්ෂාව විය.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා, බුදු සසුන විධිමත් සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීමට උන්වහන්සේට අවැසි වූහ. සසුනෙහි සාමාජිකයන් වූ භික්ෂූන් වහන්සේලා, ගමන් කළ යුතු මාර්ගයන් බුදුන් වහන්සේ සකස් කොට ඇත්තේ ද සාර්ථක කළමනාකරණයක් සහිත ව බව පැහැදිලි ය. මේ අනුව, බුදු සසුන කළමනාකරණ ලක්ෂණයන්ගෙන් යුක්ත සංවිධානයකි.

## 3.2 භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමට බල පෑ සාධක

භික්ෂු සමාජය විමුක්තිය සාධනයෙහිලා මෙන්ම එකී විමුක්තිය අන්‍යයන්ට ලබාදීම උදෙසා කටයුතු කරන සංවිධානයකි. භික්ෂු සංස්ථාව සකස් කොට, වසර විස්සක් ඉක්ම ගිය පසු, බුදුන් වහන්සේට සිය ශ්‍රාවක චරිත විධිමත් පරිදි සැකසීමේ වැඩපිළිවෙළක අවශ්‍යතාව පෙනුණු අතර, ඒ සඳහා කාලය ද උදා වී තිබුණි. මුල් යුගයෙහි භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ යුතු එකම ක්‍රියා මාර්ගය වූයේ ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.[3] පැවිද්ද ලැබූවන්ගේ මූලික අරමුණ වූයේ ද ඉක්මණින් ම නිවන් අවබෝධ කර ගැනීමයි. ඒ



සඳහා ඔවුන් පාදක කොට ගත්තේ ධර්මයයි.[4] ධර්මය උපදේශයෙහි තබාගෙන විමුක්තිය උදෙසා අනුශාසනාව ප්‍රමාණ කර ගත් බව, සාමඤ්ඤඵල සූත්‍රයෙන්[5] පැහැදිලි වේ.

සම්බාධයොං ඝරාවාසො - රජසසායතනං ඉති
අබ්භොකාසොව පබ්බජ්ජා - ඉති දිසවාන පබ්බජි[6]

ගිහිගෙයි කලකිරුණු, පැවිදි ජීවිතයෙහි වටිනාකම තේරුම්ගත්, අඩු බලාපොරොත්තු ඇති, අපිස් ජීවිතයට නැඹුරු වූ සංඝ සංවිධානයක්, මුල් විසිවස තුළ දක්නට ලැබුණි.

ආරම්භක යුගයෙහි භික්ෂූන්ගේ දිවි පැවැත්ම සකස් වූයේ ස්වකීය චර්යාව තුළින්, දුටුවන්ගේ ප්‍රසාදය දිනාගත හැකි වන අයුරිනි. එහෙත් ක්‍රමයෙන්, බුදුන් වහන්සේගේ හා සසුනෙහි කීර්තිය විවිධ ප්‍රදේශවල පැතිර යාම නිසා, විවිධ පරමාර්ථ ඇතිව පැවිදි වූවන් බහුල වන්නට විය.[7]

භික්ෂූන් වහන්සේලා විධිමත් ලෙස සකස් කිරීමට බලපෑ සාධක පාරාජිකා පාලියෙහි[8] ආසවට්ඨානීය ධර්ම ලෙස අංග හතරකින් දක්වා තිබෙන නමුත් මජ්ඣිම නිකායේ භද්දාලි සූත්‍රයෙහි[9] එය කරුණු පහක් ලෙස දක්වයි. කෙසේ වෙතත්, පැවිදි ප්‍රජාව විධිමත්ව සැකසීමට මූලික ව බලපෑ කරුණු ඒ දෙකෙහි ම එක සේ සඳහන්ව ඇත.

මේ කරුණු අධ්‍යයනය කරන විට භික්ෂු සංස්ථාව විධිමත් පරිසරයක් තුළ සකස් කිරීමට අවශ්‍ය පසුබිම සකස් වී තිබූ බව පැහැදිලිව ම පෙනේ.

බුදුන් වහන්සේ විනය ශික්ෂා පැනවීමේ අරමුණු විස්තර කරමින්, එයට අදාළ වූ කරුණු දහයක් පාරාජිකා පාලියෙහි දක්වා තිබේ.[10] භික්ෂූන් වහන්සේලා සඳහා විනය නීති පනවා, භික්ෂු පිරිස විධිමත් වැඩපිළිවෙළක් ඔස්සේ ගමන් කරවිය යුතු බව, සැරියුත් හිමියන් පෙන්වා දෙනු ලැබුව ද බුදුන් වහන්සේගේ අදහස වූයේ, යම් කලෙක ආසවට්ඨානීය ධර්ම, සංඝයා කෙරෙහි පහළ වත් ද, එකල්හි එම ආසවට්ඨානීය ධර්ම දුරු කිරීම පිණිස ශික්ෂා පද පනවා සුදුසු වැඩපිළිවෙළක් සකස් කරන බව යි.[11]

CamScanner

### 3.2.1 විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුද්ගලයන් මහණ වීම

බුදු සසුනෙහි සාමාජිකත්වය ලැබූවන් අතර, විවිධ පරමාර්ථ ඇතිව පැවිදි වූ අය බහුල වන්නට පටන් ගනු ලැබීය.[12] එබඳු පරමාර්ථ අතර, රෝගාබාධයන් සුව කර ගැනීමේ අරමුණින් සසුන් ගත වූවන්,[13] රාජභටයන් මහණවීම,[14] සොරුන් මහණවීම,[15] අන්‍ය තීර්ථකයන් මහණවීම[16] හා දාසයන් මහණවීම[17] දැක්විය හැකි ය. පෞද්ගලික උවමනාවන් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් පැවිදිවීම වැළැක්වීම බුද්ධ ශාසනයෙහි කළමනාකරණය සඳහා බලපෑ සාධකයකි.

### 3.2.2 භික්ෂු ප්‍රතිරූපයට පටහැනි ක්‍රියා සිදුවීම

භික්ෂුවක් නිර්මාණය වනුයේ ගිහි සමාජයෙනි. බුද්ධ ශ්‍රමණ සංස්ථාවට ඇතුළු වූවායින් පසුව ගිහිකල පැවති ආකල්ප, අදහස් උදහස් හා ක්‍රියා කලාපයන් සිදු කළ නො හැකි ය. එහෙත් බුදුන් දවස ම භික්ෂුත්වයට නො ගැළපෙන ආකාරයේ හැසිරීම් රටාවන්ගෙන් යුත් මහණුන් මෙන් ම, භික්ෂුත්වයට නො ගැළපෙන ආකල්පවලින් යුත් භික්ෂූන් වහන්සේලා විසිතුන් නමක් සසුනෙහි විසූ බව දක්නට ලැබේ. එසේ ම, ඡන්න හිමියන් ද එසේ නොමනා සේ හැසිරුණු භික්ෂුවකි.[18]මෙවැනි භික්ෂූන් වහන්සේලා පාලනය කිරීමත්, ස්වල්පයක් වුවත් මෙම භික්ෂූන් වහන්සේලාගෙන් අන්‍ය භික්ෂූන් ආරක්ෂා කිරීමේ අරමුණත් නිසා බුදුන් වහන්සේට ස්වකීය ශ්‍රාවකයන් කළමනාකරණය කිරීමට සිදු වන්නට ඇති බව පෙනී යන්නකි.

### 3.2.3 භික්ෂූන් අතර එක්සත් බව නො මැතිවීම

බුදුන් වහන්සේගේ සංවිධානය බුදු සසුනයි. එම සසුනට පැමිණි සියලුම සාමාජිකයන් හඳුන්වනු ලැබුවේ බුද්ධ පුත්‍රයන් ලෙස ය. ඇතැම් භික්ෂූන් වහන්සේලා වැඩිමහල් භික්ෂූන් ඉදිරියේ හැසිරුණු ආකාරයත්, දානය ලබාගැනීමේ දී ගෞරවයක්



නොමැතිව හැසිරුණු ආකාරයත් මහාවග්ග පාලියෙහි වාර්තා වේ.[19] සසුන තුළ පිරිස වැඩිවීමත් සමග ම අවවාද අනුශාසනා ලබා දෙන්නට කිසිවෙකු නො සිටි බැවින්, තමන්ට කැමති පරිදි සිවුරු පෙරවීමට, දානය වැළඳීම හා දාන ශාලාව තුළ උස් හඬින් කතා කිරීම ආදිය සිදුකොට තිබේ.[20] මෙය බොහෝ විට සිදු වනුයේ නායකත්වයේ අඩුපාඩු නිසාත්, භික්ෂූන් අතර අන්‍යෝන්‍ය එක්සත් බවක් නො මැති විට ය. එබැවින් එය ද පසු කාලය වන විට භික්ෂූන් වහන්සේලා මැනවින් සකස් කරන්නට බලපෑ සාධකයකි.

### 3.2.4 ඇතැම් භික්ෂූන් වහන්සේලා ලෞකික ජීවිතයකට හුරුවීම

භික්ෂුවගේ දිවි පැවැත්මෙහි ලක්ෂණය වූයේ සරල බව යි. සැහැල්ලු සරල දිවි පෙවෙතින් පිට පැන වඩාත් කාමභෝගී ජීවිතයකට හුරු වීම භික්ෂූන් කළමනාකරණය කිරීමට බලපෑ කරුණක් බව මජ්ඣිම නිකායේ කකචූපම සූත්‍රයෙහි[21] සඳහන් වේ. එනම්,

> "න චෙව මෙ චිත්තං විපරිණතං භවිස්සති, න ච වාචං නිච්ඡාරෙස්සාමි, හිතානුකම්පි ච විහරිස්සාමි මෙත්තචිත්තො න දොසන්තරො'ති එවං හි තෙ ඵග්ගුන සික්ඛිතබ්බං"

"මගේ සිත රාගාදීන් පෙළුණේ නො වන්නේ ම ය, ලාමක වචන නො කියා, හිතානුකම්පාව ඇතිව, මෛත්‍රී සිතින් යුක්තව, ද්වේෂයෙන් තොරව, තමන්ගේ සිත හික්මා විය යුතු යි" යැයි මෝලිය ඵග්ගුන තෙරුන්ට ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වේ. ඇතැම් භික්ෂූන් වහන්සේලා කාන්තාවන් සමග ද තිරිසන් සතුන් සමග ද ඇටසැකිලි සමග ද මෛථුන සේවනය කළ බව පාරාජිකා පාලියෙහි[22] දක්වා ඇත.

බුද්ධ කාලයෙහි භික්ෂූන් කාමභෝගී ජීවිතයට ප්‍රිය කළ බව, උදායී භික්ෂුව විසින් සෙය්‍යක භික්ෂුවට කරන ලද ප්‍රකාශය සාක්ෂි දරයි.[23] ඔහු මිහිරි ආහාරපාන ලබා ගැනීමටත්, ප්‍රීතිමත් ව ජීවත් වීමටත්, උපදෙස් ලබා දුනි. මෙවන් ආකල්පවලින් තම

සංවිධානයෙහි සාමාජිකයන් ඉවත් කර ගැනීමට ද බුදුන් වහන්සේට අවශ්‍ය වූ බව පැහැදිලි ය.

### 3.2.5 භික්ෂූන් වහන්සේලා සඳහා ලාභසත්කාර බහුල වීම

බුදුරදුන්ගේ ශිෂ්‍යවරයන් අල්පේච්ඡ ජීවිතයක් ගත කරමින් ද දුටුවන්ගේ ප්‍රසාදයට ලක් වෙමින් ද භික්ෂු ජීවිතය ගත කරනු ලැබුවත්, සසුනෙහි කීර්ති රාවය පැතිරීම නිසා, බුදු සසුන වෙත ලැබුණ විවිධ ලාභ සත්කාර වැඩි වන්නට විය. එනිසා ම ඇතැමෙක් සසුනට පිවිසියේ විමුක්තිය ලබා ගැනීමේ අරමුණින් නොව, ලාභ සත්කාර ලබා ගැනීමේ අටියෙනි. මෙසේ මහණවීමට පැමිණි පිරිස් ක්‍රමයෙන් බහුල වන්නට විය. පාරාජිකා පාලිය[24] වාර්තා කරන ආකාරයට වග්ගුමුදා නදියෙහි වස් වැසූ සමයෙහි දුර්භික්ෂයක් උදා විය. ජනතාව ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීමට අපහසු අවස්ථාවේ දී, "අසුවල් භික්ෂුව ධ්‍යානලාභීය, මාර්ගඵල ලාභීහුය" ආදී වශයෙන් දානය ලබාගැනීමට උත්සාහ ගෙන තිබිණි. ඡබ්බග්ගිය භික්ෂූන්ට බොහෝ තුන් සිවුරු පරිහරණය කිරීමටත්, දස දිනකට වඩා පාත්‍ර තබා ගැනීමට අවසර නොදීමත්[25] විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. වාර්ෂිකව සංවිධානය කරනු ලබන දානයක දී ඡබ්බග්ගිය භික්ෂූන් එම දානයෙහි සිවුරු තමන් වෙත ලබා දෙන ලෙස කරන ලද ආයාචනයන්[26] ලාභසත්කාර ලබා ගැනීමෙ අටියෙන් ඔවුන් සසුනට පිවිසුණු බැව් පෙන්වන සාධකයකි.

### 3.2.6 අන්‍ය ශ්‍රමණ සංස්ථාවල සාමාජිකයන් හා විවිධ ප්‍රදේශවල පිරිස් සසුනෙහි සාමාජිකත්වය ලබා ගැනීම

පස් දෙනෙකුගෙන් සසුන ආරම්භ වුවත්, පසු කාලය වන විට එහි සාමාජික පිරිස වැඩි වූ අතර, අන්‍ය ශ්‍රමණ සංස්ථාවන්ගේ සාමාජිකයෝ ද බුදු සසුනෙහි සාමාජිකත්වය ලැබූහ. ඇතැම් සාමාජිකයෝ, තමන් මහණවීමට පෙර පැවති සිරිත් විරිත් මහණ වූවායින් පසුව ද ඒ අයුරින් ම ක්‍රියාත්මක කළහ. අචේලකයන්ගේ ලක්ෂණයක් වූයේ නග්නව සිටීම යි.[27] නග්න භාවය භික්ෂූන් වහන්සේලා සඳහා ද සුදුසු යැයි කල්පනා කළ භික්ෂුවක්, බුදුන් වහන්සේ වෙත පැමිණ එය බුදු සසුනට ද එකතු කරන ලෙස ඉල්ලීය.[28] මේ හේතුව නිසා, අන්‍ය තීර්ථක ලක්ෂණයන් සසුනට එකතුවීම වැළැක්වීමට බුදුන් වහන්සේට අවශ්‍ය විය. පාත්‍රයක් නොමැතිව පිඬු සිඟා යාම ද අන්‍ය තීර්ථකයන්ගේ ලක්ෂණයකි. තවද විවිධ ගම්, නගරවල විවිධ ගෝත්‍රවලට අයත් ජනතාව ද සසුනෙහි සාමාජිකත්වය ලබා ගත්හ.[29] එබඳු ලක්ෂණයන් ද බුදු සසුනට නො ගැළපෙන ක්‍රියාවන් ය. මෙලෙස එකම සසුන තුළ සාමාජිකයන් විවිධ ආකාරයට කටයුතු කිරීම වැළැක්වීම උදෙසා බුදුන් වහන්සේ පොදු වැඩපිළිවෙළක් සකස් කරනු ලැබූ අතර, එය බුද්ධ කළමනාකරණය ලෙස සැලකිය හැකි ය.

### 3.2.7 තත්කාලීන සමාජ චින්තනයෙහි බලපෑම

ක්‍රි. පූ. 6 වන සියවස වන විට භාරතයේ පැවති එකම ආගම බුදු දහම නො වේ.[30] "සත්‍යම් වද" සත්‍ය කතා කරව, "ධර්මංචර" ධර්මයෙහි හැසිරෙව, යන ඉගැන්වීම් ද පැවත තිබිණි.[31] මෙම ශික්ෂණය, සංඛ්‍ය, යෝග හා ජෛන චින්තාවන් ඔස්සේ වැඩි දියුණු වූ අතර, බුදු සසුනට එකතු කිරීමට අවශ්‍ය විය. ඕනෑම කෙනෙකුට ස්වභාව ධර්මයට අනුකූලව ජීවත්වීමේ අයිතියක් තිබෙන බව, භාරතීය සමාජය විසින් පිළිගෙන තිබුණි. එම අයිතිය බුදු සසුන තුළ ද තහවුරු කිරීමට අවශ්‍ය විය.[32] සොරකම් කිරීම හා ඒ සඳහා කුමන්ත්‍රණය කිරීම ද සදාචාරයට පටහැනි ක්‍රියා ය. එබඳු ක්‍රියා භික්ෂුවගේ දිවි පැවැත්මෙන් ඉවත් කිරීමට අවශ්‍ය වීම ද විධිමත් ලෙස භික්ෂුව සකස් කිරීමට බලපෑ සාධකයන් ය.

ඉහත කරුණු අනුව භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීම උදෙසා, භික්ෂු සමාජයෙන් ද සාධක රාශියක් බලපා ඇති බව පැහැදිලි ය.

### 3.3 බුදු සසුනෙහි තීරණ ගැනීමේ ස්වභාවය

සංවිධානයක් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම අරබයා ක්‍රියාත්මක වීමේ දී, එකී අරමුණු පහසුවෙන් ඉටුකර ගැනීමට නම් ඒ පිළිබඳව නිවැරදි වූ තීරණයන් ගත යුතු ය. අරමුණු මුදුන්පත්



CamScanner

කර ගැනීමෙ වඩාත් නිවැරදි ක්‍රමය නම් ඒ හා සම්බන්ධ හා එය වටා ඇති, එම අරමුණුවලට බලපාන කරුණු අධ්‍යයනය කොට ඒ අනුව තීරණ ගැනීමයි. අරමුණක් එක්වරම මුදුන් පමුණුවා ගත නො හැකි හෙයින්, ඒ සඳහා බලපාන සාමාජීය සාධක හා තොරතුරු ද අධ්‍යයනය කිරීම වැදගත් වේ.

බුදුන් වහන්සේ සිය සසුන සකස් කිරීමේ දී මුළුමනින්ම අන්‍යආගමික සම්ප්‍රදායයන් ප්‍රතික්ෂේප නො කළහ. යනමඟෙහි ගිය ආගමික උතුමන් උන්වහන්සේ විසින් අතිශය ගෞරවනීය වචනය භාවිත කරමින් ඇගයීමට ලක් කෙරිණි. "සුනෙත්ත, මූගපක්ඛ, අරණේමි, කුද්දාලක, හත්ථිපාල, ජෝතිපාල[33] මෙන් ම 'ආරක'[34] ආදී ගුරුවරුන් ගැන සඳහන් කරන බුදුන් වහන්සේ ඔවුන් අනුගමනය කළෝ යහපත දුටු බව ප්‍රකාශ කළහ. මේ උතුමන් විතරාගී වූ බව ද දේශනා කර ඇත. වෛදික ආගමෙහි ආරම්භක ඍෂිවරුන් ද අභිශ්‍රද්ධා නො ලද නමුත් සීලය හා ඍජු බව වර්ණනා කළ අය ලෙස බුදුන් වහන්සේගේ ගෞරවයට පාත්‍රව තිබුණි.[35] බ්‍රාහ්මණ දහමේ ඇතැම් ක්‍රියාකාරකම් ප්‍රතික්ෂේප කරනු ලැබූවත්, සාමාජික විෂයෙහි බ්‍රාහ්මණයන් සසුනට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප නො කළහ.[36] බුදුන් වහන්සේගේ මතවාදය පිහිටුවනු ලැබුවේ ද ඒ වන විට පැවති ආගම් සැට දෙකක් අතර ය.[37] තම සසුනෙහි සාමාජිකයන් මෙහෙයවීමේ දී තත්කාලීන ආගමික සංස්ථා පිළිබඳව විමසා තම ශ්‍රාවකයන් කෙසේ සකස් කළ යුතු ද යන්න අධ්‍යයනය කොට ඇත. ඒ අනුව, එකල්හි පැවති ශ්‍රමණ සංස්ථාවන්ගේ ඌනපූරණයන් ඉවත් කොට, භික්ෂු සංස්ථාව සකස් කිරීමට තීරණය කොට ඇති බව පැහැදිලි ය.

බ්‍රාහ්මණයන් ස්වකීය කුලයෙහි ආධිපත්‍යය හා ගෞරවය ආරක්ෂා කරගැනීමට නිරන්තරව ක්‍රියා කළ පිරිසක් වූ හෙයින් සමාජය පිළිබඳව අවධානය යොමු නො කළහ. ඔවුහු ගිහි ජීවිතයෙහි පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට ප්‍රයත්න දැරූ පිරිසකි[38]. සාමූහික වගකීමක් රහිතව ක්‍රියා කළ මොවුහු පොදු ආගමික සංවිධානයක් ලෙසින් ද සකස් නො වූහ.[39]



බුදු සසුන ආරම්භ කිරීමත් සමග ම විධිමත් සැකැස්මකට අනුකූලව භික්ෂු පිරිස සකස් කරනු නො ලැබී ය. පස්වග තවුසන්ට නිගාථක සූත්‍රය[40] දේශනා කිරීමෙන් රහතන් වහන්සේලා සය දෙනෙකුගෙන් ආරම්භ වූ සසුනට යසකුල පුත්‍රයාත්[41] ඔහුගේ යහළුවන් පනස් සතර දෙනාත්[42] ඇතුළු වීමෙන් පසුව, ඒ සියලුදෙනාට ම බුදුන් වහන්සේ දේශනා කරනු ලැබුවේ,

"අපපසනනානංවා පසාදාය - පසනනානංවා භියොභාවාය....."[43] යනුවෙනි.

මෙ අනුව පැහැදිලි වන්නේ, නො පැහැදුණු අයගේ පැහැදීම පිණිසත්, පැහැදුණු අයගේ පැහැදීම වර්ධනය කරනු පිණිසත් ක්‍රියා කළ යුතු බව ය.

ප්‍රාථමික දර්ශනවාදය භාරතය පුරා ව්‍යාප්ත කිරීම උදෙසා ප්‍රමාණවත් ශ්‍රාවක පිරිසක් සසුනෙහි ඇති නො වුව ද අතළොස්සක් වූ ශ්‍රාවකයන්ගේ ශ්‍රමය කළමනාකරණය කළ බුදුන් වහන්සේ,

"මා එකෙනදවෙ අගමිත්ථ"[44] "මහණෙනි, දෙදෙනකු එක මඟ නො යන්න" යනුවෙන් ප්‍රකාශ කරමින්, නායකත්වය හා මඟපෙන්වීම මගින් බුදු දහමෙහි කළමනාකාරිත්වය මූලික අවස්ථාවේ දී ම ආදර්ශවත් ව පෙන්වා දී තිබේ.

බුදුන් වහන්සේ, භික්ෂු සංඝයා මූලික අරමුණු කරා යොමු කිරීම උදෙසා තීරණ ගැනීමේ දී අවධානය යොමු කළ කරුණු අතර ප්‍රධාන කරුණු කිහිපයකි.

- පැවති ශ්‍රමණ සංස්ථාවන්ගේ ඌනපූර්ණතා, භික්ෂු සංස්ථාව තුළින් ඉවත් කිරීම,
- ගිහි සමාජයෙන් වෙන්වුණු, දිවි පැවැත්මක් ඇති කිරීම,
- පරාර්ථය මුල් කරගත් සංඝ සමාජයක් ස්ථාපිත කිරීම,
- සමාජ, . ආර්ථික හා දේශපාලන රටාවට ගැළපෙන පරිදි, සසුන සකස් කිරීමට තීරණය කිරීම,

යනුවෙන් වර්ග කළ හැකි ය. එමගින් භික්ෂු සමාජය සංවිධානකරණය කිරීමේ දී භික්ෂු සමාජයත්, බාහිර සමාජයත්, තම සංවිධානයේ අරමුණුත් කෙරෙහි අවධානය යොමු කොට ඇති බව පැහැදිලි ය.

කළමනාකරණ ක්‍රියාවලිය තුළ, තීරණ ගැනීමේ දී වරින්වර මතුවන ගැටලු සඳහා ද විසඳුම් ලබාදීමට අවස්ථාව අනුව, පරිසරය අනුව තීරණයන් ගත යුතු ය. බුද්ධ කාලීන භික්ෂු ශාසනය පරීක්ෂා කර බලන විට ද බුදුන් වහන්සේ ද මෙම සංකල්පය අනුගමනය කොට තිබේ. උපසම්පදා විනය කර්මය සිදු කිරීමට භික්ෂූන් වහන්සේලා දස නමක් සිටිය යුතු ය.[45] එහෙත් අවන්ති දේශයට ගිය, මහාකාශ්‍යප හිමියන්ගේ ශිෂ්‍යවරයෙකු වූ සෝණ භික්ෂුවගේ ඉල්ලීම පරිදි, ප්‍රත්‍යන්ත ප්‍රදේශවල උපසම්පදා විනය කර්මයක් සිදු කිරීමට භික්ෂූන් පස් නමක් ප්‍රමාණවත් බව උන් වහන්සේ වදාළ සේක.[46]

සසුන තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී බහුජන මතයට ගරු කිරීම ද සිදුකර ඇත.[47] භික්ෂූන් වහන්සේලා මෙන් ම සසුන ද ක්‍රියාත්මක වීමේ දී විවිධ පුද්ගලයන්, විවිධ අදහස් ඉදිරිපත් කරන්නට වූහ. සසුනෙහි අනාගත පැවැත්ම සකස් කිරීමේ දී බුදුන් වහන්සේ ඒ පිළිබඳව ද සිය අවධානය යොමු කොට තිබේ. දෙමවුපියන්ගේ අවසරයක් නොමැතිව දරුවන් මහණ නො කරන ලෙසට ශුද්ධෝදන රජතුමා කරන ලද ආයාචනයත්,[48] රාජභටයන් මහණ කර නො ගන්නා ලෙසට බිම්බිසාර රජතුමා විසින් කරන ලද ඉල්ලීමත්,[49] රෝගාබාධ ඇති පුද්ගලයන් මහණ නො කරගන්නා මෙන් ජීවක වෛද්‍යවරයා කරන ලද ඉල්ලීමත්,[50] වර්ෂා කාලයෙහි ඒකේන්ද්‍රිය ජීවීන් පාගමින් පිඬු සිඟා වඩින බවට ජෛනාග මිකයන් නැගූ චෝදනාව හේතුවෙන් වස්සූපනායික ශික්ෂාපදය පැනවීමත්[51] ඒ සඳහා නිදසුන් වන අතර, මහජන සහභාගිත්වයෙන් තීරණ ගෙන ඇති අයුරු ඉන් පෙනී යයි.

තීරණයන් ගැනීමේ දී ස්වකීය මතයට අනුව ම නොව, පැවති සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිම කෙරෙහි ද බුදුන් වහන්සේ අවධානය යොමු කොට ඇත. බුදුන් වහන්සේ,



සමකාලීන පාලකයන් සමග සමීප සබඳතා පැවැත්වූහ. සසුනෙහි ක්‍රියාකාරීත්වය උදෙසා රජවරු විසින් පෙන්වා දෙනු ලැබූ අඩුපාඩු පිළිබඳ සැලකිලිමත්වීම උන්වහන්සේගේ විශේෂ ලක්ෂණයක් වන අතර එය අනාගත සසුන සකස් කිරීමට ද බලපාන ලදී.

බුද්ධ කාලීන සමාජාර්ථිකය ද බුදු සසුනෙහි ඉදිරි පැවැත්ම උදෙසා ක්‍රියා කිරීමට හේතු වී තිබේ. බුදුන් වහන්සේ මිනිසුන්ගේ ජීවන රටාව, ආර්ථික වෙනස්කම් කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කොට ඇත. මෙහිදී බෙහෙවින් ම බලපෑවේ බුදු දහම භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වීමත් සමග ය. බුදු හිමිගේ තීරණය වී තිබුණේ භික්ෂුව කිසිම අවස්ථාවක ආහාර සකස් නො කළ යුතු බව යි. එම තීරණය, දුර්භික්ෂ, නියං සමයන් හි දී සැදැහැතියන් මුහුණ දෙන දැඩි ආර්ථික දුෂ්කරතාව හමුවේ වෙනස් කරමින්, එවන් කාලවලදී භික්ෂුවට ආහාර පිස ගැනීම ආරාමයෙන් පිට සිදු කළ හැකි බවට තීරණය කිරීමත්, ආහාර අහේනිය නිසා, මිනිසුන් ඒවා සොරකම් කිරීමට පෙළඹීම නිසා ආරාමය තුළ ම පිළියෙල කිරීමට අවසර ලබාදීමත් වැදගත් වේ.[52]

මෙසේ නම්‍යශීලීව තීරණ ගත යුතු බව හා දැඩි ප්‍රතිපත්තියක සිට තීරණවලට එළැඹීම විධිමත් කළමනාකාරිත්වයක ලක්ෂණයක් නොවන බව ආදර්ශයෙන් ම උන්වහන්සේ පෙන්වා දුන්හ. ප්‍රාතිමෝක්ෂය දෙසීමේ දී බුද්දානුබුද්දක සික්ඛාපද දෙසීමෙන් ප්‍රයෝජනයක් නැතැයි සවග මහණුන් කළ ප්‍රකාශ අරබයා අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා කැපවීමේදීත්, ඒ සඳහා භික්ෂුව සකස් කිරීමේදීත් බුදුන් වහන්සේ බුද්දානුබුද්දක ශික්ෂාපද කාලානුරූපව හා දේශානුරූපව වෙනස් කර ගැනීමට ලබාදුන් අවසරය[53] තුළින් තීරණ ගැනීමේ දී උන්වහන්සේ තුළ පැවති නම්‍යශීලී බව ප්‍රත්‍යක්ෂ වේ. විධිමත් කළමනාකරණයක් තුළ සංවිධානයක් විධිමත් ලෙස සකස් කිරීමේ දී, එය වෙනස් වන සමාජ රටාවන්ට මුහුණ දෙමින් ම නවතාවන්ට මුහුණ දිය හැකි ආකාරයට සකස් විය යුතුය යන්න බුදුන් වහන්සේගේ ප්‍රකාශය තුළින් මැනවින් සනාථ වේ.

## 3.4 බුද්ධ කාලීන භික්ෂු සමාජයේ සැලසුම්කරණය

පරමාර්ථයන් මුදුන්පත් කර ගත හැකි වන ආකාරයට මානව සම්පත් හා භෞතික සම්පත් සැකසීම කළමනාකරණයයි.54 බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ගේ කටයුතු සැලසුම් කිරීමේ දී, භික්ෂුවක් පිරිහෙන කරුණු අටක් ප්‍රිය සූත්‍රයෙන් පෙන්වා දී එයින් වැළකී ක්‍රියා කළ යුතු බව දක්වා ඇත.[55] භික්ෂුවක් "අප්‍රියයන් පසස්නා සුලුවෙයි ද , ප්‍රියයන් ගරහන සුලුවෙයි ද , ලාභ සත්කාර කැමති වෙයි ද, ලජ්ජා නැතිවෙයි ද, ඔතප් නැතිවෙයි ද, ලමු ඉච්ඡා නැති වෙයි ද, මිසදිටු නැති වෙයි ද" එබඳු කෙනෙකු පිරිහෙන බවත්, සෑම භික්ෂුවක් ම එයින් වැළකී ක්‍රියා කළ යුතු බවත් දක්වා තිබේ. එමෙන්ම සේඛ පරිහානිය සූත්‍රයෙන් ද භික්ෂුවක් පිරිහෙන කරුණු අටක් පෙන්වා දී ඇත.

1. යම් භික්ෂුවක් නවකම්හි නිරත වන්නේ ද,
2. අල්ලාප සල්ලාපයෙහි නිතර යෙදෙන්නේ ද,
3. නිද්‍රායෙහි නිරත වන්නේ ද,
4. ගණ සංහතිකායෙහි නිරත වන්නේ ද,
5. ඉඳුරන්හි නො අවුරන ලද දොර ඇති බව,
6. බොජුන්හි පමණ නොදක්නා බව,
7. සංසර්ගයෙහි නිරත බව,
8. පපඤ්චයන්හි නිරත බව, යන කරුණු අටෙන් භික්ෂුවක් වැළකී ක්‍රියා කළයුතු බව දක්වා ඇත.

සසුනෙහි සෑම සාමාජිකයෙකු ම තම ජීවිතය පවත්වාගෙන යා යුතු වූයේ "සිවුපසය" තුළිනි. සිවුපසය පිළිගැනීමට සුදුසු වන අයුරින් භික්ෂුව සකස් කිරීමට බුදුන් වහන්සේ ක්‍රියා කොට ඇති බව භික්බු සූත්‍රයෙන්[56] පැහැදිලි ය.

සසුන සකස් කිරීමේ දී භික්ෂුව, තමන්ට මෙන් ම අන්‍යයන්ට ද හිතකාමී වන අයුරින් ක්‍රියා කළ යුතු බව, අලං සූත්‍රයෙන්[57] දක්වා තිබේ. බුදු සසුන සකස් කිරීමේ දී උන්වහන්සේ මූලිකව සැලසුම් කළේ ද එයයි. භික්ෂු සංස්ථාව සකස් කරනු



ලැබුවේ ගිහි සමාජයෙනි. එහෙත් ගිහි සමාජයෙන් පරිබාහිර වූ ලක්ෂණයන්ගෙන් භික්ෂූන් වහන්සේලා සැලසුම් කොට ඇති බව, දසධම්ම සූත්‍රයෙන්[58] ද පැහැදිලි වේ. ප්‍රතිපත්තිගරුක සෑම භික්ෂුවක් විසින් ම මොහොතක් පාසා සිහි කළ යුතු කරුණු දහයක් මේ තුළ අන්තර්ගතව ඇත.

යම් භික්ෂුවක් මහණ දිවිය ගත කළ යුතු අයුරුත්, එහිදී මූලික පරමාර්ථයෙන් බැහැර නො යායුතු බවත්, සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රයෙන්[59] පැහැදිලි කර දී ඇත.

මේ අනුව බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් විධිමත් සැලැස්මකට අනුකූලව පරමාර්ථයට උචිත වන අයුරිනුත් බාහිර සමාජයට ද ගැළපෙන අයුරිනුත් සකස් කිරීමට සැලසුම් කර ඇති අයුරු පැහැදිලිය.

සංවිධානයක් ලෙස භික්ෂු සමාජය සැලසුම් කිරීමේ දී හා පාලනය කිරීමේ දී බුදුන් වහන්සේ පහත කරුණු අවධාරණය කර ඇත.

1. මහණ කිරීම හා ඒ සඳහා අනුගමනය කළ යුතු විධික්‍රම හඳුන්වා දීම.
2. උපසම්පදා ශීලය හෙවත් අධි ශීලය භික්ෂුවට අනිවාර්ය අංගයක් කිරීම.
3. භික්ෂූන් වහන්සේලාගේ මනා පැවැත්ම උදෙසා "වත්" හඳුන්වා දෙමින්, ආචාර්ය උපාධ්‍යායන් දෙදෙනෙකු හඳුන්වා දීම හා ඒ යටතේ වාසය කළ යුතු ය.
4. සෑම භික්ෂුවක් ම නිස සමාදන් විය යුතු ය.
5. සෑම භික්ෂුවක් ම වස් විසිය යුතු වීම.
6. උපෝසථය භික්ෂුවට අනුදැන වදාරා තිබීම.
7. භික්ෂූන් වහන්සේලා සඳහා තනතුරු ප්‍රදානය.
8. විනය නීති හඳුන්වා දීම.
9. දඬුවම් ක්‍රම හඳුන්වා දීම.

බුදුන් වහන්සේගේ සැලසුම්කරණ මූලධර්මය හා පාලන මූලධර්මය අනුව, කුලපුත්‍රයෙකු මහණ වීමේ දී ඔහු අනත්‍යාගමිකයෙකු නම් සිවු මසක් පිරිවෙස් සමාදන් විය යුතු ය.[60] එය ද ලබාදිය යුත්තේ, තිසරණය සරණයාමෙන් පසුව ය. මහණ කිරීමේ දී රාජභටයන් මහණ නො කිරීමටත්,[61] පංච ආබාධ ඇත්තවුන් ද,[62] සොරකම් කරන්නවුන් ද,[63] දඬුවම්වලට නියම වූවන් ද,[64] සිරගෙට නියම වූවන් ද,[65] හංවඩු ගසනු ලැබූවන් ද,[66] ණය ගැතියන් ද,[67] දාසයන් ද,[68] දෙමවුපිය අවසර නො ලත් තැනැත්තන් ද[69] මහණ නො කළ යුතු බවත්, කපුටෙකු එළවා ගත හැකි වයසේ සිටින්නෙකු මහණ කළ යුතු බවත්[70] දක්වා ඇත. මහණ කිරීමේ දී හිස මුඩු කිරීම සඳහා ද විමසා කළ යුතු බවත්[71] දක්වා ඇත.

මහණ නො කළ යුතු පුද්ගලයන් තිස් දෙදෙනෙකු ද[72] බුදුන් වහන්සේ දක්වා ඇත්තේ ප්‍රියශීලි වූ සාමාජික පිරිසක් සකස් කිරීමේ අරමුණෙනි. ඒ අනුව, සංඝ සමාජය විධිමත් ක්‍රමානුකූල තෝරා ගැනීමකට යටත් කර ඇති බැව් පැහැදිලි ය. එහි දී, කැපූ අත් ඇති අය, කැපූ පා ඇති අය, කැපූ අත් පා ඇති අය, කැපූ කන් ඇති අය, කැපූ නාස් ඇති අය, කැපූ කන්නාස් ඇති අය, කැපූ ඇඟිලි ඇති අය, කැපූ මාපට ඇඟිලි ඇති අය, කැපූ මහවහර ඇති අය, පෙණය වැනි අත් ඇති අය, කුදු අය, මිටි අය, ගලගණ්ඩය රෝගය ඇති අය, කසයෙන් පහර කෑ අය, රජයෙහි ලියා තැබූ අය, බරවා රෝග ඇති අය, පාප රෝග ඇති අය, පිරිස් දූෂණය කරන්නන්, එකැස් ඇති අය, වක් වූ අත් පා ඇති අය, කොර වූවන්, එක් අතක් හෝ එක් පයක් හෝ සිරුර අඩක් හෝ නැති අය, ජරාවෙන් දුබල වූවන්, අන්ධයන්, ගොලුවන්, බිහිරන්, අඳගොලුවන්, අඳ බිහිරිවූවන්, ගොලු බිහිරන්, අඳ ගොලු බිහිරන් පැවිදි නො කළ යුතු බව දක්වා ඇත. කළමනාකරණයේ දී කළමනාකරුවෙකුගේ චරිත ලක්ෂණ ගැන වඩාත් සැලකිලිමත් වෙනවා සේ ම බුදුන් වහන්සේ භික්ෂූන්ගේ චරිත ලක්ෂණ එහි සාර්ථකත්වයට බලපාන බැව් තේරුම් ගෙන ක්‍රියා කර ඇත.

මෙලෙස මහණ කිරීම විධිමත් ලෙස සිදු කිරීමට සැලසුම් කරනු ලැබූ අතර සාමණේරයන් සඳහා දස සීලයක් ද රාහුල කුමරු මහණ කිරීමත් සමග ම නියම කිරීමට සැලසුම් කොට



තිබේ.[73] එනම් සතුන් මැරීමෙන්, නුදුන් දෙය ගැනීමෙන්, මෙවුන්දම් සේවනයෙන්, බොරු කීමෙන්, මත් වීමට හා පමාවට කරුණු වූ රහමෙර බීමෙන්, විකල් බොජුනෙන්, නැටුම් ගැයුම් වැයුම් විසුළු දැක්මෙන්, මල් හා සුවඳ විලවුන් ගැල්වීම, අඩුතැන් පිරවීමෙන් සැරසීම, අබරණ ලා සැදීමෙන්, උසසුන් මහස්නෙන් හා රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන්, සාමණේර නමක් වැළකිය යුතු බව දක්වා ඇත. "ඒහි භික්ඛු"[74] මහණ කිරීම "සරණාගමන මහණ"[75] කිරීමක් බවට පරිවර්තනය කොට එය සැලසුම් කිරීමේ දී කිසිවෙකුගෙනුත් ප්‍රශ්නයක් නො වන ආකාරයට සිදු කිරීමත් වැදගත් කොට මෙහි දී සැලකිය හැකි ය. කළමනාකරණයේ දී කළමනාකරුවෙකුගේ චරිත ලක්ෂණ ගැන වඩාත් සැලකිලිමත් වෙනවා සේ ම, බුදුන් වහන්සේ භික්ෂූන්ගේ චරිත ලක්ෂණ එහි සාර්ථකත්වයට බලපාන බව තේරුම් ගෙන ක්‍රියා කර ඇත.

බුදුන් වහන්සේ උපසම්පදාව ද මනා ලෙස සිදු කිරීම උදෙසා සැලසුම් කොට තිබිණි. මෙය ද "ඒහි උපසම්පදාව" "සරණාගමන උපසම්පදාව" බවට පරිවර්තනය කොට, පසුව රාධ බමුණා මුල් කරගෙන "ඤත්ති චතුත්ථ" උපසම්පදාව හඳුන්වා දෙමින්, එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය හා ඒ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් සැලසුම් කොට සකස් කිරීම වැදගත් ය. මෙහි දක්නට ලැබෙන විශේෂත්වය වනුයේ ක්‍රමික ව පරිණාමයට ලක් වීම යි. එනම්,

- විසිවයස් සම්පූර්ණ කළ යුතු ය.[76]
- මාතෘඝාතයෙක්, පිතෘඝාතකයෙක්, අරහන්තඝාතකයෙක්, සංඝභේදකයෙක්, භික්ඛුණී දූෂකයෙකු, ලෝහිතුප්පාදකයෙකු, මෙවුන්දම් සේවනය කළ තැනැත්තෙකු, තිරිසන් යෝනිවල උපන්නවුන්, පණ්ඩයෙකු නො කළ යුතු ය.[77]
- ආචාර්යවරයෙකු හා උපාධ්‍යායවරයෙකු නොමැති තැනැත්තෙකු උපසම්පදා නො කළ යුතු ය.[78]
- සංඝයා වහන්සේලා උපාධ්‍යාය කොට උපසම්පදා නො කළ යුතු ය. පාත්‍රයක් නැත්තවුන්, සිවුරු නැත්තවුන්, පාසිවුරු නැත්තවුන්, ඉල්ලාගත් පාත්‍රයක් ඇත්තවුන්,

ඉල්ලා ගත් සිවුරු ඇත්තවුන්, ඉල්ලා ගත් පා සිවුරු ඇත්තවුන් උපසම්පදා නො කළ යුතු ය.[79]

- කුෂ්ඨ, ගණ්ඩරෝග, කිලාස, ක්‍ෂය, මීමැස්මොරය ආදී රෝග ඇති අය උපසම්පදා නො කළ යුතු ය.[80]
- පුරුෂයෙක් විය යුතු ය.[81]
- නො ඉල්ලූ උපසම්පදාවක් නො දිය යුතු ය.
- ඤත්ති චතුත්ථ කර්මයෙන් උපසම්පදා කළ යුතු ය. යනුවෙන් දක්වමින් විධිමත් සැලැස්මකට අනුකූලව උපසම්පදා කර්මය සිදු කළයුතු බව දක්වා ඇත.

මෙමගින් බුදුන් වහන්සේ සිය සාමාජිකයන් මනා ලෙස සකස් කිරීම උදෙසා විධිමත් සැලැස්මක්, විධිමත් පාලනයකින් හා මෙහෙයවීමකින් සිදු කර ඇති බව පැහැදිලි ය.

## 3.5 භික්ෂු සංවිධානකරණය

සංවිධානයක තිබෙන එක් මූලික පරමාර්ථයක් වනුයේ, බලතල බෙදා දීමයි.[82] එය සැලසුම්කරණයෙහි මූලික අරමුණු ඉටු වන පරිදි සකස් විය යුතු ය. බුදු සසුනෙහි මූලික පරමාර්ථයක් වූයේ, ලෝකයාට නව දහම බෙදා හැරීම මගින් සමාජය වඩාත් යහපත් තත්ත්වයට පත්කරවීම යි. තථාගත සසුනෙහි ආරම්භයේ දී පිරිස අඩුවීම නිසා, සංස්ථාගත වීමකින් තොරව, භික්ෂු පිරිස් බුදුන් වහන්සේ සමග ම සත්‍ය ගවේෂණයෙහි නිරත වූහ. එහෙත් ශ්‍රාවක පිරිස ක්‍රමයෙන් වර්ධනය වීමත් සමග ම භික්ෂු පිරිසට ම බුදු සසුන තුළ නායකත්වය බුදුන් වහන්සේ පවරා දෙනු ලැබී ය. පළමු වරට වේළුවනාරාමයේ දී අග්‍රශ්‍රාවක තනතුරු දෙක සැරියුත් - මුගලන් දෙනමට පැවරීමෙන් මේ බව සනාථ වේ. ඒ බව "එතෙ භික්ඛවේ ද්වේ සහායකා ආගච්ඡන්තා..."[83] යනුවෙන් සඳහන් වෙයි.

සසුනෙහි මුල් ම බලතල පැවරීම සිදු වූයේ, "ඒහි භික්ඛු මහණ කිරීම හා උපසම්පදාව"[84] සරණාගමන මහණ කිරීමක් හා උපසම්පදාවක්" බවට පත් කිරීමත් සමග ය. එහි දී ඒ ඒ ප්‍රදේශවල භික්ෂූන් වහන්සේලා වෙත, මහණ කිරීමට හා උපසම්පදා කිරීමට බලය පැවරිණි. මධ්‍ය දේශයෙහි භික්ෂූන් වහන්සේලා දස නමක් ද, ප්‍රත්‍යන්ත දේශයන්හි භික්ෂූන් වහන්සේලා පස් නමක් ද වන පරිදි,[85] එම කාර්යය සිදු කළ යුතු ය. එම කාර්යය සිදු කිරීමේ දී බුදුන් වහන්සේ තමා වෙත පැවති අධිකාරි බලය, විමධ්‍යගත කරමින්, පවරමින් (Delegation and Authoring) භික්ෂු සංවිධානකරණයෙහි මුල් ම පියවර ලෙස, එම බලය, "තුම්හෙවදානි භික්ඛවේ තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පදාථොති"[86] යනුවෙන් ප්‍රකාශ කරමින්, ඒ ඒ දිශාවන්හි ම, ඒ ඒ ජනපදයන්හි ම පැවිදි කිරීමටත්, උපසම්පදා කිරීමටත් භික්ෂූන්ට අවසර දෙන ලදි.

වසර කීපයකින් ශ්‍රාවක ශ්‍රාවිකා පිරිස ගණනින් වැඩිවීමත් සමග ම තථාගතයන් වහන්සේ තම අනුගාමික පිරිස මැනවින් සංවිධානය කිරීම සඳහා ඒ ඒ අයගේ දක්ෂතා, චරිත ස්වභාව, සමාජ පිළිගැනීම හා නිපුණතාවන් සැලකිල්ලට ගෙන, තනතුරු ප්‍රදානය සිදු කොට තිබේ. මෙමගින් පුද්ගල විභවතාවන් අගය කරනු ලැබූ අතර ම, සංස්ථාගත සංවිධානය ද අපේක්ෂා කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

බුදුන් වහන්සේ සිය සංවිධානය පවත්වාගෙන යාම සඳහා තනතුරු ප්‍රදානය කළ බව, අංගුත්තර නිකායේ දැක්වේ.[87] තනතුරු 80කට, සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේලා මෙන් ම භික්ෂුණීන් හා උපාසක - උපාසිකාවන් තෝරා ගෙන ඇත.

භික්ෂූන් වහන්සේලා සඳහා තනතුරු 47ක් ද,

භික්ෂුණීන් වහන්සේලා සඳහා තනතුරු 13ක් ද,

උපාසකවරු සඳහා තනතුරු 10ක් ද,

උපාසිකාවක් සඳහා තනතුරු 10ක් ද වශයෙන් ද බෙදා වෙන් කොට තිබිණි.

**භික්ෂුන් වහන්සේලා සඳහා පිරිනැමුණු තනතුරු,**

| | | | |
|---|---|---|---|
| 1. | අඤ්ඤා කොණ්ඩඤ්ඤ | - | රතනඤ්ඤූනං |
| 2. | සාරිපුත්ත | - | මහාපඤ්ඤාවන්තානං |
| 3. | මහා මොග්ගල්ලාන | - | ඉද්ධි මන්තානං |
| 4. | මහා කස්සප | - | ධුතවාදානං |
| 5. | අනුරුද්ධ | - | දිබබචක්ඛුකානං |
| 6. | කාලිගොධාය සුත්ත හද්දිය | - | උච්චාකුලිකානං |
| 7. | පිණ්ඩොල භාරද්වාජ | - | සිහනාදිකානං |
| 8. | ලකුණ්ටක හද්දිය | - | මඤ්ජුස්සරානං |
| 9. | මණ්තාණි පුත්ත පුණ්ණ | - | ධම්මකථිකානං |
| 10. | මහාක චචාන | - | විත්ථාරෙන අත්ථා විභජන්තානං |
| 11. | චුල්ලපන්ථක | - | මනොමයං කායං / අභිනිම්මනන්තානං |
| 12. | මහා පන්ථක | - | චෙතොවිවට්ට කුසලානංසඤ්ඤා විමට්ට කුසලානං |
| 13. | සුභූති | - | දක්ඛිණෙය්‍යානං / දක්ෂිණාර්හයන් අතර |
| 14. | ඛදිරවනිය රේවත | - | ආරඤ්ඤකානං |
| 15. | කංඛාරේවත | - | ඣායීනං |
| 16. | සෝණ කොළිස | - | ආද්ධවීරියානං |
| 17. | සෝණ කුටිකණ්ණ | - | කල්‍යාණ වාක්කරනානං |
| 18. | සිවලී | - | ලාභීනං |
| 19. | මක්කලී | - | සද්ධාධිමත්තානං |
| 20. | රාහුල | - | සිකඛාමානානං |



| | | | |
|---|---|---|---|
| 21. | රට්ඨපාල | - | සද්ධා පබ්බජිතානං |
| 22. | කුණ්ඩධාන | - | පඨමං සලාකං / ගණ්හන්තානං |
| 23. | වංගීස | - | පටිභාන වන්තානං |
| 24. | උපසේන වංගන්ත | - | සමන්තපාසාදිකානං |
| 25. | දබ්බමල්ලපුත්ත | - | සේනාසන / පඤ්ඤාපකානං |
| 26. | පිළින්දවච්ඡ | - | දේවතානං / පියමනාපානං |
| 27. | බාහිය දාරුචීරිය | - | ඛිප්පාභිඤ්ඤානං |
| 28. | කුමාරකස්සප | - | චිත්තකථිතානං |
| 29. | මහ කොට්ඨිත | - | පටිසම්භිදා පත්තානං |
| 30. | ආනන්ද බහුස්සුතානං | - | සතිමන්තානං / ගතිමන්තානං / ධිතිමන්තානං / උපට්ඨානං / ධර්මභාණ්ඩාගාරිකං |
| 31. | උරුවේලකස්සප | - | මහා පරිසානං |
| 32. | කාළුදායි | - | කුලප්පසාදකානං |
| 33. | බක්කුල | - | අප්පාබාධානං |
| 34. | සෝභිත | - | පුබ්බෙනිවාස / අනුස්සරන්තානං |
| 35. | උපාලි | - | විනය ධරානං |
| 36. | නන්දක | - | භික්ඛුනොවාදකානං |
| 37. | නන්ද | - | ඉන්ද්‍රියෙසු / ගුත්තද්වාරානං |
| 38. | මහාකප්පින | - | භික්ඛු ඔවාදකානං |

CamScanner

39. සාගත - තෙජොධාතු කුසලානං
40. රාධ - පටිභානෙය්‍යකානං
41. මොඝරාජ - ලූඛවිවරධරාණං

**තනතුරු ලත් භික්ෂුණීන් වහන්සේලා**

1. මහා ප්‍රජාපතී ගෝතමී - රතතඤ්ඤානං
2. ඛේමා - මහා පඤ්ඤාවතීනං අගගශ්‍රාවිකා
3. උප්පලවණ්ණා - ඉද්ධිමනතීනං
4. පටාචාරා - විනයධරානං
5. ධම්මදින්නා - ධම්මකථිකානං
6. නන්දා - ඣායීනං
7. සෝනා - ආරද්ධවිරියානං
8. සකුලා - දිබබචකකානං
9. බද්දා - ඛිපපාභිඤ්ඤාණං
10. භද්දකාපිලානි - පුබෙබානිවාසං අනුසසරනතීනං
11. භද්දකච්චානා - මහාභිඤ්ඤපපතතානං
12. කිසාගෝතමී - ලූඛචීවරධරානං
13. සිගාල මාතා - සද්දාධි මුතතානං

**තනතුරු ලැබූ ගිහි ශ්‍රාවකයන්**

1. පසසුභලලිකා දෙව වාණිජා - පඨම සරණං ගචඡනතානං
2 සුදතතගහපති - දායකානං
3. චිතතගහපති - ධමමකථිකානං



4. හත්ථක ආලවක - චතූහිසංගහ වතථුහි පරිසං සංගණ්හකානං
5. මහානාම ශාක්‍ය - පනීත දායකානං
6. උගගගහපති - මහාපදායකානං
7. උගගත ගහපති - සංඝුපඨායකානං
8. සූර අටබමඨ - අබචචප්ප සත්තාහං
9. ජීවක කෝමාරභචච - පුගගලපප සහනානං
10. නකුලපිතා - විසසාසකානං

**තනතුරු ලත් උපාසිකාවන්**

1. සුජාතා සෙනානිධීතා - පඨමංසරණ ගචඡනතීනං
2. විසාඛා - දාසිකානං
3. ඛුජ්ජුතතරා - බහුසසුතානං
4. උතතරා - ඣායීනං
5. සුප්පවාසා කෝලියයිකා - පණීත දායිකානං
6. සුපපියා - ගිලානපටඨායිකානං
7. සාමාවතී - මෙතතාවිහාරීනං
8. කාතියානි - අබෙචචපපසනනානං
9. නකුලමාතා - විසසාසිකානං
10. කාළි කුරරසරිකා - අනුසය පසනනානං

අංගුත්තර නිකායේ දැක්වෙන ආකාරයට භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිවුවණක් පිරිසේ තනතුරුලාභීන් 74 ක් වුව ද තනතුරු 80 ක් දැක්වෙයි. චුල්ලපන්ථක තෙරණුවන්ට තනතුරු දෙකක් ද සුභූති තෙරණුවන්ට තනතුරු දෙකක් ද ආනන්ද තෙරණුවන්ට තනතුරු හයක් ද ප්‍රදානය කිරීමෙන් තනතුරු අසූව සම්පූර්ණ වෙයි.

පොළොන්නරු යුගයෙහි රචනා කරන ලද බුත්සරණයෙහි[88] අසූමහා ශ්‍රාවකයින් ලෙසට දක්වා තිබෙන්නේ පැවිදි උතුමන්ගේ නම් පමණි. සුත්ත නිපාතයේ සඳහන් බාවරි බ්‍රාහ්මණයන්ගේ සිසු පිරිසට අයත් බ්‍රාහ්මණවරුන් දහසය දෙනා සහ එහි ම දැක්වෙන, "සභියසේල" ආදි බ්‍රාහ්මණයන්ගේ නම් නමයක් ද සඳහන් කොට තිබේ.

බුද්ධ කාලයෙහි ම පිරිනමන ලද තවත් තනතුරක් හෙවත් ගෞරව නාමයක් වනුයේ "පණ්ඩිත" යන්නයි. "පණ්ඩිතො භික්ඛවෙ සාරිපුත්තො" "පණ්ඩිතො භික්ඛවෙ මහා කච්චායනො" යනුවෙන් මධුපිණ්ඩික සූත්‍රයේ හා ධම්ම පදයෙහි දැක්වේ. උගත්, වියත්, බහුශ්‍රැත යන ගෞරවය දැක්වීමට "පණ්ඩිත" යන ගෞරව නාමය භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි අතර, මෙම තනතුර සඳහා වගකීම් හා බලතල දක්නට නො ලැබෙන බව ද සඳහන් කළ යුතු ය.

එනමුත්, බුදුන් වහන්සේ භික්ෂු සංවිධානය සකස් කිරීමේ දී වගකීම් හා බලතල වෙන් කර[89] දීමත් සිදුකොට ඇති අතර, බලතල බෙදා වෙන් කිරීම මඟින් ඒ ඒ තොරතුරු මැනවින් ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ද සකස් කළහ. බලතල හා වගකීම් බෙදා දුන් තනතුරු අතර, ආචාර්ය - උපාධ්‍යාය[90] තනතුර දැක්විය හැකි ය. මෙමගින් භික්ෂූන් වහන්සේලා සකස් කිරීමේ දී උන්වහන්සේ ගුරුවරුන් සහිතව, පිහිට සහිතව, ගැළපෙන පැවතුම් ඇතිව වාසය කළ හැකි පරිසරයක් නිර්මාණය කළහ.

කුඩා මහත් වරද සොයා බලා අවවාදයෙන් ශිෂ්‍යයන් හික්මවන තැනැත්තා "ආචාර්යවරයා" හා "උපාධ්‍යාය" නම් වේ.[91] උපාධ්‍යායන් වහන්සේගෙන් අවවාද ලබන ශිෂ්‍යයා සද්ධිවිහාරික නම් වේ. සාමණේර පැවිද්දෙහි හා මහලු පැවිද්දෙහි මූලිකත්වය උසුලන ගුරුවරයා වනුයේ උපාධ්‍යායන් වහන්සේ ය.

## උපාධ්‍යායවරයාගේ කාර්යභාරය හා වගකීම්.[92]

- අවවාද අනුශාසනා කිරීමෙන් සද්ධිවිහාරිකට සංග්‍රහ කළ යුතු ය.
- වැඩිපුර පාත්‍රයක් තිබේ නම් සද්ධිවිහාරිකයාට දිය යුතු ය.



- වැඩිපුර සිවුරක් තිබේ නම් සද්ධිවිහාරිකයාට දිය යුතු ය.
- වැඩිපුර පරිෂ්කාරයක් තිබේ නම් සද්ධිවිහාරිකයාට දිය යුතු ය.
- සද්ධිවිහාරිකයා ගිලන් වී නම් කලින් නැගිට දැහැටි දිය යුතු ය, මුව දෝනා දිය යුතු ය, අසුන් පැනවිය යුතු ය, කැඳ දිය යුතු ය.
- සද්ධිවිහාරිකයා ශාසනයෙහි නො ඇලීමක් ඇති වන්නේ නම්, අන් තැනකට ගෙන යා යුතු ය, අනෙකෙකු ලවා අන් තැනකට පමුණුවා ලිය යුතු ය, ඔහුට ධර්ම කථා හෝ කියා දිය යුතු ය.
- සද්ධිවිහාරිකයාට කුකුසක් ඇතිවේ නම්, උපාධ්‍යාය විසින් එය දුරු කළ යුතු ය, අනෙකෙකු ලවා හෝ එය දුරු කළ යුතු ය.
- පිය පුතු මෙන් ක්‍රියා කළ යුතු ය.

## ආචාර්යවරයා

උපාධ්‍යායන් වහන්සේට දෙවැනිව සිටින ගුරුවරයා වනුයේ ආචාර්යවරයා ය. නවක භික්ෂුවගේ දිවි පැවැත්ම මනා ලෙස හැඩගැස්වීම සිදු කිරීම සඳහා බුදුන් වහන්සේ ආචාර්යවරයෙකු පත් කළහ.[93] එබඳු ආචාර්යවරුන් හතර දෙනෙකි.
එනම්,

1. නිශ්‍රයාචාර්ය
2. ප්‍රව්‍රජ්‍යාචාර්ය
3. උපසම්පදාචාර්ය
4. ධර්මාචාර්ය යනුවෙනි.

යාච්ඤා කොට ආචාර්යත්වයෙහි තබා ගන්නා ආචාර්යවරයා නිශ්‍රායචාර්යවන අතර, පැවිදි වන කල්හි සරණ සමාදානය කරවන, තවත් දත යුතු දේ උගන්වන ආචාර්යවරයා ප්‍රව්‍රජ්‍යාචාර්යවරයා වේ. උපසම්පදා කිරීමේ දී අනුශාසනා කරන, කර්ම වාක්‍ය ප්‍රකාශ කරන ආචාර්යවරයා උපසම්පදාචාර්යවරයා නම්. භික්ෂුවරයන්ට ධර්ම විනය උගන්වන ආචාර්යවරයා ධර්මාචාර්යවරයා ලෙස හඳුන්වා ඇත.

මේ අයුරින් උපාධ්‍යාය හා ආචාර්යවරයා, සද්ධිවිහාරික හා අන්තේවාසිකයන් තම ගුරුවරුන් සඳහා සිය කාර්යභාරය හා වගකීම් ඉටු කරන විට ශිෂ්‍යයන් විසින් ඉටු කළ යුතු වගකීම් සම්භාරයක් දක්වා තිබේ.[94] එනම්,

- පළමුව අවදි විය යුතු ය.
- දැහැටි ලබා දිය යුතු ය.
- මුව දෝනා දිය යුතු ය.
- අසුන් පැනවීම්.
- කැඳ තිබේ නම් බඳුන සෝදා කැඳ ලබා දිය යුතු ය.
- කැඳ වළඳා අවසන් වීමෙන් පසුව පාත්‍රය ගෙන සෝදා තැන්පත් කොට තැබිය යුතු ය.
- උපාධ්‍යාය අවදි වූවායින් පසුව අසුන ඔසවා තැබිය යුතු ය.
- ඒ අසල කසළ තිබේ නම් හැමදිය යුතු ය.

  ගමට යනු කැමැත්තේ නම් අඳනය දිය යුතු ය.
- පටිය දිය යුතු ය.
- දෙගුණ කොට සඟල සිවුර දිය යුතු ය.
- සෝදා දිය සහිත පාත්‍රය දිය යුතු ය.
- වැඩිදුරින් නොයා යුතු ය. වැඩි ළඟින් නො යා යුතු ය.
- උපාධ්‍යාය කතා කරමින් සිටිය දී අතරතුර කතා නොදැමිය යුතුය. යනුවෙන් දක්වා තිබේ.

උපාධ්‍යාය ආචාර්ය හා සද්ධිවිහාරික අන්තේවාසිකයන් මෙලෙස ගුරුන් සහිතව සසුනට ගැළපෙන පැවතුම් ඇතිව වාසය කරන්නේ නම්, එය සසුනෙහි වර්ධනයට මෙන් ම මුල් බැස ගැනීමට ද හේතු වන්නේ ය. උපාධ්‍යායවරයෙකු පත් කර ගැනීමේ දී දස වස් ඇති භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.[95]



අන්තේවාසිකයා ආචාර්යවරයා වෙත මැනවින් නො පවත්නා විට ගත යුතු ක්‍රියා මාර්ග[96]

- මැනවින් නො පවත්නේ නම් දුකුලා ඇවැත් වේ
- බැහැර කිරීම
- ආචාර්යවරයා කමා නො කරන විට මහණෙනි, කමා නම්මා ගැනීම අනුදනිමි. (භගවතො ඒකමන්තං ආණෙව්වෙයුං අනුජානාමි භික්ඛවේ ඛමායෙතු තති)
- ආචාර්යවරයන් කමා නොකරන්නේ නම් දුකුලා ඇවැත්වේ.
- මනාකොට පිළිවෙත් පුරන අතවැසියා බැහැර නො කිරීමත්
- මනාකොට පිළිවෙත නො පුරන අතවැසියා බැහැර කිරීමටත්
- එසේ නො කරන්නේ නම් ආචාර්යවරයාට දුකුලා ඇවැත් සිදු වේ.

**කරුණු 05 කින් යුත් අතවැසි තෙමේ බැහැර කළ යුතු ය.**

එනම්,

- ප්‍රේමයක් නොවේ නම්,
- අධික පැහැදීමක් නොවේ නම්,
- අධික ලජ්ජාවක් නො වන්නේ නම්,
- අධික ගෞරවයක් නො වන්නේ නම්,
- අධික මෛත්‍රී භාවනාවක් නො වන්නේ නම් අතවැසියා බැහැර කළ යුතු ය.

මුල් කාලීන සසුනෙහි සාමාජිකයන්ට චීවරය වශයෙන් තබා ගත හැක්කේ එක් චීවරයක් පමණි. සසුන ක්‍රමිකව සංවර්ධනය වීමේ දී එසේ භික්ෂූන් වහන්සේලාට එක් පාංශුකූල චීවරයක් පමණක්

CamScanner

පරිහරණය කරන්නට තිබූ අවසරය, ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි ගෘහපති චීවරය[97] පිළිගැනීමත් සමග ම, සිවුරු පිළිගැනීමට අවසරය ලැබිණි. අනතුරුව සැදැහැවතුහු පූජා කිරීමේ අදහසින් සිවුරු රැගෙන, භික්ෂූන් වහන්සේලාට පූජා කිරීමට පැමිණි නමුත් ඒවා පිළිගැනීමට භික්ෂුවක් නොවූයෙන්, ආපසු රැගෙන ගියහ. මෙම අවස්ථාවේ දී බුදුන් වහන්සේ ඒ සම්බන්ධව කටයුතු කිරීමට භික්ෂූන් වහන්සේලා ම පත් කරන ලදි.

1. සිවුරු පිළිගැනීමට භික්ෂුවක් පත් කිරීමත්, (චීවර පටිග්ගාහක)[98]
2. සිවුරු ප්‍රවේශමෙන් තබා ගැනීමට භික්ෂුවක් පත් කිරීමත් (චීවර නිදහක)[99] (සිවුරු තැන්පත් කරන්නා)
3. සිවුරු ගබඩා කර ගැනීම සඳහා භාණ්ඩාගාරික භික්ෂුවකුත්,[100]
4. සිවුරු බෙදා දීම සඳහා භික්ෂුවකුත් (චීවරභාජක)[101] යනුවෙන්, භික්ෂූන් වහන්සේලා පත්කරන ලදි.

මේ අයුරින් ගෘහපතියන් විසින් පූජා කරනු ලබන සිවුරු භාර ගැනීම සඳහා පත් කළ භික්ෂුව තුළ තිබිය යුතු ලක්ෂණ පහකි,

"සංඝො ඉත්‍ථනතාමං භික්ඛුං චීවර පටිග්ගාහකං සමන්තනි, යසසා යස්සමතො ඛමති ඉත්‍ථන්නාමස්ස භිකඛුනො චීවර පටිග්ගාහකස්ස සම්සුති, සො තුන්හස්ස යස්ස නකඛමති සො භාසෙය්‍යය....." යනුවෙන් දක්වා ඇත.[102]

ඒ අනුව එබඳු සුදුසුකම් වනුයේ,

1. ඡන්දයෙන් අගතියට නො යෑම. (න ඡන්‍දාගතිං ගච්ඡෙය්‍ය)
2. ද්වේෂයෙන් අගතියට නො යෑම. (ජදො දොසාගතිං ගච්ඡෙය්‍ය)



3. මෝහයෙන් අගතියට නො යෑම. (න මෝහාගතිං ගච්ඡෙය්‍ය)
4. බියෙන් අගතියට නො යෑම. (න භයාගතිං ගච්ඡෙය්‍ය)
5. ගත් නො ගත් දෙය දන්නේ ද යන කරුණු වේ.

මෙම කරුණුවලින් සම්පූර්ණ වූ භික්ෂුවක් සංඝ සම්මුතියෙන් "චීවර පටිග්ගාහක"[103] (චීවර භාර ගැනීම) වශයෙන් පත්කර ගත යුතු ය. එම භික්ෂුව තෝරා පත් කර ගැනීමේ දී ද අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ද බුදුන් වහන්සේ දක්වා ඇත.[104] එහිදී,

1. පළමු කොට ම ඒ මහණ ඉල්විය යුතු ය.
2. ප්‍රතිඵල භික්ෂුනමක් විසින් සංඝයාට දැන්විය යුතු ය.
3. ඥත්තිය හෙවත් නිවේදනය නිකුත් කළ යුතු ය.
4. චීවර ප්‍රතිග්‍රාහක සම්මුතිය රුචි නම් තුෂ්ණිම්භූත විය යුතු ය.
5. චීවර ප්‍රතිග්‍රාහක සම්මුතිය රුචි නොවේ නම් කතා කළ යුතු ය.
6. චීවර ප්‍රතිග්‍රාහක සම්මුතිය රුචි නම් එය සම්මත කළ යුතු ය.

චීවරය මුල් කරගෙන සසුන තුළ ඇති කළ තවත් තනතුරක් වූයේ, සිවුරු තැන්පත් කරන්නා(චීවර නිදහකො) තනතුරයි. චීවර පටිග්ගාහක භික්ෂුව, ගිහියන් පූජා කළ සිවුරු තැන්පත් කරන්නට තැනක් නොමැතිව එහි ම හැරදමා ගියහ. බුදුන් වහන්සේ පිළිගත් සිවුරු තැන්පත් කිරීම සඳහා භික්ෂුවක් පත් කරනු ලැබීය.[105] එම තනතුරට පත්වීමට සපුරාලිය යුතු සුදුසුකම් පහක් දක්වා ඇත.

1. ඡන්දයෙන් අගතියට නො යෑම (න ඡන්‍දාගතිං ගච්ඡෙය්‍ය)
2. ද්වේෂයෙන් අගතියට නො යෑම (ජ දො දොසාගතිං ගච්ඡෙය්‍ය)
3. මෝහයෙන් අගතියට නො යෑම (න මෝහාගතිං ගච්ඡෙය්‍ය)

CamScanner

4. බියෙන් අගතියට නො යෑම (න භයාගතිං ගච්ඡෙය්‍ය)
5. තැන්පත් කළ නොකළ දෙය දැනගත යුතුයි(නිහිතානිහිතඤ්ච ජානෙය්‍ය)

යන මූලික සුදුසුකම් සම්පූර්ණ කළ භික්ෂුවක්, සංඝ සම්මතයෙන් පත් කර ගත යුතු ය. ඒ සඳහා සුදුසුකම් සහිත අය තෝරාපත් කර ගැනීමේ ඇති වැදගත්කම බුදුන් වහන්සේ අවබෝධ කරගෙන ක්‍රියා කළ බව මින් පැහැදිලි වේ.

සිවුරු පිළිගැනීමට භික්ෂුවක් හා තැන්පත් කිරීමට භික්ෂුවක් පත් කරනු ලැබුවත් ලැබුණු සිවුරු තැන්පත් කිරීම සඳහා භාණ්ඩාගාරයක් වශයෙන් වෙහෙරක, අඩ පියසි ගෙයක්, සිවුගස් ගෙයක්, සලු සහිත ගෙයක් හෝ ගුහාවක් භාවිත කරන්නට බුදුන් වහන්සේ අනුදැන වදාළ අතර, ඒ සඳහා "භාණ්ඩාගාරික" කෙනෙකු ද පත් කරනු ලැබීය.[106] එම තනතුරට පත්වීමේ දී සපුරා ලිය යුතු සුදුසුකම් ද දක්වා තිබෙන අතර, එය චීවර නිදහක තනතුර සඳහා අනුදැන වදාළ සුදුසුකම්වලින් මුල් හතර එලෙස ම තබා අවසාන සුදුසුකම වශයෙන් "න ගුත්තාගුත්තඤ්ච ජානෙය්‍ය" යනුවෙන් දක්වමින්, තමා රැකිය යුතු හා නො රැකිය යුතු දේවල් පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතු යැයි දක්වා ඇත. එම සුදුසුකම් සම්පූර්ණ කරන ලද භික්ෂුවක් සංඝ සම්මුතියෙන් තෝරා පත්කර ගත යුතු විය.

භාණ්ඩාගාරිකගේ වගකීම වූයේ භාණ්ඩාගාරය තුළ තිබෙන්නාවූ සිවුරු නිසි ලෙස තබා ගැනීමයි. ආරක්ෂා කිරීමයි. භාණ්ඩාගාරයේ සිවුරු විශාල ප්‍රමාණයක් තිබූ හෙයින්, එම සිවුරු බෙදා ගැනීමේ දී භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ කලහ ඉවත් කොට, නැවතත් එබඳු කළහ ඇති නො වන්නට "චීවරභාජක" හෙවත් සිවුරු බෙදාදීම සඳහා භික්ෂුවක් පත් කරනු ලැබීය. වැඩ බෙදීමේ මූලධර්මය ක්‍රියාත්මක කර ඇති බවට මෙය නිදසුනකි.

එම තනතුර සඳහා ද සපුරාලිය යුතු සුදුසුකම් පහක්[107] බුදුන් වහන්සේ පෙන්වා දී ඇති අතර, එයින් මුල් සුදුසුකම් හතර චීවර නිදහක තනතුරට අදාළ සුදුසුකම්වල මුල් හතර විය. "න



භාජිතා භාජිතඤ්ච ජානෙය්‍ය" යනුවෙන් දක්වමින්, "බෙදූ නො බෙදූ දෙය දැන ගත යුතුයි" යන්න අවසාන සුදුසුකම විය.

මෙම සුදුසුකම් සපුරාලන භික්ෂුවක්, සංඝ සම්මතයෙන් තෝරා පත් කර ගනු ලැබේ.

### චීවර භාජක හෙවත් සිවුරු බෙදන්නා තනතුරට අදාළ වගකීම්

1. සිවුරු තෝරා වටිනාකම අනුව කොටස් කර භික්ෂූන් ගණන් කොට පොදි බැඳ සිවුරු කොටස් තැබිය යුතු ය.
2. හෙරණුන්ට සිවුරු කොටස් භාගයක් දිය යුතු ය.
3. එතෙර වඩින භික්ෂූන්ට (ගමනට සූදානම් වූ භික්ෂුවට) කොටසෙහි වැඩි වටිනා ගණන වෙනුවට දිය යුතු කැප පිරිකර කල්හි වැඩි කොටසක් දිය යුතු ය. (අතිරේක භාගය දීම)
4. සිවුරු කොටස් බෙදීමේ දී (භික්ෂූන් හෝ සිවුරු අඩුනම්) කුසපත් ක්‍රමයට බෙදිය යුතු ය.[108]

බුදු සසුන ක්‍රියාත්මක වීමේ දී ඒ ඒ තනතුරු සඳහා සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ දී තිබිය යුතු සුදුසුකම් හා ඒ ඒ තනතුරුවට අදාළ වගකීම් හා කාර්යභාරයන් ද දක්වා තිබෙන හෙයින් සංවිධාන සැලැස්මකට අනුව සිදුව ඇති බව නිගමනය කළ හැකි ය.

## 3.6 භික්ෂූන් වහන්සේලා මෙහෙය වීම

බුදුන් වහන්සේ සිය භික්ෂු සංවිධානය කළමනාකරණය කිරීමේ දී, තම ශ්‍රාවකයන් මනා ලෙස මෙහෙයවීම ද සිදුකර ඇති බව පැහැදිලි ය. බුදුන් ව67හන්සේගේ නායකත්වය, සන්නිවේදනය හා අභිප්‍රේරණ ක්‍රම ඒ සඳහා බලපා ඇත.

### 3.6.1 බුදුන් වහන්සේගේ නායකත්වය

ඕනෑම සංවිධානයක ආයතනයක කළමනාකරණ ක්‍රියාවලියේ දී සාර්ථක හෝ අසාර්ථක බව රඳා පවතිනුයේ එහි නායකත්වය මත ය. නායකත්වයෙහි ද විශේෂත්වය වනුයේ, තම සංවිධානය පරමාර්ථයන්ට අනුකූලව පවත්වා ගෙන යාමට අවශ්‍ය තීරණ ගැනීමේ දී මෘදු (නම්‍යශීලි) ස්වරූපයක් අනුගමනය කිරීමත්, ගත් තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ඍජු (අනම්‍යශීලි) ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් ය. ඒ අනුව බුදුන් වහන්සේ සසුන සැකසීමේ දී අත්තනෝමතික ලෙස සකස් කිරීමට උත්සාහ නො කළහ. බහුජන මතයට කන්දෙමින් සිදුකළ බව, එතෙක් නීතියක් ව නො පැවති දෙමවුපියන්ගෙන් අවසරයක් නො ගෙන මහණ නො කරන ලෙසට ශුද්ධෝදන රජුගේ ඉල්ලීමත්,[109] මහණ කිරීමේ දී තමන් වහන්සේ වෙත තිබූ බලය විමධ්‍යගත කිරීමත්,"[110] සැලකිය හැකි ය.

නායකත්වයෙහි ලක්ෂණයක් විය යුත්තේ තමන් දැඩි ස්ථාවරයක නො සිට තම සාමාජිකයන් පාලනය කිරීම යි. ආරම්භයේ සිට වසර විස්සක් යනතුරු බුදු සසුනට නීති අවශ්‍ය නොවීය. එහෙත්, භික්ෂු සංවිධානය සංකීර්ණවත් ම බුදුරදුන් විනය පැනවීම සිදුකරනු ලැබුයේ ඒ සඳහා ගැටලු මතුවූ අවස්ථාවලදී ය.[111] ඒවා ක්‍රියාත්මක කිරීමේ දී තම ඥාති මිත්‍රාදීන්ටත්, සෙසු භික්ෂූන් වහන්සේලාටත් එකසේ බලපාන පරිදි ක්‍රියාවට නැංවූ බව, ඡන්න භික්ෂුවට බ්‍රහ්ම දණ්ඩනය පැනවීමට[112] තීරණය කිරීමෙන් අවබෝධ වෙයි. සංවිධානයක් තම සංවිධානයේ අරමුණු මුදුන් පමුණුවා ගත හැකි වන ආකාරයට, සිය සාමාජිකයන් මෙහෙයවීම සඳහා පාලන ක්‍රම හඳුන්වා දී ඇත. බුදුන් වහන්සේ ද තම සංවිධානයෙහි පැවැත්ම උදෙසා විනය නීති හඳුන්වා දුන්හ.[113] එම ප්‍රඥප්තීන් "වෙනස් කළ නොහැකියි" යන පරමාර්ථයක් බුදුන් වහන්සේ තුළ නොතිබිණි. භික්ෂුවක් තම පරිහරණය සඳහා උපයෝගී කොට ගත යුත්තේ එක් චීවරයක් පමණි. එය ද පාංශුකූල චීවරය ලෙස හැඳින්විණි.[114] වස් විසීම මුල් කොට ගෙන, අතිරේක සිවුරක් භික්ෂුවට තබා ගන්නට අවස්ථාව ලබා දීම,[115] ආර්ථික හා සමාජ තත්ත්වය හමුවේ නීති රීති වෙනස් කළ යුතු බව සඳහන් වන



උදාහරණයකි. බුදුන් වහන්සේ විනය නීතිවලට අනුප්‍රඥප්තීන්[116] ද පනවා ඇති බව ගණභෝජනය සත්වරක් ම සංශෝධනය කිරීමෙන් පැහැදිලි ය.

විචාර පූර්වක ආකල්පය ද බුදුරදුන්ගේ නායකත්වය තුළ දක්නට ලැබෙන්නකි. මජ්ඣිම නිකායේ කාලාම සූත්‍රයෙහි[117] දැක්වෙන ආකාරයට "පරම්පාවෙන් ආ නිසාවත්, තර්කය නිසාවත්, බොහෝ දෙනා කියන නිසාවත්, පිළිනොගන්නා ලෙසත්, තමාගේ බුද්ධියට, තර්කයට ගැළපේ නම් පමණක් පිළිගන්නටත්" අවස්ථාව සලසා දී තිබේ. ඒ බව තවදුරටත් සනාථ කරමින් මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි[118] ද බුදුන් වහන්සේ කියූ නිසාවත් පිළිනොගන්නා ලෙසට" අවවාද කොට ඇත. මෙතුළින් ද පැහැදිලි වනුයේ බුදුන් වහන්සේ තුළ පැවති විශිෂ්ට නායකත්වයයි.

ක්‍රි. පූ. 6 වන සියවස වනවිට භාරතයේ ජනප්‍රියව පැවති අන්‍ය ආගම් විෂයෙහි සුහදශීලි, සහයෝගයෙන් කටයුතු කරන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ද බුදුන් වහන්සේ තුළ දක්නට ලැබුණි. නිගණ්ඨනාථපුත්තගේ ශිෂ්‍යවරයෙකු හා දායකයෙකු වූ උපාලි ගෘහපතියා[120]කර්මය පිළිබඳව වාද කිරීම සඳහා පැමිණ අවසානයේ බුදු සසුනෙහි පැවිද්ද ඉල්ලූ අවස්ථාවේ දී එයට අවසර දෙනු ලැබුවේ පෙර ගුරුවරයාට පෙර පරිදිම උවටැන් කිරීමේ පොරොන්දුව මත ය.

### 3.6.2 සන්නිවේදනය

කිසියම් සංවිධානයක් තම අරමුණුගත ව ක්‍රියාත්මක වීමේ දී සන්නිවේදනය හෙවත් තොරතුරු බෙදා හැරීම විධිමත් ලෙස පවත්වා ගෙන යා යුතුය. බුදුන් වහන්සේ තම සංවිධානයෙහි පණිවුඩය, අන්‍ය ජනයාට බෙදා හැරීම සඳහා ප්‍රධානතම සාධකය බවට පත් කර ගත්තේ ශ්‍රාවක සමාජයයි.[121] ගම්, නියම්ගම්හි වෙසෙන ජනතාවට එකී දහම ව්‍යාප්ත කිරීමේ දී භික්ෂූන් වහන්සේලා තුළ අල්පේච්ඡ ගුණය හා ප්‍රසන්න ගුණය වඩාත් වැදගත් වන බව, ධම්මචේතිය සූත්‍රයෙන්[122] දක්වා ඇත.

CS CamScanner

නායකයෙකු ලෙස ධර්මය ව්‍යාප්ත කිරීමේ දී, බුදුන් වහන්සේ පුද්ගලයන්ගේ මානසික මට්ටම අවබෝධ කරගෙන ඒ ඒ බුද්ධි මට්ටමට ගැළපෙන ලෙස ධර්මය දේශනා කළහ. එහි දී ධර්ම දේශනා ක්‍රම හතරක් උපයෝගී කරගෙන ඇත.

එනම්,

1. ඒකංසව්‍යාකරණ ක්‍රමය
2. විභජ්ජ ක්‍රමය
3. පටිපුච්ඡා ක්‍රමය
4. ඨපනීය ක්‍රමය යනුවෙනි.[123]

යමක් එක්වරම අවබෝධ කරගත හැකි මානසික මට්ටමක් ඇති පුද්ගලයන් සඳහා ධර්මය අවබෝධ කිරීමේ දී ඒකංසව්‍යාකරණ ක්‍රමයෙන් ධර්ම දේශනා කරනු ලැබූ අතර, කොණ්ඩඤ්ඤ බමුණා එසේ එක්වරම ධර්මය අවබෝධ කරගත් තැනැත්තෙකි. ධර්මය කොටස් කර, දේශනා කිරීම "විභජ්ජ ක්‍රමය" ලෙස හැඳින්වෙන අතර, සිඟාලෝවාද සූත්‍රය,[124] ව්‍යග්ඝපජ්ජ සූත්‍රය,[125] සතර සතිපට්ඨාන සූත්‍රය එම ක්‍රමය උපයෝගී කරගෙන දේශනා කරන ලද සූත්‍රයන් ය. ධර්මය ශ්‍රවණය කරනු ලබන්නාගෙන් ප්‍රශ්න අසමින්, ඔහුත් සමග වාද විවාද පවත්වමින් ධර්මය දේශනා කිරීම පටිපුච්ඡ ක්‍රමය වේ. උත්තර ආජීවකයාගේ පාරිසරික බමුණාට ඉන්ද්‍රිය භාවනාව සූත්‍රය[126] දේශනා කරනු ලැබුවේ මෙම දේශන ක්‍රමය මගිනි. කර්මය, පුනරුත්පත්තිය, විශ්වයේ ආරම්භය හා විනාශය කවදා ද? යන්න පිළිබඳ ගැටලුවලදී බුදුන් වහන්සේ පිළිතුරුදීමෙන් වැළකී (ඨපනීය ක්‍රමය) සිටියහ.

පණිවුඩයක් ග්‍රාහකයා වෙත රැගෙන යාමේ දී කථන මාධ්‍යය තුළ අංග අටක් තිබිය යුතු ය. ඒවා නම්, විස්සට්ඨි, (සිඳුණු බව) මඤ්ජු, (මිහිරි බව) වීඤ්ඤෙය්‍ය (පහසුවෙන් වැටහෙන බව), සවනිය (ඇසීමෙන් රුචිය ඇති කිරීම) අවිසාරි (පැහැදිලි බව) බින්දු (ඒකමතික ස්වරූපය) ගම්භීර (ගැඹුරු බව) නින්නාද (සෑම ප්‍රදේශයක් කරා ම ව්‍යාප්ත වීම) යනුවෙනි. බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් එකක් වන "මධුරස්වරය" තුළ මෙම ලක්ෂණයන් අඩංගු වේ.



ශ්‍රාවකයා තමා වෙත යොමු කර ගැනීමේ දී වඩා හොඳ සන්නිවේදනයක් වනුයේ, ග්‍රාහක ස්වභාවය තේරුම් ගැනීම යි. එවිට ශ්‍රාවකයා තමාට ඇහුම්කන් දෙන තැනැත්තෙකු බවට පත් වේ.

මජ්ඣිම නිකායේ චංකි සූත්‍රයෙහි[127] ඒ සඳහා අනුගමනය කළ යුතු පියවර දහතුනක් දක්වා ඇත. එනම්, සොයා බැලීම, (සමන්නේසන) පැහැදීම, (ශ්‍රද්ධාව) එළැඹීම (උපසංකමති) සේවන කිරීම, (පයුරුපාසති) කන් යොමු කිරීම, (සොතං ඔදහති) ධර්මය ශ්‍රවණය කිරීම (ධම්මං සුනාති) දරා ගැනීම, (ධාරෙති) අර්ථය පරීක්ෂා කිරීම, (අත්ථං උපපරික්ඛති) ධර්මය වැටහීම, (ධම්මං නිජ්ජාන ඛමන්ති) කුසල් කිරීමේ කැමැත්ත, (ඡන්දෝජායති) උත්සාහය(උස්සහති), තුලනය කිරීම (තුලයති), වීර්ය කිරීම (පදහති) යනුවෙනි.

උපමා යොදා ගැනීම බුදුන් වහන්සේගේ සන්නිවේදනයේ ලක්ෂණයක් වන අතර, කළමනාකරණයේ දී යොදා ගෙන මූලධර්මවලට අනුව බුදුන් වහන්සේ ක්‍රියා කර ඇති බව මින් මනාව පැහැදිලි ය.

### 3.6.3 ශ්‍රාවක අභිප්‍රේරණය

තම අනුගාමිකයන් ස්වකීය අරමුණු සඳහා පෙළඹවීමට ද බුදුන් වහන්සේ විවිධ උපක්‍රම යොදා ඇත. ප්‍රශංසාත්මක ලෙස කතා කිරීම, බලතල හා තනතුරු ප්‍රදානය, මෙහිදී විශේෂ වේ. නායකයෙකු ලෙස ක්‍රියාකිරීමේ දී ස්වකීය අරමුණු කරා ළංවන අනුගාමිකයන්ට ප්‍රශංසා කිරීම වැදගත් ය. "කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් චතුරාර්ය සත්‍ය ධර්මය දක්තේ ය''[128] යනුවෙන් ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළහ.බුදුන් වහන්සේ සිය අනුගාමිකයන්ගේ තතු හෙළි කරන්නේ, "ජනයා විස්මයට පත් කරනු පිණිස නොවේ, ජනයා නළවනු පිණිස ද නොවේ. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පිණිස ද නොවේ. ජනයා මා මේ අයුරින් දැන ගනීවා යන අභිප්‍රායකින් ද නොවේ.[129] මෙහිදී අරමුණ වනුයේ, තම තමන් ද ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ සිහිකරමින් ඒ තත්ත්වවලට පත්වීමට සිත එළවීම

CamScanner

කළයුතු බව ය. එකී අවශ්‍යතාව සලකා බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ ගුණ හෙළි කරති. සිවුවණක් පිරිසෙහි සුදුසුකම් ඇති අය සඳහා තනතුරු ප්‍රදානය කිරීම ද සසුනෙහි ශ්‍රාවක අභිප්‍රේරණය කළ බවට සාධකයකි.

## 3.7 බුද්ධ කාලීන භික්ෂු පාලනය

තථාගතයන් වහන්සේ තම පැවිදි ශ්‍රාවක පිරිස සංඛ්‍යාත්මක වශයෙන් වර්ධනයට පත්වීමත් සමග එය ස්වාධීනව සංවිධානය කිරීම සඳහා භික්ෂු පිරිසට ම අවස්ථාව සලසා දුන්හ. එහිදී උන් වහන්සේ භික්ෂූන්ට තම සමාජය තුළ ම ස්වයං පාලනය සඳහාත්, නායකත්වය සඳහාත් ප්‍රධානත්වය පැවරූහ. ආරම්භයේ දි භික්ෂූන් වහන්සේලා පාලනය කරනු ලැබුවේ ස්වයං ශික්ෂණය මගිනි. "තමාට පිහිට තමාම ය, වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල්හි දුර්ලභ වූ පිහිටක් ලබන්නේය." යනුවෙන් ධම්ම පදයෙහි[130] දක්වා ඇති අතර, තමාට තමා ම පිහිට කොට සරණ කොට වාසය කරන ලෙස මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි ද දක්වා ඇත.[131] තම තමන් විසින් ම කැමැත්තෙන් ඇති කරගත් සංවරය තුළින්, තමාගේ සිත, කය හා වචනය පාලනය කර ගත යුතු බව මෙයින් අවධාරණය කොට තිබේ. චූලගෝසිංහ සූත්‍රයේ දැක්වෙන පරිදි,[132] බුදුන් වහන්සේ සහ අනුරුද්ධ හිමියන් අතර ඇති වූ සාකච්ඡාවේ දී භික්ෂූන් වහන්සේලා සමගියෙන් වාසය කරන බව දක්වා ඇත. භික්ෂු සංස්ථාව තුළ ගැටලුවක් මතු වූ අවස්ථාවක එය විසඳා ගත යුතු ආකාරය, කෝසම්බි සූත්‍රයෙන්[133] පැහැදිලි කර දී ඇත. සාමූහික භික්ෂු ජීවිතයත්, ප්‍රීතිමත් සැහැල්ලු සමගි සම්පන්න ප්‍රබෝධමත් ජීවිතයක් ගත කළේ ද යන්නත්, ස්වං පාලනයත් මැනවින් සිදු වූ බවත් පැහැදිලි වේ.

භික්ෂු සංස්ථාව පාලනය කිරීමේ දී බුදුන් වහන්සේ ඒකාධිපති හා ආඥාදායක ශාස්තෘවරයෙක් ලෙස ක්‍රියා නො කළහ. වරක් ආනන්ද හිමියන් බුදුරදුන් අමතා, භික්ෂු සංඝයා පාලනය කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ දී, තමන් වහන්සේ උදෙසා ම භික්ෂූන් ක්‍රියා නො කළ යුතු බවත්, භික්ෂූන් පාලනය කිරීමට තමන් වහන්සේ බලාපොරොත්තු නො වන බවත්, "අහං භික්ඛුසංඝං



පරිහරිස්සාමීති" වා මමුද්දෙසිතො භික්ඛු සංඝොති වා" යනුවෙන් මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි[134] දක්වා ඇත.

"නානාහි ඛො නො භන්තෙ කායා එකංච පන මඤ්ඤෙ චිත්තන්ති" සමග්ගා සම්මෝදමානා...... යනුයෙන්, ස්වාමිනි, අපි කයින් වෙන් වෙන් වූවෝ වුව ද, සිතින් දුක්වෙන්නෝ වෙමු. කිරි හා දිය මෙන් මුසු වී එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලමින් වාද විවාද රහිතව එකට නැගී වාසය කරමු.[135] බුද්ධ කාලීන භික්ෂූන් වහන්සේලා ස්වයං පාලනයක යෙදී සිටි බව දසධම්ම සූත්‍රයෙන් ද පැහැදිලි වේ. මේ අනුව, බුදුන් වහන්සේ තම සංවිධානයෙහි පාලනය සඳහා උපයෝගී කොට ගෙන ඇත්තේ ස්වයං පාලනයක් හා සාමූහික පාලන ක්‍රමයක් බව පැහැදිලි ය.

එනමුත්, පසුකාලීනව විවිධ පරමාර්ථයන්ගෙන් යුත් පිරිස සසුනට ඇතුළුවීම නිසා භික්ෂු සංවිධානය පාලනය කිරීම උදෙසා විනය නීති හඳුන්වා දෙනු ලැබූ අතර,[136] එම නීති ප්‍රජාතන්ත්‍රවාදීව ද සකස් කොට ඇත.[137]

බුදුන් වහන්සේ සංඝයාගේ නායකයා වුවද නායකයාගේ බලතල පාවිච්චි නො කළහ. ඒ සඳහා බලය ලබා දී තිබුණේ භික්ෂුව වෙනම ය.

විනය යනු හික්මවීමේ මගයි.[138] එය කාය විඥප්තියෙන් හා වාග් විඥප්තියෙන් සිදුවන වැරදිවලින් වැළකීම ලෙස ද[139] අර්ථකථනය කළ හැකිය. විනය යනු පරමාර්ථ සත්‍යයක් නොවේ. එහි මූලික පරමාර්ථය වනුයේ, කිසියම් වූ සමාජයක ඇති වන ගැටලු අවම කර ගැනීමට හා ඇති වූ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති සමූහයක් පමණි. භික්ෂු විනය තුළ අඩංගු වනුයේ, බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට නො කළයුතු යැයි පෙන්වා දුන් දේවල්ය. මෙමගින් භික්ෂු සමාජ සංවිධානයෙහි, අපේක්ෂිත අරමුණුවලින් වෙනස් නොකර එය මැනවින් පාලනය කිරීම සඳහා සැකසුණු සම්මුතියක් ලෙස විනය සැලකිය හැකිය. ස්වකීය ශ්‍රාවකයන් අරමුණු කරා මෙහෙයවීමට හා භික්ෂු පාරිශුද්ධිය ඇති කිරීම උදෙසා බුදුන් වහන්සේ පනවා වදාළ විනය ප්‍රධාන කොටස් දෙකකින් යුක්තය.

CamScanner

1. ආදි බ්‍රහ්මචරියක සික්ඛා පද
2. ආභි සමාචාරික සික්ඛා පද යනුවෙනි.

භික්ෂු සමාජය වූ කලී, විමුක්තිය පරමාර්ථ කර ගැනීම හා එකී විමුක්තිය අන්‍යයන්ට ලබාදීම උදෙසා ක්‍රියාකළ සංවිධානයකි. විමුක්තිය අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේලා තුළ තිබිය යුතු විනය, "ආදි බ්‍රහ්මචරියක සික්ඛා පද" යනුවෙන් හැඳින්වෙන අතර, භික්ෂූන් වහන්සේලා සංස්ථාවක් ලෙස ක්‍රියා කිරීමේ දී ගෞරවය හා කීර්තිය ආරක්ෂා වන පරිදි සකස් විය යුතු විනය, "ආභි සමාචාරික විනය" යනුවෙන් ද හැඳින්වේ.

බුද්ධ විනය තත් කාලීන සමාජයේ පැවති නීති බව පෙට්‍රික් ඔලිවෙල්ලෙ පවසයි.[141] අන්‍ය ශ්‍රමණ සංස්ථාවන් අධ්‍යයනය කරන විට "විනය" ඔවුන් තුළ ද අන්තර්ගත ව පැවතිණි.[142] පාරභෞතික චින්තනයක් වූ, උපනිෂද් දර්ශනය තුළ ද සදාචාරයක් ගොඩ නැගීම උදෙසා, "සත්‍යම් වද" හෙවත් "සත්‍ය කතා කරව" "ධර්මංචර" "ධර්මයෙහි හැසිරෙව" යන ඉගැන්වීම් පැවත තිබිණි.[143] ශික්ෂණය හෙවත් හික්ම වීම නම් වූ සංකල්පය, සංඛ්‍ය, යෝග හා ජෛන චින්තාවන් ඔස්සේ පැමිණ, එය විශිෂ්ට ස්ථානයක් බුදු දහම තුළ ගනු ලැබී ය.

එසේ ම ඔවුන්ගේ දුර්වලකම්, ඌනපූරණතා අවබෝධ කරගෙන, එයින් භික්ෂු සංස්ථාව වෙන් කිරීම සඳහාත්, විනය නීති සකස් කළ බව, සේඛියා හැත්තෑ පහ(75) තුළින් පැහැදිලි වේ. බුදුන් වහන්සේ, ශ්‍රාවක පිරිස මැනවින් පාලනය කිරීම උදෙසා විනය හඳුන්වා දීමට බලපෑ සාධක පාරාජිකාපාලියෙහි[144] දැක්වේ. භික්ෂු සංස්ථාව විධිමත් කළමනාකාරිත්වයකින් පවත්වාගෙන යාමට බුදුන් වහන්සේට අවශ්‍ය ව තිබූ බව, මෙයින් පැහැදිලි ය.

භික්ෂු සංවිධානයෙහි, භික්ෂූන් වහන්සේලා පාලනය කිරීම උදෙසා පනවන ලද විනය එක්වරම පනවන ලද්දක් නොවේ.[145] බුද්ධ කාලයෙහි විනය නීති එකසිය පනහක් (150) පමණක් තිබූ බව සුකුමාර් දත් පවසයි.[146] අංගුත්තර නිකායේ සමණ වග්ගයෙහි[147] එම සූත්‍රය, බුදුන් වහන්සේගේ විනය පැනවීමෙහි අවසානය



වශයෙන් දක්වා නොමැත. ඒ වන විට නීති එකසිය පනහක් (150) තිබෙන්නට ඇති අතර බුදුන් වහන්සේගේ කාලයෙහි ම ඒවා විනය නීති 220ක් බවට සංවර්ධනය වූවකි. මෙලෙස සංඝ සංස්ථාවෙහි ශික්ෂා පද බහුල වන්නට බල පෑ හේතුවක් ලෙස බුදුන් වහන්සේ දක්වා ඇත්තේ, "සත්තේසු හයාමානෙසු සද්ධම්ම අන්තරධායමානෙ"[148] යනුවෙන්, භික්ෂූන්ගේ පිරිහීමත්, ඔවුන් කෙරෙහි සද්ධර්මය අතුරුදන් වීමත් ය. සසුන මැනවින් පාලනය කිරීම උදෙසා උපයෝගී කොට ගත් විනය නීති දෙසිය විස්සක් (220)[149] දක්නට ලැබේ.

"සංඝ කර්ම" උපයෝගී කොට ගත්තේ ද භික්ෂූන් පාලනය සිදු කිරීමට ය. ගණපූරණය සහිතව නිශ්චිත ස්ථානයක දී රැස්වෙන මෙම සංඝ සභාවන්, සංඝ කර්ම ලෙස හැඳින්වේ. පනවන ලද විනය නීති ක්‍රියාත්මක කිරීමේ වගකීම භික්ෂූන් වහන්සේලා වෙත ම පවරන ලදී.[150] මෙය ක්‍රියාත්මක වනුයේ ප්‍රාදේශීය වශයෙන් භික්ෂූන් වහන්සේලා රැස්වීමෙනි. සංඝ සභාව විසින් සිදු කරනු ලබන සංඝ කර්ම අතර, භණ්ඩු කර්ම, අපලෝකන කම්ම, ඤත්ති දුතිය කම්ම හා ඤත්ති චතුත්ත කම්ම යනුවෙන් වර්ග කළ හැකි ය. යම් භික්ෂුවක් භික්ෂු ප්‍රතිරූපයට හානි වන ආකාරයට ක්‍රියා කොට ඇත්නම් එබඳු භික්ෂූන්ට දඬුවම් ලබා දීම සඳහා සතර අධිකරණයක්[151] ද හඳුන්වා දී තිබේ.

බුදුන් වහන්සේ දඬුවම් ක්‍රම[152] හඳුන්වා දෙමින්, එමගින් භික්ෂූන් වහන්සේලා පාලනය කිරීමට ක්‍රියා කළහ.

එම දඬුවම් ක්‍රම නම්:

1. තජ්ජනිය කම්ම
2. නියස්ස කම්ම
3. පබ්බාජනිය කම්ම
4. පාටිසරණිය කම්ම
5. ආපත්තිය අදස්සනෙ උක්ඛේපනිය කම්ම
6. ආපත්ති අප්පටිකම්මෙ උක්ඛේපනිය කම්ම යනුවෙනි.

මෙසේ බුදුන් වහන්සේ ස්වකීය අනුගාමිකයන් පාලනය කිරීම සඳහාත්, මැනවින් සකස් කිරීම සඳහාත්, විනය මෙන් ම විනය නීති ද හඳුන්වා දීම, සාර්ථක කළමනාකරණයක ලක්ෂණයක් ලෙස සැලකිය හැකි ය.

බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් සංවිධානයක් ලෙස සකස් කිරීමේ දී අරමුණුගත සැලසුම්කරණයක් හා ඒ අනුව සැකැසුණු පාලනයකින් යුක්තව විධිමත් සංවිධානකරණයක් හා මෙහෙයවීමකින් යුක්තව සිදුකර ඇති බව පැහැදිලි ය. කිසියම් සංවිධානයක් හෝ ආයතනයක් දීර්ඝ කාලයක් තිස්සේ පවතින්නට නම් ඒ සඳහා සාර්ථක කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ම ය. එබැවින් පොදු ක්‍රියාවලියක් වූ කළමනාකරණය ක්‍රි. පූ. 6 වන සියවස තුළ ද ක්‍රියාත්මක වූ බව බුද්ධ ශ්‍රමණ සංස්ථාව මැනවින් සකස් කිරීම තුළින් පැහැදිලි වන බව ද නිගමනය කළ හැකි ය.



## ආන්තික සටහන්

1 ම. පා.1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 25 පි.
2 ම. පා.1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 42 පි.
3 දී. නි., මහාපදාන සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1976, 49 පි.
4 ම. නි., කකචූපම සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1974, 316 පි.
5 දී. නි., සාමඤ්ඤඵල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1974, 110පි.
6 සු. නි., පබ්බජ්ජා සූත්‍රය, සංස්කරණය තොටගමුවේ විමලඥානතිස්ස හිමි, ප්‍රකාශක, ජේ. ඩී. ප්‍රනාන්දු, 1924, 408 පි.
7 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 189 පි.
8 පාරා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 22 - 36 පිටු.
සඞ්ඝො රත්තඤ්ඤු මහත්තං පත්තො හොති- භික්ෂු ශාසනයට බොහෝ කල් ගතවීම
සඞ්ඝො වෙපුල් මහත්තං පත්තො හොති- භික්ෂු සමාජය පිරිස වශයෙන් මහත් බවට, විපුලත්වයට පත්වීම
සඞ්ඝො ලාභග්ග මහත්තං පත්තො හොති- භික්ෂු සමාජයෙහි පිරිස අතර, ලාභයට ගිජුවන්නන්ගේ පිරිස වැඩි වීම
සඞ්ඝො බාහුසච්ච මහත්තං පත්තො හොති- භික්ෂු සමාජය තුළ බහුශ්‍රැතයන් බහුල වීම
9 ම.නි., 11 භද්දාලි සූත්‍රය., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1964,
සඞ්ඝො රත්තඤ්ඤු මහත්තං පත්තො හොති- භික්ෂු ශාසනයට බොහෝ කල් ගතවීම
සඞ්ඝො වෙපුල් මහත්තං පත්තො හොති- භික්ෂු සමාජය පිරිස වශයෙන් මහත් බවට, විපුලත්වයට පත්වීම
සඞ්ඝො යසග්ගං පත්තො හොති- භික්ෂු පිරිසට යසස වැඩිවීම
සඞ්ඝො ලාභග්ග මහත්තං පත්තො හොති- භික්ෂු සමාජයෙහි පිරිස අතර, ලාභයට ගිජුවන්නන්ගේ පිරිස වැඩි වීම
සඞ්ඝො බාහුසච්ච මහත්තං පත්තො හොති- භික්ෂු සමාජය තුළ බහුශ්‍රැතයන් බහුල වීම
10 පා.පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 48 පි.
(සංඝසුට්ඨුතාය - සංඝයාගේ හිතසුව පිණිස,
සංඝ ඵාසුතාය - සංඝයාගේ පහසු විහරණය පිණිස,
දුම්මංකූනංපුග්ගලානං නිග්ගහාය - දුසිල් භික්ෂූන්ට නිග්‍රහ පිණිස, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය - ප්‍රියශීලි භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය - මෙලොවදී පැමිණෙන දුක් නැසීම පිණිස, අප්පසන්නානං පසාදාය - නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස, පසන්නානං භියොභාවාය - පැහැදුනවුන්ගේ පැහැදීම දියුණු කරනු පිණිස, සද්ධම්මට්ඨිතියාය - සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස, විනයානුග්ගහාය - විනයට අනුග්‍රහ පිණිස ය) යනුවෙනි.
11 පාරා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 22-35 පිටු.
12 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 189 පි.
13 - එම - 181 පි.

ned with CamScanner
CS CamScanner

14 - එම - 183 පි.
15 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 189 පි.
16 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 73 පි.
17 - එම - 189 පි.
18 පා.පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 48 පි., 462 පි.
19 - එම - 592 පි.
20 - එම - 592 පි.
21 ම.නි.කකචූපම සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1964, 310 පි.
22 පාරා.පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 29-10 පිටු.
23 - එම - 256 පි.
24 - එම - 503 පි.
25 - එම - 595 පි.
26 - එම - 639 පි.
27 - එම - 596 පි.
28 - එම - 503 පි.
29 අ. නි., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 82 පි.
30 දී. නි., බ්‍රහ්මජාල සූත්‍රය., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 57 - 81 පි.
31 Patterson, Patrick., The Orgin and the Early Development of Buddhist Manachism, M. D. Gunasena, Colombo 12, 1974, 35 P.
32 Wintemitz, M., A History of Indian Liercture, Vol II, University of Culcutta, India, 1959, 75 P.
33 අ. නි., 111, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 371 පි.
34 අ. නි., 111, බු. ජ. ත්‍රි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 136 පි.
35 සු. නි., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 292 පි.
36 අ. නි., උපාලි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 124 පි.
37 දී. නි., බ්‍රහ්මජාල සූත්‍රය., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බු. ජ. ත්‍රි. 1962, 57 - 81 පි.
38 Ghosal, U. N., A History of Hindu Pablic Life, Part 1. 2 P.
39 Barnett, Antiquities of India, 173 P.
40 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 31 පි.
41 - එම - 37 පි.
42 - එම - 41 සිට 48 පිටු
43 පාරා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 44 පි.
44 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 42 පි.
45 - එම -
46 - එම - 242 පි.
47 ම. පා., වස්සූපනායිකක්ඛන්ධකය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 346 පි.
48 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 207 පි.
49 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 183 පි.
50 - එම - 181 පි.
51 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1956, 596 පි.
52 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 260, 288, 289 පි.



53 "ආකංඛමානො ආනන්ද සංඝො මමච්චයෙන ඛුද්දානුඛුද්දකානි සික්ඛාපදානි සමූහන්තු" දී. නි. 11, මහාපරිනිබ්බාන සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 55 පිටුව., විලේඛන සික්ඛාපද, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1981, 384 පි.
54 Sharma, R. K., and Shashik Gupta, Industrial Organization and Management, Culcutta, 1988, 367 P.
55 අ. නි., මෙත්ත වග්ගය, පළමුවැනි ප්‍රිය සූත්‍රය, (පස්වන භාගය) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 13 පි.
56 අ.නි., දුතිය පණ්ණාසකය, ගොතමී වගගය, භික්ඛු සූත්‍රය, (පස්වන භාගය) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 253 පි.
1. මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි.
2. සමාදන් කොට ගෙන සික පදයන්හි හික්මෙයි.
3. බහුශ්‍රැත වෙයි.
4. ප්‍රඥාවෙන් යුක්ත වෙයි.
5. කල්‍යාණයට නැඹුරු වූයෙන්, කල්‍යාණ මිත්‍ර වෙයි.
6. සම්‍යක්දෘෂ්ටික වෙයි.
7. සුබ විහරණය ඇති අධිචිත්තයෙහි උපන් සිවුදැහැන් කැමති සේ ලබන සුලු වූයේ විපුලයේ ලබන සුලු වූයේ වෙයි.
8. අනේකවිධ වූ පූර්වනිවාසය සිහි කරන්නේය යනුයි.
57 අ. නි., දුතිය පණ්ණාසකය, ගොතමී වගගය, අලං සූත්‍රය, (පස්වන භාගය) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 263 පි.
58 අ. නි. දසක නිපාතය,දසධම්ම සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,
1."වෙවණ්ණියම්හි අජ්ඣුපගතෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (මම විවිවර්ණ භාවයට පැමිණියෙක් මි. අප බාහිර අලංකාරයෙන් ඈත් වී ස්වභාවික රූපයෙන් මිදුණු විරූප භාවයක් ඇත්තෙමි.)
2. "පරපටිබද්ධා මෙ ජිවිකාති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (මගේ මේ ජීවිකාව අනුන්ට අයත් වූවෙකි. සිව්පසය ලබා දෙන්නේ දායකකාරකාදීන් බව නිතර සිහි කළ යුතු ය.)
3."අඤ්ඤො මේ ආකප්පෝ කරණියෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (මා විසින් අන්‍ය වූ ආකල්පයක් කටයුතු යැයි නිතර නිතර භික්ෂුව සිහි කළ යුතු ය. එනම් ගිහි චර්යාවන්ට බොහෝ සෙයින් වෙනස් වූ පැවිද්දටම සීමා වූ සන්සුන් ඉඳුරන් ඇතිව යහපත් අනුදමින් ඉරියව් පැවතිමයි.)

4.."කච්චිනු බෝ මෙ අත්තා සීලතෝ න උපවදතීති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං." (ස්වකීය සීලය පිළිබඳව තමන්ගේ සිතේම යම් උපවාදයක් වැරදි වැටහීමක් ඇති වීමට ඉඩක් නැත්තේ දැයි සලකා බැලීම)
5."කච්චිනු බෝ මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතෝ න උපවදන්තීති පබ්බජිතේන අභිනහං පච්චවෙක්ඛිතබ්බං" (බුද්ධිමත් භික්ෂූන් වහන්සේ තමා ගැන සිතා නින්දා පරිභව කෙරේ ද යන්න විමසා බැලිය යුතු ය. භික්ෂූන් සුලු වරදින් පවා වෙන්වීමට උත්සාහ දැරිය යුතු ය. තුන්දොර

with CamScanner
CS CamScanner

පිරිසිදු කර ගැනීමට මෙයින් උපදෙස් ලැබේ.
6. "සබ්බේහි මෙ පියේහි මනාපේහි නානා භාවෝ විනා භාවෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (ලෝකය මනස්කාන්ත වූ විචිත්‍ර වූ තැනකි. භික්ෂූන් වහන්සේලා ලෝකය දෙස බැලිය යුත්තේ බාහිර විචිත්‍රත්වය පදනම් කොට ගෙන නොවේ. ඊට යටින් දිවෙන්නා වූ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය පදනම් කරගෙන ය.)
7. "කම්මස්සකෝම්හි කම්මදායාදයෝ කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණෝ යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමි' ති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (අනිෂ්ට ප්‍රතිඵල අත්විඳින්නට සිදුවෙන බව සිතන භික්ෂුව ආධ්‍යාත්මය පිරිසිදු කර ගනියි.)
8. "කථම්භූතස්ස මෙ රත්තින්දිවා වීතිපතන්තීති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (තමා තුළ පවතින ගුණ දොස් හරි වැරදි තමා විසින් ම විවේචනයට බඳුන් කරමින් අප්‍රමාදිව නිවැරදි මාවතකට අවතීර්ණ වීමට උත්සාහ ගත යුතු ය.)
9. "කච්චිනු බෝ හං සුඤ්ඤාගාරේ අභිරමාමීති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (භික්ෂුව තමා විවේකී ජීවිතයට ඇලුම් කරන්නේදැයි නිරන්තරයෙන් සිහි කළ යුතු ය. එහි දී විදර්ශනාවට නැඹුරු වූ භික්ෂුවක් නම් ජනයාගෙන් තොර වූ ශූන්‍ය ස්ථානයක, රුක්මුලක, වන සෙනසුනක කාය චිත්ත විවේකයෙන් ස්වකීය ධ්‍යාන භාවනා ආදී කටයුතුවල යෙදිය යුතු බවත්, තමා එම කාර්යයෙහි නිතර ම ඇද්දැයි සිහි කළ යුතු බවත් ය.)
10."අත්ථි නු බෝ මෙ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසේසෝ අධිගතෝ සෝ හජ පච්ඡිමේ කාලේ සබ්‍රහ්මචාරීහි පුට්ඨෝ න මංකු භවිස්සාමීති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං" (වෙනත් භික්ෂූන් විසින් තමා තුළ විශේෂ අධිගමයක් ඇත්දැයි ඇසූ විට මම එයින් දුර්මුඛ නො වෙමි යි ප්‍රකාශ කළ යුතු ය.)

59 අ. නි., සමන වග්ගය, සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය (පස්වන භාගය) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 391 පි.
60 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 172 පි.
61 - එම - - 185 පි.
62 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, බු. ජ. ත්‍රි., 1957,181 පි
63 - එම - - 185 පි.
64 - එම - - 187 පි.
65 - එම - - 185 පි.
66 - එම - - 187පි.
67 - එම - - 187 පි.
68 - එම - - 189 පි.
69 - එම - - 207 පි.
70 - එම - - 193 පි.
71 - එම - - 189 පි.
72 - එම - - 227 පි.
73 - එම - - 209 පි.



74 - එම - - 26 පි.
75 - එම - - 44 පි.
76 - එම - - . 193 පි.
77 - එම - - 213 - 221 පිටු
78 - එම - - 223 පි.
79 - එම - - 224 - 225 පිටු
80 - එම - - 231 පි.
81 - එම - - 235 පි.
82 Peter Dukker, Management Tasks Responsibilities, Heinemenn, London, 1974, 23 P.
83 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 85 පි.
84 - එම - - 85 පි.
85 - එම - - 85 පි.
86 - එම - - 44 පි.
87 අ. නි., ඒතදග්ග පාලිය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977
88 බුත්සරණ, විද්‍යාචක්‍රවර්ති, සංස්කරණය ඇම්. ඤාණානන්ද හිමි, විද්‍යාර්ථ ප්‍රකාශ මුද්‍රණාලය, කොළඹ, 1920, 69 පි.
89 ම. නි.මධුපිණ්ඩික සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1971, 287 පි.
90 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 156 පි.
කුඩා මහත් වරද සොයා බලා අවවාදයෙන් ශිෂ්‍යයන් හික්මවන ආචාර්යවරයා "උපාධ්‍යාය" නම් වේ. උපාධ්‍යායන් වහන්සේගෙන් අවවාද ලබන ශිෂ්‍යයා සද්ධිවිහාරික නම් වේ.
91 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 94 පි.
92 - එම - 107 පි.
93 - එම - 94 පි.
94 - එම - 97 පි.
පළමුව අවදි විය යුතු ය. දැහැටි ලබා දිය යුතු ය.මුව දෝනා දිය යුතු ය. අසුන් පැනවීම. කැඳ තිබේ නම් බඳුන සෝදා කැඳ ලබා දිය යුතු ය. කැඳ වළඳා අවසන් වීමෙන් පසුව, පාත්‍රය ගෙන සෝදා තැන්පත් කොට තැබිය යුතු ය. උපාධ්‍යාය අවදි වූවායින් පසුව, අසුන ඔසවා තැබිය යුතු ය. ඒ අසල කසළ තිබේ නම් ඇමදිය යුතු ය. ගමට යනු කැමැත්තේ නම් අඳනය දිය යුතු ය. පටිය දිය යුතු ය. දෙගුණ කොට සඟල සිවුර දිය යුතු ය. සෝදා දිය සහිත පාත්‍රය දිය යුතු ය. වැඩිදුරින් නොයා යුතු ය. වැඩි ළඟින් නො යා යුතු ය. උපාධ්‍යාය කතා කරමින් සිටිය දි අතරතුර කතා නොදැම්ය යුතුය.
95 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 131 පි.
96 - එම - 153 පි.
97 ම. පා., චීවර බන්ධකය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 696 පි.
98 - එම - 703 පි.
99 - එම - 705 පි.
100 - එම - 703 පි.
101 - එම - 705 පි.
102 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 700 පි.

103 - එම - 702 පි.
104 - එම -
105 - එම -
106 - එම - 705 පි.
107 - එම -
108 - එම - 753 පි.
109 ම. ව. පා. 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 206 පි.
110 ම. ව. පා. 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 45 පි.
111 පාරා. පා. 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 28 පි.
112 ම. ව. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957 ත්‍රි, ංසඞ පි.
113 පාරා. පා. 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 28 පි.
114 ම. පා. 11, චීවරකඛන්ධකය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 708 පි.
115 - එම - 696 පි.
116 පා. පා භොජනවග්ගය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1981, 200 - 251
117 ම. නි. කාලාම සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1976
118 දි. නි., මහා පරිනිබ්බාණ සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962
119 දි. නි., බ්‍රහ්මජාල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 2 පි.
120 දි. නි., උපාලි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 124 පි.
121 "චරත භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං..." ලෝකයාට හිත පිණිස, ලෝකයාට සුව පිණිස, ධර්ම චාරිකාවේ හැසිරෙන ලෙසත්, එක මග දෙදෙනෙකු නොයන ලෙසත් භික්ෂූන්ට අවවාද කළහ. (ම. පා. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි, 1957, 42 පි.)
122 ම. නි. ධම්මචේතිය සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 555 පි.
123 ම. නි. ධම්මචේතිය සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, පි.
124 දි. නි., සිඟාලෝවාද සූත්‍රය,බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 288 පි.
125 අ. නි., ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1972
126 ම. නි., ඉන්ද්‍රිය භාවනාව සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977
127 ම. නි., චංකි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1974
128 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 25 පි.
129 ම. නි., නළකපාන සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1964, 226 පි.
130 අත්තා හි අත්තනො නාථො - කොහි නාථො පරො සියා
අත්තනා ව සුදන්තෙන - නාථං ලභති දුල්ලභං
ධම්ම පදය, 12, 4 ගාථාව. (පාලි - සිංහල - දෙමළ - ඉංග්‍රීසි සංස්කරණය, සංස්කාරක අමර හේවාමද්දුම, සංස්කෘති කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ 8, 1994, 99 පි.)



131 දි. නි.,මහාපරිනිබ්බාණ සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 158 පි.
132 ම. නි.,මූල පණ්ණාසකය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1964, 494 පි.
133 ම. නි.,කෝසම්බි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1964, 752 පි.
134 දි. නි.,මහාපරිනිබ්බාණ සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 160 පි.
135 ම. නි.,චූලගෝසිංහ සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 494 පි.
136 ම. නි.,භද්දාලි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
137 Dutt, Nalinaksh. The Cultural Heritage of India Vol 1. 290 P.
138 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, XIII පි.
139 ස. පා., හේවාවිතාරණ සංස්කරණය, 1949, 10 පි.
140 ධම්මපරායනතිස්ස හිමි, බුජ්ජම්පොළ, ප්‍රාතිමෝක්ෂ විවරණය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 12 පි.
141 Olivelle, Partrick., The Origin and the Early Development of Buddhist Manachism, M. D. Gunasena, Colombo, 1974, 35 P.
142 Olivelle, Partriek., The Origin and the Early Development of Buddhist Manachism, M. D. Gunasena, Colombo, 1974, 35 P.
143 Patterson, H. Charle, Western Philisophy, U. S. A. 1970, 47 P.
144 පා. පා. 1. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 48 පි.
145 Dutt. Sukumar., Early Budddhist Mosachism, New York, London, 1924, 80P.
146 Dutt. Sukumar., Early Budddhist Mosachism, New York, London, 1924, 80P.
147 අ. නි. තික නිපාතය, සමණ වග්ගය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1950, 230 පි.
148 ම. නි. භද්දාලි සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1976
149 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1, 1959
150 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 46 පි.
151 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 427 පි.
( විවාදාධිකරණය අනුවාදාධිකරණය ආපත්තාධිකරණය හා කිච්චාධිකරණය)
152 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 758 - 810 පිටු

CamScanner

# හතරවන පරිච්ඡේදය

## කතිකාවත් තුළින් හෙළිවන භික්ෂු සංවිධානය පිළිබඳ කළමනාකරණය

රජදරුවන්, සාමාන්‍ය මිනිසුන් තමන් සතු දෑ භික්ෂුවට පිදීමෙන්, භික්ෂු ශාසනය රැක ගැනීමට බලාපොරොත්තු වූ අතර, ඒ වෙනුවෙන් ආධ්‍යාත්මික කටයුතුවල දී ගිහියන්ට අනුශාසනා කිරීම, බුද්ධ දහම පිළිබඳව අවබෝධයක් ලබා දීම තමන්ගේ යුතුකමක් ලෙස භික්ෂුව සැලකීය. [1] මේ නිසාම මුල් කාලීන සමාජයේ අතිශය ගෞරවාදරයට පාත්‍ර වූයේ භික්ෂුවයි. එහෙත් පසුකාලය වන විට සංඝයා වහන්සේලා විනයෙන් පිරිහී දූෂිත ක්‍රියාවලට පෙළඹෙන්නට වූහ. එම තත්ත්වය භික්ෂු සමාජය තුළ වරින් වර මතුවූ ලක්ෂණයක් ලෙස ද කතිකාවත් මගින් අනාවරණය වෙයි. එබැවින් භික්ෂු ශාසනය පාලනය කිරීමටත්, සාමයත් හා පාරිශුද්ධත්වයත් ඇති කිරීම සඳහා කතිකාවත් පිහිටුවනු ලැබීය.

ලාංකේය භික්ෂු ශාසනයෙහි වරින්වර ඇති වූ විවිධ විෂම ක්‍රියා වළකා, ශාසනය චිරස්ථායී කිරීමේ අරමුණ ඇතිව සකස් කළ කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී සැලසුම් ක්‍රමය, පාලන ක්‍රමය බවට පත්වූයේ මෙය යි. ලාංකේය භික්ෂු ශාසනය විධිමත් කිරීම අරමුණු කොට ගෙන සකස් කළ මෙහි, භික්ෂුවකට නො ගැළපෙන ක්‍රියා මැඩපැවැත්වීමට ගත යුතු ක්‍රියා මාර්ගයන් සැලසුම් කිරීමත්, ඉදිරියේ දී භික්ෂුව ක්‍රියාකළ යුතු ආකාරයත් එලෙස ක්‍රියා කරන්නේ ද යන්න සොයා බැලීමත්, සඳහා වූ විධිමත් වැඩපිළිවෙළක් අන්තර්ගත ය.

ed with CamScanner
CamScanner

## 4.1 කතිකාවත්වල අන්තර්ගත කළමනාකරණ පසුබිම

ලාංකේය භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේ පනවා වදාළ විනය මාර්ගයෙහි ම ගමන් කරනු ලැබුවේ නම්, විශේෂ නීති මාලාවක් පැනවීම අවශ්‍ය නොවේ. කතිකාවත්වලට පසුබිම වූයේ භික්ෂූන් වහන්සේලා භික්ෂුත්වය අමතක කොට විවිධ දුෂ්ප්‍රතිපත්තිවලට හුරුවීම හා බාහිර සමාජයෙන් එල්ල වූ බාධාවන් වළක්වාලීම ය.

ක්‍රි.ව. 10 වන සියවස වන විට ලාංකේය භික්ෂු ශාසනයෙහි විනය පිරිහී තිබුණු බව මහාවංශය[2] වාර්තා කරන අතර, එහි ආරම්භය වළගම්බා රාජ්‍ය සමය වන තෙක් දිව යන බව, පොළොන්නරු කතිකාවතෙහි අන්තර්ගත ය.[3] ක්‍රි. ව. 13 වන සියවස වන විට නැවත භික්ෂු ශාසනය පිරිහී තිබූ බව දඹදෙණි කතිකාවත තුළින් සනාථ වේ. වරින්වර විනය පිරිහුණු අවස්ථාවල භික්ෂුවගේ හා ශාසනයේ පැවැත්ම උදෙසා කතිකාවත් සකස් කරගෙන තිබෙන බවත්, ඒ සඳහා වූ පසුබිමක් නිර්මාණය වී පැවති බවත්, පැහැදිලි ය.

කතිකාවත්වලින් හෙළිවන තොරතුරුවලට අනුව, භික්ෂූන් වහන්සේලා කළමනාකරණය වීමට බලපෑ සාධක කොටස් කීපයකට බෙදා දැක්විය හැකි ය.

එනම්,

1 භික්ෂූන් වහන්සේලාගේ ඇවතුම් පැවතුම් බුද්ධ විනයට පටහැනි වීම.

2 භික්ෂූන් වහන්සේලා විවිධ විෂම ක්‍රියාවලට යොමු වී සිටීම.

3 බුද්ධ නීතියට පටහැනිව කුලදරුවන් මහණ කිරීම.

4 බුද්ධ විනයට පටහැනිව උපසම්පදාව ලබා දීම.

5 භික්ෂූන් වහන්සේලා නිකාය වශයෙන් බෙදී වෙන්ව සිටීම.

6 භික්ෂූන් වහන්සේලා නක්ෂත්‍ර, අභිචාර විධිවලට යොමුව සිටීම.



7 බුදුන් වහන්සේ දේශනා කරන ලද ධර්මය විවිධ ආකාරයට අර්ථනිරූපණය කිරීම.

8 මහායාන ධර්මයෙහි මූලික ඉගැන්වීම් හා සම්මිශ්‍රණය වීම.

9 දේශපාලන අස්ථාවරත්වය

10 සාංඝික දේපොළ පෞද්ගලික කිරීම වැළැක්වීම.

යනුවෙන් වර්ග කළ හැකි ය.

මෙමගින් භික්ෂුව කළමනාකරණය කිරීමට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ භික්ෂූන් වහන්සේලා පිළිවෙත් නොපිරීම හා වැරදි පිළිවෙත්වල යෙදීමෙහි නියුක්තව සිටීමයි. පොළොන්නරු ගල්විහාර කතිකාවත හා දඹදෙණි කතිකාවතෙහි වාර්තා කරන ආකාරයට, නවක භික්ෂූන් වහන්සේලා වැඩිමහලු භික්ෂූන් වහන්සේලා ඉදිරියේ හැසිරිය යුතු ආකාරය නො දැන සිටි බව වාර්තා වෙයි. "අනාචාරනිදෙශ (යෙ)හි වදාළ බැවින් එළඹියනුව්සිනුදු වෙරින් එව් සිවුරෙන් එව් නොසැටියැ යුතු මහළු සඟුන් හා බිණුවමනා කරුණක් ඇත ආදර දක්වා ඉතා නො ලංවැ නැමී සිටැ"[4] යනුවෙන් දක්වා තිබීමෙන් එය පැහැදිලි ය. ආගමික වතාවත් සිදු කරන අවස්ථාවන් නිසි ගෞරවයක් නො දැක්වූ බව, "දහගබ් මහ බෝ ආචාර්‍ය්‍ය උපාධ්‍යාය, මහලු සබ්‍රම්සරුන් දිනකට තුන් වේලක් වැන්ද යුතු" යනුවෙන් දඹදෙණි කතිකාවතෙහි[5] දැක්වීමෙන් මෙම යුගය වන විට එවැනි චාරිත්‍ර මගහැරී ගොස් ඇති ආකාරය පැහැදිලි ය. මෙබඳු ක්‍රියා නවක භික්ෂුවකට නො ගැළපෙන ක්‍රියාවක් ලෙස බුද්ධ කාලයෙහි ද දක්වා ඇති බව මහාවග්ග පාලියෙන් අනාවරණය වෙයි.[6]

"සිනාවට නිසි කරුණෙක්හිදු හඬ නොවිහිදැ මුව වසාසතුටු පමණක් දැක්වියැ යුතු" යනුවෙන් පොළොන්නරු කතිකාවතෙහි[7] දැක්වෙන අතර, දඹදෙණි කතිකාවතෙහි ද අන්තර්ගත ය.

එහි දැක්වෙනුයේ, "සිනාවට නිසි කරුණෙක් හි බාලයන්සේ දත් වැහැරැ හඬවිහිද සිනානොසී මුව වසා සතුටු පමණක් දැක්විය යුතු" යනුවෙනි. කතිකාවත් දෙකෙහි දෙයකාරයකින් දැක්වුව ද, එකම වැරැද්දක් ඉස්මතු වන බව පෙනේ. එනම්, නවක භික්ෂූන්ගේ

ned with CamScanner
CS CamScanner

වැරදි ක්‍රියා කලාපයන් මෙමගින් අනාවරණය වීමයි. භාවනා ගෘහයෙහි භාවනා කරන භික්ෂූන් වහන්සේලාගේ සිතේ ඒකාග්‍රතාවයට බාධා වන ලෙස සාමණේරවරුන් හැසිරුණු අයුරු, පොළොන්නරු කතිකාවතෙහි වාර්තා කරනුයේ, "පධන් ඝෙරෙහි වසනුවනට විබෙවු නොකොටැ හැදෑරිය යුතු"[8] යනුවෙනි.

අන්‍යයන්ගේ සිත් කෝප වන ආකාරයෙන් හැසිරුණු භික්ෂූන් වහන්සේලා පිළිබඳ ව දඹදෙණි කතිකාවතෙන් වාර්තා වෙයි. එබඳු භික්ෂූන් අතර, පහත් ලෙස මිනිසුන්ට බැණ වැදුණු භික්ෂූන් වහන්සේලා ද වාසය කොට තිබූ බව, "ජාත්‍යාදින් ඝටා නොබිණිය යුතු"[9] යනුවෙන් දක්වා තිබීමෙන් පැහැදිලි වේ.

කතිකාවත් මගින් භික්ෂුව කළමනාකරණය කිරීමට හේතු වූයේ භික්ෂු සංස්ථාව තුළින් ම ඉස්මතු වූ භික්ෂු අවිනය යි. දත් වැළඳීමේ දී පවා භික්ෂූන් වහන්සේලා තුළ නො මනා හැසිරීම් පැවති බව සුමංගල විලාසිනියෙහි වාර්තා වේ.[10] මේ නිසා ම සද්ධාතිස්ස රජතුමා මහාවිහාර භික්ෂූන්ට දත් දීම නැවැත්විය. මේ අනුව, එකල ද වත්පිළිවෙත්වල පවා ශීඝ්‍ර පිරිහීමක් දක්නට ලැබුණි.

ලක්දිව බුද්ධ ශාසනය පිරිහීමේ එක් පියවරක් වනුයේ, සංඝයා වහන්සේ කෙරෙහි තිබූ ගෞරවය බිඳ වැටීම යි.[11] (ක්‍රි. ව. 31-34) කණිරජානුතිස්ස රජතුමා ගැන කලකිරී සිටි ඇතැම් භික්ෂූන් වහන්සේලා උපෝසථාගාරය තුළ ම රජතුමා මරා දැමීමට කුමන්ත්‍රණ කළහ. මෙයට මූලික හේතුව වූයේ, භික්ෂූන් වහන්සේ නමක් විසින් උපෝසථාගාරයක් තුළ පාප ක්‍රියාවක් සිදුකිරීම හා එයට රජතුමා කලකිරී සිටීම යි. මේ අනුව, නැවතත් සංඝයා කෙරෙහි ගෞරවයක් ඇති කරවීමේ පරමාර්ථය ද මෙම කතිකාවත්වලට පසුබිම වන්නට ඇත.

දෙතිස් කථාවෙන් තොරව භික්ෂූන් වහන්සේ කතා කළ යුත්තේ දැහැමි කථාවකි. එහෙත් පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්වල සඳහන් වන තොරතුරුවලට අනුව, පැවිද්දන් විසින් නො කළ යුතු කතා සිදු කර ඇති බව කතිකාවත් දෙකෙහිම දැක්වේ. "ඇත්ගම්හි ගිහිමිනිසුන් හා පස පිළිබඳ කතා ද විසභාග කතා ද නොකටයුතු" යි පොළොන්නරු කතිකාවතෙහි සඳහන් ව



ඇත.[12] චීවරාදි ප්‍රත්‍ය පහසුකම් ගැනත්, (පස පිළිබඳ කතා) ස්ත්‍රීන් පිළිබඳ කතා (විසභාග කතා) ද භික්ෂුවට තහනම් කර ඇති බව දැක්වීමෙන්, ක්‍රි. ව. 10 වන සියවස වනවිට භික්ෂූන් වහන්සේලා මෙම ක්‍රියාවෙහි යෙදී ඇති බව පැහැදිලි ය. මෙබඳු කතා නිසා බුදුන් වහන්සේ ද භික්ෂුවට අවවාද කරනු ලැබුවේ "වැඩ සලසන බසක් ම කියන්න"[13] යනුවෙනි.

බුද්ධ විනයට අනුව, භික්ෂුව ස්ත්‍රියක් සමග රහසිගත ස්ථානයක කතාබහ නො කරන ලෙසට නීතියක් "අනියත"[14] නමින් හැඳින්වෙයි. අභයගිරි සංස්කෘත ලිපියට අනුව ලාංකේය භික්ෂූන් වහන්සේලා[15] මෙම වැරදි ක්‍රියාවෙහි නිරතව සිටි බව, "ක්ෂේත්‍රලාභිනාමපි නග්‍රසො නවාසඃ මිථ්‍යාජිවිනා නව [ස්තවෘං] (ස්ත්‍රීපොෂ) කෙණෙ න වස්ත්‍යම්, අන්‍යත්‍ර මාතාපි..." යන්නෙන් සඳහන් වන අතර, මිථ්‍යා ආජීවයෙන් යුතු භික්ෂූන් වහන්සේලා අශාසනිකවූ දිවි පෙවෙතක් ගත කරන්නවුන් හා ස්ත්‍රී පෝෂකයෙකු විසින් ද විහාරය නො වැසිය යුතු යැයි දක්වා තිබීමෙන් එය තහවුරු වේ.

භික්ෂුවට තමා ළඟ නොමැති ගුණ කීම තහනම් බව පාරාජිකා තුළ අන්තර්ගත ය.[16] එය කළමනාකරණයට අනුව, සාර්ථක නායකත්වයේ ගුණාංගයකි. එහෙත්, දඹදෙණි යුගය වන විට භික්ෂූන් වහන්සේලා එවැනි ක්‍රියාවල නිරත ව සිටි බව එම කතිකාවතෙන් ම සාධක ලැබේ. "ලාභාශායෙන් පොලොබන පිණිස තමාගේ ඇති නැති හෝ ගුණ ගොතා සොලෝ ආදිය කීකල සතුටුවැ ශ්‍රද්ධා දේය විනිපාතයෙන්"[17] යනුවෙන් සඳහන් කර තිබීමෙන් භික්ෂූන් ලාභාපේක්ෂාවෙන් යුතුව තමා ළඟ ඇති හෝ නැති ගුණ වර්ණනා කිරීමෙහි නිරතව සිටි බව පැහැදිලි ය. එසේම ඇතැම් භික්ෂූන් වහන්සේලා යුව රජතුමාගේ සමතත්ත්වයෙහිලා ගැනෙන බව පවසමින් උන් වහන්සේලාගේ ගුණ කියා ලාභ ලබා ගැනීමට පුරුදුව සිටි බව ද සඳහන් ව ඇත.[18]

දඹදෙණි කතිකාවතෙහි ම "ශීල ශ්‍රැතාදි ගුණ පතළ කිරීම" ද සිදු කර ඇත. සිඛවළඳ හා සිඛවළඳ විනිස ග්‍රන්ථයේ[19] ද "ලිහිණි

වැ වදි නම් වැඳුම් ගනී නම් බොජුන් බුදුනාදී කෙරේ නම් දියෙන් බැහැර සිට තමහට පිරියම් කවා නම් අත්හට තෙමෙ කෙරෙ නම් දුකුළා වේ" යැයි දක්වා ඇත. පොළොන්නරු යුගයේ ඇතැම් භික්ෂූන් දුසිරිතෙහි ඇලී සිටි බවත්, ඔවුන් උදර පෝෂණය සඳහා මහණ වූවන් බවත්, චූලවංශයෙහි[20] සඳහන් ය.

ඇතැම් පැවිද්දන් උපාසක - උපාසිකාවන්ට "ගුණසාගරය" "දානපතිය" යනාදී විවිධ නම් යොදා ඔවුන්ගේ සිත් දිනාගෙන ඒ තුළින් ප්‍රත්‍ය පහසුකම් සලසා ගත් බව ද දඹදෙණි කතිකාවතෙහි අන්තර්ගතය.[21]

ලාංකේය භික්ෂු සමාජය කළමනාකරණය කිරීම උදෙසා කතිකාවත් උපයෝගී කර ගැනීමට බලපෑ සාධක අධ්‍යයනයේ දී ඇතැම් භික්ෂූන් වහන්සේලා සැදැහැතියන් පොළඹවාගෙන, ඔවුන්ගේ දරුවන් පැවිදි කොට, එම දෙමවුපියන්ගෙන් ලාභ ප්‍රයෝජන ලබා ගැනීම ද සිදුකොට තිබේ. සමහර භික්ෂූන් වහන්සේලා ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ පරමාර්ථයෙන් යුතුව අකුරු කියා දුන් අවස්ථා ද ඇත. [22]

බුද්ධ විනය තුළ භික්ෂුවට ගනුදෙනු කිරීම තහනම්[23] වන අතර, එසේ සිදු කරනු ලැබුවහොත්, එය නිස්සග්ගිය පාචිත්තියක් වේ.[24] එහෙත් දඹදෙණි යුගයෙහි විසූ සමහර භික්ෂූන් තමන්ට ලැබුණු සිවුරු තම අන්තේවාසිකයන්ට නො දී ඒවා අලෙවි කොට අකැප වස්තූන් රැස් කළ බව,

"වැඩි තරම් ලාභයක් ලද තැන් විසින් ඒ ලාභයෙන් අන්තේවාසිකාදීන්ට සිවුපසයෙන් පාසු කොට පර්යාප්ති ප්‍රතිපත්තියෙහි යොදා තමාත් බුදුසස්නත් රක්නා ලෙස කරන්මිස ක්‍රයවික්‍රය කොට කැප අකැප දෙය රැස් කොට තමාත් ඇසුරු කළවුනුත් නොනැසිය යුතු"[25] යනුවෙන් සඳහන් වීමෙන් එය සනාථ වේ.

සමන්තපාසාදිකාවෙහි[26] ද භික්ෂුවට අකැප වස්තු දක්වා තිබේ. ශ්‍රී රාජාධිරාජසිංහ[27] කතිකාවතෙහි ද මෙය භික්ෂුවට නොගැළපෙන ක්‍රියාවක් ලෙස තිබීම, මේ දුෂ්ප්‍රතිපත්තිය භික්ෂු සමාජයේ පැවති



බවට සාධකයකි. "මේ වන විට එකදු භික්ෂු නමකුත් නැතිව, සාමණේර ගණනක් අවශේෂව එයිනිදු සමහර ලජ්ජිපේශල ශික්ෂාකාමී තැන් හැර, සෙසු බොහෝ දෙන නක්ෂත්‍ර වෛද්‍ය කර්මය, යක්ෂප්‍රලය ආදී ව බුදුන් විසින් එපා කර වදාළ නින්දිත ශාස්ත්‍ර ඉගැන්මෙන් රාජ රාජ මහාමාත්‍ය සේවකයන් ග්‍රාමරක්ෂත්‍රාදි තනතුරු ලා ගැන්මෙන් ගොවිතැන් වෙළඳාම් ආදී වූනොයෙක් අකර්ත්තව්‍යයෙහි යෙදී ඥාතිකුලසංඝය ව පුත්‍රදාර පෝෂණශීලිව ශාසන පිළිවෙත් පිරිහී ගොස් විනාශමුඛ ප්‍රාප්තව සිටි කල්හි...." යනුවෙන් රාජසිංහ කතිකාවතෙහි සඳහන් වීමෙන් පැහැදිලි ය.

මේ කතිකාවතෙහි, කතිකාවත සකස් කිරීමට බලපෑ හේතුව ලෙස වාර්තා කරනුයේ, භික්ෂූන් වහන්සේලාගේ අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තින් දුරු කොට මනා ප්‍රතිපත්තියෙහි පිහිටා ශාසනය නිර්මල ව පවත්වා ගැනීම යි.

ලාභාපේක්ෂාවෙන් යුතු ව සසුන් ගත වන්නන්ට මහණවීම හා උපසම්පදාව ලබා නො දිය යුතු බව බුදුන් වහන්සේ වදාළහ.[28] ක්‍රි. ව. 8 වන සියවසේ සිට 15 වන සියවස දක්වා වූ කාලය තුළ ආරාමවල එබඳු අපේක්ෂාවෙන් යුතු ව මහණ වූවන් නිසා ශාසනය අපිරිසිදු ව පැවති බවත් පැහැදිලි ය. "ලාභාර්ථං ස්නේහාර්ථං වා තාම්බූලාදිකං...."[29] යනුවෙන් අභයගිරි සංස්කෘත ලිපියෙහි වාර්තා වන අන්දමට "ලාභය පිණිස හෝ ගෞරවය පිණිස බුලත් ආදිය රජගෙට යවන්නහු නො විසිය යුතු ය" යැයි දක්වා තිබීම, වැදගත් වේ. එහෙත්, ඇතැම් රජවරුන් භික්ෂූන් වහන්සේලාට ලාභ පිණිස දීමනා ලබා දුන් බව, වෙස්සගිරි ලිපියෙහි[30] අන්තර්ගත ය. ,විරාංකුරා අරමැ මහසඟ් වත්හිමියනට් ලබ් සකර් දෙමින් දෙසියක් කළඳ් රන් දී මෙ රනට් හවුරුදුපතා..., මෙය පසුකාලය වන විට භික්ෂූන් වහන්සේලා ලාභ සත්කාර කෙරෙහි යොමු වීමට බලපාන්නට ඇතැයි සිතිය හැකි ය. එහෙත්, බුද්ධ විනයට අනුව ද, "යො පන භික්ඛු යචබ ජාතරූපරජතං උගගණෙභය්‍ය උපනික්ඛිතතං වා සාදියෙය්‍ය, නිසසගගියං පාචිතතියනති" යනු හෙයින් භික්ෂුවට මුදල් පරිහරණය කිරීම තහනම් ය.[31]* මනා කළමනාකරණයකට අවශ්‍ය ඉතාමත් උසස් වූ පාලන පද්ධතියක් ක්‍රියාත්මක වූ බව මින් අනාවරණය වෙයි.

බුද්ධ විනය තුළ භික්ෂුවට සුරාපානය ද ඇවතකි.[32] එහෙත් මේ කාල වකවානුව තුළ ඇතැම් භික්ෂූන් වහන්සේලා සුරාපානය ඇවතක් කොට නොගත් අවස්ථා විමතිවිනෝදනියෙහි දැක්වේ.[33] අභයගිරිකයන්ගේ මතය වූයේ උපසම්පදාව ලත් භික්ෂුව නො දැන සුරාපානය කිරීමෙන් ඇවත් සිදුනොවන බවයි. එමෙන් ම සාමණේරයන්ට ද අකුසලයක් සිදුනොවන බවයි. මේ මතය මහා විහාරිකයන් ද පිළිගෙන තිබූ බව වංසත්ථප්පකාසිනිය වාර්තා කරයි.[34]

ජේතවන විහාරයේ භික්ෂූන් වහන්සේලාගේ විනය විරෝධී ප්‍රතිපත්තියක් ගැන වාර්තා නොවන නමුත් ඔවුන්ගෙන් ද වැරදි වන්නට ඇත. අනුගමනය කළ පිළිවෙළ අභයගිරිකයන්ගේ ප්‍රතිපත්තිවලට සමාන වීම හා මහා විහාර සම්ප්‍රදායෙන් වෙනස් නොවුණු නිසා විය හැකිය.[35] බොහෝ භික්ෂූන් වහන්සේලා බුද්ධ විනයෙන් බැහැරව ක්‍රියා කිරීම කතිකාවත්වලට පසුබිම වූ බව පැහැදිලිය. කළමනාකරණ මූලධර්ම අනුව පාලනයේ දී බලාපොරොත්තු වන ප්‍රමිතීන්ට අනුව වැඩ කටයුතු සිදුවෙනවාද නැද්ද බැලීමත් ප්‍රමිතීන් හා සත්‍ය ප්‍රතිඵලය, තත්ත්වය සැසඳීමත් අපගමනයත් සොයා බැලීම අත්‍යවශ්‍යය. කතිකාවත්වලින් මෙම ක්‍රියාවලිය සිදුවී ඇති බව සනාථ වේ.

විහාරවාසී භික්ෂූන් වහන්සේලා අතර ඇතිව තිබූ අසමගිය ද කතිකාවත්වලට පසුබිම් වූ හේතුවකි. ඒ බැව් කළුදිය පොකුණ ලිපියෙහි[36] සඳහන් වනුයේ, "යෙහෙළ වියගුරක් ඇත මෙ බත් කවුඩු බල්ලනට් දෙනු ඉසා..." යනුවෙනි. දක්ඛිණගිරි විහාරයේ යම් මත භේදයක් ඇති වුවහොත් බත් බලු කපුටන්ට විසි කළයුතු බව දක්වා තිබේ.

පොළොන්නරු යුගයේ විසූ ඇතැම් භික්ෂූන් නුවණ නැති, පාප සත්ත්වයන් බවට පත්ව සිටි බව, "ශඨ කුට කෙරාට''[37] යනුවෙන් නිශ්ශංකමල්ල කතිකාවතෙහි අන්තර්ගතව තිබීමෙන් පැහැදිලි ය.

සංස්ථාවක් වශයෙන් ගත් කළ භික්ෂූන් වහන්සේලා අතර සමගිය තිබිය යුතු බව බුදුන් වහන්සේ පෙන්වා දුන්හ.[38] සමගිය



දෙදරා යාම ද කතිකාවත් සකස් කිරීමට පසුබිම වූ සාධකයකි. පොළොන්නරු කතිකාවතෙහි දැක්වෙන්නේ, "වළගම්බා අභා මහරජු දවසැ පටන් එක්වාදහස් දෙසිය සූ පනස් හවුරුද්දක් භින්න නිකාය වැ ශාසනය පිරි(ය) මින් සිටි කල්හි..."[39] යනුවෙනි. වළගම්බා රජුගේ කාලයේ සිට, 1 වන පරාක්‍රමබාහු රජුගේ අවධිය දක්වා මෙම නිකාය භේදය පැවතුණු බවත්, එමගින් භික්ෂු සංස්ථාව අතර අසමගිය වර්ධනය වූ බවත් පැහැදිලි ය. එසේ පැවති නිකාය භේදය තුරන් කොට ශාසනය පවිත්‍ර කිරීමේ අවශ්‍යතාවක් තිබූ රජ කෙනෙකු, මහාපරාක්‍රමබාහු රජතුමාට පෙර සිටි බව මෙතෙක් හමුවී නො මැත. කෙසේ නමුත්, විජයබාහු රජතුමාණෝ නිකාය තුනට ම එකසේ සංග්‍රහ කළහ.[40] ආගමික ඉගැන්වීම් පදනම් කරගෙන මෙම අසමගිය තවත් වර්ධනය විය.

අභයගිරිකයන් පසුකාලීන ව ථේරවාදී නොවන ඉගැන්වීම් පදනම් කරගත් බව අභිධම්මත්ථ විකාසිනියෙහි සඳහන් ය.[41] ධර්මය පිළිබඳව ද අභයගිරිකයන් හා මහා විහාරිකයන් අතර මතභේද පැවති බව අභිධම්මත්ථ විකාසිනියෙහි[42] තවදුරටත් දැක්වේ. "දාන, සීල, භාවනා, පත්තිදාන, වෙය්‍යාවච්ච, දේසනා, අනුමෝදනා, දිට්ඨුජ්ජුන්නා, සංයුති හා අපචායන" දස පුණ්‍ය ක්‍රියා ලෙස මහා විහාරිකයන් හඳුන්වනු ලබන අතර, එය අභයගිරිකයන් විග්‍රහ කරනුයේ, "දාන, සීල, භාවනා, සංයුති, දේශනා, අනුස්සති, මෝදා, සරණ, පත්ති, පසංසා, වෙය්‍යාවච්ච සහ පූජා යනුවෙනි. මාර්ගඵල සම්බන්ධයෙන් ද දෙනිකාය අතර මතභේද පැවතිණි."[43]

විෂමාචාර ක්‍රියාවලට භික්ෂුව යොමුව සිටීම නිසා, දූර්මත ශාසනයට එකතු වූ බව චූලවංශයෙහි[44] දැක්වෙන අතර, එනිසාම විනය විරෝධී ක්‍රියාවලට යොමුව සිටි බව වංසත්ථප්පකාසිනියෙහි[45] හා විමති විනෝදනියෙහි[46] සඳහන් ය. දඹදෙණි යුගයෙහි[47] පමණක් නොව රාජසිංහ කතිකාවත[48] ද භික්ෂුව යක්ෂ දෝෂයන්ට පිළියම් කරමින් සිටි බවත්, එය භික්ෂු ප්‍රතිරූපයට පටහැනි වන හෙයින් එයින් වළකින ලෙසත් දක්වා ඇත. දඹදෙණි යුගයෙහි පමණක් නොව, අනුරාධපුර යුගයෙහි විසූ චෝල හිමි නම නිරතවී තිබේ.[49] මෙයින් අනුරාධපුර යුගයේ සිට ම භික්ෂූන් වහන්සේලා යක්ෂ දෝෂයන්ට පිළියම් කිරීමේ කටයුතුවල නිරත වී සිටීම භික්ෂු

ප්‍රතිරූපයට පටහැනි වන හෙයින් එයින් වැළැක්වීමේ ක්‍රියා මාර්ග යක් වශයෙන් කතිකාවත් පිහිටුවා තිබෙන බව පැහැදිලි ය.

භික්ෂු සංස්ථාව මැනවින් සකස් කිරීම උදෙසා කතිකාවත් සම්පාදනයට භික්ෂු සංස්ථාවෙන් ම පමණක් නොව බාහිර සමාජයෙන් ද විවිධ හේතු සාධක ද බලපානු ලැබීය. කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී ඇතැම් කතිකාවත් සඳහා දේශපාලන හේතු සාධක ද බලපා ඇති බව දක්නට ලැබේ. පොළොන්නරු කතිකාවතෙහි ම ඒ බව සඳහන්ව ඇත්තේ, "වළගම්අබා මහ රජු දවසැ පටන් එක්වාදහස් දෙසිය සූ පනැස් හවුරුද්දක් භින්න නිකාය වැ ශාසනය පිරි(ෙය) මින් සිටි කල්හි''[50] යනුවෙනි. මෙම කතිකාවත් සකස් කිරීමට බලපෑවේ භික්ෂු සංස්ථාවේ පැවති අප්‍රතිපත්ති හා දුෂ්ප්‍රතිපත්ති වුවත් එය ඇති වීමට හේතු සාධක වී ඇත්තේ වළගම්බා රජු දවස ඉදි කළ අභයගිරි විහාරය පෞද්ගලික පූජාවක් ලෙස උස්සිලියාතිස්ස හිමියන්ට ප්‍රදානය කිරීම යි.[51] මෙයින් පසුව රජවරුන් නිකාය වශයෙන් බෙදීමත්, තමන් වැඩි කැමැත්තක් දක්වන නිකාය උදෙසා ලාභසත්කාර ලබාදීමත් මෙලෙස පසුකාලීන ව භික්ෂු සංස්ථාව පිරිහීමට බලපෑ හේතු සාධක ලෙස දැක්විය හැකි ය. ලාංකේය භික්ෂූන් වහන්සේලාට පෞද්ගලික ආරාමයන් තනවා දීම වළගම්බා රාජ්‍ය සමයට පෙරත් සිදු වූ බව මහාවංශයෙහි සඳහන් ය.[52] ලාභයන් සඳහා යොමු වන්නට ඇත්තේ මහාසිව රාජ්‍ය (බු.ව. 287) සමයේ සිට විය හැකි ය. උත්තිය රජුගෙන් පසුව රජ පැමිණි මොහු භද්දසාල තෙරුන් කෙරෙහි පැහැදී සිත්කලු නගරංගන විහාරයක් කරවූ බව මහාවංශය වැඩිදුරටත් දක්වයි. මෙය භික්ෂු ප්‍රතිරූපය වෙනත් මගකට යොමු කරවීමට බලපෑ හේතුවකි.

භික්ෂූන් වහන්සේලා තමන් වසන ආවාස ගිහියන්ට තවාතැන් සඳහා ලබාදුන් බව අනුරාධපුර පුවරු ලිපියෙන් වාර්තා වේ.[53] එවන් තත්ත්වයක් මෙම ලිපියෙන් පමණක් වාර්තා වුවත්, එම ක්‍රියාව සමස්ත භික්ෂු සමාජයේ පැවැත්ම කෙරෙහි බලපාන්නකි. භික්ෂු සමාජය නිර්මාණය වනුයේ ගිහි සමාජයෙනි. ගිහියන් විසින් භුක්ති විඳින ලෞකික ජීවිතයෙන් ඈත් ව අල්පේච්ඡ ජීවිතයක් පවත්වා ගෙන යන භික්ෂු සමාජය ගිහි සමාජයෙන් වෙන් වූ



ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍යව තිබූ හෙයින් භික්ෂුව හා ගිහියන් සමාජ දෙකක් වශයෙන් ඉදිරියට පවත්වාගෙන යාමේ අරමුණ ද කතිකාවත්වලට පසුබිම් වූ බව පැහැදිලි ය.

ක්‍රි. ව. 8 වන සියවස සිට 15 වන සියවස දක්වා වූ භික්ෂු සංස්ථාව තුළ සකස් වූ කතිකාවත් අධ්‍යයනය කරන විට ඒවා සකස් කිරීම උදෙසා පසුබිමක් භික්ෂු සමාජය තුළ හා බාහිර සමාජය තුළින් නිර්මාණය වී තිබුණු බව පැහැදිලි ය. ඉහත දැක්වෙන හේතු සාධක පදනම් කරගෙන, නිර්මල වූ භික්ෂු පරපුරක් සේම බුදු දහම මැනවින් සුරක්ෂිත කරනු සඳහා කතිකාවත් සකස් කොට ඇති බැව් පෙනේ. කළමනාකරණයේ භාවිත වන ප්‍රධාන පාලන ක්‍රමයක් වන පසුවිපරම නැතහොත් ප්‍රතිපෝෂණ පාලනයට (Feed Back Control) සමාන පාලන ක්‍රමයක් ලෙස කතිකාවත් හැඳින්විය හැකි ය.

## 4.2 කතිකාවත්වල දැක්වෙන භික්ෂු සැලසුම්කරණය

"කතිකාවත්" වල දක්නට ලැබෙන මූලික ලක්ෂණය නම්, තිබෙන්නාවූ ගැටලු විසඳා ගැනීම සඳහා, වර්තමානයෙහි හා අනාගතයෙහි ක්‍රියා කළයුතු වැඩපිළිවෙළක් සකස් කොට එය ක්‍රියාවට නංවා ගෙන පවත්වාගෙන යාමයි. කතිකාවත් යනු භික්ෂු ජීවිතය හා ආරාම විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා සකස් කළ සැලසුමකි. ඒ අනුව, සැදැහැති කුලපුත්‍රයෙකු සසුනට ඇතුළත්වීමේ සිට සසුනෙහි රැඳී සිටින තෙක් භික්ෂු ජීවිතය ගත කළ යුතු ආකාරය මෙන් ම භික්ෂූන් වහන්සේලාගේ ආරාම මැනවින් පාලනය කිරීම උදෙසාත් විධිමත් සැලැස්මකින් යුතුව කතිකාවත් සකස් කොට ඇති බව පැහැදිලි ය.

ලාංකේය භික්ෂූන් වහන්සේලා තුළ පැවති අප්‍රතිපත්ති හා දුශ්ප්‍රතිපත්ති ඉවත් කොට, පැවිදි දිවිය මැනවින් සකස් කිරීමත්, උසස් කිරීමත් අරමුණු කොටගෙන භික්ෂු ජීවිතය ආරම්භයේ සිට ම පුහුණුවීම සිදු කිරීම, ගුණධර්ම දියුණු කිරීමටත්, ධර්ම ඥානය ලබා දීම, භාවනා කටයුතුවල යෙදවීම සහ වත්පිළිවෙත්වලට භික්ෂුව හුරු කරවීම ආදිය සැලසුම් කිරීම මෙම කතිකාවත්වල එක් අරමුණක්

වූ බව පැහැදිලි ය.[54] ශත වර්ෂ ගණනාවක් මුළුල්ලෙහි පරිහානියට පත්ව තිබුණු භික්ෂු විනය විධිමත් කොට සංඝයා වහන්සේලා සැකසීම උදෙසා කතිකාවත්වල අන්තර්ගත සැලසුම්කරණ ලක්ෂණයන් ලෙස,

1. මහණ කිරීම විධිමත් කිරීම
1.1 මහණවීමට පැමිණෙන සෑම කෙනෙකු ම පණ්ඩුපලාස අධ්‍යාපනය ලැබිය යුතු වීම.
 1.2 සාමණේර අධ්‍යාපනය ඉදිරිපත් කිරීම.
 1.3 උපසම්පදා අධ්‍යාපනය ලබා දීම.
 1.4 ස්ථවිර අධ්‍යාපනය අනුදැන වදාරා තිබීම.
2. උපසම්පදාව විධිමත් කිරීම.
3. භික්ෂු ඇවතුම් පැවතුම් සකස් කිරීම.
4. භික්ෂූන් වහන්සේලා උදෙසා දායකයෙකු පත්කර ගැනීම.
5. බහුනායකත්වය වෙනුවට සසුන උදෙසා නායකත්වයට එක් භික්ෂුවක් පත් කර ගැනීම.
6. භික්ෂු ආරාවුල් විසඳීම සඳහා රාජ්‍ය නිලධාරීන් මැදිහත් කරවීම යනුවෙන් දැක්විය හැකි ය.

### 4.2.1 පණ්ඩුපලාස අධ්‍යාපන - (ප්‍රවුජ්‍යාපේක්ෂකයා)

"පණ්ඩුපලාස" යනු, පැවිදි දිවිය අපේක්ෂාවෙන් සිටින, පා සිවුරු පිළියෙල කර ගන්නා තැනැත්තා ය. කතිකාවත් සකස් කිරීමට පෙර පණ්ඩුපලාස අධ්‍යාපනයක් තිබුණු බවට තොරතුරු හමුවේ. මහාවංශයෙහි[55] සඳහන් වන අන්දමට, සංඝයා වහන්සේලාගේ ඇසුරෙහි අවුරුද්දකට අඩු කාලයක් සිටිය ද වරදක් ලෙස නො සලකනු ලැබුවත්, දඹදෙණි කතිකාවතෙහි එය අවුරුද්දක් ලෙස දක්වා ඇත. බුද්ධ කාලයෙහි පණ්ඩුපලාස අධ්‍යාපනය ලැබිය යුත්තේ අන්‍ය තීර්ථකයන් පමණි. එය සිවුමස් අධ්‍යාපනයක් ලෙස මහාවග්ග පාලියෙහි දැක්වේ.[55] භික්ෂූන් වහන්සේලා විෂමාචාර



ක්‍රියාවලින් වළක්වා ගැනීමේ අරමුණින් කතිකාවත් සකස් කිරීමෙන් පසුව, ලාංකේය භික්ෂු විනයට අනුව කුලපුත්‍රයෙකු බුද්‍ධ දහම කෙරෙහි පැහැදී මහණ වන්නේ නම්, ඔහු මහණ වීමට පෙර අධ්‍යාපනයක් ලැබිය යුතුය. "....(තුන්) මසින් සතර් බණවර්..." යනුවෙන් කළුදියපොකුණ සෙල් ලිපියෙහි[57] දැක්වේ.

බුද්ධ කාලයෙහි අන්‍යාගමියෙකු මහණ වන්නේ නම් පමණක් මාස හතරක අධ්‍යාපනයක් ලැබිය යුතු බව මහාවග්ග පාලියෙහි[58] සඳහන්ව ඇත. මේ අනුව, කතිකාවත්වල දැක්වෙන ආකාරයට මහණවීම සැලසුම් කිරීමේ දී "මහණ වීමට පැමිණෙන සියලු දෙනාම පණ්ඩුපලාසයන් ලෙස" අධ්‍යාපනය ලැබිය යුතු ය. මහණ කළ යුත්තේ ඉන් පසුව වන අතර සතර බණවර කට පාඩමින් දන්නා අය මහණ කළ යුතු බව, V වන කාශ්‍යප රජුගේ ලිපියෙහි[59] අන්තර්ගතය. ඇණවුම් සකස්කඩ, ධම්පියා හා කතිකා බණ පුහුණු විය යුතු ය.[60]

මෙමගින් බලාපොරොත්තු වූයේ භික්ෂු ජීවිතය මැනවින් පවත්වා ගෙන යාම සඳහා මූලික අධ්‍යාපනයක් සේ ම අවබෝධයක් ලබාදීමට ය. දඹදෙණි යුගය වන විටත් පණ්ඩුපලාස අධ්‍යාපන ක්‍රමය පැවති බව දඹදෙණි කතිකාවතෙහි[61] ද අන්තර්ගත ය. එහෙත් මෙම වකවානුවෙහි එය වඩාත් සංකීර්ණත්වයට පත්ව ඇති බව, ගණසංගණිකාවලින් තොරවීම හෙවත් පිරිස් සමග එකට සිටීමෙන් වැළකී සිටිය යුතු බව හා නිතර දොඩමලු ස්වරූපයෙන් ද ඈත් විය යුතු බව දඹදෙණි කතිකාවතෙන් පැහැදිලි වේ. එමෙන් ම මහණවීමට පෙර ඔහු ඇණවුම් සකස්කඩ, බණවර, ධම්පියාව ලිවීම හා කියවන්නට හැකි අයුරුත් පුහුණු කර මහණ කරවන ලෙස[62] දඹදෙණි කතිකාවත වාර්තා කරන අතර ම චතුපාරිසුද්ධි ශීලය හා සතර කමටහන් ද ප්‍රගුණ කළ යුතු යැයි අනිවාර්ය කරනු ලැබුවේ සංඝ සමාජය නො පැහැදුණු අයගේ පැහැදීම හා පැහැදුණු අයගේ වැඩි ප්‍රසාදය සඳහා ය.

CS CamScanner

### 4.2.2 මහණ කිරීම විධිමත් කිරීම

මහණ කිරීම කොටස් දෙකකට බෙදා දක්වා ඇත. එනම්, සාමණේර පැවිද්ද හා මහලු පැවිද්ද යනුවෙනි. සාමණේරවරු පුහුණු කිරීම සඳහා ත්‍රිපිටකය තුළ අන්තර්ගත වනුයේ "ඛුද්දක පාඨ" [63] නම් වූ ග්‍රන්ථයෙහි ය. කෙසේ නමුත්, ලංකාවේ කුලදරුවන් මහණ කිරීමේ දී සිදුව තිබූ වැරදි පිළිවෙත් ඉවත් කොට බුදුන් වහන්සේ පෙන්වා දී ඇති පරිදි හා ඒ වන විට ලාංකේය සසුන තුළ ක්‍රියාත්මක ව පැවති විනය නීති ග්‍රන්ථවල දැක්වෙන ආකාරයට මහණ කිරීම සිදුකොට ඇති බව කතිකාවත්වල තොරතුරු අන්තර්ගතය. ඒ අනුව බාලවයසේ සිටින අය මහණ නොකළ යුතු යැයි අනුරාධපුර පුවරු ලිපියෙහි දැක්වේ.[64] බුදුන් වහන්සේ ද කපුටෙකුවත් එළවා ගැනීමට තරම් හැකියාවක් ඇති කුල පුත්‍රයන් මහණ කළයුතු බව දක්වා තිබේ.[65] මහණ කිරීමේ දීත් පිරිත් පොත, සතර බණවර උගත් අය පමණක් මහණ කරන ලෙස V වන කාශ්‍යපගේ ලිපියෙහි වැඩිදුරටත් දක්වා ඇත.[66] මෙයින් බලාපොරොත්තු වන්නට ඇත්තේ යම්කිසිවක් මැනවින් තෝරා බේරා ගැනීමට හැකි තරම් බුද්ධියකින් යුක්තවීමයි. එය මනා භික්ෂු පාලනයක් ඇති කිරීමට වඩාත් පහසුවීම අදහස් වන්නට ඇත. පාලනයේ දී සකස් කරනු ලබන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කර ඇති බැව් මින් පැහැදිලි වේ.

මහණ කිරීම විධිමත් කිරීම පිළිබඳව බොහෝ කරුණු සඳහන් වනුයේ, දඹදෙණි කතිකාවතෙනි.[67] මහණ කිරීම සොයා බලා සිද්ධකරන ලෙස නිශ්ශංකමල්ල සෙල් ලිපියෙහි අන්තර්ගත ය.68 පැවිදි දිවිය අපේක්ෂා කරනු ලබන පණ්ඩුපලාසයා පිරිස් සමග රැස්ව සිටීම හා දොඩමලු බවින් තොර විය යුතු ය. "ශඨ කූට කෛරාටි(ක) ගුණනුවණ නැති පාප සත්වයන් නොවිචාරා මහන නොකටයුතු" යයි නිශ්ශංකමල්ල රජුගේ සෙල් ලිපියෙහි ද දැක්වේ.[69] මහණ වන්නට පෙර පණ්ඩුපලාසයාගෙන්, අසනු ලබන ප්‍රශ්න අතර, සිවුපසයෙහි ලොල් බවක් නොදක්වන, සංඝයා වහන්සේලාට ගරු බුහුමන් දක්වන හා ක්‍රීඩා ආදියෙහි නො ඇලෙන යන ගුණ ධර්මයන් ද තිබිය යුතු ය. මහණ කිරීම සිදු කළයුත්තේ භික්ෂූන් වහන්සේලා තුන් නමකගේ සහභාගීත්වය ඇතිව ය.[70] එය ජාති ගෝත්‍ර විමසීමෙන් ආරම්භ වී ඇත. එයට අමතර ව, ප්‍රත්‍යයෙහි



ලොල් බවක් නො දැක්විය යුතු ය, සංඝයාට ගරු බුහුමන් දැක්විය යුතු ය, ක්‍රීඩා පරවශ නො වීම යන ගුණධර්ම ප්‍රගුණ කොට තිබිය යුතු ය.[71] තථාගත බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් මහණ කර ගැනීමේ දී කුලය නො සැලකූ බව පහාරාද සූත්‍රයෙන්[72] පිළිබිඹු වේ. දඹදෙණි කතිකාවට අනුව, මහණවීමේ දී සලකා බලනු ලබන කුලය ලෙස දක්වා ඇත්තේ ග්‍රාමවාස හා වනවාසය යි. මෙලෙස කුලය[73] සලකා බැලීමෙන් බලාපොරොත්තු වන්නට ඇත්තේ මෙම වකවානුව වන විට කුලය ප්‍රබල ස්ථානයක් ගෙන තිබීමත් එමගින් ගෞරවයක් අපේක්ෂා කිරීමත් නිසා විය හැකි ය.

මහණ කිරීමට ප්‍රථම දෙවෙනුව ලිවීම හා කියවීම සලකා බැලිය යුතු අතර, එම කාර්ය සිදු කිරීමට භික්ෂූන් වහන්සේ නමකට භාර විය. දඹදෙණි යුගය වන විට භික්ෂුවගෙන් අපේක්ෂා කළ එක් කාර්යභාරයක් වූයේ බෞද්ධ ග්‍රන්ථකරණය යි.[74] මහණ කරන අවස්ථාවේ සිට ම එය සොයා බැලීමෙන් වඩාත් සංවිධිත බෞද්ධ අධ්‍යාපනයක් සකස් කිරීමේ අරමුණ මුදුන් පමුණුවා ගැනීමට සකස් කරන ලද සැලසුම් කිරීමකි.

පැවිදි කිරීමේ දී කල්ගත වූ රෝග ලෙස සැලකෙන කුෂ්ඨ, ගණ්ඩ, ගෙඩි, වන හා අපස්මාර යන රෝග ඇති[75] අය මහණ නො කරන ලෙස දක්වා තිබුණත්, කතිකාවත්වල එබඳු රෝග දක්වා නැත. එහෙත්, සමන්තපාසාදිකාවෙහි[76] දැක්වෙනුයේ අර්ශස්, පත්, සෙම්, කාස, ශ්වාස යන රෝගයන් ය. බුද්ධ කාලයෙහි රෝග විනිශ්චයන් සිදු කරනු ලැබුවේ ජීවක වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලබා ගැනීමේ පරමාර්ථයෙන් මහණ වී රෝගය සුව වීමෙන් පසුව නැවත ගිහි බවට පත්වීම වැළැක්වීමේ අරමුණින් වුවත්, කතිකාවත්වල දැක්වෙන ආකාරයට එබඳු පසුබිමක් ලංකාව තුළ නො වී ය. එහෙත්, සමන්තපාසාදිකාවෙහි දැක්වෙන රෝගයන් ද එක්වරම සුව කරගත නො හැකි රෝගයන් වන අතර ම ඊටත් වඩා පිළිකුල් සහගත වන හෙයින් ද එබඳු රෝගීන්ට භික්ෂු ජීවිතයට අදාළ කාර්යයන් මැනවින් ඉටු කිරීමට තරම් කායික හා මානසික ශක්තියක් නොමැති හෙයින් මෙලෙස සැලසුම් කරන්නට ඇත.

CamScanner

රෝග විනිශ්චයෙන් පසුව පණ්ඩුපලාසයා මාහිමි අසලට රැගෙන යා යුතු අතර, පැවිදි අපේක්ෂකයාගේ තොරතුරු දැන්වීමෙන් අනතුරුව මහණ කිරීමට සුදුසු කුලපුත්‍රයෙකු ලෙස පිළිගත යුතු ය. අනතුරුව සංඝ සභාවෙහි භික්ෂුවක් විසින් පැවිද්ද අපේක්ෂා කරන පුද්ගලයාගේ කුල දෝෂයක් නැති බව ප්‍රකාශ කළ යුතු ය.

පණ්ඩුපලාසයන්ගේ කුලදෝෂයන් පිළිබඳව සොයා බැලීමට ද භික්ෂුවක් පත් කර තිබීමෙන් වඩාත් පිරිසිදු ලෙස මෙම කාර්ය සිදු කිරීමට සැලසුම් කොට ඇති බවත්, සංවිධාන ගත කොට ඇති බවත් අනාවරණය වෙයි.

මහණ කිරීම සඳහා සුදුසු වයස් ප්‍රමාණය අන්‍ය කතිකාවත්වල සඳහන් නො වුවද දඹදෙණි කතිකාවතෙහි[77] දක්වා ඇත. ගම්වාසයට ඇතුළත්වීමේ දී වයස අවුරුදු දොළහක් විය යුතු අතර, වනවාසයට ඇතුල්වන්නේ නම් අවුරුදු දාහතරක් විය යුතු බව දැක්වේ. බුද්ධ කාලීන මහණ කිරීමේ දී එය වරින් වර සංශෝධනය වී අවසානයෙහි වයස අවුරුදු පහළොවට අඩු වුවත් මහණ විය හැකි බව දක්වා තිබේ.[78]

ඉහත සඳහන් කරුණු සම්පූර්ණ වීමෙන් ම පමණක් පැවිද්ද සම්පූර්ණ නොවේ. යම් හෙයකින් පැවිදි කිරීමේ දී කතිකාවත්වල දැක්වෙන නියමයන් අනුගමනය නො කළහොත්, උපාධ්‍යායන් වහන්සේ ට දඬුවම් ලබා දෙයි. මෙයින් බලාපොරොත්තු වන්නට ඇත්තේ භික්ෂු ජීවිතය වඩාත් සංවිධිත කිරීමට විය හැකි ය. පැවිදි කිරීමේ දී ප්‍රතිඥාව අසත්‍ය වුවහොත් උපාධ්‍යායන් වහන්සේ කෙනෙක් වෙත භාර කළ යුතු ය. ප්‍රතිඥාව වැරදීමෙන් උපාධ්‍යායාට පමණක් නොව පැවිද්දාට ද පැවිදි බව අහිමි වන අතර, ඔහු ගිහි බවට පත් කළ යුතු බව දක්වා තිබේ. දෙවෙනි වර පැවිද්ද කරවීමට භාර ගත් උපාධ්‍යයන් වහන්සේ පසුව විශේෂ පුහුණුවක් ලබා දිය යුතු අතර, තමන් වහන්සේගේ නිකායේ සියලුම භික්ෂූන් වහන්සේලා කැඳවා "මහණ කතිකාවත කියවා ගුණ උපන් කල" පැවිදි කළ යුතු යැයි දඹදෙණි කතිකාවත[79] වැඩිදුරටත් දක්වා ඇත.

මහණ කිරීම සැලසුම් කිරීමේ දී, මහණ වී උපසම්පදාව ලැබ, සිවුරු හැර පසුව මහණ වන්නවුන්ට මහණ වීමට අවසර



නො දිය යුතු බව දඹදෙණි කතිකාවත දක්වයි. සාමණේර පැවිද්දේ දී, සාමණේර ජීවිතයට පටහැනිව වාසය කොට උපැවිදි වී නැවත පැවිද්ද ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, පැවිද්ද ලබා නොදිය යුතුය. මේ තුළින් ද බලාපොරොත්තු වූයේ භික්ෂු ජීවිතය වඩාත් නිවැරදි මඟට යොමු කිරීමයි.

### 4.2.3 සාමණේර අධ්‍යාපනය

පැවිද්දේ සිට උපසම්පදාව තෙක් කාලය තුළ හෙරණ පැවිද්දා ගතකළ යුතු ආකාරය සැලසුම් කිරීම ද කතිකාවත්වල දක්නට ලැබෙන ලක්ෂණයකි. මෙම කාලපරිච්ඡේදය තුළ ඉගෙන ගත යුතු විෂය මාලාවන් ඉගෙනීම ද එයට අමතරව භාවනාව ප්‍රගුණ කිරීම ද සිදු කළ යුතු ය. එහි කායගතාසති භාවනාවෙහි යෙදීම අනිවාර්ය වී තිබිණි. ඒ අනුව, පැවිද්ද ලැබූ පුද්ගලයා ඉන් පසු දසධම්ම සූත්‍රය, හෙරණසිඛ, සේඛියා කටපාඩම් කොට තිබිය යුතු ය.[80] එහෙත් දඹදෙණි කතිකාවත වාර්තා කරනුයේ, හෙරණසිඛ හා සේඛියා ඉගෙන ගතයුතු බවයි.[81] "අධ්‍යාපනය ලබන කාලය තුළ සතර කමටහන් සහ චතුපාරිශුද්ධි ශීලය ඉගෙන ගත යුතුය.[82] හෙරණ පැවිද්දන් විසින් ධූතාංග තුනක් රැකීම ද අනිවාර්ය වී තිබුණි.[83]

### 4.2.4 මහලු පැවිද්ද

කතිකාවත් මගින් භික්ෂු සමාජය සංවිධානය කලමනාකරණය කිරීමේ දී "මහලු පැවිද්ද" යනුවෙන් වෙනම ම මහණ කිරීමක් ඇතුළත් කොට ඇත.[84] මහලු පැවිද්ද උසස්වීම් පටිපාටියේ අවස්ථාවක් බව මැන්දිස් රෝහණදීර මහතා[85] සඳහන් කරයි. එහෙත් දඹදෙණි කතිකාවතෙහි දැක්වෙන ආකාරයට එය මහණ කිරීමේ අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ එයට අදාළ වන්නාවූ නීතිරීති දක්වා තිබීම නිසා ය.[86] මහලු පැවිද්ද යනු වයස අවුරුදු විස්ස ඉක්මවා ගොස්, බුදු දහම කෙරෙහි පැහැදී මහණ වීමට පැමිණෙන අයට ලබා දෙන මහණ කිරීමේ ක්‍රමයක් ලෙස උපකල්පනය කළ

හැකි ය. මෙම පැවිද්ද අපේක්ෂා කරන කුල පුත්‍රයා උපාධ්‍යායන් වහන්සේ යටතේ වසරකට නො අඩු කාලයක් වත් පිළිවෙත් ආදිය පිළිබඳ ව අධ්‍යාපනය ලැබිය යුතු ය. මෙය, බුද්ධ කාලීන මහණ කිරීමට වෙනස් වූ ක්‍රමයක් අනුගමනය කිරීමක් වන නමුත් බුද්ධ කාලයෙහි ද විසි වයස් ඉක්මවූවන් මහණ කරනු ලැබීය. තත්කාලීන භික්ෂු සමාජයෙහි මහණ කිරීමෙහි ඇති ව තිබූ විෂමතා අවම කරගැනීමේ හා විධිමත් ලෙස පැවැත්වීමේ අරමුණින් යුතු ව සකස් කළ සැලසුම් කිරීමක් ලෙස සැලකිය හැකි ය.

## 4.2.4.1. මහලු උපසම්පදාව ලබා දීම

මහලු පැවිද්දන් විසින් සම්පූර්ණ කළ යුතු අධ්‍යාපනයන් සම්පූර්ණ කළ පසුව, උපසම්පදා අපේක්ෂකයාව සංඝයා මධ්‍යයට පමුණුවා උපසම්පදා වීමට සුදුසුකම් තිබෙන බව සංඝ සභාවට දැන්වීමෙන් පසුව උපසම්පදාව ලබාදීමට ප්‍රථම ප්‍රශ්න විසිතුනක් අසනු ලැබේ.[87] උපසම්පදාවෙන් පසුව උපාධ්‍යායන් වහන්සේ යටතේ අවුරුදු තුනක් අධ්‍යාපනය ලැබිය යුතු ය.[88] එහෙත් බුද්ධ කාලීන උපසම්පදා අපේක්ෂකයාගෙන් අසනු ලැබුවේ ප්‍රශ්න පහළොවක් පමණි.[89]

1. සුවචයෝද?
2. මේ පැවිද්දෝ සම්පූර්ණ විංශතිවර්ෂයෝද?
3. බුද්ධාදිරත්නත්‍රයෙහි ද තමන් විසින් පිරිය යුතු ශික්ෂායෙහි ද ශ්‍රද්ධාසම්පත්තීන් යෙදී වෙසෙද්ද?
4. යටත් පිරිසෙයින් අවුරුද්දක් පමණ කල් තමන් ගුරුන් නොහැර වෙසෙමින් සිටියෝද?
5. තමන් විසින් සමාදන් වූ ගුණධර්ම ඛණ්ඩාදී භාවයට නො පමුණුව ස්වොත්සාහීවැ රක්ෂාකෙරෙද් ද?
6. තමන් යෙහෙන් පමණක් ධුතාංග සමාදානය කොට වෙසෙද්ද?
7. හෙරණසිඛ වනපොත් කොට අසා නිමවූද?
8. කතිකාබණ වනපොත් කොට අසා නිමවූද?



9. මහලු සබ්‍රම්සරුන් කෙරෙහි පිළි පදනා වත් දැනැ සිතනබා ඒවූ පරිද්දෙන් වෙසෙද්ද?
10. අදින්නාදාන පාරාජිකයෙන් සංසයක් නූපදවා විසූද?
11. උපන් අධිකරණයක් වෙහෙස නොදී ප්‍රකාශ කෙරෙද්ද?
12. කලහකාරී නොවෙද්ද? මණ්ඩනශීලි නොවෙද්ද?
13. චතුර්විධ ප්‍රත්‍යායෙහි වදාළ සන්තෝෂයෙන් තමන්ට සුදුසු ලෙස සන්තුෂ්ටවෙද්ද?
14. ගුරුන් ආදීන්ට කළමනා වත් පිළිවෙත් සරුවෝද?
15. බැලූවනට රිසියෙන කායවාක් සමාචාරයෙන් යෙදී වෙසෙද්ද?
16. තමන්ට ප්‍රතිනියතවූ ග්‍රන්ථධුර විදර්ශනාධුරයෙහි නො-පමාව වෙසෙද්ද?
17. ග්‍රන්ථධුර පුරන්නෝත් ඇසිල්ලක් පුරා වෙසෙද්ද?
18. රාජභට නොවෙද්ද?
19. සිවුරු නොහළුවෝද?
20. විචාරයෙන් මහණවූද?
21. ජාතිගෝත්‍ර විරෝධයෙක් නැද්ද?
22. නිරෝගියෝද?
23. කතිකා බණ වනපොත් නියාදැයි

මෙසේ විචාරණ අතර අවුරුදු තුනක් උපාධ්‍යායන් වහන්-සේ සමීපයෙන් වසන බවට ප්‍රතිඥා දීම ද මහලු උපසම්පදාවේ තවත් විශේෂ ලක්ෂණයකි. උපසම්පදාව ලබා දීම සඳහා විමසනු ලබන ප්‍රශ්න විමසා බැලීමේ දී බුදුන් වහන්සේ උපසම්පදාවෙන් පසුව අනිවාර්ය කරනු ලැබූ සතර පාරාජිකා උපසම්පදාව ලබා ගැනීමේ දී විමසා ඇති බව, දසවන ප්‍රශ්නයෙන් පැහැදිලි වේ.

දඹදෙණි කතිකාවතෙහි උපසම්පදාවේ දී අසනු ලබන ප්‍රශ්න බුද්ධ කාලීන උපසම්පදාපේක්ෂකයාගෙන් අසන ප්‍රශ්නවලට සමාන නො වූවත් මහාවග්ග පාලියෙහි ම අන්තර්ගත ප්‍රශ්නවලින් යුක්ත බව පැහැදිලිය. මහාවග්ග පාලියෙහි දැක්වෙන ආකාරයට ලෙඩ

රෝග පහක් පිළිබඳව විමසා බලනු ලබන නමුත්, කතිකාවතෙහි දැක්වෙනුයේ, "නියෝගියෝද" යනුවෙනි. සමන්තපාසාදිකාවෙහි දැක්වෙනුයේ, මහාවග්ග පාලියට වෙනස් වූ රෝග පහකි.[90] කෙසේ නමුත් රෝග විනිශ්චය සිදු කිරීමෙන් අනතුරුව උපසම්පදාව ලබා දී ඇති බව පැහැදිලි ය.

කතිකාවත් මගින් භික්ෂු සමාජයෙහි උපසම්පදාව සැලසුම් කිරීමේ දී සිවුරු හැරීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කොට ඇති බව, "සිවුරු නොහළවෝද?" යනුවෙන් විමසීමෙන් අවබෝධ වේ. දඹදෙණි යුගය වන විට සිවුරු හැරගොස් නැවත පැවිදිවන්නන්ට නැවත උපසම්පදාව ලබා නොදීමට තීරණය වී තිබුණු බව මෙයින් පැහැදිලි ය. ඇතැම් විට සාමණේර අවධියෙහි උපැවිදි වී, නැවත මහලු කළ පැවිදි වීමට අපේක්ෂා කිරීම මෙලෙස "මහලු පැවිද්ද" යනුවෙන් වෙනම ම පැවිදි කිරීම සැලසුම් කිරීමට හේතු වූ සාධක විය හැකිය.

දඹදෙණි කතිකාවතෙන් භික්ෂූන්ගේ උපසම්පදාව සැලසුම් කිරීමේ දී බුදුන් වහන්සේ විසින් උපසම්පදා අපේක්ෂකයෙකුගෙන් අසනු ලබන, පාසිවුරු සම්පූර්ණද? යන ප්‍රශ්නය දක්වා නොමැත. මේ වන විට භික්ෂු සමාජය තුළ එබඳු ගැටලුවක් මතුව නො තිබීම එයට හේතුව වන්නට ඇත.

### 4.2.4.2 මහලු පැවිදි වූවන්ගේ අධ්‍යාපනය

ග්‍රන්ථ ධුරය දරන්නා වූ මහලු පැවිද්දන් විසින් හැදෑරිය යුතු විෂය මාලාවක් ද දඹදෙණි කතිකාවතෙන් නිර්දේශ කොට ඇත.[91] කුදුසික සහ පාමොක් දෙක ඉගෙන ගත යුතු අතර, දසධම්ම සූත්‍රය හා අනුමාන සූත්‍රයත් කටපාඩම් කළ යුතු ය.[92] මුල් සික සේඛියා හා සිකවළඳ විනිස ද ඉගෙනීම අනිවාර්ය ය. මහලු පැවිද්දන් මැනවින් සකස් කිරීමේ දී, මාස හතරකට වරක් තමන් ඉගෙන ගනු ලැබූ දේ පිරික්සා බැලීම සිදු කිරීමට ද සැලසුම් කොට තිබිණි.[93] දසධම්ම සූත්‍රය නිතර ම සිහි කළ යුතු සූත්‍රයක් ලෙස අනිවාර්යය විය. මහණ කිරීම කළමනාකරණය කිරීමේ දී වැඩි අවධානයක් යොමු කරනු ලැබුවේ විදර්ශනාධුරය වෙත බැව් පොළොන්නරු කතිකාවතෙහි



දැක්වේ. ඒ බැව් "චාරිත්‍රානුකූල කමටහන් උගන්වා විදර්ශනා ධුරයෙහි මැ යොදා චතුසම්පජංඤ කථායෙහි වදාළ පරිද්දෙන් දවස් යවනු කොටැ පැවැත්වියැ යුතු..." යනුවෙන් දැක්වීමෙන් පැහැදිලි ය.[94]

### 4.2.5 උපසම්පදා භික්ෂු අධ්‍යාපනය

උපසම්පදාව ලබා ගැනීම උදෙසා සාමණේර අවධියෙහි මාස තුනක්වත්, සතරබණවර ඉගෙන ගත යුතු ය.[95] එලෙස උපසම්පදාව ලබන භික්ෂු සමාජ සංවිධානය මැනවින් සකස් කිරීමේ දී උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේලා පිළිබඳව ද අවධානය යොමු කොට ඇත. දඹදෙණි යුගයෙහි[96] පමණක් නොව අනුරාධපුර යුගයෙහි ද මෙය ක්‍රියාත්මකව පැවති බව සිකවළඳ හා සිකවළඳ විනිස ග්‍රන්ථය[97] භික්ෂූන් වහන්සේලා උදෙසා ම සකස් කිරීමෙන් පැහැදිලි ය.*

නවක උපසම්පදාව ලත් භික්ෂුව ගණදෙට[98] තෙර නමින් ආචාර්යවරයෙකු යටතේ "නිස්සය" සමාදන්වීම සිදු කළ යුතු ය. උපසම්පදාව සැලසුම් කිරීමේ දී බුදුන් වහන්සේ හඳුන්වා දුන් ආචාර්ය - උපාධ්‍යාය යන වචන වෙනුවට "ගණදෙටු" යන වචනය භාවිත කොට ඇති බව දක්නට ලැබෙන නමුත්, බුදුන් වහන්සේ එබඳු අවස්ථාවලදී ක්‍රියා කළ යුතු පිළිවෙත් ආදියෙහි කිසිදු වෙනසක් සිදුකොට නොමැති බව ද දක්නට ලැබේ. මෙම ගණදෙටු තෙරුන්ගේ වගකීම වනුයේ උපසම්පදාව ලත් භික්ෂුව, ග්‍රන්ථධුර හා විදර්ශනාධුර දෙකට යොමු කිරීමයි. විදර්ශනා ධුරයට යොමු කිරීමෙන් හා මඟ පෙන්වීමෙන් තමාගේ විමුක්තියත්, ග්‍රන්ථධුරය සඳහා අධ්‍යාපනය ලබා දීමෙන් පොදු ජනතාවගේ විමුක්තියත් යන උභයාර්ථ සාධනය සඳහා යොමු කිරීමට මග පෙන්වීමට කටයුතු යොදා ඇත.

උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේලා ද අනුක්‍රමයෙන් උසස්වීම් ලබන ආකාරයට සැලසුම් කොට ඇති බව පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්වල[99] අවස්ථා තුනකට බෙදා දක්වා ඇත.

nned with CamScanner
CamScanner

එනම්, නවක, මධ්‍යම, ථෙර යනුවෙනි. කතිකාවත්වල ඒ හා සම්බන්ධ තොරතුරු සඳහන් නොවූවත්, කංඛාවිතරණී ටීකාවෙහි[100] උපසම්පදාවෙන් වස් දක්වා කාලය නවක කාලයටත්, වස් පහක් හා අතිරේක වස් පහක් ගත කොට තිබේනම් මජ්ඣිම ගණයටත් හා වස් දහයක් හා අතිරේක වස් දහයක් ඇති භික්ෂූන් වහන්සේලා ස්ථවිර ලෙසත් දක්වා තිබේ. කතිකාවත්වල සඳහන් වන්නේ ද මෙම අවස්ථා තුන ම බව මැන්දිස් රෝහණදීර මහතා පවසයි.[101]*

උපසම්පදාව ලබා දීමේ දී එය රාජ්‍ය අනුග්‍රහයෙන් මිස වෙනත් ස්ථානවල ලබා නොදිය යුතු බවට තීරණයක් දඹදෙණි කතිකාවතෙහි දක්වා ඇත.[102] එමෙන් ම උපසම්පදා උත්සවය නීත්‍යනුකූල වනුයේ "මාහිමි" හෝ උන්වහන්සේගේ නියෝජිතයෙකු පැමිණීමෙන් පසුව ය. බුදුන් වහන්සේ ද අලජ්ජි භික්ෂූන්ට සවග මහණුන් උපසම්පදාව ලබා දීම නිසා එබඳු භික්ෂූන්ට නිස නො දිය යුතු බව තීරණය කළහ.[102] මෙමගින් තම පිරිස පාලනය කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි නීතිරීති සංශෝධනය කොට ගෙන පාලනය ගෙන ගොස් ඇති බවත්, එය සාර්ථක කළමනාකරුවෙකුගේ ලක්ෂණයක් බවත් දැක්විය හැකි ය. කතිකාවත්වල සඳහන් නොවූවත් දැක්වෙන තොරතුරුවලට අනුව, විවිධ පරමාර්ථයන් මුදුන්පත් කරගැනීම සඳහා උපසම්පදාව ලබා දී ඇති බව පැහැදිලි ය. එය විධිමත් කිරීම උදෙසා ලාංකේය භික්ෂූන් වහන්සේලා බුද්ධ කළමනාකරණ න්‍යායක් පාදක කොට ගෙන, "මාහිමි" තනතුරක් ඇති කිරීමෙන් බලාපොරොත්තු වන්නට ඇත්තේ භික්ෂූන් වහන්සේලා තුළ පැවති ගැටලු අවම කර ගැනීම සඳහා විය හැකි ය. එමගින් ලාංකේය භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමේ දී සම්ප්‍රදායත් තත් කාලීන භික්ෂු සමාජයත් පිළිබඳව සලකා බලා සැලසුම්කරණය හා පාලනය කිරීම සිදුකොට ඇති හෙයින්, සාර්ථකත්වයට හේතු වන්නට ඇත.

උපසම්පදාව ලබාදීම විධිමත් කිරීමට සැලසුම් කිරීමෙන් සෑහීමට පත් නොවූ භික්ෂූන් හා රජවරුන් එකී අධ්‍යාපනය කොටස් තුනකට බෙදා වෙන් කොට ඒ සඳහා සුදුසු අධ්‍යාපනයක් ලබාදීමට සැලසුම් කොට ඇත.[104] මෙම අධ්‍යාපනය ලබා දීමෙන් බලාපොරොත්තු වී ඇත්තේ භික්ෂූන්ට ත්‍රිපිටක ධර්මය පිළිබඳව



මනා අවබෝධයක් ලබාදීම හා භික්ෂුව කෙරෙහි මනා ගෞරවයක් බාහිර සමාජය තුළ ඇති කරවීම විය හැකි ය. උපසම්පදාව ලබා ගත් දින සිට නිශ්‍රයමුක්ත වන තෙක් ඉගෙන ගත යුතු විෂය මාලාවන් ප්‍රධාන කොටස් තුනකි.[105] එනම්,

1. නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය දක්වා උගත යුතු විෂය මාලාව
2. නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය දක්වා ඉගෙන ගැනීම
3. නිශ්‍රයමුක්ත සම්මුතිය සඳහා වූ අධ්‍යාපනය (භික්ඛුනෝවාද) යනුවෙනි.

එහෙත් දඹදෙණි කතිකාවතෙහි එම විෂය මාලාව නො දැක්වෙන අතර, සමන්තපාසාදිකාවෙහි ඒවා අන්තර්ගත ය.[106]

#### 4.2.5.1 නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය දක්වා ඉගෙන ගැනීම

උපසම්පදාව ලත් භික්ෂුවකට වර්ෂ පහක් ඉක්ම යාමෙන් පසුව මේ අවස්ථාව ලබා ගත හැකි ය. නිශ්‍රයමුක්ත භාවයෙන් ඉවත් වන්නට නම්,

- මුල් සික හා කතිකා බණ කටපාඩම් කොට සෑම පොහොයකදී ම පාඩම් දිය යුතු ය.
- සිඛවළඳ විනිස ග්‍රන්ථය හොඳින් අධ්‍යයනය කළ යුතු ය.
- නිශ්‍රයමුක්තයට සුදුසු බණ ටීකා ඉගෙන ගත යුතු ය[107]"
- උභය ප්‍රාතිමෝක්ෂය, කුඩුසිඛ අර්ථසංග්‍රහ පරිහරණය කළ යුතු ය.

"නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතයට සුදුසු බණ කතිකා කොට අසා නිමවා කල්පිරුණහොත් ගුරුන් විසින් උන්ගේ ධූතාංග ධරත්වාදී බොහෝ ගුණ කියා නායක තැනට පාවා දුන් කළ උභය ප්‍රාතිමෝක්ෂ කුඩුසිඛ අත්ථසඞ්ග්‍රහ පරිහරණය කරන ව්‍යාකරණ සුතුරු ධාතුපාඨාත්ථියෙහි අසම්පූර්ණවූ ඉගෙන වනපොත් දුන් කළ කංඛාවිතරණියෙන් තුන් තැනක් හා ඉතිරි සත් පොතින් එකී එකී තැන් පරීක්ෂා ගෙනැ නිශ්‍රය මුක්තාංග වනපොත් ගෙනැ මෙසේ

Scanned with CamScanner
CamScanner

ගුණ නුවණ පරීක්ෂා කොට නිශ්‍රය මුක්ත සම්මුති දිය යුතු. සම්මුති ලත්පසු තැන් පටන් ප්‍රාතිමෝක්ෂාදී යටකී බණ වන පොත් තබා කලින් කල සඟ මද වනපොත් දිය යුතු."

එක් එක් තැන් පරීක්ෂා කොට,නිශ්‍රය මුක්තාංග වනපොත් දීමෙන් පසුව නිශ්‍රයමුක්ත සම්මුතිය දිය යුතු ය. එයින් පසුව නිශ්‍රයමුක්තභාවය ලැබෙන අතර එදින සිට ම ප්‍රාතිමෝක්ෂය වන පොත් කොට, වරින්වර සංඝයා වහන්සේලාට කට පාඩම් දිය යුතු ය. ඉහත දැක්වෙන විෂය මාලාව හැදෑරීමෙන් පසුව සිව් දෙස නිදහසේ හැසිරෙන්නටත්, ස්වෛරීව වෙසෙන්නටත් හැකියාව ලැබේ.

### 4.2.5.2 නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය දක්වා ඉගෙන ගැනීම

මෙම විෂය මාලාව හැදෑරීමට අවශ්‍ය පොත්පත් දඹදෙණි කතිකාවතෙහි අන්තර්ගත නො වන නමුත්, සමන්තපාසාදිකාවෙහි දක්වා ඇත.[108] ඒ අනුව,

- උපසම්පදාව ලබා වස් පහක් ගත විය යුතු ය.
- වේමාතිකාව ඉගෙන ගෙන කටපාඩම් කළ යුතු ය.
- සූත්‍රාන්තයෙන් සතර බණවර ඉගෙන ගත යුතු ය.
- අන්ධකවින්ද, මහරාහුලෝවාද, අම්බට්ඨ සූත්‍රයන් ඉගෙන ගත යුතු ය.
- සංඝභත්ත, මංගල, අවමංගල අවස්ථාවන් උදෙසා අනුමෝදනා තුනත්
- උපෝසථ, පවාරණය දැනගැනීම සඳහා කම්‍මාකම්ම විනිශ්චය සහ එක් කම් ස්ථානයක් ඉගෙන ගත යුතු ය.

### 4.2.5.3 නිශ්‍රයමුක්ත සම්මුතිය සඳහා වූ අධ්‍යාපනය (භික්ඛුනෝවාද)

- උභය ප්‍රාතිමෝක්ෂය හැදෑරිය යුතු ය.
- කුදුසික, අත්‍ථසංග්‍රහ, ව්‍යාකරණ, සූත්‍රපාඨ සහ ධාතුපාඨ ඉගෙන කටපාඩම් දිය යුතු ය.
- මෙයින් පසුව පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.



පරීක්ෂණයෙන් අනතුරුව කංඛාවිතරණියෙන් නිර්දේශ කරනු ලබන අවස්ථා තුනක් සහ ඉතිරි සත් පොතින්* නියමිත විෂයයන් පිළිබඳව ශිෂ්‍යයාගේ දැනුම පරීක්ෂා කොට, නිසයෙන් මිදීමට අවශ්‍ය පොත්පත් කටපාඩම් ගනු ලබයි.

නිශ්‍රයමුක්ත භාවයෙන් මිදුණු පසුව "ස්ථවිර" තත්වය පිරිනැමීමට කතිකාවත්වල සැලසුම් කොට තිබිණි.[109] ඉහත දැක්වෙන විෂය මාලාවට අමතරව මෙම තත්ත්වයට පත්වීමට අවශ්‍ය සුදුසුකම් ද කතිකාවත්වල අන්තර්ගත කොට තිබීම ලාංකේය භික්ෂු සංවිධානය මැනවින් කළමනාකරණය කිරීමට ගත් උත්සාහයක් ගෙන ඇති අතර, නිශ්‍රයමුක්තභාවය භික්ෂු සංවිධානකරණයෙහි මූලිකම උපාධිය ලෙස ද සලකා තිබේ.

### 4.2.5.4 ස්ථවිර තත්ත්වයට පත්වීමට අවශ්‍ය මූලික සුදුසුකම්.

- මෙම තත්ත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේලා, සිල්වත් හා ගුණවත් විය යුතු බව යි.[110]
- ප්‍රත්‍යය බහුල කර නො ගැනීමත්, සසුනෙහි විනය නීති රීති ලිහිල් කර ගැනීමට උත්සාහ නො කිරීමත්
- සිය අනුගාමිකයන් නොමග නො යවා හැම ලෙසින් ම සිල්වත්ව ගුණවත් ව සිටිය යුතු ය.
- පඤ්චූපස්ථායක බාහුශ්‍රැතයෙන් යුක්ත විය යුතු ය.[111]
- උපසපන් වී වස් දහයක් ගත කොට තිබිය යුතු අතර, විභංග දෙක අධ්‍යයනය කිරීමෙන් පසුව කට පාඩම් දිය යුතු ය.
- ධුතාංග ධරත්වයෙන් යුක්ත විය යුතු ය.
- කම්මාකම්මය සහ ඛණ්ධකවත් ඉගෙන ගත යුතු යි.
- සූත්‍ර පිටකයේ කොටස් ඉගෙන ගත යුතු ය.[112]
- එම කොටස් අතර,

- දීඝ භාණක භික්ෂුවක් විසින් මහාවග්ගය ද
- මජ්ඣිම භාණක භික්ෂුවක් විසින් මූලපණ්ණාසකය ද
- සංයුක්ත භාණක භික්ෂුවක් විසින් මුල් වග්ග තුන හෝ මහා වග්ගය ද
- අංගුත්තර භාණක භික්ෂුවක් විසින් මුලින් හෝ අගින් නිකාය අර්ධයක් ද ඉගෙන ගත යුතු යි.

මෙම සුදුසුකම් සපුරාලන භික්ෂුව නායක හිමියන්ට භාරදීමෙන් පසුව, අධ්‍යාපන කටයුතු ආරම්භ කරයි. එහි දී ප්‍රථමයෙන් ම අධ්‍යයනය කරනුයේ "තෙර බණ" නමින් හැඳින්වෙන පාඨමාලාවයි.[113] මේ සඳහා ගත වන කාලය අවුරුදු පහකි. වර්ෂ පහ අවසානයේ දී උභය ප්‍රාතිමෝක්ෂය (භික්ඛු හා භික්ඛුණී ප්‍රාතිමෝක්ෂය) කට පාඩම් දිය යුතු ය.[114] කුදුසිඛ, අභිධර්මාර්ථසංග්‍රහය, ව්‍යාකරණ, සූත්‍රපාඨ සහ ධාතු පාඨ යන පොත් ද ඒ අතර විය.

අනතුරුව "ස්ථවිරාංග" නමින් හැඳින්වෙන පොත් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කිපයක් හෝ කට පාඩම් ගනු ලැබේ. අධ්‍යාපන සුදුසුකම් ද පරීක්ෂා කිරීමෙන් පසුව "ස්ථවිර" සම්මුතිය පිරිනමයි.

භික්ෂු ශාසනයෙහි පැවැත්ම රඳා පවතින විනය කර්ම ද වධාත් විධිමත් ලෙස පවත්වන්නට කතිකාවත් මගින් සැලසුම් කොට ඇත. ඒ අනුව, සංඝ කර්මවලදී භික්ෂු සංඛ්‍යාව නියම කොට තිබීම,[115] සතර නමක් සිටිය යුතු විනය කර්මය සඳහා භික්ෂූන් වහන්සේලා අට නමක් ද, පස් නමක් සිටිය යුතු විනය කර්ම සඳහා භික්ෂූන් වහන්සේලා දස නමක් ද, විසි නමක් සිටිය යුතු විනය කර්ම සඳහා භික්ෂූන් වහන්සේලා තිස් නමක් ද සිටිය යුතු ආකාරයට කතිකාවත් මගින් සැලසුම් කොට තිබේ. මේ තුළින් ලාංකේය භික්ෂූන් වහන්සේලාගේ සාමූහිකත්වය සේ ම බොහෝ දෙනාගේ කැමැත්ත තුළින් සංඝ පාරිශුද්ධිය ඇති කිරීමේ අරමුණින් යුතු ව සිදු කළ සැලසුමක් ලෙස සැලකිය හැකි ය.

භික්ෂු අධ්‍යාපනය සැලසුම් කිරීම ද කතිකාවත්වල දැක්වෙන සැලසුම්කරණයේ තවත් ලක්ෂණයකි. භික්ෂු අධ්‍යාපනය, ක්‍රි. ව. 1



වන සියවස පමණ වන විට ග්‍රන්ථ ධුර හා විදර්ශනාධුර යනුවෙන්-කොටස් දෙකකට බෙදුණි. ග්‍රන්ථධුර භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය වූයේ, ආරාමවල ඉගෙනීම හා ඉගැන්වීම යි. විදර්ශනාධුර භික්ෂූන් වහන්සේලා භාවනානුයෝගීව ජීවිත ගත කළහ. ග්‍රන්ථධුර දරණ භික්ෂූන් විදර්ශනාධුරය ද විදර්ශනාධුරය දරණ භික්ෂූන් ග්‍රන්ථධුරය ද දැරූහ. එහෙත් වැඩි සැලකිල්ල දැක්වූයේ ග්‍රන්ථ ධුර චරණ භික්ෂු කණ්ඩායම වෙත ය. පොළොන්නරු කතිකාවතෙහි ද "අත්වැඩ පරවැඩ සාධමින් කී ග්‍රන්ථයෙන් වැඩියක් කොටැගත නොහෙන..." ලෙස දක්වා තිබීමෙන් ග්‍රන්ථධුරය කෙරෙහි වැඩි අවධානයක් යොමුව ඇති බව පැහැදිලි ය. පොත්පත් ලිවීම මගින් බුදු දහම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට භික්ෂුවට මෙන් ම ගිහි ජනතාවට අවස්ථාව සැලසීමේ අරමුණින් ග්‍රන්ථ ධුරයට වැඩි සැලකිල්ලක් දැක්වීමට හේතු සාධක වන්නට ඇත.

ලාංකේය භික්ෂු ශාසනය, භික්ෂූන් වහන්සේලාට මෙන් ම ගිහි සමාජයට ද ප්‍රසන්න හිතකර සංවිධානයක් මෙන් ම වඩාත් ම සංවිධිත වූයේ, පොදු ජනතාවගේ ප්‍රසාදයට ලක් වන අයුරිනුත්, සකස් කිරීම සඳහා කතිකාවත් මගින් භික්ෂුව සැලසුම්කරණය කොට ඇති බව ඉහත සාකච්ඡා කළ කරුණුවලින් පැහැදිලි වේ.

## 4.3 භික්ෂු සංවිධානකරණය

ලාංකේය භික්ෂු සමාජයට නව සංඝ සංවිධාන සැලැස්මක් මුල් වරට ඉදිරිපත් වූයේ 1165 වර්ෂයේ සකස් කළ පොළොන්නරු කතිකාවතෙහි.[116] දඹදෙණි කතිකාවත වන විට එය අංග සම්පූර්ණ සංවිධානයක් බවට පත් විය.(සැලැස්ම බලන්න. පිටු අංක 179) මෙමගින් කළමනාකරණයෙහි ලක්ෂණයක් වන මතුවන ගැටලුවලට අනුකූලව විසඳුම් සොයා ගැනීමත්, කළමනාකරණය යනු, එක ම රාමුවක් තුළ ක්‍රියා නො කිරීමත් නො වන බව පැහැදිලි ය. සංඝ සමාජයෙහි භික්ෂූන් වහන්සේලාගේ සිට ප්‍රධාන පදවිය වන මාහිමි දක්වා අනුක්‍රමයෙන් ගමන් කරන්නාවූ තනතුරු ක්‍රමයක් හඳුන්වා දී ඇත.

Scanned with CamScanner
CS CamScanner

භික්ෂු සංවිධානකරණය තුළ ඉටු කිරීමට තිබෙන වැඩ කටයුතු අනුව, තනතුරු හඳුනා ගැනීම හා තනතුරු ඇති කිරීම ද වැදගත් ය. ඒ සඳහා ප්‍රථම වරට "මාහිමි" කෙනෙකු පත්කර ගනු ලබන්නේ දඹදෙණි කතිකාවතෙනි.[117] එම තනතුරට පත් වූ මුල් ම භික්ෂුව වනුයේ, දිඹුලාගල මේධංකර හිමියන් ය. එය ක්‍රි. ව. 1266 දී දෙවන පැරකුම්බා රජු විසින් සිදු කරන ලද ශාසන සංශෝධනයෙන් පසුව ය. මෙය නිශ්චිත අරමුණක් මුදුන් පමුණුවා ගැනීම සඳහා වන සංවිධානයක මූලික ලක්ෂණයකි. මෙම තනතුරට මූලික පසුබිම පරාක්‍රමබාහු කතිකාවතෙන් සැකසුණු බව අනුමාන කළ හැකි ය.

සංවිධානයකට අයත් වූ කිසියම් තනතුරක් උදෙසා වගකීම් හා ඒ සඳහා ව සුදුසුකම් ද සඳහන් වන්නේ නම් එය වඩාත් වැදගත් ය. ඒ අනුව, මාහිමි තනතුරට පත් වන්නට තිබිය යුතු සුදුසුකම් ද දඹදෙණි කතිකාවතෙහි දැක්වේ.[118] මාහිමි යනු ශ්‍රී ලංකා භික්ෂු ශාසනයෙහි උසස් ම පුද්ගලයා ය. (දඹදෙණි කතිකාවතෙහි සංඝ සංවිධාන සැලැස්ම බලන්න) පිටු අංක [181]

## 4.3.1 මාහිමි තනතුරට පත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

1. ග්‍රාමවාස මහතෙර පදවිය හෝ ආරණ්‍යවාස මහතෙර පදවිය දරණ භික්ෂු නමක් විය යුතු ය.
2. උපසම්පදාවෙන් විසි වයස් සම්පූර්ණ කළ යුතු ය.
3. යටත් පිරිසෙයින් ආයතන නායක පදවියේ වර්ෂ 10ක් සම්පූර්ණ කළ යුතු ය.
4. මාහිමි තනතුරට පත් කළ යුත්තේ රාජ්‍ය සහභාගිත්වයෙන් පැවැත්වෙන උපසම්පදා උත්සවයක දී විය යුතු ය.

අධිකාරය හා වගකීම්:

1. සංඝ සංස්ථාවේ ම අනුශාසක වශයෙන් ක්‍රියා කිරීම.
2. උපසම්පදා උත්සවය පැවැත්විය යුත්තේ මාහිමි වහන්සේගේ හෝ උන්වහන්සේගේ නියෝජිතයෙකුගේ සහභාගිත්වය ඇතිව ය.



### 4.3.1.1 මහථේර තනතුර

මාහිමි තනතුරට පහළින් තිබෙන තනතුර වනුයේ මහථේර තනතුර යි.

මූලික සුදුසුකම්:

1. වනවාස හා ග්‍රාමවාසයන්ට අයත් භික්ෂූන් වහන්සේලා විය යුතු ය.
2. උපසම්පදාවෙන් විසිපස් වසරක් පිරී තිබිය යුතු ය.
3. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය කඩ නොකොට ආරක්ෂා කළ යුතු ය.
4. අටුවා සහිත පිටකත්‍රය ගැඹුරට අධ්‍යයනය කළ යුතු ය.
5. පරෝපදේශනා ගුණය තිබිය යුතු ය.
6. ආදර්ශවත් චරිතයක් තිබිය යුතු ය.
7. අෂ්ටායතනාධිපතියෙකු විය යුතු ය.
8. "වනවාස" නිකායේ මහා ස්ථවිර තනතුරට පත්වීමේ දී ආරණ්‍යයක ප්‍රතිපත්ති පුරන්නෙකු විය යුතු ය.
9. ආරණ්‍යයක ප්‍රතිපත්ති යෙදවීමේ ශක්තියක් නැතහොත් පාලනය කිරීමේ ශක්තියක් තිබිය යුතු ය.
10. අවවාද දීමෙහි හා අන්‍යයන්ගේ වචන ඉවසීමෙහි හැකියාවක් තිබිය යුතු ය.

මෙම සුදුසකම් සනාථ කරනු ලබන භික්ෂූන් වහන්සේට මහථේර තනතුර සඳහා පත්විය හැක්කේ තුන් සිංහලයේ සංඝයාගේ ම අනුමැතිය ඇතිව ය.

වගකීම්:

1. ගණදෙටු තෙරුන්ට අවශ්‍ය බලතල ලබා දීම
2. ස්ථවිර සම්මුතිය සඳහා අධ්‍යාපනය ලබා දීම යනුවෙනි.

මහථේර තනතුරු දෙකක් දඹදෙණි කතිකාවතෙහි සැලසුම් කොට තිබේ.[119] සාර්ථක කළමනාකරණයක් පවතින්නේ නම්

අවස්ථාවෝචිත පරිදි සැලසුම් කිරීම හා පාලනය කිරීම් වෙනස් කර ගැනීමට හැකියාව ද තිබිය යුතු ය. ක්‍රි. ව. 14 වන සියවසේ මධ්‍ය භාගය වන විට භික්ෂූන් වහන්සේලා පස් දෙනෙකුට පමණ "මහථෙර" පදවි පිරිනමා ඇති බව වුත්තමාලා සතකයේ[120] සඳහන් ව ඇත. වනවාසී නිකායෙන් මහතෙරවරු තිදෙනෙක් හා දැදිගම ආශ්‍රමයේ වැඩසිටි මූල තෙරුන් දෙදෙනෙකුත් වශයෙනි. මෙයින් සාර්ථක කළමනාකරණයක් තුළ භික්ෂු සංවිධාන සැලැස්මක් නිර්මාණය කොට ඇති බව දක්නට ලැබේ.

14 වන සියවසේ අග භාගය වන විට තනතුරු නාමයන් ද සංශෝධනය කොට ගෙන ඇත.[121] "ස්ථවිර" නාමය "දේවරක්ෂිත" ලෙසත්, "මහාස්ථවිර" නාමය "ජයබාහු" ලෙසත්, "මහාසාමි" නාමය "ධර්මකීර්ති" යනුවෙනුත් සංශෝධනය වී ඇත.[122]

ක්‍රි. ව. 12 වන සියවසේ විධිමත් ලෙස සකස් කළ සංඝ සංවිධානය තවදුරටත් වර්ධනය වී ඇති බවත්, ඒ ඒ අවධිවලදී භික්ෂූන් පාලනය කිරීම උදෙසා එම අවධියට ගැළපෙන ආකාරයට වෙනස් කර ගැනීමට සැලසුම් කොට ඇති බවත්, එය සාර්ථක කළමනාකරණ ලක්ෂණයක් ලෙසත් සැලකිය හැකි ය.

### 4.3.1.2 අයතැන

මහතෙරට පසුව සංඝ සංවිධානය තුළ වැදගත් තනතුර වනුයේ 'අයතැන' තනතුරයි. මෙනමින් හැඳින්වෙන්නේ මූල අට හෙවත් ආයතන විය හැකිය. මූල අටෙහි[123] නායකයන් "අයතැන" ලෙස හඳුන්වා ඇත. අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ ආයතන දඹදෙණි යුගය දක්වා ම පැවති බව පැහැදිලි වන අතර ම, ඒවා මැනවින් සකස් කිරීම ද කතිකාවත්වල අරමුණක් වී තිබිණි.

අයතැන තනතුර සඳහා සුදුසුකම්:

1. ගුණ නුවණ ඇත්තවුන් විය යුතු ය.
2. දරුගම්*(විහාරගම්) හා වටනාපසගම්* (කැප ප්‍රත්‍යය) ආදියෙන් ලැබෙන ලාභයෙන් ගිජු නැති අය විය යුතු ය.



3. සංගමු ගණවැසි ගම්වල අඛණ්ඩ පරම්පරාවෙන් පැවත එන භික්මුණු භික්ෂූන් විය යුතු ය.
4. උපසම්පදාවෙන් දස වසක් සපුරා ලිය යුතු ය.
5. ස්ථවිර භික්ෂුවක් විය යුතු ය.
6. සංගමු ගම්වැසි ගම්වලින් පැවත එන භික්ෂුවක් විය යුතු ය.

මෙම තනතුරට පත් කිරීමේ දී මාහිමියන්ගේ අනුමැතිය ඇතිව, සංඝයා වහන්සේලාගේ අනුමැතිය හා රජුගේ සම්මුතියෙන් පත් කිරීම සිදුකරනු ලබයි.

වගකීම:

1. භික්ෂූන්ගේ ඕනෑ එපාකම් ගැන සොයා බැලිය යුතු ය.
2. ආරාම පාලනය සම්බන්ධ ගැටලු විසඳීමට හැකියාව තිබිය යුතු ය.

### 4.3.1.3 අයතැන් වැළත තනතුර

අනුරාධපුර යුගයේ අවසානයේ සිට ක්‍රියාත්මක වූ, ආයතන අට දඹදෙණි යුගය දක්වා ම පැවති අතර එම ආයතනයන් මැනවින් සැලසුම් කොට සංවිධානගත කිරීමක් දඹදෙණි යුගයෙහි ද සිදු කොට ඇති බව, දඹදෙණි කතිකාවතෙහි අන්තර්ගත ය. එම ආයතනවල උප අධිපතීන් "ආයතන වැළත" යනුවෙන් හඳුන්වා ඇත.

අයතැන් වැළත තනතුර සඳහා තිබිය යුතු සුදුසුකම්:

මෙම තනතුරට පත්වීම සඳහා තිබිය යුතු යුතුකම් ලෙස දක්වා ඇත්තේ, නිශ්‍රයමුක්ත භාවයත්, මූලය හෙවත් ආයතනයෙහි කැමැත්තත් සේ ම රාජ සම්මුතිය අවශ්‍ය බව යි.[124] එසේ ම "අයතැන" තනතුර සඳහා තිබිය යුතු සුදුසුකම් ද මේ තනතුරට අවශ්‍ය බව, ධම්මවිසුද්ධි හිමියෝ පවසති.[125] දඹදෙණි කතිකාවතෙහි ද "මේ තරම් වැ තෙනක්..." යනුවෙන් දැක්වෙන බැවින්, එය සනාථ

වෙයි. මේ අනුව, ආයතනාධිපති තනතුර සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම් මෙම තනතුරට ද අදාළ කිරීමට සැලසුම් කොට ඇත්තේ ආයතනාධිපති තනතුර හිස් වූ විට ඒ සඳහා පත්වීමට සුදුසුකම් ඇත්තේ මෙම අයතැන් වැළත හෙවත් උප ආයතනාධිපති හෙයින් විය හැකි ය.

1. ගුණ නුවණ ඇත්තවුන් විය යුතු ය.
2. දරුගම් (විහාරගම්) හා වටනාපසගම් (කැප ප්‍රත්‍යය) ආදියෙන් ලැබෙන ලාභයෙන් ගිජු නැති අය විය යුතු ය.
3. සංගමු ගණවැසි ගම්වල අඛණ්ඩව පරම්පරාවෙන් පැවත එන හික්මුණු භික්ෂූන් විය යුතු ය.
4. උපසම්පදාවෙන් දස වසක් සපුරා ලිය යුතු ය.
5. ස්ථවිර භික්ෂුවක් විය යුතු ය.
6. සංගමු ගණවැසි ගම්වලින් පැවත එන භික්ෂුවක් විය යුතු ය.
7. ආයතනාධිපතිගේ අනුමැතිය අත්‍යවශ්‍ය ය. යනුවෙනි.

### 4.3.1.4 ප්‍රධාන පරිවේණාධිපති තනතුර සඳහා තිබිය යුතු සුදුසුකම්:

මෙම තනතුර සඳහා තිබිය යුතු සුදුසුකම් ද වනුයේ අයතැන් වැළත තනතුරට අදාළ සුදුසුකම් විය හැකි ය. බලවත් පිරිවෙන් යනුවෙන් හැඳින්වෙන්නේ ද මෙම තනතුරම ය. දඹදෙණි කතිකාවතෙහි "නැදි පිරිවෙන්" ලෙස හඳුන්වා ඇති බව පැහැදිලි ය.[126] කෙසේ නමුත්, ප්‍රධාන පරිවේණාධිපති තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ද වන්නේ අයතැන් වැළත තනතුර සඳහා වන සුදුසුකම් ය. ඒ අනුව,

1. ගුණ නුවණ ඇත්තවුන් විය යුතු ය.
2. දරුගම් (විහාරගම්) හා වටනාපසගම් (කැප ප්‍රත්‍යය) ආදියෙන් ලැබෙන ලාභයෙන් ගිජු නැති අය විය යුතු ය.
3. සංගමු ගණවැසි ගම්වල අඛණ්ඩව පරම්පරාවෙන් පැවත එන හික්මුණු භික්ෂූන් විය යුතු ය.



4. උපසම්පදාවෙන් දස වසක් සපුරා ලිය යුතු ය.
5. ස්ථවිර භික්ෂුවක් විය යුතු ය.
6. සංගමු ගණවැසි ගම්වලින් පැවත එන භික්ෂුවක් විය යුතු ය.
7. ආයතනාධිපතිගේ අනුමැතිය අත්‍යවශ්‍ය ය. යනුවෙනි.

### 4.3.1.5 පරිවේණාධිපති

දඹදෙණි කතිකාවතෙහි සංඝ සංවිධාන සැලැස්මෙහි දැක්වෙන පරිවේණාධිපති තනතුරට අදාළ සුදුසුකම් වනුයේ,

1. සුදුසු ගුණ නුවණ[127] ඇති කෙනෙකු විය යුතු ය.
2. භික්ෂුව නිශ්‍රයමුක්ත කෙනෙකු විය යුතු ය.
3. ස්ථවිර කෙනෙකු විය යුතු ය.
4. මාහිමිගේ අනුමැතිය තිබිය යුතු ය.[128]

### 4.3.1.6 ගණදෙටු තනතුර

ගණදෙටු තෙරුන් නමින් තනතුරක් පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් දෙකෙහි දක්නට ලැබේ.[129] අන්තේවාසිකයන් හා සද්ධිවිහාරිකයන් අයත් වනුයේ ගණදෙටු තෙරුන්ට ය. මේ අන්තේවාසිකයින් හා සද්ධිවිහාරකයන් බොහෝ පිරිසක් සිටින්නට ඇති නිසා, ඔවුන් භාර තෙරුන් ගණදෙටු යනුවෙන් හඳුන්වා දෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

එම තනතුරට පත්වීමට අවශ්‍ය සුදුසුකම් වනුයේ,[130]

1. ස්ථවිර සම්මුතිය ලබා තිබිය යුතු ය.
2. ග්‍රන්ථධුරය දැරූ භික්ෂුවක් විය යුතු ය.
3. විදර්ශනාධුරය දැරූ භික්ෂුවක් විය යුතු ය.
4. ගුණයහපත් වලින් යුක්ත විය යුතු ය.
5. ඥාන ශක්තියෙන් යුක්ත භික්ෂුවක් විය යුතු ය.

එකී තනතුරට පැවරී තිබුණු බලතල පහත පරිදි වේ.

CamScanner

ගණදෙටු තෙරුන්ගේ වගකීම:

මෙම තනතුරට හිමි විය යුතු බලතල හා කාර්යයන් පිළිබඳව පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් දෙකෙහි ම අන්තර්ගත ය. ඒ අනුව,

1. නොපවතින අන්තේවාසික හා සද්ධිවිහාරිකයන්ට දඬුවම් කිරීමේ බලතල[131]
2. අන්තේවාසික හා සද්ධිවිහාරිකයන් ග්‍රන්ථධූරය හා විදර්ශනා ධූරය සඳහා අධ්‍යාපනය ලබා දීම.
3. වැරදි කරනු ලබන භික්ෂූන්ට තුන්වන වර දක්වා අවවාද කිරීම.
4. ඒ පිළිබඳ ව අවධානය යොමු නො කොට, නැවත නැවතත් වැරදි කළහොත්, නිස නොදී මාසයක් සිටිය යුතු ය. (මෙය නිශ්‍රයමුක්ත නොවූ උපසපන් භික්ෂූන් සඳහා විය හැකි ය.)
5. නිස නො දී සිටින මාසයක කාලය තුළවත් විනයානුකූලව නොපවතිත් නම්, එම පැවිද්දා ගැන උනන්දුව අතහැර ඔහු සමග තිබෙන සම්බන්ධකම් නැවැත් විය යුතු ය.
6. නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතය සඳහා අධ්‍යාපනය ලබා දිය යුතු ය.
7. ස්ථවිර සම්මුතිය සඳහා අධ්‍යාපනය ලබා දිය යුතු ය.

### 4.3.1.7 කාරක සංඝ සභාව

කතිකාවත් මගින් භික්ෂු සංවිධානය පිළිබඳව කළමනාකරණය කිරීමේ දී එහි සංවිධාන සැලැස්මට, කාරක සංඝ සභාව නමින් සංස්ථාවක් ද දඹදෙණි කතිකාවතෙහි පමණක් ඇතුළත් කොට තිබේ.[132] දඹදෙණි යුගය වන විට භික්ෂු සංස්ථාව තුළ තිබූ අවශ්‍යතාව මත මෙම තනතුර ඇතුළත් කළා විය හැකි ය. මෙම යුගයෙහි භික්ෂු සමාජයෙහි සියලු ම තීරණ ගනු ලැබුවේ කාරක සංඝ සභාව විසිනි.



භික්ෂු කාරක සංඝ සභාවේ සංයුතිය

මෙහි සංයුතියෙහි ප්‍රධානත්වය හිමිව තිබුණේ මහාස්වාමින් වහන්සේ වෙත ය.[133] මහතෙර පදවිය හෙබ වූ භික්ෂූන් වහන්සේලා දෙනම ද නියෝජනය වන්නට ඇත.

කාරක සංඝ සභාවේ කාර්යභාරය

සමස්ත සංඝ සමාජයෙහි වර්තමාන පැවැත්ම හා ඉදිරි පැවැත්ම පිළිබඳව තීරණ ගැනීම සිදුකොට ඇත්තේ මෙමෙ සංඝ කාරක සභාව යි. එසේ ම භික්ෂූන් වහන්සේලා අතර උද්ගත වන්නා වූ ගැටලුවලදී ක්‍රියා කරනු ලැබ ඇත්තේ, සංඝ කාරක සභාව රැස්වී තීරණයන් ගැනීමෙන් පසුව විය යුතු ය. දඹදෙණි කතිකාවත සකස් කොට ඇත්තේ ද මෙමෙ කාරක සංඝ සභාව විසිනි.

ලාංකේය දේශපාලනය වරින්වර වෙනස් වෙමින් පැවතිය ද මෙම සංවිධාන සැලැස්ම ක්‍රි. ව. 15 වන සියවසෙන් පසුව ද පැවති බව මේධංකර මහතෙර සාමීන් වහන්සේ, පැපිලියාන පිරිවෙනෙහි තෙර සාමීන්ගේ ශිෂ්‍ය මංගල ස්වාමීන් වහන්සේ ලෙස පත් කිරීමෙනුත් උන් වහන්සේ "නිශ්‍රයමුක්ත"[134] බව දක්වා තිබීමෙනුත්, පැහැදිලි ය. උසස් තනතුරු ලබාගැනීමේ දී අනිවාර්ය සුදුසුකමක් වනුයේ, නිශ්‍රයමුක්ත භාවයයි. උපසම්පදාවෙන් වස් පහක් ඉක්ම ගිය පසු, ඒ සඳහා වන අධ්‍යාපනය ලබා ගැනීමෙන් අනතුරුව ලබා ගත යුත්තකි. මෙම අධ්‍යාපනය අනුරාධපුර යුගයේ අවසාන භාගයේ සිට ක්‍රි.ව. 1454 දක්වා ම පැවත තිබීමෙන් ලාංකේය භික්ෂු සමාජ සංවිධානය තුළ අනුක්‍රමයෙන් වර්ධනය වූ සංවිධාන සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වූ බව නිගමනය කළ හැකි ය.

### 4.4 භික්ෂූන් වහන්සේලා මෙහෙයවීම

බෞද්ධ භික්ෂුවගේ මූලික පරමාර්ථය නිවන් ලබා ගැනීම වුවත්, භික්ෂුව සංස්ථාවක් වශයෙන් ගත් කල, මනා වූ සමාජ සංවිධානයක් ලෙස ක්‍රියාත්මක කරවීමේ දී මෙහෙයවීම ද මැනවින් ක්‍රියාත්මක කොට ඇති බව පැහැදිලි ය. කතිකාවත් මගින් අපේක්ෂිත ආකාරයට ලාංකේය භික්ෂු සමාජ සංවිධානය මෙයෙහවීමේ

CamScanner

දී, ක්‍රම දෙකක් අනුගමනය කොට ඇති බව පැහැදිලි ය. එනම්,

1. භික්ෂු අභිප්‍රේරණය
2. භික්ෂුවට වැටුප් ගෙවීම යනුවෙනි.

### 4.4.1 භික්ෂු අභිප්‍රේරණය

තනතුරෙන් තනතුරට උසස් වීම් ලබා ගැනීමට හැකිවන ආකාරයට දඹදෙණි කතිකාවතෙහි භික්ෂු සමාජ සංවිධාන සැලැස්ම නිර්මාණය කොට ඇත.[135] කුලපුත්‍රයෙකු සසුනෙහි සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව, උසස් ම තනතුර වූ මාහිමි තනතුරට පත්වීමට පෙර ඒ අතර තිබෙන්නා වූ තනතුරු ලබා ගැනීම කතිකාවතෙහි පැහැදිලි ව සඳහන් නොවුව ද, අනිවාර්යයෙන් ම එම තනතුරු ලබාගෙන තිබීම විශේෂ සුදුසුකමක් වන්නට ඇත. ලබා ගත යුතු හා ලබා ගත හැකි තනතුරු සියල්ලට ම මූලික ම සුදුසුකම වනුයේ නිශ්‍රයමුක්ත භාවයට පත්ව තිබීම යි.[136] මේ අනුව, සෑම කතිකාවතකම භික්ෂුවට අභිප්‍රේරණ ක්‍රම සකසා නො තිබුණත්, දඹදෙණි කතිකාවතෙහි එය සඳහන් වේ. විධිමත් කළමනාකරණය වූ අභිප්‍රේරණය දඹදෙණි කතිකාවත තුළින් විද්‍යමාන වන බව පැහැදිලි ය.

### 4.4.2 වැටුප්

කළමනාකරණයෙහි එක් අංගයක් වනුයේ, අභිමත අරමුණු කරා සංවිධානයක් ගමන් කිරීමේ දී එහි සාමාජිකයන් තෘප්තිමත් කිරීම අරබයා ඔවුන් වෙත වැටුප් හා වෙනත් දීමනා ආදිය ලබා දීම යි. 1 වන විජයබාහු රජතුමා ද සංඝයා වහන්සේලා උදෙසා "දන් වැටුප්"[137] ලබා දී ඇත.

කතිකාවත් මගින් තහවුරු වන එක් අංශයක් වනුයේ, ආරාම පාලනය භාරව ක්‍රියා කළ භික්ෂුවට එම සේවය වෙනුවෙන් දීමනාවක් ලබා දී ඇති බව යි. ක්‍රි. ව. 9 වන සියවස එබඳු දීමනා



කළමනාකරණය කිරීමේ දී සැලසුම් කරගත් පරිදි, ගුරුවරුන් අභිප්‍රේරණය කිරීමක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව, ගුරුවරුන්ට "කැවිලි පස් වර්ගයක් ද මිදුණු කිරි සේරු භාගයක් ද නැළියෙන් ප්‍රමාණ කරන ලද පරිදි ගිතෙල් පාලිකා විස්සක් ද" ලබා දිය යුතු බව දැක් වේ.

ආචාර්යවරුන් සඳහා වැටුප් ගෙවා ඇති බව, මිහින්තලා පුවරු ලිපියෙහි දැක්වෙයි.[139] එම ලිපියෙහි සඳහන් වන ආකාරයට විනය පිටකය, සූත්‍ර පිටකය හා අභිධර්ම පිටකය ඉගැන්වූ ආචාර්යවරුන් සඳහා වෙන වෙන ම වැටුප් ගෙවා ඇති[140] අතර, විනය පිටකය කියන භික්ෂූන්ට වස්ත්‍රයෙන් හා භෝජනයෙන් වසග් පහකුත්, සූත්‍ර පිටකය කියන භික්ෂූන්ට වසග් හතකුත් හා අභිධර්ම පිටකය කියන භික්ෂූන්ට වසග් දොළහකුත් වශයෙන් ලබාදිය යුතු බව ව්‍යවස්ථා ගත කිරීමෙන් මේ බැව් වැඩිදුරටත් පැහැදිලි වේ. භාතිකාභය රජු (ක්‍රි. පූ. 22 - 7) ග්‍රන්ථධුරය දරණ භික්ෂූන් වහන්සේලාට ප්‍රත්‍යයෙන් සංග්‍රහ කළ බව මහාවංශයෙහි[141] දැක්වේ. ග්‍රන්ථධුරයෙහි නියුක්ත භික්ෂූන් සඳහා ගිතෙල් හා උක් සකුරුවලින් වසභ රජතුමා (ක්‍රි. ව. 67 - 111) සංග්‍රහ කොට ඇත.[142] ධර්ම ග්‍රන්ථ සම්පාදනයෙහි යෙදෙන්නන්ට දිනකට සහල් නැළි තුනක් ද මාළු ලබා ගැනීම සඳහා මසුරන් දෙකක් ද පොල් දෙකක්, බුලත් දහයක් හා පුවක් පහක් ද ලබා දුනි.[143] ක්‍රි. ව. 15 වන සියවස වන විට භික්ෂූන් වහන්සේලාගේ ධර්ම අධ්‍යාපනයේ පහසුව සඳහා ධර්ම ග්‍රන්ථකරණයෙහි ගිහියන් ද යොදවා ඔවුන්ට ඒ සඳහා දීමනා ලබා දී ඇත.[144] ඒ අනුව, ග්‍රන්ථ 1700ක් ලිවීමෙන් පසුව මසකට ලුණු නැළි 10ක් ද එණු, දූරු, කහ ආදිය ලබා ගැනීම සඳහා පණමක් ද මිරිස් නැළියක් ද ලබා දී ඇත.[145] මෙයට අමතරව වර්ෂයකට ඇඳුම් සඳහා ද පණම් සියයක් ලබා දීමට ද කටයුතු යොදා තිබීම මනා වූ කළමනාකරණයක් මගින් පාලනය කිරීමට ගත් උත්සාහයක් ලෙස සැලකිය හැකි ය.

භික්ෂූන් වහන්සේලා සඳහා ප්‍රත්‍ය පහසුකම්වලට අමතරව වෙනත් දීමනා ද ලබා දුන් බවට පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙනේ කතිකාවත ද සාක්ෂි දරයි.[146] පිරිවෙන්පති ස්වාමීන් වහන්සේට දිනපතා සහල් නැළි හයක් ලෙස සටහන් වව ද ලබා දිය යුතු

Scanned with CamScanner

හා පුවක් ද නියම කොට ඇත. දිනපතා එක් බුලත් තටුවක් තැබිය යුතු අතර, අනෙක් භික්ෂූන් වහන්සේලා හතර නමට තවත් බුලත් තටුවක් තැබිය යුතු ය. පිරිවෙනෙහි පිරිවෙන්පති ස්වාමීන් වහන්සේට අමතරව තවත් භික්ෂූන් වහන්සේලා පස් නමක් වැඩ සිටිය යුතු අතර, එක් භික්ෂූන් වහන්සේනමකට හාල් නැළි හතර බැගින් ලබා දීමට නියම කොට ඇත. පිරිවෙන්පති ස්වාමීන් වහන්සේ ඇතුළු අනෙක් භික්ෂූන් වහන්සේලා පස් නම සඳහා වර්ෂයකට එක් වරක් ඇඳුම් සඳහා ද දීමනා ලබා දී තිබෙන බව පැපිලියාන සෙල් ලිපිය වැඩිදුරටත් සඳහන් කරයි.

"ආචරිය භාග" යනුවෙන් සමන්ත පාසාදිකාවෙහි[147] ගුරුවරයාට දෙනු ලබන දීමනාවක් පිළිබඳ සඳහන් වෙයි. වසභ රජතුමාගේ බිසවට වැලඳුණු රෝගයක් මහාපදුම තෙරුන් සුව කිරීම නිසා, සිවුරු තුනක් ද කහවණු තුන් සීයක් ද බෙහෙත් කුඩයක් ද පූජා කරනු ලැබූ අතර, කහවණු මල් පිදීම සඳහා යෙදවූ බව සමන්තපාසාදිකාව වැඩිදුරටත් සඳහන් කරයි. මිහින්තලා සෙල් පුවරු ලිපියෙහි වාර්තා කරන අන්දමට ආරාමයෙහි අධිපති ස්වාමීන් වහන්සේට දිනපතා සහල් නැළියක් ද වස් අවසාන බණ දේශනාවේ දී රන්කලන් එකක් හා කහවණු එකහමාරක් ලබා දිය යුතු ය.[148] පවාරණ දිනයේ දී ධර්ම දේශනාව පවත්වනු ලබන භික්ෂූන් වහන්සේට එම ප්‍රමාණය ම ලබාදිය යුතු බවට එම ලිපිය වැඩිදුරටත් දක්වා තිබේ.

බෞද්ධ ආරාමවල අධ්‍යාපනය ලබා දෙනු ලැබූ ආචාර්ය භික්ෂූන් වහන්සේලාට මෙන් ම, විවිධ තනතුරු දැරූ භික්ෂූන් වහන්සේලාට එකී තනතුරට අදාළව වැටුප් ගෙවීමක් සිදු කර ඇත.

## 4.5 භික්ෂු පාලනය

කළමනාකරණ ක්‍රියාවලිය තුළ පාලන මූලධර්මයට හිමි වනුයේ වැදගත් ස්ථානයකි. අභිමත අරමුණු කරා සාමාජිකයන් ගමන් කරවීමේ දී සාමාජිකයන් පාලනය කිරීම වැදගත් ය. එකී ලක්ෂණය කතිකාවත් තුළ ද දක්නට ලැබේ. භික්ෂුව පාලනය



කිරීමේ වගකීම පැවරුණේ භික්ෂුව වෙතම ය. (Self Control) ඒ සඳහා වෙනත් කිසිදු පාර්ශ්වයක් මැදිහත් නො වූ නමුත් අනුරාධපුර පුවරු ලිපියෙහි[149] දැක්වෙන ආකාරයට, භික්ෂු කණ්ඩායමක් අතර පවතින ගැටලු නිරාකරණය කර ගැනීමට භික්ෂුව අපොහොසත් වුවහොත් පමණක් රාජ්‍ය නිලධාරීන් මැදිහත් වී නිරාකරණය කළ යුතු ය.[150] මේ අනුව, භික්ෂුව පාලනය කිරීමේ දී නීති හා දඬුවම් යන ක්‍රම දෙක ම උපයෝගි කොට ගෙන ඇත.

දඹදෙණි කතිකාවතෙහි[151] සෑම භික්ෂුවක් ම පොහොයෙන් පොහොය මෙම කතිකාවත කියවීම අනිවාර්ය කිරීමත්, ඒ සඳහා භික්ෂුවක් පත් කිරීමෙනුත් අපේක්ෂා කරනු ලැබ ඇත්තේ කතිකාවත මගින් භික්ෂුව පාලනය කිරීම යි.

සෑම භික්ෂුවක් ම සමගි ව සිටීම අනිවාර්ය ය.[152] බුදුන් වහන්සේ ද භික්ෂුවගේ සමගිය අගය කරනු ලැබූහ. ලාංකේය භික්ෂු ශාසනය ද මැනවින් පාලනය කිරීමේ දී එම න්‍යාය මත පිහිටුවා ක්‍රියා කොට ඇති බව පැහැදිලි ය.

භික්ෂූන් පාලනය කිරීම උදෙසා ඒ ඒ විහාරයට අයත් භික්ෂූන් වහන්සේලාට බලපාන බුද්ධ නීති මෙන් ම, තත්කාලීනව සකස් කර ගත් නීති ද ක්‍රියාත්මක කොට ඇති බව පැහැදිලි ය. සිඛවළඳ හා සිඛවළඳ විනිසෙහි අන්තර්ගත විනය නීති කෙරෙහි අනුරාධපුර යුගයේ දී දැඩි අවධානයක් යොමු කොට ඇති බව, ගල්විහාර කතිකාවතෙහි[153] සඳහන් වීම මෙහිදී වඩාත් වැදගත් වේ. මෙහි අන්තර්ගත වනුයේ, විනය නීති එකසිය පනහකි.[154] එහෙත් බුද්ධ විනයෙහි විනය නීති දෙසිය විස්සකි. (220) ලාංකේය භික්ෂු සමාජ සංවිධානය කළමනාකරණය කිරීමේ දී තත් කාලයෙහි භික්ෂුව පාලනය කිරීමට අවශ්‍ය නීති පමණක් ඇතුළත් කිරීමට උත්සාහ කිරීමෙන් මෙය සිදුවන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එය සකස් කර ගැනීමේ දී සමස්ත භික්ෂු සංඝයා ම ඇතුළත් වන පරිදි ද නීති සකස් කොට තිබීම වැදගත් ය. කතිකාවත්වල දැක්වෙන පරිදි ක්‍රියා නො කරන ඕනෑම තරාතිරමකට අයත් භික්ෂූන් වහන්සේ නමකට දඬුවම් ලබා දීමට කතිකාවත් සැලසුම් කොට තිබීම භික්ෂු සංවිධානය පිළිබඳ කළමනාකරණයෙහි විශේෂත්වයකි.

CS Scanned with CamScanner

සෑම භික්ෂූන් වහන්සේ නමක් ම, ග්‍රන්ථධුර හා විදර්ශනාධුරයන් හි නිරත විය යුතු බව, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්වල මෙන් ම කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවතෙහි ද දක්නට ලැබේ.[155] එය ලාංකේය භික්ෂු සමාජ සංවිධානය තුළට පැමිණි නව නීතියකි. භික්ෂූන් අල්පේච්ඡ ගුණයෙන් යුක්ත විය යුතු ය.[156] පරුෂ වචන භාවිත නො කළ යුතු අතර, මුසා බස් ද නො කිය යුතු ය.[157] අව් මුගුරු නො ගත යුතු ය. මහණ කිරීමේ දී භික්ෂූන් තුන් නමක්වත් සිටිය යුතු ය.[158]

"පොහොයවිනා චාතුර්වර්ගකරණීය කර්මයක් යටත් පිරිසෙයින් අටනමක් ඇති වැ කටයුතු. පවුරුණු විනා පචවර්ග කරණීය කර්මය යටතේ පිරිසෙයින් දස නමක් ඇතිවැ කටයුතු. විංශතිවර්ග කරණීය කර්මය තිස්නමක් හෝ පන්තිස් නමක් ඇතිවැ කටයුතු"

භික්ෂූන් වහන්සේලා මැනවින් සකස් කිරීම උදෙසා මනා වූ සැලැස්මක් සකස් කර ඇති බවට වැදගත් ම සාධකය වනුයේ දඹදෙණි කතිකාවත යි. එහි දැක්වෙන ආකාරයට, භික්ෂුව සැලසුම් කරගත් පරිදි පාලනය කිරීමේ දී පොදු නීති රීති ද සකසා ගෙන ඇත.

- බහුනායකත්වය ශාසනයෙහි විනාශයට හේතු වන හෙයින්, එහි නායකත්වයක් සකස් කිරීම හා මහ තෙරවරු දෙදෙනෙකු පත් කිරීම.
- භික්ෂුව, භාණ්ඩාගාරිකයෙකු නොවිය යුතු වීම.
- නිශ්චිත ස්ථානයක පමණක් බණ කීම කළ යුතු වීම.
- ගිහි ජනයාට සොලෝ ආදිය නො කිය යුතු ය.
- ආචාර්ය හා උපාධ්‍යායන් වහන්සේගෙන් ඉවත් ව නො විසිය යුතු ය.
- කාව්‍ය නාට්‍ය ගර්හිත විද්‍යා ඉගෙන නො ගත යුතු අතර, ඉගැන්වීම නො කළ යුතු ය.
- මෙහෙකරුවන්ට උදහස් නොවීම.



- අවසරයක් නොමැතිව කිසිවෙකුට කිසිවක් නො දිය යුතු ය.
- හදිස්සියක් වුවත් පියවි ගමනින් ම යා යුතු ය.
- දත් පෙන්වා, ශබ්ද නගා සිනා නොවීම.
- ආරාමවල නඩු පිටතට ගෙන නො යා යුතු අතර, පිටත නඩු ආරාමවලට රැගෙන නො යා යුතු ය.[159]
- සිවුරු බෙදාදීම සිදු කොට ඇත්තේ ද වර්ෂයේ අවසානයත් සමග ය.[160]
- භික්ෂුවගේ ගුණ වර්ණනා කරන පුද්ගලයන්ට පඬුරු නො දිය යුතු ය.[161]
- භික්ෂූන් වහන්සේලාට ලැබෙන ප්‍රත්‍යයන් එකතු කිරීම නො කළ යුතු අතර, ඒවා අනෙක් භික්ෂූන් වහන්සේලා සමග බෙදා ගෙන පරිභෝජනය කළ යුතු ය.
- පිරිකර ලබාගැනීමේ දී වැඩිහිටි භික්ෂූන්ට දන්වා ලබා ගත යුතු ය.
- ගිහි ගෙදරක එක් රාත්‍රියක් හෝ ගත නො කළ යුතු ය.
- සිවුරු විකෘති නො කළ යුතු ය.
- උපාසකයන්ට මෙහෙවර නො කළ යුතු ය.
- සාංඝික දේපළ ආරාමයෙන් පිටත ගෙන ගොස් පරිභෝජනය නො කළ යුතුය.
- තමන් කෙරෙහි පැහැදුණු දායකයන් දෙමවුපියන් ලෙස තබා නො ගත යුතු ය.
- උදලු, වෑ, පොරෝ, දෝලා ආදිය පෞද්ගලිකව පරිහරණය නො කළ යුතු ය.
- ගිලන් වූ භික්ෂූන් වහන්ස්ලාට හා ආචාර්ය - උපාධ්‍යායන් වහන්සේලාට කළයුතු වත්පිළිවෙත් ඒ අයුරින් ම සිදු කළ යුතු ය.
- කිසිදු පුද්ගලයෙකුගේ උපත සිහි කර නොබැණිය යුතුය.

Scanned with CamScanner
CamScanner

- උපාසකයන්ගේ දරුවන්ට උගන්වා ප්‍රත්‍ය පහසුකම් ලබා නො ගත යුතු ය.
- භික්ෂූන් වහන්සේලා යකුන් කෙළවීම, බලි බිලි පූජා ආදිය සිදු නො කළ යුතු ය.
- භික්ෂුව ලද දෙයින් සතුටු විය යුතු ය.
- භික්ෂූන් වහන්සේලා රංචු ගැසී කතා කිරීමෙන් වැළකිය යුතු ය.[162]
- සෑම භික්ෂුවක් විසින් ම දසධම්ම සූත්‍රය මෙනෙහි කළ යුතු ය.[163]

එකම ආවාසයෙහි ඥාතීන් සතර දෙනෙකුට වාසය කිරීම තහනම් වන අතර, භික්ෂූන් අතර, අරගලයක් ඇති වුවහොත්, එම භික්ෂූන් වහන්සේලා ද, එයට හේතු කාරක වූ භික්ෂූන් වහන්සේලා ද ආවාසයෙහි වාසය කිරීම තහනම් වේ.[164] මෙයටත් වඩා වැදගත් වනුයේ, බුද්ධ විනය තුළ දී වැරැද්දකට හසු වූ භික්ෂුවක් සංඝාධිකරණයක් මගින් දඬුවම් ලබා දීමෙන් අනතුරුව දොස් නිදොස් කර නැවතත් භික්ෂූන් වහන්සේලා අතරට පැමිණෙන්නේ නම්, එබඳු භික්ෂූන් නිවැරදි භික්ෂුවක් ලෙස පිළිගත යුතු ය.[165] යන සඳහනයි. එහෙත් ලාංකේය විනය තුළ දී එවැනි ලක්ෂණයක් දක්නට නො ලැබෙන අතර, ආවාසයෙන් ඉවත් කළ භික්ෂුවකට නැවතත් එම ආවාසයට පැමිණීම තහනම් විය.[166] අභයගිරි සංස්කෘත ලිපියෙහි දැක්වෙනුයේ, වෙහෙරකින් පිටමං කරනු ලැබූ භික්ෂුවක් වෙනත් විහාරයකට පමුණුවා ගැනීම නුසුදුසු[167] බවකි. බුද්ධ විනය ප්‍රජාතන්ත්‍රවාදය මත පිහිටා කටයුතු කරනු ලැබුවත්, කතිකාවත් මගින් එවැන්නක් විද්‍යමාන නො වන බව පෙනී යයි.

භික්ෂූන් වහන්සේලාට මුදල් පරිහණය කිරීම තහනම් බව පාරාජිකා පාලියෙහි රූපිය වග්ගයෙහි[168] දැක්වේ. එහෙත් ලාංකේය භික්ෂූන් වහන්සේලාට ක්‍රි. ව. 10 වන සියවස වන විට ද ආදායම් ලබා ගැනීම සපුරා තහනම් විය.[167] මෙම නීතිය තුළින් භික්ෂූන් වහන්සේලා ලෞකික දිවියක් ගත කිරීමට ගන්නා උත්සාහය වැළැක්වීමක් ලෙස සැලකිය හැකි ය. මෙය වඩාත් තීව්‍ර වනුයේ,



ජේතවනාරාම සංස්කෘත ලිපියෙහි ම ස්ත්‍රීන් පෝෂණය කරනු ලබන භික්ෂූන් වහන්සේලාට ආවාසයෙහි වාසය කිරීම තහනම් කරමින් නීතියක් පනවා තිබීමෙනි. භික්ෂුව පාලනය කිරීම සඳහා කතිකාවත් නීතියක් ලෙස ද භාවිත කොට ඇති බව, වෙස්සගිරි පුවරු 1 ලිපියෙහි සඳහන් වෙයි. "මෙ කතිකාවත මහසඟුන් ර ක්ක යුතු"[170] මෙය සෑම භික්ෂුවක් විසින් ම අනුගමනය කළ යුතු නීතියකි.

භික්ෂු ශාසනය කෙරෙහි මිනිසුන් තුළ ඇතිව තිබූ ප්‍රතිරූපය වෙනස් කිරීමේ අරමුණ ඇතිව සකස් කළ ශාසන කතිකාවත් මගින්, සමස්ත භික්ෂු සමාජයෙහි ම වත්පිළිවෙත් සකස් කිරීම ද මූලික කටයුත්තක් වූ අතර, එය භික්ෂුව මැනවින් පාලනය කිරීමට ද උපයෝගී කර ගනු ලැබීය. භික්ෂූන් වහන්සේලා ඉතා අලුයම අවදි වී, සතර කමටහන් වැඩිය යුතු ය. දැහැටි කිස නිමවා, සිකකරණියෙහි[171] සඳහන් වන ආකාරයට සිවුරු හැඳ පෙරවිය යුතු ය.[172] අලුයම් වේලෙහි ඇත් වෙහෙරට සලාකග්ගයට පැමිණ මෛත්‍රියෙන් පිරිත් සජ්ඣායනා කොට, කැඳ බත් ලබා ගත යුතු විය. ගිලන් වූ භික්ෂූන් වහන්සේලාට වෛද්‍යවරයන්ගේ උපදෙස් පරිදි, දානය ලබා ගන්නටත්, අවස්ථාව සලසාදීමට කතිකාවත් සැලසුම් කොට ඇත.[173] සංඝයා වහන්සේලාගේ ඇවතුම් පැවතුම් සකස් කිරීමේ දී විහාරයෙහි සේවය කරනු ලබන සේවකයන්ට දඬුවම් කිරීමේ දී සංඝයා වහන්සේලාගේ එකමුතුවෙන් සිදුවිය යුතු බව දැක් වේ. පෞද්ගලිකව භික්ෂුවට අණ කිරීම හෝ තර්ජනය කිරීම තහනම් ය.[174] මෙමගින් භික්ෂු සාමග්‍රිය තුළින් නිසා දඬුවම් පැමිණවීම අපේක්ෂා කළා විය හැකි ය.

### 4.5.1 දඬුවම්

භික්ෂූන් වහන්සේලා පාලනය කිරීමේ දී දඬුවම ද භාවිත කොට ඇති බව, මිහින්තලා ලිපියෙහි[175] දැක්වේ. එහි දැක්වෙන නීති කඩ කරනු ලබන භික්ෂූන් වහන්සේලා, එම තනතුරින් බැහැර කිරීම, ආවාසයෙන් බැහැර කිරීම, දඹදිවට පිටුවහල් කිරීම වැනි දඬුවම ලබා දී ඇති බව V වන කාශ්‍යප රජුගේ පුවරු ලිපියෙහි

සඳහන් වෙයි. යම් භික්ෂුවක් විහාර සන්තක දේපළ අන්සන්තක කරනු ලැබුවහොත්, රටින් පිටුවහල් කරනු ලබන බව වැඩිදුරටත් දක්වා ඇත. එසේ ම අසමගිව වාසය කරන, වත් සිරිත් පිළි නොපදින භික්ෂූන් වහන්සේලා රටින් පිටුවහල් කළ යුතු ය.[176] සාධාරණ හේතුවක් නොමැති ව නඩත්තු ඉඩම් හෝ වැටුප් හෝ විහාරස්ථ සේවකයන්ට අහිමි කරන භික්ෂුවක් වේ නම් විහාරස්ථානයේ වාසය කිරීම තහනම් කළ යුතු බව, කළුදිය පොකුණ සෙල් ලිපියෙහි දැක්වේ.[177] එමෙන් ම විහාරස්ථ දේපළ වංචනිකව තමන් සතු කර ගැනීම හෝ අන්සත් කිරීම පිළිබඳව භික්ෂුවකට චෝදනාවක් ලැබුණහොත්, එය රාජ්‍ය නිලධාරීන් මැදිහත් වී පරීක්ෂණය කළ යුතු බවත්, යම් හෙයකින් භික්ෂුව වැරදිකරු වුවහොත්, නෙරපීම කළයුතු බවත් ලිපියේ දක්වා තිබේ.[178] මෙවැනි දඬුවම් තුළින් බලාපොරොත්තු වන්නට ඇත්තේ භික්ෂුව බාහිර කටයුතුවලට අවධානය යොමු කිරීම වැළැක්වීම හා භික්ෂූත්වය මැනවින් ආරක්ෂා කිරීම විය හැකි ය.

කතිකාවත් මගින් භික්ෂූන් පාලනය කිරීමේ දී දඬුවම්වලට මුහුණ දීමට සාමාජික භික්ෂූන් වහන්සේලාට පමණක් නොව, තනතුරු දරණ භික්ෂූන් වහන්සේලාට ද සිදු විය. පොළොන්නරු ගල්විහාර කතිකාවතෙහි දැක්වෙන ආකාරයට, ගණදෙටු තෙරුන්ගේ කාර්යභාරය මැනවින් ඉටු නො කළහොත් දඬුවම් ලබාදීමට මහතෙරුන්ට පවරා ඇත.[179] උසස් තනතුරු දරණ භික්ෂූන් වහන්සේලාට ද දඬුවම් දීමෙන් සමස්ත භික්ෂු සංස්ථාවම මැනවින් පාලනය කිරීමේ අවශ්‍යතාව තිබූ බව පැහැදිලි වේ.

භික්ෂූන් වහන්සේලා අතර සමගිය නොමැතිනම්, සහල්, බත් ආදිය නොදිය යුතු බවත්, විහාරයේ යම් කලහයක් ඇතිව තිබේ නම් භික්ෂූන්ට පිරිනැමීම සඳහා රැගෙන එන ප්‍රත්‍යය බලු කපුටන්ට දෙන ලෙස කළුදිය පොකුණ සෙල් ලිපිය වාර්තා කරයි.[180] මෙයින් බලාපොරොත්තු වූයේ භික්ෂූන් තුළ සමගිය ගොඩනඟා තැබීමට ය.

බුද්ධ විනය තුළ අඩංගු වන්නා වූ දඬුවම් මෙන් ම ඊට හාත්පසින් ම වෙනස් වූ රටින් පිටුවහල් කිරීම, ආරාමයෙන් නෙරපීම

canner



වැනි දඬුවම් ක්‍රම ද අනුගමනය කොට ඇති බව ශිලා ලේඛන මූලාශ්‍රය තුළින් දක්නට ලැබෙන අතර, මෙලෙස දැඩි දඬුවම් දීම මගින් බලාපොරොත්තු වන්නට ඇත්තේ භික්ෂුව භික්ෂුවක් ලෙස සමාජයෙහි ක්‍රියාත්මක කරවීමට විය හැකි ය.

ඉහත දැක්වෙන කරුණුවලට අනුව පැහැදිලි වනුයේ, කතිකාවත් මගින් ලාංකේය භික්ෂූන් වහන්සේලා බුද්ධ විනයත් තත්කාලීන භික්ෂු සමාජයෙහි ඇතිව තිබූ ගැටලු නිරාකරණය කිරීම උදෙසා එම ගැටලුවේ ස්වභාවය අනුව ලාංකේය සමාජ සිරිත් විරිත් ද උපයෝගී කොට ගෙන භික්ෂු සංවිධානය මැනවින් කළමනාකරණය කොට ඇති බවයි.

CamScanner

## ආන්තික සටහන්

1 Adikaram, E.W., Early History of Buddhism in Ceylon, The Ceylon Daily News, Colombo, 1946, 126P.

2 ම.වං., 76 පරිච්ඡේදය, 22 ගාථාව, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959

3 උපග්‍රන්ථ 183 පිටුව බලන්න.

4 උපග්‍රන්ථය 188 බලන්න.

5 උපග්‍රන්ථය 201 බලන්න.

6 ම. පා. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 131, 133 පිටු.

7 උපග්‍රන්ථය 187 - 188 බලන්න.

8 උපග්‍රන්ථය 188 බලන්න.

9 උපග්‍රන්ථය 139 බලන්න.

10 S.V., Edit by T.W. Rhys Davids, and J. Estlin Carpenter, Pali Text Society, Oxford University Press, London, 1932, 473 P.

11 ම.වං. 35. 10.11 ගාථා, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959

12 උපග්‍රන්ථය 188 බලන්න.

13 දී. නි. බ්‍රහ්මජාල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1962, 8 පි.

14 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 484 පි.

15 E.Z. Volume, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912 4 P.

16 පාරා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 89 පි.

17 උපග්‍රන්ථ 201 පිටුව බලන්න.

18 උපග්‍රන්ථ 204 පිටුව බලන්න.

19 සිඛවළඳ හා සිඛවළඳ විනිස, මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි, සංස්කරණය, හීන්පැල්ලේ ඉන්ද්‍රවංශ හිමි, 1950, කොළඹ, 6 පි.

20 C.V., Translated by Wilhelm Geiger, Published by the Ceylon Information Department, 1953

21 උපග්‍රන්ථ 202 බලන්න.

22 උපග්‍රන්ථය 204 බලන්න.

23 පා. පා., රූපිය වග්ගය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 584 පි.

24 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1959, 269 - 270 පිටු

25 උපග්‍රන්ථ 202 බලන්න.



26 ස. පා. ශූ. ජී. ඒකනායක, ප්‍රකාශක, ඩබ්ලිව්. ඩී. පී. සමරසේකර, 1900, 2, (මුතු, මැණික්, වෛදූර්‍ය, සක්, සිලා, පබලු, රතු පැහැති මැණික්, මැසිරිගල්, සප්තධාන්‍ය, දාසි, දාස, කෙත්වතු, මල්වතු, පතුරු උයන්)

27 ක. ස., ඩී. බී. ජයතිලක, දෙවෙනි සංස්කරණය, කොළඹ, 1955, 36 පි.

28 ම. පා. 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 178, 181 පිටු

29 උපග්‍රන්ථය 209 පිටුව බලන්න.

30 උපග්‍රන්ථය 204 පිටුව බලන්න.

31 පාරා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 580 පි.

* යම් මහණෙක් රන්රිදී මසු කහවණු තෙමේ ගණී නම් හෝ අනුන් ලවා ගන්වා ගනී නම් හෝ ළඟ තබන ලද්දක් ඉවසා නම් හෝ නිසගි පචිති වේ.

32 පා. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1981, 296 - 335 පිටු

33 විමති විනෝදනිය, බේරතුඩුවේ සිරිධම්මාධාර තිස්ස ස්ථවිර, 1935, 99 පි.

34 Vamsatthappakasini, Vol.1, Edit by G. P. Malalasekara, Oxford University Press, London, 1935, 166P.

35 ගුණවර්ධන රණවීර, සිවුර සහ නඟුල, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ.05, 1993, 35 පි.

36 මෙම ස්ථානයෙන් සෙල්ලිපි තුනක් සොයා ගෙන ඇති අතර, එහි පළමුවන ලිපිය හෙවත්, 429 ලිපියෙහි (E. Z. Volume 111 Edit by S. Paranavithana, Oxford University Press, London, 1933, 2586 P.) සඳහන් වේ. සිරිසඟබෝ රජුගේ දොළොස්වෙනි වර්ෂයෙහි ඉදි කොට ඇත.

37 උපග්‍රන්ථය 247 පිටුව බලන්න.

38 චු. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1977, 337 පි.

39 උපග්‍රන්ථය 183 පිටුව බලන්න.

40 ම. වං. 60 පරිච්ඡේදය, 10 - 20, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959

41 අභිධම්මත්ථ විකාසිනිය, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, 1961, 128 - 129 පිටු. (අභයගිරි නිකාය ආරම්භ වූයේ ස්ථවිරවාදීන්ගේ විනය පිටකයට අයත් ඛන්ධක හා පරිවාර (චුල්ලවග්ග හා මහාවග්ග) දෙකෙහි අර්ථය වෙනස් කරමිනි. (සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායාන අදහස්, කොළඹ, 1969, 71 පි.) ජේතවනිකයන්ගේ විභංග දෙක වෙනස් කර ගත් බව වංසත්ථප්පකාසිනිය සඳහන් කරයි. (Vansatthappakasini, Vol. 1, Edit by G. P. Malalasekara, Oxford University Press, London, 1935, 175 P.)

Scanned with CamScanner
CS CamScanner

42 අ. වි., සංස්කරණය බෙන්තර සද්ධාතිස්ස හිමි, කළුතර, 1919, 1015-1017 පිටු.

43 ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද්උපාධි ආයතනය, කොළඹ, 1995, 45 පි.

44 Culavamsa, Part 1, Chapter 72, W. 5, Translated by Wilhelm Geiger, Published by the Ceylon Information Department, Colombo, 1953.

45 Vansatthappakasini, Vol. 1, Edit by G. P. Malalasekara, Oxford University Press, London, 1935, 175 P.

46 විමතිවිනෝදනී, බේරතුඩුවේ සිරිධම්මාධාර තිස්ස ස්ථවිර, 1935, 99 පි.

47 උපග්‍රන්ථය 191 පිටුව බලන්න.

48 ක. ස. සංස්කරණය, ඩී. බී. ජයතිලක සහ ඩී. එන්. ජයතිලක, කැලණිය, 1955, 29 පි.

49 ම. ව., 36, 113, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959

50 උපග්‍රන්ථය 183 බලන්න.

51 නිකාය සංග්‍රහය, සංස්කරණය, වේරගොඩ අමරමෝලි, කොළඹ, 54 පි.

52 ම. ව. 1 කොටස, 21 පරිච්ඡේදය, 2 - 3, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959

53 E. Z. Vol. 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1912, 42 P.

54 උපග්‍රන්ථය 184-185 බලන්න.

55 ම. ව., 36, 113, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959

56 ම. ව. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 81 පි.

57 උපග්‍රන්ථය 221 බලන්න.

58 ම. ව. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 81 පි.

59 උපග්‍රන්ථය 214 බලන්න.

60 E. Z. Vol. 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1912, 45 P.

61 උපග්‍රන්ථය 194 බලන්න.

62 උපග්‍රන්ථය 193 බලන්න.

63 බුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් ලෙස සැලකේ.

64 උපග්‍රන්ථය 214 පිටුව බලන්න.

65 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 91 පි.



66 උපග්‍රන්ථය 214 පිටුව බලන්න.

67 උපග්‍රන්ථය 194-196 පිටු බලන්න.

68 උපග්‍රන්ථය 247 පිටුව බලන්න.

69 උපග්‍රන්ථය 247 පිටුව බලන්න.

70 උපග්‍රන්ථය 194 පිටුව බලන්න.

71 උපග්‍රන්ථය 207 පිටුව බලන්න.

72 ම. නි. පහාරාද සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1964

73 "ජාති ගෝත්‍ර" යනු "කුලය" යැයි ජයතිලක මහතා ප්‍රකාශ කරයි. සිංහල සාහිත්‍ය, 1958, අගෝස්තු, 93 පි.

74 සැම භික්ෂුවක් ම ග්‍රන්ථ ධුරයෙහි හා විදර්ශනා ධුරයෙහි නියැළිය යුතු බවත්, එහිදී ග්‍රන්ථ ධුරය දරණ භික්ෂූන් වහන්සේලාට වැඩි වරප්‍රසාද පිරිනැමීමත් සිදුව ඇත.

75 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 234 - 235 පිටු

76 ස. පා., සංස්කරණය, යූ. ජී. ඒකනායක, ප්‍රකාශක, ඩබ්ලිව්. සී. අමරසේකර, කොළඹ, 1900, 766 පි.

77 උපග්‍රන්ථය 194 පිටුව බලන්න.

78 ම. පා., බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 91 පි.

79 උපග්‍රන්ථය 216 පිටුව බලන්න.

80 උපග්‍රන්ථය 185 පිටුව බලන්න.

81 උපග්‍රන්ථය 185 පිටුව බලන්න.

• පොළොන්නරු ගල් විහාර කතිකාවතට අනුව, හෙරණසිඛ හා සේඛියා වෙන් වූ ග්‍රන්ථ දෙකක් වුව ද, දඹදෙණි කතිකාවතෙහි එය දැක්වෙනුයේ සේඛියාව හෙරණ සිඛයේ කොටසක් වශයෙනි. පොළොන්නරු යුගයේ රචනා වූ හෙරණසිඛයට සේඛියා අන්තර්ගත නොවූ බව මෙයින් පැහැදිලි ය.

82 මෙය ද හෙරණසිඛයේ ම අන්තර්ගත ය.

83 උපග්‍රන්ථය 195 පිටුව බලන්න.

84 උපග්‍රන්ථය 195 පිටුව බලන්න.

85 රෝහණධීර, මැන්දිස්, ශ්‍රී ලංකාවේ සංඝ සංවිධාන, ගංගොඩවිල, 1974, 169 පි.

86 "මහලු පැවිදි කැමති හෙරණ පැවිද්දන් සංඝ මාධ්‍යයට එළවා උපාධ්‍යායන් විසින් මුත් උපම්පදාවට සුදුස්සෝයයි ප්‍රතිඥාකොට පාවා දුන්කළ මෙසේ විචාර ගත යුතු"

87 උපග්‍රන්ථය 206 - 207 පිටු බලන්න.

88 උපග්‍රන්ථය 138 පිටුව බලන්න.

89 මහාවග්ග පාලිය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 1957, 234 - 235 පිටු

90 මෙහි 95 පිටුව බලන්න.

91 උපග්‍රන්ථය 203 - 205 පිටු බලන්න.

92 උපග්‍රන්ථය 205 පිටුව බලන්න.

93 උපග්‍රන්ථය 205 පිටුව බලන්න.

94 උපග්‍රන්ථය 185 - 186 පිටු බලන්න.

95 E. Z. Vol. 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1912, 48 P.

96 උපග්‍රන්ථය 191 - 207 පිටු බලන්න.

97 සිඛවළඳ හා සිඛවළඳ විනිස, සංස්කරණය, මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි, ඇම්. ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1955.

• උපසපන් භික්ෂූන් දැන සිටිය යුතු, ඉගෙන ගත යුතු විනය නීති අතර, සතර පාරාජිකා, සංඝාධිසේස හතක්, නිස්සග්ගිය දාහතරක්, පකිණ්ණක හැට එකක් හා පොහෝ පවුරුණු විධි අනිවාර්යයෙන් ම දත යුතු ය.

98 E. Z. Vol. 1, Edit by Don Martino De Zilva Wickramasinghe, Oxford University Press, London, 1912, 267 P.

99 උපග්‍රන්ථ 198 පිටුව බලන්න. දඹදෙණි කතිකාවතෙහි ද "ස්ථවිර නව මධ්‍යම ඇමදෙනා විසින් මැ යනුවෙන් දැක්වෙන අතර, පොළොන්නරු කතිකාවතෙහි "ස්ථවිර නව මධ්‍යම හැම" යනුවෙන් දැක්වෙයි."

100 ක. වි. යු. ජී. ඒකනායක, කොළඹ, 1923

101 රෝහණධීර, මැන්දිස්, ශ්‍රී ලංකාවේ සංඝ සංවිධාන, නුගේගොඩ, 1976, 169 පි.

102 උපග්‍රන්ථ 195 පිටුව බලන්න.

103 ම. ව. පා. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 229 පි.

104 උපග්‍රන්ථ 194 - 206 පිටු බලන්න.

105 ස. පා., හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 577 පි.

106 ස. පා., හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 577 පි.

107 මේ සඳහා ඉගෙන ගත යුතු බණ ටිකා මොනවාදැයි කතිකාවත්වල දක්වා නොමැත. සමන්තපාසාදිකාවෙහි දැක්වෙන අන්දමට උපසම්පදාවෙන් වස් පහක් ඉක්ම ගිය පසුව, වේමාතිකාව කට පාඩම් කළ යුතු ය. සතර බණවර ඉගෙන ගත යුතු ය. අන්ධකවින්ද, මහාරාහුලෝවාද, අම්බට්ඨක යන සූත්‍ර, මංගල, අවමංගල අවස්ථාවන්හිදී අවශ්‍ය කරන අනුමෝදනා



තුනක්, උපෝසථය හා පාවාරණය දැනගැනීම හා කර්ම විනිශ්චය සහ එක් කර්මස්ථානයක් ඉගෙන ගත යුතු ය. (ස. පා., හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 577, 578 පිටු. )

108 ස. පා., හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 577 පි.

• සමන්තපාසාදිකාවෙහි අන්තර්ගත වුවද දඹදෙණි කතිකාවතෙන් බලාපොරොත්තු වූ විෂය මාලාව ද යන්න නිර්ණය කිරීම අපහසු ය.

109 උපග්‍රන්ථ 196 පිටුව බලන්න.

110 උපග්‍රන්ථ 205 පිටුව බලන්න.

111 ස. පා., හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 577 පි.

• සමන්තපාසාදිකාවෙහි අන්තර්ගත වුවද දඹදෙණි කතිකාවතෙන් බලාපොරොත්තු වූ විෂය මාලාව ද යන්න නිර්ණය කිරීම අපහසු යග

112 ස. පා., හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 258 පි.

113 උපග්‍රන්ථ 195 පිටුව බලන්න.

• සත්පොත පිළිබඳව නවැරදිව සටහන් නොවන බැවින් මතවාද පවතී. සත්පොත ලෙස "මුල්සිඛ, කතිකාවත, උභයප්‍රාතිමෝක්ෂය, කුදුසිඛ, අත්ථසංග්‍රහය, සූත්‍රපාඨ, ධාතුපාඨ" ලෙස ශ්‍රී ධම්මින්දා සහ දෙණගම ශ්‍රී ප්‍රඥාසාගර හිමියෝ පවසති. (ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද්උපාධි ආයතනය, 1995, 89 පිටුව) මෙයට අදාළ පොත්පත් කිසිවක් ගැන සඳහන් නොවෙයි.

114 උපග්‍රන්ථ 133 පිටුව බලන්න.

115 උපග්‍රන්ථ 201 පිටුව බලන්න.

116 රෝහණධීර, මැන්දිස්., ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය, (මධ්‍යතන යුගය), නුගේගොඩ, 1976, 167 පි.

117 උපග්‍රන්ථ 198 පිටුව බලන්න.

118 උපග්‍රන්ථ 1198 පිටුව බලන්න.

119 සංඝ සංවිධාන සැලැස්ම, (182 පිටුව) හා උපග්‍රන්ථ 188 පිටුව බලන්න.

120 රෝහණධීර, මැන්දිස්, ශ්‍රී ලංකාවේ සංඝ සංවිධාන, (මධ්‍යතන යුගය), නුගේගොඩ, 1976, 171 පි.

121 රෝහණධීර, මැන්දිස්, ශ්‍රී ලංකාවේ සංඝ සංවිධාන, (මධ්‍යතන යුගය), නුගේගොඩ, 1976, 170 පි.

122 ස. ර. ක. කලපළුවාවේ ධර්ම කීර්ති සුගතසාර දේවානන්ද හිමි, දෙවෙනි සංස්කරණය, කොළඹ, 1955, 533 පි.

CamScanner

123 උතුරළුමූලය, කපාරා මූලය, වහදු මූලය, මහනෙත් පා මූලය, සෙනෙවිරත් මූලය, ගලතුරුමූලය, විල්ගම්මූලය යනුවෙනි.

124 උපග්‍රන්ථ 198 පිටුව බලන්න.

125 ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, ධම්මවිසුද්ධි හිමි, යටදොලවත්තේ, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කොළඹ 10, 1995, 123 පි.

126 උපග්‍රන්ථ 198 පිටුව බලන්න.
නැදි පිරිවන පොළොන්නරු යුගයේ මුල් භාගයේ සිට ම පැවත එන පිරිවෙනකි. බු. ව. 1700 - 1800 අතර, කාලපරිච්ඡේදය තුළ මෙහි සුමංගල හිමි වැඩ සිටි පිරිවෙන ලෙස සැලකේ. (පොල්වත්තේ බුද්ධදත්ත හිමි,ථෙරවාදී බෞද්ධාචාර්‍යයෝ, ඇස්. කේ. වන්‍දතිලක, 1960, 97 පි.) මහාවංශයෙහි ද "නන්ද මූල" නමින් පිරිවෙනක් පැවත ඇත. (මහාවංශය, 70, 132 - 134, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959. දඹදෙණි කතිකාවතෙහි මෙනම්න් හැඳින්වෙන්නේ මෙම පිරිවෙන විය හැකි බව, යටදොළවත්තේ ධම්මවිසුද්ධි හිමියෝ පවසති. (යටදොළවත්තේ ධම්මවිසුද්ධි හිමි, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද්උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, 1995, 124 පි.)

127 "සුදුසු ගුණ නුවණ" යනු උතුම් චාරිත්‍ර, ඇවතුම් පැවතුම්වල නියුක්ත කරවීමෙහිත් ප්‍රත්‍ය පහසුකම්වලට ඇල්මක් නො දක්වන හා හික්මවීමෙහි නියුක්ත වීම ලෙස දැක්වේ.

128 "නායක තැන් දක්වා ලිය යුතු" යනුවෙන් දඹදෙණි කතිකාවතෙහි (උපග්‍රන්ථ පිටුව බලන්න) සඳහන් වන අතර, එය මහාස්වාමිගේ අනුමැතියෙන් සිදුවන්නක් බව, පරණවිතානගේ අදහසයි. (Ray, H. C. and Paranavitha-na, S., University of Ceylon of Ceylon History of Ceylon, Vol. 1, Part 11 Ceylon University Press, 1959, 1960, 749 P.)

129 උපග්‍රන්ථ 198 පිටු බලන්න.

130 උපග්‍රන්ථ 198 පිටු බලන්න.

131 උපග්‍රන්ථ 198 පිටු බලන්න.

132 උපග්‍රන්ථ 128 පිටුව බලන්න.

133 ක. ස. කතිකාවත් සඟරා, සංස්කරණය ඩී. බී. ජයතිලක සහ ඩී. එන්. ජයතිලක, කැළණිය, 1955, 50 පි.

134 195 පිටුව බලන්න.

135 උපග්‍රන්ථ 181 පිටුව බලන්න.

136 ම. ව., 60 පරිච්ඡේදය, 13, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959



137 උපග්‍රන්ථ 138 පිටුව බලන්න.

138 උපග්‍රන්ථ 209 - 210 පිටු බලන්න.

139 උපග්‍රන්ථ 229 පිටුව බලන්න.

140 උපග්‍රන්ථ 229 - 23- පිටු බලන්න. (E. Z. Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 85 P.)

141 මහාවංශය, 34 පරි. 66. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1957

142 මහාවංශය, 35 පරි. 92 - 93,. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1957

143 ක. ස. සංස්කරණය, ii, ඩී. බී. ජයතිලක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1984, 52 පි.

144 ක. ස. සංස්කරණය, ii, ඩී. බී. ජයතිලක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1984, 52 පි.

145 ක. ස. සංස්කරණය, ii, ඩී. බී. ජයතිලක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1984, 52 පි.

146 ක. ස. සංස්කරණය, ඩී. බී. ජයතිලක සහ ඩී. එන්. ජයතිලක, කැලණිය, 1955, 52 පි.

147 සමන්තපාසාදිකාව, සංස්කරණය ඩී. බී. ජයතිලක සහ ඩී. එන්. ජයතිලක, කැලණිය, 1900, 273 පි. (තතිය පාරාජික වණ්ණනා)

148 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 75 P.

149 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 42 P.

150 උපග්‍රන්ථ 215 පිටුව බලන්න.

151 උපග්‍රන්ථ 206 පිටුව බලන්න.

152 පා. පා. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1981

153 උපග්‍රන්ථ 185 පිටුව බලන්න.

154 සිඛ වළඳ හා සිඛවළඳ විනිස, මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි, සංස්ක-රණය, හීන්පැල්ලේ ඉන්‍දවංශ හිමි, කොළඹ, 1950

155 ක. ස. සංස්කරණය, ඩී. බී. ජයතිලක සහ ඩී. එන්. ජයතිලක, කැලණිය, 1955, 31 පි.

156 උපග්‍රන්ථ 186 - 188 පිටු බලන්න.

157 උපග්‍රන්ථ 188 පිටුව බලන්න.

Scanned with CamScanner
CS CamScanner

158 උපග්‍රන්ථ 194 පිටුව බලන්න.
159 උපග්‍රන්ථ 199 - 200 පිටු බලන්න.
160 උපග්‍රන්ථ 202 පිටුව බලන්න.
161 උපග්‍රන්ථ 202 පිටවු බලන්න.
162 උපග්‍රන්ථ 205 පිටුව බලන්න.
163 මෙය දඹදෙණි කතිකාවත පමණක් නොව පොළොන්නරු ගල්විහාර කතිකාවතෙහි ද අන්තර්ගතය. උග්‍රන්ථ 126 - 148 පිටු බලන්න.
164 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 43 P.
165 ම. පා. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957, 46 පි.
166 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 43 P.
167 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 2 P.
168 පාරාජිකා පාලිය, 580 - 584 රූපිය වග්ගය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1957.
169 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 3 P.
170 E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 24 P.
171 සිඛවළඳ විනිසෙන් උපුටා ගෙන සකස් කර ඇති කුඩා ප්‍රකරණයක් ලෙස සැලකේ.

E . Z., Vol. 1, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912 සිකකරණිය පස්වැනි කාශ්‍යප රජු දවස හෝ ඊට පෙර සකස් වූවක් ලෙස සැලකේ. මෙය ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වෙන සේඛියාවන්ට හෙළ බසින් ලියූ විවරණයකි. මෙහි අන්තර්ගත වනුයේ, "අවට නැත්තා කොට සිවුරු හඳිනම් දුකුලා වේ. වඩු අඟුලෙන් අටඟුලක් දණ මඩලෙන් බහා වමත් පසැ හ සුත්කත් තබා එක කෙළවරකින් නොඑල්වා අවට ඇත්තා කොට හැඳ යුත්තේයි. අවට ඇති කොට හදන සැඳ වැරද අවට නැතිවුව වරජ නැති. අවට නැත්තා කොට සිවුරු පොරවීමෙ නම් දුකුලා වේ. අත්පිටැලි ගොටු සෙයින් දෙකෙළවර සමකොට මව්අතින් පත්පිටු බහාලා එක් කෙළවරකින් නොඑල්වා අවට ඇති කොට පෙරවිය යුත්තේයි" යනුවෙනි.

CamScanner

# පස්වන පරිච්ඡේදය

## කතිකාවත් තුළින් හෙළිවන අරාම කළමනාකරණය

කතිකාවත්වල අන්තර්ගත කරුණු අතර ආරාම කළමනාකරණය සම්බන්ධයෙන් හෙළිවන තොරතුරු ඉතා වැදගත් ය. ආරාම ආශ්‍රිත ව දියුණු පාලන සම්ප්‍රදායක් පැවති බවත්[1] එය විදේශීය ආක්‍රමණ හමුවේ විනාශ වුවද කතිකාවත්වල සඳහන් වන තොරතුරුවලට අනුව, විහාරාරාම සතු භෞතික සම්පත් හා මානව සම්පත මනා ලෙස කෙසේ කළමනාකරණය කොට ඇත්තේ ද යන්න අභයගිරි සංස්කෘත ලිපිය, V වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය, IV වන සේන රජුගේ කළුදිය පොකුණ ලිපිය අනුව පැහැදිලි වෙයි. මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනය කොට ඇත්තේ විහාරාරාමවලට පූජා කරන ලද භෞතික සම්පත් රැක ගැනීම හා ඒවායෙහි සේවය කරනු ලබන නිලධාරීන් හා සේවකයන් කළමනාකරණය කොට ඇති අයුරු ය.

### 5.1 අරාම කළමනාකරණය කිරීමට බලපෑ සාධක

මිහිඳු මහරහතන් වහන්සේ හා දෙවන පෑතිස් රජු මහාවිහාර සීමාව ලකුණු කිරීමත් ඉන් අනතුරුව නියමිත ස්ථානයන්හි ඒ ඒ විහාරාරාම අංග ස්ථාපිත කිරීමට සැලසුම් කිරීමත් ලාංකේය ආරාම සැලසුම් කිරීමේ මූලික අවස්ථාව ලෙස සැලකිය හැකි ය.[2]

සසුන ආරම්භ වී බොහෝ කල් ගතවීමත්, භික්ෂු සංඝයා ප්‍රමාණාත්මකව වර්ධනය වීමත් සමග භික්ෂු සමාජය තුළ විවිධාකාරයේ ගැටලු සහගත තත්ත්වයන් මතු වන්නට විය.

CamScanner

ඒ ඒ යුගයන්හි පැවති සමාජ, ආර්ථික හා දේශපාලනික මෙන් ම ආගමික සන්දර්භය හරහා භික්ෂුවට මුහුණදීමට සිදු වූ අනේකවිධ ගැටලු සඳහා විසඳුම් සෙවීමක් වශයෙන් බිහි වූවක් ලෙස කතිකාවත් හැඳින්විය හැකි අතර, එමගින් භික්ෂුව පමණක් නොව ආරාම ද මැනවින් කළමනාකරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව පැහැදිලිව දක්නට ලැබේ.

ක්‍රි. පූ. තෙවන සියවසේ සිට ම විවිධ අවස්ථාවලදී ශාසනය උදෙසා කැප කරන ලද උපයෝග පරිභෝග වස්තූන් පිළිබඳව ලජ්ජිතිස්ස (ක්‍රි. පූ. 119 - 109) රජුගේ දූවේගල හා නාඋල්පොත්[3] ශිලා ලේඛනය මගින් හෙළි වේ. එම රජු දවස වෙහෙර විහාරයන්හි පරිපාලන කටයුතු සඳහා පැහැදිලිව ම වෙන් කරන ලදැයි සිතිය හැකි ය. මෙම රාජ්‍ය සමයෙහි මෙලෙස පැවතිය ද දුටුගැමුණු - එළාර යුද්ධය,[4] වුල්ලත්තන හා ලජ්ජිතිස්ස සහෝදරයන්ගේ යුද්ධය[5], වැනි යුද්ධ අවස්ථාවලදී ලාංකේය ජනතාව බෞද්ධ භික්ෂූන් වහන්සේලා පෝෂණය කිරීම හා රක්ෂා කිරීම යන අංග දෙක ම අමතක කොට දැමූහ. කූටකණ්ණතිස්ස, භාතික තිස්ස ආදී රජවරුන් ද මෙම ක්‍රියා කලාපය අනුගමනය කිරීමෙහි ම නිරත ව සිටියහ.

වසභ රජුගේ රාජ්‍ය සමය වන විට සෑම නගරයක ම පිහිටි ආරාමවලට අවශ්‍ය උපයෝග පරිභෝග වස්තූන් පිදීමෙහි රජවරු මෙන් ම ගිහි ජනතාව නිරත වූ බැව් ඔහුගේ සෙල් ලිපිවලින් අනාවරණය වෙයි.[6] මේ වන විට ලංකාවේ භික්ෂු ශාසනයෙහි ප්‍රමාණාත්මක වර්ධනයක් ද සිදුවී ඇති ආකාරය පූජාවලිය වාර්තා කරයි.[7] එයට වඩා සාක්ෂිය වනුයේ ලංකාව පුරා විසිරී ඇති ආරාම සංකීර්ණයන් ය.

ලාංකේය භික්ෂූන් වහන්සේලාට ලැබෙන ලාභ සත්කාර බහුල වී භික්ෂු ජීවිතය සුඛෝපභෝගී වීම ඇරඹීමත් සමග ම ඔවුහු තමන්ගේ මූලික පිළිවෙත්වලින් ක්‍රමානුකූලව බැහැරවන්නට පටන් ගත්හ. එහි දී රජවරුන්ට ඒ සඳහා මැදිහත් වී ඒවා පාලනය කිරීමට ක්‍රියා මාර්ග ගන්නට සිදු විය. මේ අයුරින් ආරම්භ වූ භික්ෂු සංස්කෘතියෙහි විපරිණාමී ස්වභාවයන් තුළ භික්ෂූන්ගේ ක්‍රියා කලාපයන් සෑම අවස්ථාවක ම නිවැරදි නොවූ බව අනුරපුර සමය



තුළ ම ශාසන ශෝධන රැසක් පිළිබඳව දක්වා තිබීමෙන් පැහැදිලි ය. භික්ෂු සමාජය තුළ ඇති වූ මෙම ගැටලුවලට අනුරපුර අවසාන භාගය වන විට දේශපාලන සංස්ථාව මෙන් ම භික්ෂු සංස්ථාව ද එක් වී විසඳුම් සෙවීමෙහි නිරත විය. එහි දී භික්ෂුවගේ වත් පිළිවෙත් නිසි ලෙස ඉටු කිරීමට නම් බාහිර කටයුතුවලින් සෘජුව ම ඉවත්වී සිටිය යුතු බව, ආරාම පාලනයට ගිහියන් සේවකයන් ලෙස පත් කිරීමෙන් පෙනේ. ඇතැම් විට විහාරස්ථ භික්ෂූන් පරිපාලන නිලධාරීන් තම ඒකාධිපති පාලනය මගින් ඉවත් කරන්නට ඇතැයි සැක කළ හැකි ය. මෙම තත්ත්වය උදා වූයේ භික්ෂූන් නැවත ස්වාධීන වන්නට උත්සාහ දරන අවස්ථාවක දී වන්නට ඇත. එහෙත් ඒ සඳහා දේශපාලනමය වශයෙන් තීරණයක් ගත් බව, කළුදිය පොකුණ[8] ශිලා ලිපිය සාක්ෂි දරයි. ඒ අනුව, සාධාරණ හේතුවක් නොමැතිව නඩත්තු ඉඩම් හෝ වැටුප් හෝ විහාරස්ථානයෙහි සේවකයන්ට අහිමි කරනු ලබන භික්ෂූන්ට අදාළ විහාරස්ථානයෙන් නේවාසික බව අහිමි කරනු ලබන බවට අණක් ආකාරයෙන් දක්වා තිබීමෙන් පෙනී යයි. මේ නිසා ආරාම කළමනාකරණය කිරීමට බලපෑ හේතුවක් වනුයේ, භික්ෂුවගේ අරමුණු කරා යෑමට ඉඩකඩ සලසාදීමට බව පැහැදිලි වන කරුණකි.

භික්ෂු සමාජය ක්‍රමිකව වර්ධනය වීමත් සමග ම රජදරුවන්, උපාසක - උපාසිකාවන් පිරිනමන ලද කෙත්වතු, ආරාම හා වැව් ඉතා විශාල ප්‍රමාණයක් විය. භික්ෂු ශාසනය ආරම්භයේ දී ආරාමය බවට පත් වූයේ ගල් ලෙන් ය.[9] ගල් ලෙන්වල විකාශනයත් සමග ම ආරාමයන් සංඛ්‍යාත්මකව වර්ධනය වීම හේතුවෙන් එහි අංගෙ ්පාංගයන් හි වර්ධනයත් සිදුවන්නට විය. ලාංකේය සංස්කෘතිය තුළ භික්ෂුව හා සසුන ප්‍රමුඛස්ථානයෙහිලා සැලකීමත් නිසා, සැදැහැවතුන් විවිධ පූජාවන් භික්ෂූන් වහන්සේලා උදෙසාත්, ශාසනය උදෙසාත් පරිත්‍යාග කරනු ලැබී ය. එලෙස ලැබුණු පරිත්‍යාග අතර, ගම්,[10] කෙත්වතු,[11] වැව්,[12] ඇළ දොළ,[13] වී ආදී ධාන්‍ය වර්ග, මුදල්, මුදල් තැන්පත් කිරීමෙන් ලැබෙන්නා වූ පොලිය,[14] ඉඩම් බදු මුදල්,[15] දඩ මුදල්,[16] වහලුන් හා වහලුන් මුදවා ගැනීමෙන් ලැබෙන්නා වූ ආදායම ආදී විශාල ප්‍රමාණයේ පරිත්‍යාගයන් ලැබිණි. රොබට් නොක්ස්[17] පවසනුයේ, රජුගේ ආදායමට වඩා විහාරවල

CS Scanned with CamScanner
CS CamScanner

ආදායම වැඩි බවයි. එමෙන් ම මෙයින් පැහැදිලි වනුයේ, භික්ෂුව බොහෝ ආදායම් මාර්ගවලට හිමිකම් කියූ ආකාරය යි. මෙලෙස වැඩි ආදායම් මාර්ගයක් ලැබීම හේතු කොට ගෙන සුඛෝපභෝගිවීම වැළැක්වීම හා එයට මැදිහත් නොවීමට අවස්ථාවක් ලබාදීම ද ආරාම කළමනාකරණය කිරීමට බලපෑ සාධකයකි.

ක්‍රි. ව. 9 හා 10 වන සියවස් වන විට ඇතැම් විහාරස්ථානයන්හි භික්ෂූන් ඒවායේ සේවකයන්ට ගෙවන ලද වැටුප් සීමා කිරීම හෝ පාලනය කිරීමේ කටයුතුවල නිරත වී තිබේ.[18] මෙම ලක්ෂණය ප්‍රධාන අරාම සංකීර්ණවලට පමණක් සීමා වූවක් නොවන අතර, කුඩා ප්‍රමාණයේ ආරාමවල ද ක්‍රියාත්මක වූ ලක්ෂණයකි. ප්‍රධාන විහාරයේ ලේඛනභාරව සිටින ජ්‍යෙෂ්ඨ භික්ෂූන් තමන් විසින් පත් කරන ලද නියෝජිතයන් ද විහාරයට අනුබද්ධිත ආශ්‍රමවල ගණන් පරික්ෂා කිරීම, විගණනය හා ආරාවුල් විභාග කිරීම මගින් ආරාම පාලනය කරන ලදි.[19]

සැදැහැවතුන් සසුන උදෙසා පරිත්‍යාග කරනු ලැබූ කෙත්වතු, ඇළ දොළ ආදිය ආරාම අවට ම පිහිටි ඒවා නොවේ. මහාවිහාරයට පූජා කරන ලද ඉඩමක් මහාවිහාරයෙන් ඈත මුහුන්ද්නරුවෙහිත්,[20] මෙම ආරාමයට ම අයත් ගම් තුනක් මන්නාරමත්[21] පිහිටා තිබුණි. මොරගොඩ ඉඩමක් අභයගිරි විහාරයට අයිති විය.[22] ජේතවනාරාම විහාරයේ සිට සැතපුම් විසි පහක් පමණ ඈතින් වූ මැදවච්චියේ එම විහාරයේ සිරිසඟබෝ පිරිවෙනට අයත් ඉඩමක් තිබිණි.[23] මේවා පාලනය කිරීමට නම් ඒ සඳහා විධිමත් කළමනාකරණයක් තිබීම අනිවාර්ය ය. ඒ අනුව, කතිකාවත් මගින් ආරාම කළමනාකරණය කිරීමට මෙම හේතුව ද බලපාන්නට ඇතැයි සිතිය හැකි ය.

මෙම කරුණුවලට විසඳුම් ලෙස රාජ්‍ය බලය මගින් පාලන නීතිරීති සකස් කර ඇති ආකාරය අනුව, ආරාමයන් ක්‍රමානුකූල බවකින් පාලනය කිරීම සඳහා නිශ්චිත හා කාලීන ප්‍රතිපත්ති මාලාවක් ඒ ඒ විහාරාමයන්ගේ ප්‍රභූත්වය - පිරිස හා සාමාජික ස්ථාවරභාවය අනුව සකස් කරන්නට යෙදුණු බව IV මිහිඳු රජුගේ මිහින්තලා ශිලා ලිපිය මඟින් පෙන්වා දිය හැකි ය.[24] එමෙන් ම ලාංකේය භික්ෂු සංස්කෘතිය තුළ ක්‍රමවත් කළමනාකරණයක අවශ්‍යතාව



අවබෝධ කොට ගත් රජවරුන් ආරාමයන් කළමනාකරණය කිරීම සඳහා කතිකාවතක් පිහිටුවා තිබෙන අතර, ඒවා විහාර කතිකාවත් ලෙස නූතනයේ අර්ථ දක්වනු ලැබේ.[25]

ක්‍රි. ව. 9 වන සියවසේ දී පමණ වන විට ආරාමවලට අයත් ඉඩම්වලින් ලැබෙන අයබදුවලට රාජ්‍ය නිලධාරීන්ගේ ඇඟිලි ගැසීම් නතර කිරීම සඳහා අත්තානි ප්‍රදානයන් කරනු ලැබීය. එහි ප්‍රතිඵලය වූයේ, විහාරස්ථානවල පාලන බලය විහාරස්ථානවලට ම පැවරීමයි. මේ බව අනුරාධපුර V වන කාශ්‍යප රජුගේ සෙල් ලිපියෙහි ද අන්තර්ගත ය.[26] මෙහි අධිකාරී බලයක් තමන් වෙත ලැබීම නිසා ඇතැම් භික්ෂූන් වහන්සේලා විහාරස්ථ සේවකයන්ගේ වැටුප් ගෙවීම නතර කිරීම, ඉඩම් ලබා නො දීම සිදු කළ බව කළුදිය පොකුණ සෙල් ලිපිය[27] වාර්තා කරයි.

විනය පිටකයෙහි අන්තර්ගත වනුයේ, ද්‍රව්‍යමය දේ පිළිගැනීම, පාලනය කිරීම හා භුක්ති විඳීම ඇතුළත් සියලු ලෞකික වැඩ කටයුතුවලින් වළකින ලෙසට භික්ෂූන් වහන්සේලාට කරනු ලබන නියමයකි.[28] ස්ථවිර, නවක, මධ්‍යම, සාමණේර යන කිසිම භික්ෂුවක් විසින් රන් රිදී ආදිය කැපකරුවන් විසින් ලබා දෙන දෙයක ප්‍රයෝජනයක් භුක්ති විඳිනවා මිසක පිළිනොගත යුතු යැයි රාජාධිරාජසිංහ කතිකාවතෙහි ද දැක්වේ.[29] එහෙත් සැදැහැවතුන් ශ්‍රී ලාංකේය ශාසනය උදෙසා විවිධ දේ පරිත්‍යාග කළහ. ලාංකික භික්ෂූන් වහන්සේලා ඒවා පිළිගනු ලැබූහ. බුද්ධ විනයත් තත්කාලීන සමාජයත් අතර ඇති වූ මෙම ගැටලුව පිළිබඳව බුද්ධඝෝෂ හිමියන් ප්‍රකාශ කරනුයේ, "කුඹුරක්, ඉඩමක්, වැවක් හෝ ඇළක් වැනි නිශ්චල දේපළ කිසිවක් පාලනය නො කිරීම, නො පිළිගැනීම හා පිළිගැනීමට නො කැමතිවීම භික්ඛු සංඝයාට ඔබින, ඔවුන් විසින් පිළිපැදිය යුතු ගුණාංගයක් බව යි". කෙසේ වෙතත් කොඩ්රිංටන් මහතා ප්‍රකාශ කරනුයේ, ගිහි භාරකරුවන් හා නිලධාරීන් පිරිසක් මාර්ගයෙන් භික්ෂූන් වහන්සේ ආරාම පාලනය ගෙන ගිය බව යි.[30] සසුන වෙනුවෙන් පරිත්‍යාග කරන ලද දේපළක් කප්පිය කාරයෙකු මගින් භාර ගැනීම හා පාලනය කිරීම තුළින් මතු වනුයේ, භික්ෂුවගේ පරමාර්ථය කරා ගමන් කිරීමේ දී විහාරයන්ගේ මෙම

CS Scanned with CamScanner
CS CamScanner

දේපළ පාලනය කිරීමට ගිහි භාරකරුවන් හා සේවකයන් යෙදවීමට සුදුසු වැඩපිළිවෙළක් මෙම කතිකාවත් මගින් සපයා ගෙන ඇති බව යි.

## 5.2 ආරාම සැලසුම්කරණය

ආරාම සැලසුම් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ම නිර්ණායක කොට ගත්තේ එතෙක් අනුගමනය කරන ලද සිරිත් ය.[31] අනාගත වැඩපිළිවෙළ සකස් කිරීම ද තනි පුද්ගලයෙකු විසින් සිදු කළ යුත්තක් නො වන අතර, එයට අදාළ වූ සියලුම පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් සිදුවිය යුතු අතර, මහජන සහභාගිත්වය මත තීරණ ගැනීම සිදුවී ඇති බව දක්නට ලැබේ. මිහින්තලය කතිකාවතෙහි දැක්වෙන අන්දමට, එහි අනාගත සැලැස්ම සකස් කිරීමේ දී, ඒ සඳහා සුදුසු පුද්ගලයන්ගෙන් ද විහාරස්ථ මහා භික්ෂු සංඝයාගේ ද, දාසයන් හා කම්කරුවන්ගේ ද සහභාගිත්වයෙන් සකස් වූවකි.[32] විහාරාරාම පාලනයේ දී එතෙක් පැවති අඩුපාඩුවලට විසඳුම් වශයෙන් ආරාම කළමනාකරණය කිරීමේ දී නැවතත් එවන් ගැටලු මතු නො වන ආකාරයට සැලසුම් කොට තිබීම වැදගත් කරුණකි. ප්‍රතිපෝෂණ පාලනය හා සැලසුම් කිරීම අතර සම්බන්ධතාව මින් අනාවරණය වෙයි. ඒ අනුව ආරාම සැලසුම් කිරීමේ දී,

1. භික්ෂුව බාහිර කටයුතුවලින් ඉවත් කිරීම.
2. භික්ෂුවගේ අධීක්ෂණය යටතේ සියලු කටයුතු සිදු කිරීම.
3. ආරාමවල වැඩ කටයුතු සඳහා රාජ්‍ය නිලධාරීන්, සේවකයන් යෙදවීම.
4. විධිමත් සංවිධාන සැලැස්මකට අනුකූලව පාලනය කිරීමට කටයුතු සම්පාදනය කිරීම.
5. අය - වැය ලේඛනයක් සකස් කිරීමට තීරණය කිරීම.
6. පිරිස් කළමනාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.



7. නීති හා දඬුවම් හඳුන්වාදීම පිළිබඳව අවධානය යොමු කොට ඇති බව පැහැදිලි ය.

ආරාම කළමනාකරණයේ දී රජුට හා ප්‍රධාන භික්ෂුවට කළමනාකරණය කළ යුතු ප්‍රධාන අංග දෙකක් හඳුනා ගත යුතු විය. ඒ ඒ විහාරාරාම ආශ්‍රිත ව පැවති, භෞතික කළමනාකරණය හා අභෞතික කළමනාකරණය (මානව සම්පත් කළමනාකරණය) යනුවෙනි. භෞතික කළමනාකරණය යනු, ඒ ඒ විහාරාරාම සංකීර්ණයෙහි ඇති උපයෝග පරිභෝග වස්තූන් ඇතුළත් විහරාරාම අංගෝපංගයන් සේ ම රජවරුන්, දායක දායිකාවන් විසින් පිරිනමන ලද ආරාම, කෙත්වතු, වැව් ආදිය ද ඇතුළත් වේ.[33] මෙයට අමතරව චෛත්‍ය, ධාතු මන්දිරය, ප්‍රාකාර භූමි, ගබඩාව, ගස් කොළන් ද කළමනාකරණය කිරීමට බලපෑ භෞතික සම්පත් ලෙස සැලකිය හැකි ය.

අභෞතික කළමනාකරණය ලෙස විග්‍රහ කළ හැක්කේ ආරාම පරිපාලනය කිරීමේ දී පත් කරගෙන සිටි කාර්යමණ්ඩලය හා විහාරස්ථ භික්ෂූන් වහන්සේලා ය. මානව සම්පත් කළමනාකරණය කළ අන්දම මින් පැහැදිලි ය. තෙවැනි පරිච්ඡේදයේ දී භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීම පිළිබඳව අධ්‍යයනය කොට ඇති හෙයින්, මෙහි දී ඒ සඳහා අවධානය යොමු නො කෙරේ. අභෞතික කළමනාකරණයේ දී හුදෙක් බලාපොරොත්තු වූයේ භික්ෂුව හා ගිහි ජනතාව අතර ගැටුමක් ඇති නො වන ආකාරයට, තත්කාලීන සමාජ සාරධර්ම හා නීතියට අනුකූලවන අන්දමට පාලනය කිරීමට ය.

ආරාම කළමනාකරණය කිරීමට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ ශාසනය වෙනුවෙන් පූජා කරනු ලබන ද්‍රව්‍යමය දේ පිළිගැනීම, පාලනය හා පරිභෝජනය කිරීම ආදියෙන් භික්ෂුව ඈත් කිරීම යි.[34] භික්ෂුව මිලදී ගැනීම් නො කළයුතු යැයි දක්වා තිබේ.[35] අනුරාධපුර යුගයට අයත් මුල් කාලීන සෙල් ලිපිවලට ආරාම පාලනයෙහි නියැලුණු පිරිස් ගැන සඳහන් නො වන නමුත් පසු කාලීනව විහාරවලට පරිත්‍යාග කරනු ලැබූ දේපළ ප්‍රමාණයෙන් වැඩිවෙත් ම ඒ සඳහා සුදුසු කැපකරුවෙකු පසු කාලයෙහි පත්

කිරීමට සැලසුම් කෙරිණි. ඔහු කප්පියකාරයෙකු[36] ලෙස හැඳින්වූ බව පැහැදිලි ය. ආරාම දේපළවලින් බොහොමයක් පරිභෝජනය කොට ඇත්තේ කප්පියකාරයන් විසින්[37] වන අතර, ඔහුට විහාර දේපළ සියල්ල කළමනාකරණය කිරීමට බලය පවරා දී තිබේ.[38] පසුකාලීනව ආරාම උදෙසා පූජා කරන භාණ්ඩයන් හා ද්‍රව්‍යයන් ප්‍රමාණාත්මක හා සංඛ්‍යාත්මක වැඩිවීම නිසා එම කාර්යභාරය තනි පුද්ගලයෙකුට සිදු කිරීමට නො හැකි වන්නට ඇති අතර, එයට විසඳුමක් ලෙස ඒ සඳහා නිලධාරීන් හා සේවකයන් යෙදවීමටත්, එලෙස ඔවුන්ගේ සේවය ලබාගැනීමේ දී ක්‍රමානුකූලව ලබා ගැනීමටත් යෙදවීමටත් හැකි වන ආකාරයට කළමනාකරණය කිරීම උදෙසා කතිකාවත් පිහිටුවා ගත් බවත් උපකල්පනය කළ හැකි වේ.

විහාරාරාම සතු දේපළ, ඉඩකඩම්, කුඹුරු, වැව් ආදිය පාලනය කිරීම,ආදායම් ආදිය සකස් කිරීමට ගිහි ජනයාගෙන් සැදුම්ලත් පිරිසකට භාර කරනු ලැබුව ද, එහි සම්පූර්ණ බලය භික්ෂුව සතු වෙයි. මේ සඳහා පළමුවෙන් ම පත් කරනු ලැබ ඇතැයි සැලකිය හැක්කේ කප්පියකාරයෙකි. ක්‍රි. ව. 3 වන සියවසේ දී පමණ රජ වූ බුද්ධදාස රජතුමා (ක්‍රි. ව. 336 - 365) ධර්මය පහදා දුන් භික්ෂූන් වහන්සේලා සඳහා කප්පියකාරයෙකු පත් කොට තිබේ.[39] මොවුන් ආරාමිකයන්[40] ලෙස ද විග්‍රහ කෙරෙන අතර, ආරාමිකයන් ආරාමවල සේවකයන් ලෙස කටයුතු කළ පිරිසකි.[41] චූලවංශයෙහි[42] රජවරුන් මෙන් ම බිසෝවරුන් ද මෙවන් ආරාමිකයන් ප්‍රදානය කිරීම සිදු කළ බව දැක්වෙන අතර, IV වන අග්ගබෝධි රජුගේ අගමෙහෙසිය වූ ජෙට්ඨා ආරාමිකයන් සිය දෙනෙකු ප්‍රදානය කරන ලදි. චූලවංශයෙහි[43] දැක්වෙන අන්දමට භෝග පරිත්‍යාගයන් ලබා දීමෙන් එකී සේවකයන් මැනවින් මෙහෙයවීමට සැලසුම් කිරීම අවශ්‍ය විය.

ආරාමවල භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ දී ඒ සඳහා වන පරිත්‍යාගයන් ද ලබා දුන් බව, V වන දප්පුල රජුගේ සමයෙහි ලියැවුණු වෙස්සගිරි ලිපියෙන් හමු වේ.[44] චිරංකුරාම ආරාමයෙහි භික්ෂූන් වහන්සේලාගේ ප්‍රත්‍ය පහසුකම් උදෙසා, රන් කළං[45] දෙසියක් ප්‍රදානය කරන ලදි. වැය කළ යුත්තේ වස් පවාරණ දෙපෝයේ දී එක් නමකට විස්සකින් සාදන ලද අවුල්පතක් පූජා කිරීම



පිණිසත්, කැඳ බඳුනෙහි කැඳ වත්කරනු පිණිසත්, මෙම මුදලින් කළං හැටක් සලාක බත්වලට ලබාදීමටත්, වර්ෂය අවසානයෙහි සිවුරු පිණිස කළං විස්සකුත් වශයෙනි. මෙයට අමතර ව, බුද්ධ ප්‍රතිමාව අභියස පහන් දැල්වීම සඳහා කළං දහයක් ද මාසිකව එක් භික්ෂූන් වහන්සේ නමකට හකුරු අකක්[46] හා ගිතෙල් අකක් ලබා ගැනීම පිණිස කලං විස්සකුත් ලබාදීමට නියෝග කොට ඇත. මෙයින් අරාමවල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය දේ සැපයීම නිසා ඒවා විධිමත් ලෙස පාලනය කිරීමක් සිදු වී තිබේ.

ආරාමවල වැඩ කටයුතු සඳහා සේවකයන් යෙදවීමේ දී ප්‍රධාන කොටස් දෙකකින් යුක්තව යොදවා ඇත. එනම් සේවකයන් හා නිලධාරීන් ය. අභයගිරි සංස්කෘත ලිපිය හා මිහින්තලා ලිපියෙහි[47] දැක්වෙන අන්දමට මෙම දෙපිරිසෙහිම මූලික කාර්යභාරය වී තිබුණේ, විහාරාරාමයන් සංරක්ෂණය කිරීම, කර්මාන්ත ශිල්ප කණ්ඩායම් වශයෙන් ක්‍රියා කිරීම හා අයවැය ලේඛනය සකස් කරන නිලධාරීන් ලෙස සේවය කිරීම යි. ජරාජීර්ණව පවතින ගොඩනැගිලි ආදිය පිළිසකර කර අලුත්වැඩියා කිරීමට සේවකයන් පත් කිරීමට සැලසුම් කොට තිබූ අතර, එබඳු සේවකයන් වාරිමාර්ග, චිත්‍ර කර්මාන්තය, කෘෂි කර්මාන්තය, ආගමික උත්සව, ආහාර පිළියෙල කිරීම සඳහා යොදවා තිබේ. ආදායම් ලබන ගම්වල එම ආදායම එකතු කර ගැනීම හා පාලනය කිරීම සඳහා ද නිලධාරීන් යොදවා තිබුණි.

අනුරාධපුර අවසාන කාලයට අයත් මිහින්තලා ශිලා ලිපියට අනුව, ආරාම හා ඉඩම් පාලනය කළ පිරිස ආකාර තුනකට සැලසුම් කොට තිබුණි. බෙදා වර්ග කර තිබුණි. එනම්, මහබික් සඟ හිමියන්, වෙහෙර් කැමියන් හා වෙහෙර් දසුන් යනුවෙනි. මේ හැර "වෙහෙර් මීමැහුන් කුඩන්" යනුවෙන් අවශේෂ පදිංචිකාර පිරිසක් ද වූ බව වැඩිදුරටත් සඳහන් කළ හැකි ය.

ආරාම පාලනයේ දී මනා සැලැස්මක් ඇතිව ක්‍රියාත්මක වූ බවට සාධකයක් වනුයේ, කැමියන් තුන් දෙනෙකුගේ සේවය චේතියගිරි විහාරයට යොදවා තිබීම යි. වැටුප් ගෙවන තැනත්, සාල් ගන්නා තැනත්, පෙරවරු කැඳ හා බත් සපයන තැනත්, අඩුවක් නැතුව තුන් දෙනෙකු සිටිය යුතු බව දක්වා ඇත.[48] එමෙන් ම

CamScanner

කණ්ඨක සෑයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන අවස්ථාවේ දී කැමියන් බලාගෙන සිදු කළ යුතු බව 30, 33 පේළිවල අන්තර්ගත ය. එලෙස කැමියන්ගේ කටයුතු සැලසුම් කිරීමේ දී විහාරයේ මෙ-හෙයට ලබා දී ඇති මිනිසුන්ගෙන් වැඩ නො ගත යුතු ය.

භික්ෂූන් වහන්සේලා ද ඒ ඒ ආරාමවලට සුදුසු පරිදි වෙන් කිරිමක් සිදු කොට ඇති බව, අභයගිරි ලිපියෙහි[49] (අවසාන පේළිවල) අන්තර්ගත ය. කළමනාකරණය තුළ සිදු වන්නේ ද යමක් නියමිත පරිදි සිදුවිය යුතු බවයි. අභයගිරි විහාරය මහායානයට හා ථේරවාදයට නැකම් කියනු ලැබුවත්, තම ආරාමයෙහි භික්ෂූන් වහන්සේලාගේ ඌනතාවක් ඇති වුවහොත්, අන්‍ය නිකායෙන් හෝ පත් කරගත හැකි බවයි. ඒ නිකායෙන් ම පත්කර ගත යුතු බවක් නො දැක්වීමෙන් විධිමත් භික්ෂු සැලසුම්කරණයක් තිබුණු බව යි.

කප්පියකාරයෙකුගේ ප්‍රධානතම වගකීම වනුයේ සඟුන වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන කෙත්වතු, ඉඩම්, ඇළ දොළ ආදිය භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පිළිගැනීමත්, පරිපාලනය කිරීමත් ය.[50] එහෙත් පසුකාලය වනවිට ආරාමවලට පිරිනැමෙන භෞතික සම්පත් ප්‍රමාණය වැඩිවීමත් සමග රජුට විහාරාරාම ප්‍රතිසංස්කරණය, නවීකරණය හා රැකබලා ගැනීම පැවරී[51] තිබුණි. එබැවින් රජු විසින් එම කාර්යයන් සඳහා වෙනම ම කාර්යමණ්ඩලයක් පත් කිරීමට සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම සිදු කොට තිබේ. ආරාමවලට ආදායම් ලැබෙන ස්ථාන, ආදායම් මාර්ග පිළිබඳව පූර්ව තීරණයක් ගැනීමත් ඒවා නිසි ලෙස කළමනාකරණය කිරීම මෙහි දක්නට ලැබෙන වැදගත් ලක්ෂණයකි. ඒ ඒ විහාර අංග සඳහා වෙනම ගම් වෙන් කොට දක්වා ඇති අතර, ධාතු ගෘහයට අයත් ගුතැ හා කරන්ද යන ගම් දෙක වෙන් කිරීමත්,[52] කණ්ඨක මහා සෑයෙහි නව කර්මාන්ත කරුවන්ට දම් ගමුව වෙන් කිරීමත්, දම්ය ගම නිලධාරීන්ට හා සේවකයන්ට ලබා දීම සඳහා ප්‍රධාන විහාරස්ථානයට වෙන් කිරීමත් සිදු කොට තිබේ. වඩුවන් සඳහා වඩු දෙවැගම ද, ලබා දීමට සැලසුම් කොට ඇත.

සමන්තපාසාදිකාවෙහි[53] දැක්වෙන ආකාරයට රජවරුන් ආරාම වෙත පූජා කරන ලද වගා ඉඩම් ප්‍රයෝජනයට ගන්නා



ජනතාව ඒ සඳහා බදු මුදලක් ගෙවිය යුතු ය. යම් පුද්ගලයෙකු එවැනි බදු මුදලක් ලබා නොදෙන්නේ නම් එම වගා ඉඩම්වලට අවශ්‍ය ජලය වැවෙන් ලබා නොදීමට භික්ෂූන් වහන්සේට හැකියාව තිබේ. නැවතත් ජලය ලබා දෙනු ලබන්නේ වගා ඉඩම් ප්‍රයෝජනයට ගන්නා ජනතාව ආරාමවලට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමට එකඟ වන්නේ නම් පමණි. විහාරස්ථ අයවැය ලේඛනය සකස් කිරීමට ගිහියෙකු පත් කරනු ලැබුවත්,[54] ඒවායෙහි වැරදි නිවැරදි බලා අනුමත කිරීමේ පූර්ණ බලය හිමි ව ඇත්තේ ඒ නිකායෙහි භික්ෂූන් වහන්සේලාට ය. මෙමගින් ආරාම කළමනාකරණය කිරීම සඳහා ගිහි ජනතාව වෙත බාර කරනු ලැබුවත්, කළමනාකරු වශයෙන් ක්‍රියාකිරීමේ අයිතිය හිමි ව ඇත්තේ භික්ෂුවට ය.

## 5.3 ආරාම සංවිධානකරණය

මුල්වරට භික්ෂූන් වහන්සේලාගේ කටයුතු සංවිධානය කිරීම උදෙසා දායකයෙකු පත් කර ඇති බව, පුලියන්කුලම සෙල් ලිපියෙහි[55] දැක් වේ. උදාකිතගබෝ විහාරයෙහි භික්ෂූන් වහන්සේලා හා ගිහියන් අතර ඇති වන ආරාවුල් විසඳීම මහයාගෙයි බලැතුන්ගේ කාර්යභාරය වුවත්, ප්‍රධාන දායකයෙකු ද පත්කර තිබීමෙන් එය වඩාත් පහසු කිරීමට මෙම තනතුර ඇති කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එම තනතුරට පත්ව ඇත්තේ සක් මහ ඇමති සඟල්නාවන් ය.[56]

විහාරාරාම සංවිධානකරණයට අනුව වගකිව යුතු වූයේ, ප්‍රධාන සංඝයා වහන්සේලා අතර, තෙර, මහතෙර, ආචාර්ය හිමියන්, වත් හිමියන්, වෙහෙර් හිමියන්, නකාබලන හිමියන්, වගවලාකියන හිමියන්, සුතන්වළා කියන හිමියන්, දම්වළාකියන හිමියන්, මජ්ඣමබණක යනාදී පැවිදි තනතුරු රාශියක් ම දැක්විය හැකි ය. නවවැනි හා දසවැනි ශතකවලට අයත් වන මිහින්තලේ හා වෙනත් සෙල්ලිපි කිහිපයක ම විහාර, ඉඩකඩම් හා දේපළ පාලනය පිළිබඳ නීති දැක්වෙන කතිකාවත් රාශියක් ද දක්නට ලැබේ. විහාර සන්තක ඉඩම්වල ගොවිතැන් වගා කටයුතු සිදු කරනු ලැබුවේ, "වෙහෙර් දසුන්" හා "වෙයෙර් කැමියන්" විසිනි.

එම විහාරයට අයත් බිම්වල සේවයෙහි නියුක්ත වූවන්ගේ පාලනය ආදායම් එකතුව ආදිය භාරව තිබුණේ ඉහත සඳහන් පැවිදි පක්ෂයට හා නිලධාරීන් පිරිසට ය.

සැලසුම් කරගත් පරිදි, ආරාමයන් හි නිලධාරීන් හා සේවකයන් සංවිධානගත කිරීමේ දී ඔවුන් ධාතු ගෙය, පිළිම ගෙය හා බත් ගෙය සඳහා පත්කොට තිබේ.[57] ධාතු ගෙය හා පිළිම ගෙය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඒවාට ආදායම් ලැබෙන ආකාරයට ඉඩම් වෙන් කිරීමත්, ප්‍රතිසංස්කරණය කටයුතුවලට අවශ්‍ය සේවකයන් හා නිලධාරීන් යෙදවීමත් ආරක්ෂක නිලධාරීන්ගේ සේවයත් ලබාදීමට කටයුතු සංවිධානය කොට තිබුණි. මෙයට අමතරව සමස්තයක් ලෙස ආරාමයෙහි සියලුම කටයුතු සිදු කිරීම හා පවත්වාගෙන යාම සඳහා තනතුරු ඇති කොට පවත්වා ගෙන ගොස් ඇති අතර ප්‍රධානත්වය ලබා දී ඇත්තේ භික්ෂුව වෙත ය. ක්‍රි. ව. 2 වන ශතවර්ෂයට අයත් කිරිවෙහෙර පුවරු ලිපියෙහි සඳහන්, "බිකුජරන සමතවය" යන පාඨයට අනුව ආරාම පාලනය සඳහා භික්ෂු ක්‍රියාකාරිත්වයක් පැවති බව පෙනේ. මෙය ආරාම පාලනය තුළ තිබුණු සිරිතක් වන අතර කතිකාවත් මගින් ආරාම කළමනාකරණය කිරීමේ දී එය තවදුරටත් පවත්වාගෙන යන ලදි.

ධාතු ගෘහයෙහි සංවිධාන ව්‍යූහය සකස් වනුයේ, එහි භාරකරු (දාගේ අත්සමක්), කරඬු පිළිබඳ (ලේකම් කරඬලෙයක්), ලේකම්, ආරක්ෂකයින් තිදෙනෙක් (වර්ජෙටු 3),චිත්‍ර ශිල්පියෙක්, ධාතු ගෘහය රකින දිසාපති (දාගේරක්නා රටිලදුව), (රටේ මහත්තයා) මල්කරුවන් දෙදෙනෙක්(2), මාසයකට එකසිය විස්ස (120) බැගින් සපයනු ලබන මාතෙල් මල වවන්නෙක් (මහතෙල් ගොවුවක්), දුම් කබල් සපයන්නෙකු හා පහන් තෙල් සපයන්නෙකු වශයෙනි.[58]



ධාතු ගෘහයෙහි සංවිධාන සැලැස්ම




ධාතු ගෘහයෙහි චිත්‍ර ශිල්පීන් සංවිධාන ව්‍යූහයකට අනුව ද සකස් කර තිබිණි.[59] විහාර අංග කළමනාකරණය තුළ චිත්‍ර ශිල්පීන් ද (ඇළි නාවන්)* අනිවාර්යයෙන් ම සිටිය යුතු ය. ප්‍රධාන චිත්‍ර ශිල්පියෙකු හා තවත් චිත්‍ර ශිල්පීන් එකොළොස් දෙනෙකුගේ සේවය සංවිධානගත කොට තිබීම මෙහි දී වැදගත් වේ. එහෙත් මෙම ඇළිනාවන් පිළිබඳව විවිධ මත පවතී. "ඇළි"ශබ්දය පරණවිතාන අර්ථකථනය කරනුයේ කාර්මික වෘත්තියක් ලෙස ය.[60] නිශ්චිතව හඳුනාගෙන නැති වුව ද ජලය හා සම්බන්ධයක් පවතින තනතුරක් ලෙස සැලකිය හැකි ය. විහාරස්ථානයන්ට ජලය සැපයීම භාරදූර ක්‍රියාවකි. එසේ ම එය ආහාරය මෙන් ම ඉතා අවශ්‍ය දෙයකි. ජලසම්පාදනයෙහි නියුක්ත ඇළියෝ නමින් හැඳින්වූවන්ගේ නායකයා ඇළිනාවා නම් වේ.[61] චේතියගිරි විහාරයේ ඇළිනා හෙවත් ජලසම්පාදන කටයුතු භාරව ප්‍රධානියෙකුත් හා එයට සහායවීම සඳහා එකොළොස් දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබිණි.

වඩු කර්මාන්තයෙහි නියැළී සිටි නිලධාරීන් හා සේවකයන් ද විධිමත් සැලැස්මකට අනුකූලව සකස් කොට

### වඩු කර්මාන්තයෙහි සංවිධාන සැලැස්ම




මෙහි ප්‍රධාන වගකීම භාර වූයේ ප්‍රධාන ශිල්පචාරී වෙත ය. ඔහුගෙන් පසුව දෙටු ශිල්පීන් දෙදෙනාගෙන් ලැබෙන උපදෙස් හා අවවාද යටතේ, ලී වඩුවන් හා කැටයම් වඩුවන් සේවය කළ යුතු ය. ආරාම සංවිධානකරණය තුළ විශේෂයෙන් ම විහාරවල පැවැත්ම සඳහා ගිහි කාර්මිකයන් යොදවා ගනු ලැබූ අතර, ඔවුන් දක්ෂ ගල්වඩුවන් හා ලී වඩුවන් විය යුතු වේ.[62]

චේතියගිරි විහාරයට අයත් මහා සෑය හා අම්බස්ථල චෛත්‍ය ආරක්ෂා කිරීමට ආරක්ෂකයන් තිදෙනෙකු හා දාගැබ නිතිපතා අතුගා පිරිසිදු කිරීමට එක් පුද්ගලයෙකුත් යොදවා ඇත.[63] මෙමගින් විහාරයක ප්‍රධාන අංගයක් වන චෛත්‍යයන් ද පාලනය කිරීමට සේවකයන් යොදවාගෙන ඒ සඳහා ඔවුන්ට දීමනා ආදිය ගෙවා ඇත.

ආරාම සංවිධානකරණය තුළ "බත් ගෙයි" කටයුතු ද විධිමත් ලෙස සංවිධානගත කොට තිබෙන්නේ,[64] බත් ගෙයි සේවය කරන්නන් එක් අයෙකු ද, බත් උයන සේවකයන් දොළොස් දෙනෙකු ද, දර ගෙනැවුත් බත් පිසින අයෙක් හා බත් පිසීම සිදු නොකොට දර පමණක් ගෙනෙන සේවකයෙකු ද වශයෙනි. මනෝරථ පූරණියෙහි "දානග්ග පරිවහණයා" ලෙසත් දක්වා



තිබේ.[65] ඔහු දාන ශාලාවෙහි ප්‍රධාන පරිපාලන තනතුර දරන්නා විය හැකි ය. ආරාමයෙහි වැඩ සිටින භික්ෂූන් වහන්සේලාට මෙන් ම ඇතැම් විට ආරාමවල සේවය කරන ගිහියන් සඳහා ද කෑම ලබාදීම සිදු කරන්නට ඇත්තේ මෙම සේවකයන් මගින් විය යුතු වේ. මේ අනුව, වැඩ බෙදීම (Division of Work) ක්‍රමානුකූලව සිදු වී ඇති බව වැටහේ.

පිළිමගෙය පවත්වාගෙන යාමේ දී පිළිමගෙයි කටයුතු කරන ප්‍රධානියෙකු ද සේවකයන් එකොළොස් දෙනෙක් ද, පත් කොට ඇති අතර මහ බුදු මැදු රට මල් සපයන්නෙකුත්, දුම් - මල් සපයන්නන් හය දෙනෙකුත් හා මංගල හා ශෛල ප්‍රතිමා ගෘහයට පැන් කෙණ්ඩි සපයන්නෙකුත් පත් කොට තිබේ.[66] මෙහි ප්‍රධානියා වශයෙන් කටයුතු කරමින් පෙර සිරිත් පරිදි පවත්වාගෙන යාමට භාර වූයේ එහි ප්‍රධානියාට ය. බුදු මැදුරෙහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සේවකයන් පත් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

### පිළිමගෙයි සංවිධාන සැලැස්ම




විහාර අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා පත් කළ කාර්මිකයන් සඳහා නායකයෙකු පත් කොට තිබෙන අතර, ලේඛකයෙකු ද ඔහුගේ ලිපිකරු කටයුතුවලට සහායදීමට පත් කොට ඇත.[67]

ක්‍රි. ව. 10 වන සියවසේ පමණ විහාර අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ කටයුතුවලට අවශ්‍ය සියලුම දෑ සපයා ගැනීමත්, ඒවා සකස් කිරීමත් සිදුවූයේ විහාරස්ථානය කේන්ද්‍ර කොට ගෙන ය. ඒ

Scanned with CamScanner

අනුව නව කර්මාන්ත සඳහා අවශ්‍ය වන ලෝහ කර්මාන්තයක් ද ආරාම තුළ පිහිටුවා තිබූ අතර, එහි කටයුතු සිද්ධකිරීමට අවශ්‍ය වන්නා වූ ශ්‍රමිකයන් ද යොදවා ගෙන තිබේ.[68] මණිකාර වෘත්තිය සඳහා මහාචාර්යවරුන් දෙදෙනෙකුත්, ලෝහකරුවන් දෙදෙනෙකුගේත් සේවය ලබාගෙන තිබෙන අතර හුණු පුළුස්සන්නෙක් ද උපයෝගී කොට ගෙන ඇත.

"මඩොවුවා" නමින් තවත් තනතුරක් දක්නට ලැබේ. මිහින්තලා විහාරයේ තිබුණු මණ්ඩප පාලනය කළේ මඩොවුවාය. "මඩව" යන්න මෙහි පූර්ව රූපයයි. එය බදුලු ලිපියේ ද දක්නට ලැබේ.[69] ලීලාවතී බිසවගේ සෙල් ලිපියක මඩව රූපය තිබුණ ද "මසිය" යනුවෙන් පරිවර්තනය විය.[70]

"සලාජෙටු" යන නාමය ද හතර වැනි මිහිඳුගේ සෙල් පුවරු ලිපියේ දෙවැනි පුවරුවේ දක්නට ඇත.[71] "සලා ජෙටක්" යනුවෙන් එය දක්වයි. කුඩා සේවකයා හෙවත් දාසයා "සලා" නමින් ද, ඔවුන්ගේ ප්‍රධානියා "සලා ජෙටුවෝ" නමින් ද ව්‍යවහාර විය. පිසන සලයින්, ගත්තර සලයින්, වේලාසලයින් ආදී වශයෙන් නොයෙක් ප්‍රභේද තිබේ. කෙසේ නමුත් චේතියගිරි සේවය සඳහා දාසයන්ගේ ප්‍රධානියෙකු ද, කුලියට ගත් දාසියන් විසිහතර දෙනෙක් (24) හා ඔවුන්ට ඔවුන්ට විධානය දීම සඳහා විධාන තැනැත්තියක් ද යොදවන ලදි. මොවුන් විහාරය හා සම්බන්ධ වූ දාස මෙහෙය ආදී කටයුතු කරන්නට ඇති බව සිතීමට ඉඩ තිබෙන අතරම සේවයට පුරුෂ පක්ෂය පමණක් නොව ස්ත්‍රීන් ද සුදුසු පරිදි යොදවා තිබේ.

මෙම තනතුරුවලට අමතරව විහාර සරසන්නෙකු ද (මහල් ජෙට) උත්සව සංවිධානය කිරීම සඳහා පුද්ගලයෙකුත් පහන් වැටි සපයන්නෙකු, මැටි පාත්‍ර සාදන්නෙකු, පර්වතය පරිපාලනය කරන්නෙකු, භාණ්ඩාගාර ආරක්ෂකයෙකු, රෙදි සපයන්නෙකු දාසියන් විසි හතරදෙනෙකු, මැටි කළ සකස් කිරීමට කුඹල්කරුවන් පස්දෙනෙකු, එක් මාසයකට පාත්‍ර දහයක් සැපයීමට පාත්‍රකරුවෙකු, මාසයකට පෙරහන් කඩක් සපයන්නෙකු, වෛද්‍යවරයෙකු, නැකැත්කරුවෙකු, කරණවෑමියෙකු හා කරත්තකරුවන් සේවයෙහි යොදවා ගෙන ඇත.



ආරාම කටයුතු සංවිධානය කිරීමේ දී ප්‍රධාන කම්කරුවෙකුත් ඊට දෙවැනි වූ කම්කරුවෙකුත් සේවයෙහි යොදවා ඇත.[72] ඔහු කම්දෙටු නමින් හැඳින්විණි. විහාර සන්තක ඉඩම්වල ගොවිතැන් වගා කටයුතු සිදු කරනු ලැබුවේ "වෙහෙර් දසුන්" හා "වෙහෙර් කැමියන්" විසිනි. විහාරයන් සතු ඉඩම්වලින් ආරාමයට ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට ඒවා සංවිධානගත කොට තිබෙන බවත්, මෙයින් නිරූපණය වෙයි.

ආරාමයෙහි නිලධාරීන් හා සේවකයන් අතරට වෛද්‍යවරයෙකු සහ කුඩැල්ලන් සඳහා වෛද්‍යවරයෙකු යොදවා තිබේ.[73] ආරාමවාසී භික්ෂූන් වහන්සේලා මෙන් ම සේවකයන්ගේ රෝගී තත්ත්වයන්ට ප්‍රතිකාර කරදීමේ අරමුණින් යොදවන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

ආරාම නිලධාරීන් හා සේවකයන් සංවිධානගත කිරීමේ දී ඔවුන්ට ලබාදෙන ගම් රැකබලා ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදවා තිබෙන අතර එහි දී කැබලිගම ප්‍රධානියෙකු හා කැබලි ගම්වැසියන් දොළොස් දෙනෙකු පත් කොට තිබීම වැදගත් වේ.

සැලසුම්කරගත් පරිදි, භික්ෂූන් වහන්සේලාගේ අප්‍රතිපත්ති හා දුෂ්ප්‍රතිපත්ති ඉවත් කොට සුපේශල ශික්ෂාකාමී භික්ෂු පරපුරක් සකස් කළ මිහින්තලා සෙල් ලිපියෙන් ද විධිමත් සංවිධාන සැලැස්මක් සකස් කොට ඇති බව දැක්වේ.

## 5.4 ආරාම මෙහෙයවීම

### 5.4.1 වැටුප් ගෙවීම

ආරාමවල සේවය කරනු ලැබූ නිලධාරීන් හා සේවකයන් ඔවුන්ගේ සේවය ලබා දී ඇත්තේ කිසියම් වැටුපක් හෝ දීමනාවක් බලාපොරොත්තුවෙනි. ඒ අනුව ආරාමයන්හි සේවය කරනු ලබන නිලධාරීන්ට හා සේවකයන්ට ජීවත්වීම සඳහා ඉඩම්, ද්‍රව්‍ය හෝ ඒවා ලබා ගැනීමට හැකි වන ආකාරයට සාධාරණ ගෙවීමක් කිරීම, මුදල් ලබා දී මාණ්ඩලිකරණය මූලධර්මය වැදගත් පියවරකි. කළමනාකරණ

Scanned with CamScanner
CamScanner

ලක්ෂණයකි. එක් අංශයකින් එය සේවක අභිප්‍රේරණයක් ද වන්නේ ය. වැටුප් ලබා දීමේ දී තනතුරට අනුකූලව ලබා දී ඇති බව, මිහින්තලය,[74] අභයගිරි[75] සෙල් ලිපිවලින් පැහැදිලි වේ.

ආරාමාධිපති හෙවත් තකා බලන හිමි[76] ආරාමයේ ප්‍රධානියා ලෙස සැලකෙන අතර, එම සේවය වෙනුවෙන් දිනපතා සහල් නැළි එකක් ද වස්සාන බණේ දී රන්කහවණු එකහමාරක් ද පාවාරණ දිනයේ දී එම ප්‍රමාණය ම ලබා දීමට තීරණය වී තිබුණු අතර, එම තනතුර සඳහා මුදල් හා ද්‍රව්‍යමය දේ ලබා දී ඇත.

ආරාම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ කම්කරුවන්ගේ ප්‍රධානියා වූ නියම්ජෙටයට, ජීවිකා වෘත්තිය සඳහා (දිවෙල්) පස් කිරියක්[77] (ඉඩම්) ද, දිනපතා සහල්නැළි එකක් ද ලබා දී ඇත. මීට අමතරව අවුරුද්දකට පිසීමට ව්‍යඤ්ජන මිලට රන් කළං 15ක් ද ඔහුට ලබාදීමෙන් ඔහු කිසියම් ආකාරයක අභිප්‍රේරණයක් සිදු කොට ඔහුගේ සේවය මැනවින් ලබා ගැනීමට යොදවන ලද උපක්‍රමයක් ලෙස සැලකිය හැකි ය. චේතියගිරි විහාරයෙහි පාලන කටයුතු කරනු ලැබූ නිලධාරීන් වශයෙන් සැලකිය හැකි භාණ්ඩාගාරික, විහාර ලේඛක (වෙහෙර්ලෙයා) හා කරඬු සීල් තබන්නා හා (කරඬු අස්සමු) ඒවා පරීක්ෂා කරන්නාට ද ලබා දී ඇත්තේ පස් කිරිය හා පිසීමට ව්‍යඤ්ජන මිල වේ.එම ප්‍රමාණය කොපමණ ද යන්න කතිකාවතෙහි අන්තර්ගත නොවුවත්, කම්කරු ප්‍රධානියාට ලබා දුන් කළං පහළොවම ලබා දෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මෙම නිලධාරීන් තිදෙනාට එක හා සමාන ඉඩම් ප්‍රමාණයක් ලබා දීමෙන් එකම ශ්‍රේණියක තනතුරු ලෙස ද උපකල්පනය කිරීමට පුළුවන.

ආරාම පරිපාලනයෙහි උසස් තනතුරක් වන පිළිමගෙයි කටයුතු භාර ප්‍රධානියාට (පහවැසිජෙටක්) කිරිය භාගයක් සහල් එකඩමනා එක් පතක් ද, පිළිමගෙයි සේවකයන් එකොළොස් දෙනාට ද එක් අයෙකුට කිරිය භාගයක් හා සහල් එකඩමනාව බැගින් ද රාජකාරිය වෙනුවෙන් හිමි වූ අතර, කුම්භකාරයෙක් වෙනුවෙන් කිරි දෙකක් හා සහල් අඩමනා දෙකක් ද වෙන් කොට ඇත.[78] ක්‍රි. ව. 10 වන සියවසේ දී වැඩිපුර වැටුප් හෝ දීමනා වෙන් වූයේ තනතුරේ ස්වභාවය අනුව නොව රාජකාරියේ ස්වභාවය අනුව ය.

CamScanner



ආරාම පරිපාලනයේ දී මහාචාර්යවරුන් දෙදෙනෙකුගේ සේවය ලෝහ කර්මාන්තය සඳහා ලබා ගෙන ඇති අතර, එක් අයෙකුට කිරිය තුනක් ද ලෝහකරුවන් දෙදෙනාට කිරිය එක බැගින් ද ගෙවා තිබේ.[79]

ධාතු ගෘහයෙහි සේවය කරනු ලැබූ භාරකරුට, කරඬු පිළිබඳ ලේකම් හා විහාරයේ ආරක්ෂක වශයෙන් කටයුතු කළ කංකානම්ට ද දිවෙල් වශවෙන් ලැබුණේ කරන්දෑගම ය.[80] පහන් තෙල් සපයන්නාට දම්ය ගමින් කොටසක් ද දුම් කබල් සපයන්නෙකුට දම්ය ගමින් කොටස් හතරක් ද සුදු නෙළුම් ගෙනෙන මල්කරුවන්ට දම්ය ගමින් කිරිය දෙකක් දම්ය ගමින් කොටස් එකක් ද ප්‍රදානය කොට තිබේ.

ආරක්ෂක වෘත්තියෙහි යෙදී සිටින්නන්ට කිරි එකක් හා දෙපෑළක් ලබා දී ඇති නමුත් ඊට වඩා දීමනාවක් අභයගිරි විහාරයෙහි ආරක්ෂක නිලධාරියාට ගෙවනු ලැබිණි.[81] ආරාමයෙහි අභ්‍යන්තරය හා බාහිර ආරක්ෂා කර ගනු ලබන ආරාම පාලකයාට එක එක ගමින් කිරියක් හා කිරියක් වපසරිය ඇති නිරවුල් වූ කුඹුරක් ලබා දී තිබිණි.

ජේතවනාරාම විහාරයෙහි සේවය කරනු ලබන ගල්වඩුවන් හා ලී වඩුවන් සඳහා වැටුප් වශයෙන් ලැබී ඇත්තේ මුදල් නොව ඉඩකඩම් ය. ඒ අනුව, දිවෙල[82] පිණිස කිරි එකහමාරක වපසරියක් ලබා දිය යුතු යි. ගොඩ ගොවිතැන් කිරීම සඳහා හේනක් ද ලබාදීම අනිවාර්ය වී තිබුණි.[83] එක් කම්කරුවෙකුට දිවෙල් වශයෙන් දෙන ලද ප්‍රමාණය ම කම්දෙටුවන්ට ද ලබා දිය යුතු විය. විහාර සරසන්නෙක් සඳහා කිරිය භාගයක බිම් ප්‍රමාණය ද, සහල් එක් මනාවනක් ද උත්සව සංවිධායක තනතුරෙහි නියුක්ත තැනැත්තාට කිරි එකක් ද, දම්ය ගමෙන් කොටසක් ද, අවුරුද්දකට සුදුකිරීම් මල් සැපයීම්වලට රන් කළං තුනක් හා අක දෙකක් ද, පහන් වැටි සපයන්නා තනතුරට කිරිය එකක් ද හිමිව ඇත. චේතියගිරි පර්වතය පාලනය කරන තැනැත්තාට කිරිය භාගයක් හා දම්ය ගමින් කොටසක් ස්වකීය රාජකාරිය වෙනුවෙන් ලබා දී තිබේ.

CamScanner

ආරාමයෙහි චිත්‍ර කර්මාන්තයේ කටයුතු භාරව ක්‍රියා කළ පුද්ගලයාට කිරියෙන් භාගයක් සහ පොල් එකඩමනා පතක් ද එහි සේවය සඳහා යොදවන ලද චිත්‍ර ශිල්පීන් එකොළොස් දෙනෙකු සඳහා එක් අයෙකුට දෙඅඩ බැගින් ද දමිය ගමින් එක් කොටසක් බැගින් ද "වටිනා වැරියන්" ලෙස සැලකෙන කුලීකරුවන් හතරදෙනාට එක් අයෙකුට එකඩමනා බැගින් සහල් ද දිවෙල් බාගයක් ද ලබා දී ඇත.[84]

විහාර කාර්මිකයන් දීමනා වශයෙන් මිහින්තලා ලිපියෙහි වෙන් කොට ඇත්තේ කිරිය බාගය බැගින් ද සහල්එකඩමනාවක් හා එක් පතක් බැගිනි.[85] භාණ්ඩාගාරයේ ආරක්ෂක නායක හෙවත් "කොටරුකිනාවක්හට්ට" හිමි වී තිබුණේ බාගයක් සහල් එකඩමනාවක් හා එක් පතකි.

විහාරයෙහි බත් උයන සේවකයින්ට කලොල ගමින් කිරි භාගයක් ද, දර ගෙනැවුත් බත් පිසන අයෙකුට සහල් අඩමනා තුනක් ද, ඉවීම නො කොට දර පමණක් ගෙනෙන සේවකයන්ට සහල් අඩමනා දෙබැගින් ද ලබා දී තිබුණි.

"සලා" හෙවත් දාසයන්ගේ නායකයාට සහල් අඩමනා එකක් පත එකක් සහ දාසියන්ගේ විධාන දෙන තැනැත්තියට පාද[86] ද්වයක් ද, දාසියන් විසිහතර දෙනා(24) සඳහා එක් අයෙකුට එක් පාදයක් ද බැගින් ගෙවන ලදි. කරණවැමියාට හිමි ඇත්තේ කිරිය එකක් හා දමිය ගමින් කොටසක් පමණි. අභයගිරි විහාරයට අයත් කපාරා පිරිවෙනෙහි මෙහෙකරුවන්ට වැලිගමුවෙහි දෙ පැලක් ලබා දිය යුතු විණි.[87] හුණු පුලුස්සන ලද සේවකයාට ලබා දී ඇත්තේ දෙවාගම පමණි.[88]

අභයගිරි විහාරයෙහි සේවය කරන පස් කුලයකට අයිති පුද්ගලයන් විසින් තමතමන්ගේ වැඩ පරීක්ෂා කිරීම සිදු කර ගත යුතු අතර, ඒවායෙහි පාරිශුද්ධත්වය පිළිබඳව සොයා බලන්නට ඔවුන්ට ම බාර කර ඇත. එහෙත්, එම කටයුතු සියල්ල නිම කළ යුත්තේ මාස දෙකයි දින පහක් තුළ ය.[89] එසේ ක්‍රියා නො කරන සේවකයන්ට දොස් පැවරෙන අතරම එකී දොස් ඉවත් කර ගන්නා තුරු ම ඔහුට ගෙවිය යුතු වැටුප් ගෙවනු නො ලැබේ. මෙමගින්



නියමිත පරිදි රාජකාරි බෙදාදීමත්, ඒවා නිම කළ යුතු කාලයක් දක්වා තිබීමෙන් ආරාම සංවිධානය තුළ කළමනාකරණයක් තිබූ බව පැහැදිලි ය.

සේවය වෙනුවෙනුත් සේවකයන් දිරිමත් කිරීමක් වශයෙනුත් ඉඩම් ලබාදීම දක්නට ලැබෙන තවත් වැදගත් ලක්ෂණයකි. ආරාම පාලනයෙහි වැදගත් ම ලක්ෂණය වනුයේ, නිලධාරීන්ට හා සේ-වකයන්ට ලබා දුන් එම කැබලි ගම බලා ගැනීම සඳහා පත් කළ ප්‍රධානියාට එක් කිරියක් ද සහල් එකඩමනා එක්පතක් ද කැබලි ගම්වැසියන් දොළොස් දෙනාගෙන් (12) එක් අයෙකුට එක් අඩමනාව බැගින් ද, සහල් ද දිවෙල් වශයෙන් කිරියෙන් භාගයක් ද ලබා දීම යි. මෙයින් එම ඉඩම් හා නිලධාරීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට උත්සුක වී ඇති බව නිගමනය කළ හැකි ය.

## 5.5 ආරාම පාලනය

ආරාම සේවකයන් පාලනය කිරීමේ දී නීතිය හා දඬුවම් භාවිත කොට තිබේ. කර්මාන්ත සීමා කිරීම සඳහා නියමිත කාලයක් ලබා දීමට[90] අභයගිරිය විහාරය කළමනාකරණය කිරීමේ දී තීරණය කොට තිබෙන අතර, ඒ අනුව ඒ ඒ සේවකයන්ට පැවරුණු කාර්යයන් නිම කිරීම සඳහා මාස දෙකයි දින පහක් පමණක් ලබා දී ඇත. නියමිත කාලය තුළ ඉටු කළ නො හැකි නම් ඔහුට හෝ ඔවුන්ට නියමිත වැටුප් ගෙවීම නතර කරනු ලබනවා පමණක් නොව ලබා දී ඇති ඉඩම් ද අහිමි වේ. අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමේ දී නිශ්චිත කාලයක් නියම කිරීම වැදගත් ය. එමෙන් ම එහි පාලනයක් ද තිබී ඇත.

සැලසුම් කොට ගත් පරිදි විහාරස්ථානයට ලැබෙන ආදායම් මාර්ග මොනවාද යන්නත් ඒවා විධිමත් ලෙස පාලනය කිරීමටත් නීති මිහින්තලා ලිපියෙහි වාර්තා වෙයි. ධාතු ගෘහයට වෙන් කරන ලද ගුතැ හා කරන්ද යන ගම් දෙකෙහි වාසය කරන දුම් හා මල් සපයන්නන්ගේ නිවාස දඩය කුඩා දඩයක් බවට පත් කොට අය කර ගැනීමටත්, පෙරළිකාරයින්ගේ කුලිය විහාරස්ථානයට ගත

යුතු බවත්, ගිරිභණ්ඩ පර්වතයෙහි ලොකු කුඩා ගස්වලින් තුනෙන් එකක්ද, සංවැල්ලෙහි ගෙවල් කුලී ද පොකුණ හාත්පස භූමිය ද පොරදෙනිය පිහිටි මනුවැසර වැව ද, දිය බෙදුම[91] ද, ලිහිණිය පර්වතයෙහි උඩ සහ යට වැව් දෙක[92] ද ලාභය පිණිස විහාරයට ගෙන ලාභය ලේඛනගත කොට පාලනය කළ යුතු බවත් මිහින්තලා ලිපියෙහි සඳහන් වේ.[93] එපමණක් නොව විහාර දාසයන්ගෙන් හා විහාර කාර්මිකයන් හැර විහාර භූමියෙහි පිටත ගම් වැසියන්ගෙන් බිම් බද්දක් අය කර ගත යුතු බවත්, එම බද්ද විහාර ආදායමට එකතු කළයුතු බවටත් නීතියක් පනවා ගෙන තිබිණි.

කර්මාන්තවල කටයුතු මැනවින් සිදු කරවීම පිණිස දැඩි අවධානයක් යොමු කොට ඒ සඳහා වන නීති ද දක්වා තිබේ. කර්මාන්ත සඳහා වෙන් කෙරුණු ගම්වල ආදායම කර්මාන්ත සඳහා ම යෙදවිය යුතු අතර, භික්ෂූන්ගේ ප්‍රත්‍ය පහසුකම් ලබා ගැනීමට එම මුදල් යොදවන්නේ නම් එබඳු භික්ෂූන් වහන්සේලා ආරාමයෙන් පිටමං කළ යුතු බවත්, සඳහන් වෙයි.

ක්‍රි. ව. 10 වන සියවස වන විට පාරවල් සඳහා ද බදු අය කරගෙන තිබූ බවත්,[94] එම බදු මුදලත්, කුලී බද්දත්, දිය බෙදුම් බද්දත් අය කර ගත යුත්තේ මෙම විහාරස්ථානයට ය. ආරාම පාලනය කිරීමේ දී නිලධාරීන්ට අයත් ගම්බිම් කවර ආකාරයකින්වත් උකස් වශයෙන් නො තැබිය යුතු අතර, යම් හෙයකින් එලෙස ගනු ලැබුවහොත් ඔහුගේ මුදල් තහනම් කොට විහාරයට ම ගත යුතු ය. එබඳු පුද්ගලයන් රටින් පිටුවහල් කළ යුතු බව වැඩිදුරටත් V වන කාශ්‍යප රජුගේ කතිකාවත සඳහන් කරයි.

ධාතු ගෘහය භාරව ක්‍රියා කරන ලද නිලධාරීන් පාලනය කිරීමට ද නීති සම්පාදනය කොට තිබෙන[95] අතර, ඔවුන් එහි කිසිවක් තාවකාලික ව ණයට දීම හෝ නො ගත යුතු ය. කණ්ඨක චෛත්‍යයෙහි නව කර්මාන්ත පිණිස ලබා දුන් "දම් ගමුවෙන්" දුන් ගම් රැක බලාගෙන දාගැබෙහි කර්මාන්ත කිරීම අනිවාර්ය වූවකි.

නිවාඩු ලබා ගැනීම හා නිවාඩු ලබා දීම සේවකයාගේ යුතුකමක් වුව ද, මිහින්තලා ලිපියට අනුව,[96] තුන් දිනකට ලැබෙන නිවාඩු හැර බොහෝ නිවාඩු ලබා ගැනීම සිදු නො කළ යුතු ය.



විශේෂයෙන් ම මංගල නිවාඩු ලබා ගැනීමට අවසර නො දෙන බව සෙල් ලිපිය වැඩිදුරටත් දක්වයි. අවශ්‍ය ප්‍රමාණයට නිවාඩු ලබා ගැනීමට මෙයින් අවස්ථාව තිබෙන අතර ම සෑම සේවකයෙකුට ම දින තුනක නිවාඩුවක් ලබා දී ඇති බව ද ගම්‍ය වෙයි. එහෙත් කොපමණ කාලයක් සේවය කිරීම නිසා මෙම නිවාඩුව ලබා දෙන්නේ ද යන්න නිශ්චිත තොරතුරු සොයා ගැනීම අපහසු ය.

ආරාම පාලනයෙහි වැදගත් ම අංගය වනුයේ, අයවැය ලේඛනය යි. ආරාමයන්ට ලැබෙන ආදායම විධිමත් ලෙස සටහන් කිරීම හා ඒ සම්බන්ධ අයවැය ලේඛන කම්කරුවන්, ගණකයන් හා සෙසු අය සමග පිළියෙල කරවා භික්ෂූන් ලවා අනුමත කරවා ගත යුතු බව, අභයගිරි සංස්කෘත ලිපියෙහි දැක් වේ.[97] මෙම ලේඛනය ''පඤ්ජිකා'' ලෙස නම් කොට ඇත. වුරුද්ද අවසානයේ සෑගිරිය හා චේතියගිරි විහාරයේ අයවැය ලේඛනය භික්ෂූන්ට ඉදිරිපත් කළ යුතු ය.[98] අනුරාධපුර V වන කාශ්‍යප රජුගේ පුවරු ලිපියට අනුව, අයවැය ලේඛනය සකස් කොට ඇත්තේ අභගිරිය විහාරයේ පිළිමගෙයත්, දාගැබත්, මහාබෝධි ගෘහයත්, භෝජන ශාලාවත් ඒවායේ වියදම් පිළිබඳ වාර්තාවත් භික්ෂූන් වහන්සේලාට ඉදිරිපත් කළ යුතු බව යි.[99]

මිහින්තලයේ පුවරු ලිපියට අනුව, විහාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා පොත තුළට ඉඩම්වලින් ලැබෙන ආදායමත් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කරන වියදම් ද දෛනිකව සටහන් කළ යුත්තේ මාසික වාර්තාවක් සකස් කිරීමට ය. එම වාර්තා උපයෝගී කොට ගෙන වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කරනු ලැබේ. මෙම ගිණුම් වාර්තාව පිළියෙල කිරීම ආරාමාධිපතීන් වහන්සේ, (නකා බලන හිමියන්) විහාර ආරක්ෂකයා ද, කෘත්‍ය සංවිධායකයා ද, භාණ්ඩාගාරිකයා ද, විහාරයෙහි කටයුතු පරීක්ෂා කරන්නා ද, විහාර ලේඛකයා ද, පෙට්ටි භාරකාරයා ඇතුළත් වන ගිහි නිලධාරීන් හා සේවකයන් සමග අභ්‍යන්තර හා බාහිර අයවැය ලේඛනය සකස් කරනු ලබයි. දෛනික අයවැය ලේඛනය ඉදිරිපත් කරනු ලබන්නේ විහාරස්ථ පාලක සභාව විසිනි. එහි අඩංගු කළ යුත්තේ විහාරාරාම ප්‍රතිසංස්කරණ කටයුතු ය. වාර්ෂික අයවැය වාර්තාව වප් මාසයේ අව අටවක දිනට ප්‍රථම දේපළ පරිහරණය

Scanned with CamScanner

කළ ස්වාධීන භික්ෂූන් වහන්සේට ඉදිරිපත් කළ යුතු බව, කළුදිය පොකුණ සෙල් ලිපියෙහි සඳහන් වෙයි.[100]

දෛනික ලේඛනයට විධිමත් පරිදි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පෙට්ටියක බහා පාලක සභාවට පෙන්වා මුද්‍රා සලකුණු කොට ධාතුඝරය තුළ තැන්පත් කළ යුතු ය. මූල්‍ය කටයුතු දෛනිකව සටහන් කිරීම තුළින් පැහැදිලි වනුයේ, විහාරාරාම ප්‍රතිසංස්කරණ කටයුතු අධීක්ෂණය සඳහා නිලධාරි මඬුල්ලක් යොදවා තිබූ බවයි. පාලක සභාව දෛනිකව රැස්වී මේ පිළිබඳව සාකච්ඡා කොට වාර්තා සකස් කොට තිබේ. "කම්කැන්" නමින් හැඳින්වූ[101] පාලක සභාවක් විසින් තම ප්‍රධාන විහාරයේ හා අනුබද්ධ අනෙකුත් විහාරාරාමයන්ගේ ආදායම - වියදම පරීක්ෂා කොට ඇත.

මෙමගින් දූෂණ අක්‍රමිකතාවලින් තොරව ආරාමයන්ගේ ආදායම - වියදම සටහන් කිරීම හා ඉදිරිපත් කිරීම තුළින් දියුණු කළමනාකරණයක ලක්ෂණ විද්‍යමාන වන බව පැහැදිලි වේ.

අධික මාර්ගෝපකරණලාභියා සහල් ආදිය නියමිත ප්‍රමාණයට වඩා වැඩි නො කර ගත යුතු ය.[102] පවරන ලද කාර්යයන් නියමිත දිනට අවසන් නො කරන කම්කරුවන්ට, දෙවෙනි කම්කරුවන්ට ද දොස් පැවරිය යුතු අතර, එම දොස් ඉවත් නො කරගන්නා සේවකයන්ට වැටුප් ගෙවීම නතර කළ යුතු[103] අතර ම ලබා දී තිබෙන ඉඩම් අහිමි කරනු ලැබේ.

එමගින් කණ්ඨක සෑයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන අවස්ථාවේ දී කැමියන්ට ලබා දී ඇති ඉඩම් ද බලාගෙන සිදු කළ යුතු බව සඳහන් වෙයි. කැමියන්ගේ කටයුතු සැලසුම් කිරීමේ දී විහාරයේ මෙහෙයට ලබා දී ඇති මිනිසුන්ගෙන් වැඩ නොගත යුතු යැයි නීතියක් ද පනවා තිබුණි.

ක්‍රි. ව. 8 වන සියවසේ සිට 15 වන සියවස දක්වා කාලය තුළ ආරාමවලට විශාල ඉඩම් ප්‍රමාණයක් ඒකරාශි වී තිබුණි. එම ඉඩම් අතර අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විට රජය විසින් අත්තානි පරිහාර[104] වශයෙන් සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් ද විහාරාරාමවලට පරිත්‍යාග කොට තිබේ. මෙලෙස ලැබුණු



ඉඩම්වලට විශේෂිත කරුණක් වනුයේ රජයේ නිලධාරීන්ගේ මැදිහත්වීම්වලින් ඒවා යම්තාක් දුරට නිදහස් කර තිබීමයි. විහාර ගම්බිම් ප්‍රදේශවල පරිපාලනයේ දී ඒ භූමි තුළ යුක්තිය හා සාමය රැකීමට විහාර පරිපාලනයට යටත් අධිකරණ ක්‍රමයක් ක්‍රියාත්මකවී තිබිණි. විහාර සතු ඉඩම් පාරම්පරිකව උරුම වීමේ එකඟත්වය මත වගා කිරීමේ දී ඒවා උරුම කර ගැනීමට කිසිවෙක් නොමැති අවස්ථාවක දී මිස විහාර මගින් ඉල්ලා නො ගත යුතු බව මිහින්තලා ලිපියෙහි දැක්වේ.[105] එනමුත් රාජකාරි කටයුතු මැනවින් ඉටු කරන සේවකයන්ගේ ඉඩම් විහාරයේ ප්‍රයෝජනය සඳහා ලබා ගත හැකි බව එම ලිපිය වැඩිදුරටත් සඳහන් කරයි. මෙමගින් විහාරය සතුව අධිකාරි බලයක් පැවති බව නිගමනය කළ හැකි ය.

භික්ෂූන් වහන්සේලාගේ වරප්‍රසාද පමණක් ම නොව සාමාන්‍ය නිවැසියන්ගේ අයිතිවාසිකම් ද සහතික කිරීමට රජවරුන් උත්සුක වී ඇත. විහාර නිලධාරීන්ගේ කරදර හිරිහැර මධ්‍යයේ අයුතු ලෙස දඩ අය කිරීම් නතර කොට පාලනය කළ යුතු බව, කළුදිය පොකුණ සෙල්ලිපියත්, IV වන මිහිඳු රජුගේ මිහින්තලා ලිපියත් සාක්ෂි දරයි.[106] එහෙත් දඩ මුදල් අය කිරීමේ දී තත්කාලීන සමාජයෙහි ක්‍රියාත්මක වූ දඩ ප්‍රමාණය ම විහාර නිලධාරීන් අය කර ගත යුතු බව දැක්වුව ද ඇතැම් අවස්ථාවලදී ඊට වඩා වෙනස් වූ නීතියක් ද ක්‍රියාත්මක වූ බව, විශේෂයෙන් සේවකයන් ලවා කාරමකයන් විසින් තමන්ට මෙහෙවර නො ගතයුතු බවත් වෙනත් ස්ථානයක සේවයෙහි නොයෙදිය යුතු බවත් මිහින්තලා ලිපියෙහි[107] දක්වා ඇත.

විහාර පාලනයෙහි නීති ක්‍රියාත්මක කිරීම හා දඬුවම් ලබාදීම සඳහා පත් කරන ලද නිලධාරීන්ට බලපෑන්නා වූ ව්‍යවස්ථාවන් ඇතුළත් කිරීම, වඩාත් සංවිධිත පාලනයක් ගෙනයාම සඳහා ආරාම කළමනාකරණය කර ඇති බවට සාධකයකි. ඇතැම් රාජ්‍ය නිලධාරීන් විහාරාරාමවල සේවකයන් ගෙන්වා නොමිලයේ තමන්ගේ ඉඩම්වල වගා කටයුතු සිදු කර ගැනීමත් රාජ්‍ය බලය යොදා විහාර සතු ඉඩම් මිලයට හා උකසට ගැනීමත් සිදු කළ බව කළුදිය පොකුණ ලිපිය වාර්තා කරයි.[108] මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට ද ගෙවීම් වශයෙන් ගම් දෙකක්

ලබා දීමට ක්‍රියා කළහ.[109] තමන්ට අයත් නො වන ගම්වලින් ගවයන්, මී හරකුන් හා දාසයන් අල්ලා නොගත යුතු බවත්, උගසට හෝ අඳ ක්‍රමයට විහාර සතු ඉඩකඩම් වගා කිරීම හෝ මිලයට ගැනීම තහනම් විය.[110]

විහාර නිලධාරීන් වශයෙන් ක්‍රියා කිරීමේ දී ගමෙන් පිටත මිනීමැරුමක් සිදු කළ පුද්ගලයෙකුට ගම තුළට ඇතුළු වීමට ඉඩප්‍රස්තා නො තැබිය යුතු යැයි දැක්වෙන අතර ම ගමෙහි එවැනි වරදකට හසු වූ පුද්ගයෙකු සිටී නම් ඔහුගෙන් දඩ ගෙන ගමෙන් ඉවත් කළ යුතු විය. මෙම නිලධාරීන්ට මිනීමැරුම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමත්, දඬුවම් ලබා දීමත්, පැවරුණු කාර්යභාරයකි. මිනීමැරුම් වැනි බරපතළ වැරදි මෙන් ම විහාර සන්තක ඉඩම්වල සිදුවන සුළු වැරදි පිළිබඳව ද සොයා බැලීමට හා ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් ක්‍රියා කිරීමට නීතිරීති සකස් කර ක්‍රියාත්මක කිරීමේ එක් අරමුණක් වන්නට ඇත්තේ ඉතාමත් ම සාමකාමී ආරාම පරිසරයක් නිර්මාණය කොට පවත්වාගෙන යාම විය හැකි ය. කළමනාකරණ ක්‍රියාවලියට අනුව, ආරාමයන්හි සේවය කරනු ලබන නිලධාරීන් හා සේවකයන්, ආරාම කටයුතු මැනවින් සිදු කිරීම සඳහා විධිමත් සැලැස්මකට අනුකූලව සංවිධාන ගතකර ප්‍රජාතන්ත්‍රවාදී ව පාලනය සිදු කොට ඇති බව මින් පැහැදිලි වේ.



## ආන්තික සටහන්

1 ධම්මිසුද්ධි හිමි, යටදොළවත්තේ, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, පාලි බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, 1995, 101 පි.

2 මහාවංශය, 15, 183 -184 ජේළි, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959

3 Ceylon Antiquary and Literary Register, Vol.111, 1918, 205 P.

4 මහාවංශය, 95, 23., පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959

5 මහාවංශය, 127, 21., පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959

6 IC, Vol.1, S.Paranavithana, Department of Archaeology, Colombo. 1970, 63-85

7 පූජාවලිය, සංස්කරණය වලානේ ධම්මානන්ද ස්ථවිර, කොළඹ, 1926, 27 පි.

8 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 265 P.

9 IC, Vol.1, S.Paranavithana, Department of Archaeology, Ceylon. pp i, vii

10 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 100 P.

11 E. Z. Vol. iv, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 59 P.

12 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 208 P.

13 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 153 P.

14 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 172 P.

15 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 42 P.

16 - DO - 43 P.

CamScanner

17 රොබට් නොක්ස්, එදා හෙළදිව, පරිවර්තනය, ඩේවිඩ් කරුණාරත්න, ගුණසේන සහ සමාගම, 1959, 234 පි.

18 ගුණවර්ධන රණවීර, සිවුර සහ නගුල, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ, 1993, 56 පි.

19 ගුණවර්ධන රණවීර, සිවුර සහ නගුල, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ, 1993, 33 - 34 පි.

20 E. Z. Vol. iv, S. Paranavithana, Oxford University Press, London, 1943, 59 P.

21 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 100 P.

22 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 202 P.

23 E. Z. Vol. 11, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1928, 46 P.

24 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 202 P.

25 පුරවීර, ඒ. වී., සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1985, 3 පි.

26 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 41 P.

27 උපග්‍රන්ථ 220 - 223, පි.

28 ගුණවර්ධන රණවීර, සිවුර සහ නගුල, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ 10, 1993, 96 පි.

29 උපග්‍රන්ථ 251 පිටුව බලන්න.

30 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 2, 19 P.

31 ගමගේ, ධම්මිකා., සෙල්ලිපි තුළින් හෙළිවන අයිතිවාසිකම් , ප්‍රසිද්ධ නොකරන ලද දර්ශනපති නිබන්ධය, රුහුණු විශ්වවිද්‍යාලය, 2003.

32 උපග්‍රන්ථ 127 පිටුව බලන්න.

33 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 2, 19 P.



34 උපග්‍රන්ථ 227 පිටු බලන්න.

35 සමන්තපාසාදිකාව, හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 689 පි.

36 Culavamsa, Part 1, Translated by Wilhelm Geiger, Published by the Ceylon Information Department, 1953, 36,173 P.

37 සමන්තපාසාදිකාව, VI, හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1947, 1238 පි.

38 සමන්තපාසාදිකාව, 111 කාණ්ඩය, හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1930, 679 පි.

39 Culavamsa, Part 1, Translated by Wilhelm Geiger, Published by the Ceylon Information Department, 1953, 36,173 P.

40 සමන්තපාසාදිකාව, 111, 1930, 683 පි. කප්පියකාර සහ ආරාමිකයන් වචන දෙකෙහි ම එකම තේරුමක් ඇත. (Culavamsa, Translated by W. Geiger, German in to English by C. M. Rickmers, Colombo, 1953, 16 P.) විහාරස්ථානවල සේවය කරන සායම් කරන දාසයන්, රෙදි වියන දාසයන් ද ආරාමිකයන් ලෙස පිළිගැනෙන අතර, (සමන්තපාසාදිකාව, 111, 1930, 683 පි.) විහාරවල සුළු සේවකයන් මෙන් ම යම්කිසි රාජකාරියන් භාර නැනැත්තන් ද ආරාමිකයන් ලෙස සලකා තිබේ. (සහස්සවත්ථුප්පකරණය, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, 1959, 63 පි.) ආරාමයන් හි ආහාර ද්‍රව්‍ය පිළිබඳ වගකීම ඇති පුද්ගලයන් ද (සිහළවත්ථුපකරණය, සංස්කරණය පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, 1959, 63 පි.) ගොවියන් ද (සාරත්ථදීපනිය, සංස්කරණය බිහල්පොල දේවරක්ඛිත හිමි, කොළඹ, 1914, 562 පි.)

41 සී. හ. ල., සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, 1959, 63 පි.

42 Culavamsa, Part 1, Translated by Wilhelm Geiger, Published by the Ceylon Information Department, 1953, 46, 20 P.

43 - Do -, 52, 16 P.

44 උපග්‍රන්ථ 218 පිටුව බලන්න.

45 කළඳ යනු බුහුබසය, කළඳ මාසක විස්සකි. මස්සක සාමාන්‍ය බර ග්‍රෙන්ස් 3.62ක් ලෙස සැලකේ. ඒ අනුව, කළඳක බර ග්‍රෙන්ස් 72.4ක් වේ. සිංහල නිඝණ්ඩුවල දැක්වෙන්නේ කළඳක් මදට විස්සක් බවයි. මදටක් ග්‍රෙන්ස් 4ක් වන හෙයින් කළඳට ග්‍රෙන්ස් 80ක් වෙයි.ක්ල්පේමතය වනුයේ අවුන්සයකින් 1/12ක භාගයක් ග්‍රෙන්ස් 40ක් පමණ වන බවයි. (E. Z. Vol. i, 6 P.)

CamScanner
CS CamScanner

46 "අක" යනු මාසක දෙකහමාරක බරකි. (අභිධානප්පදීපිකාව 479 පි.)" අක" එකක් යනු වී ඇට විස්සකි. (ආරියපාල, එම්. බී., මධ්‍යකාලීන ලංකා සමාජය, රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව, කොළඹ, 1962, 126 පි.)

47 උපග්‍රන්ථ 208 - 211 පිටු බලන්න.

48 උපග්‍රන්ථ 241 - 242 පිටු බලන්න.

49 උපග්‍රන්ථ 144 පිටුව බලන්න.

50 සමන්තපාසාදිකාව, Vi කාණ්ඩය, හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1948, 1238 පි.

51 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 19 No.

52 උපග්‍රන්ථ 229 පිටුව බලන්න.

53 සමන්තපාසාදිකාව, III කාණ්ඩය, හේවාවිතාරණ ප්‍රකාශනය, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1930, 676 පි.

54 උපග්‍රන්ථ 228 පිටුව බලන්න.

55 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, P.182

56 උපග්‍රන්ථ 225 පිටුව බලන්න.

57 උපග්‍රන්ථ 229 පිටුව බලන්න.

58 උපග්‍රන්ථ 233 - 237 පිටු බලන්න.

"ඇළි නාවන්" යනු දියඇලි බලා ගන්නා තැනැත්තා ලෙස ද විග්‍රහ කෙරේ

59 උපග්‍රන්ථ 1235 - 237 පිටු බලන්න.

60 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912, 19 No.

61 උපග්‍රන්ථ 234 - 237 පිටු බලන්න.

62 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912 E. Z., 4 P.

63 උපග්‍රන්ථ 235 - 237 පිටු බලන්න.

64 උපග්‍රන්ථ 234 - 237 පිටු බලන්න.

65 Manorathapurni, Edit by Max Walleser, Published Pali Text Society, Oxford University, London, 1924, 18 P.

66 උපග්‍රන්ථ 235 - 237 පිටු බලන්න.

67 උපග්‍රන්ථ 233 - 237 පිටු බලන්න.

68 එම



69 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 78 P.

70 E. Z. Vol. iii, Ed, by S. Paranavithana, Oxford University Press, London, 1933, 47 P.

71 උපග්‍රන්ථ 234 පිටුව බලන්න.

72 උපග්‍රන්ථ 233 - 237 පිටු බලන්න.

73 උපග්‍රන්ථ 235 පිටුව බලන්න.

74 උපග්‍රන්ථ 228 - 237 පිටු බලන්න.

75 උපග්‍රන්ථ 208 - 211 පිටු බලන්න.

76 උපග්‍රන්ථ 233 පිටුව බලන්න.

77 කිරිය එකක් යනු අමුණු හතරක් වන අතර බුසල් තුනක් පමණ වැපිරිය හැකි ප්‍රදේශයකි. (අමරවංශ හිමි, කොත්මලේ. ලක්දිව සෙල් ලිපි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1969, 319 පි.)

78 උපග්‍රන්ථ 235 පිටුව බලන්න.

79 උපග්‍රන්ථ 236 පිටුව බලන්න.

80 උපග්‍රන්ථ 235 පිටුව බලන්න.

81 උපග්‍රන්ථ 208 - 211 පිටුව බලන්න.

82 දිවෙල් යනුවෙන් හැඳින්වෙන්නේ ජීවත්වීම සඳහා ලබා දෙන ඉඩම් ය.

83 E. Z. Vol. i, Ed, by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, London, 1912 E. Z., 4 P

84 උපග්‍රන්ථ 235 පිටුව බලන්න.

85 උපග්‍රන්ථ 239 පිටුව බලන්න.

86 පාද ද්වයක් යන්න අර්ථකථනය කළ යුතු යි.

87 E. Z. Vol. i, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, 1958, 42 P.

88 DO

89 උපග්‍රන්ථ 210 පිටුව බලන්න.

90 E. Z. Vol. i, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, 1958, 42 P.

91 වැවකින් ජලය ලබා ගෙන ගොවිතැන් කිරීමේ දී වැව් හිමියාට ගෙවිය යුතු බද්ද.

92 උපග්‍රන්ථ 230 පිටුව බලන්න.

93 උපග්‍රන්ථ 230 231 පිටු බලන්න.

CamScanner

94 උපග්‍රන්ථ 198 පිටුව බලන්න.
95 උපග්‍රන්ථ 228 - 230 පිටු බලන්න.
96 උපග්‍රන්ථ 230 පිටුව බලන්න.
97 උපග්‍රන්ථ 208 පිටුව බලන්න.
98 උපග්‍රන්ථ 231 පිටුව බලන්න.
99 උපග්‍රන්ථ 228 පිටුව බලන්න.
100 E. Z. Vol. iii, Edit by S. Paranavithana, Oxford University Press, 1933, 265 P.
101 උපග්‍රන්ථ 229 - 230 පිටු බලන්න.
102 E. Z. Vol. i, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, 1912, 3 P.
103 E. Z. Vol. i, Edit by Don Martino De Zilva Wickremasinghe, Oxford University Press, 1958, 4 P.
104 "පරිහාර" යනු ගෞරව දැක්වීම, කීර්තිය, සත්කාරය, විශේෂ අයිතිවාසිකම්, නිදහස පවරාදීම, පූජාව යන අදහස ගැබ්ව ඇත. (Pali English Dictionary, (PTS) 1966, 439 P.) රජෙකු හෝ රජයේ උසස් නිලධාරියෙකු විසින් කිසියම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට රාජ සභාවේ අනුමැතියට යටත්ව ප්‍රදානය කරනු ලබන විශේෂ බලතල, අයිතිවාසිකම්, නිදහස හා වරප්‍රසාදයන් ය.
105 උපග්‍රන්ථ 230 - 231 පිටු බලන්න.
106 උපග්‍රන්ථ221 - 222 පිටු බලන්න.
107 උපග්‍රන්ථ 229 පිටුව බලන්න.
108 උපග්‍රන්ථ 221 - 222 පිටු බලන්න.
109 උපග්‍රන්ථ 222 පිටුව බලන්න.
110 උපග්‍රන්ථ 222 පිටුව බලන්න.

Scanned with CamScanner

# නිගමනය

ක්‍රි. ව. 9 වන සියවසෙහි පටන් 15 වන සියවස දක්වා සියවස් හයකදී ලියැවුණු කතිකාවත් මූලිකව පදනම් කොට ගෙන සකස් කරන ලද මෙම අධ්‍යයනයෙහි පර්යේෂණාත්මක අරමුණ වූයේ, කතිකාවත්හි අන්තර්ගතය "කළමනාකරණය" යන්න බව දැක්වීමයි. එම සමය නූතන ව්‍යවහාරයෙහි පවතින කළමනාකරණ මූලධර්ම සකස් නො වුණු කාලපරිච්ඡේදයකි. එහෙත් නූතන කළමනාකරණ මූලධර්ම අනුගමනය කරමින් පැරණි ලාංකේය සංඝ සංවිධානයෙහි භික්ෂුව, ආරාමවල සේවය කරනු ලැබූ නිලධාරීන් හා සේවකයන් පාලනය කිරීම සඳහා කතිකාවත් උපයෝගී කොට ගෙන තිබෙන හෙයින් කතිකාවත් යනු, කළමනාකරණය ම බව නිගමනය කළ හැකි ය.

මානවයාගේ ආරම්භයේ සිට ම පවතින්නා වූ "කළමනාකරණය" නම් වූ විෂයට ඒ සඳහා වන මූලධර්මත් සමග විෂයයක් ලෙස සකස් වී මිනිසා අතරට පැමිණ ඇත්තේ 18 වන සියවසේ දී වුවත් කළමනාකරණ මූලධර්මයන්ට අනුව, කළමනාකරණයක් සිදු කිරීමේ දී එයට සැලසුම්කරණයත්, සංවිධාන සැලැස්මක්, මෙහෙයවීමක් හා පාලනයත් ඇතුළත්වීම අනිවාර්ය අංගයකි. කළමනාකරණ විෂය නූතනයේ වෙළඳ ක්ෂේත්‍ර තුළ දියුණුව පැවති නමුත් ක්‍රි. ව. 8 - ක්‍රි. ව. 15 වන සියවස දක්වා ලියවුණු කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී එය භික්ෂු සංවිධානයට පොදු වූ විෂයයක් ලෙස නිගමනය කළ හැකි ය. එම කාලපරිච්ඡේදය තුළ ලාංකේය භික්ෂු සමාජ සංවිධානයෙහි ක්‍රියාත්මක වූ, භික්ෂූන්ගේ වැරදි ක්‍රියා කලාපයන් නිවැරදි කිරීමට පාදක කොට ගෙන ඇත්තේ කතිකාවත් නම් වූ කළමනාකරණ ප්‍රතිපත්තිය නිසා, එය සනාථ වේ. එකී අරමුණින් යුතුව සකස් කරනු ලැබුවත්, එය වැළැක්වීම ම පමණක් නොව, අනාගතයෙහි භික්ෂුව ක්‍රියා කළ යුතු ආකාරය,

CamScanner

හැසිරිය යුතු ආකාරය හා ආරාමවල පාලනය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ. ඒ අනුව, "කතිකාවත්" යනු, ලාංකේය භික්ෂු සමාජ සංවිධානකරණයෙහි අනාගත වැඩපිළිවෙළකි. කතිකාවත්වල මූලික ම ලක්ෂණය වනුයේ, ගැටලු සාකච්ඡා කිරීමත්, එයට ගතයුතු ක්‍රියාමාර්ග තීරණය කිරීමත්, පැවති සමාජ සිරිත් විරිත්වලට ගරු කරමින් සකස් කරනු ලැබීමත් ය. එම තීරණයන් ද ගනු ලැබුවේ එක් පුද්ගලයෙකු විසින් නො වන අතර ම ඒ හා සම්බන්ධ දැනුමක් හා අවබෝධයක් ඇති භික්ෂූන් වහන්සේලාගේ සාමූහික ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ය. තීරණයන්ට එළඹීමේදී බුද්ධ විනයත් ලාංකේය භික්ෂූන් වහන්සේලා විසින් සකස් කරගෙන ඇති විනය නීති ග්‍රන්ථ ද කතිකාවත් සකස් කිරීමට පෙර, කතිකාවත් සම්පාදකවරුන් අධ්‍යයනය කොට කතිකාවත් සම්පාදනය කර ඇති බව පැහැදිලි ය. එම ග්‍රන්ථ අතර, ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ මෙන් ම ලාංකේය විනය ග්‍රන්ථ වන ධම්පියා ගැටපද අටුවාව, සමන්ත පාසාදිකාව, විශුද්ධි මාර්ගය, සිඛවළඳ හා සිඛවළඳ විනිස හා සිකක-රණී යන ග්‍රන්ථ ප්‍රධාන වේ. තත්කාලීන සමාජ නීති හා සාරධර්ම උපයෝගී කොට ගෙන තිබීම විශේෂ ලක්ෂණයකි. පවතින්නාවූ ගැටලු නිරාකරණය කිරීම උදෙසා අනුගමනය කළ යුත්තේ ද පවතින සමාජ, ආර්ථික රටාව සියුම්ව අධ්‍යයනය කොට ඒ තුළින් ද විසඳුම් සෙවීම විනා එතෙක් අනුගමනය නො කළ ක්‍රමවේදයක් ඇතුළත් කර ගැනීම නොවේ. ලංකාවේ කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වනුයේ ද සම්ප්‍රදාය හා ප්‍රතිසංස්කරණය අතර සිට විසඳුම් සෙවීමෙහි නිරතව ඇති බවයි. එනිසා ම විධිමත් කළමනාකරණ මූලධර්මයන් බිහි නොවූ යුගයක, කළමනාකරණය ලාංකේය භික්ෂු ශාසනය තුළ ක්‍රියාත්මක වී තිබුණු බවත්, එනිසා ම කතිකාවත් යනු, තත්කාලයේ කළමනාකරණ ප්‍රතිපත්තියක් ලෙසත් නිගමනය කළ හැකි ය.

කතිකාවත් එහි ආරම්භය හා විකාශය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ලංකාවේ හමුවී ඇති පැරණිතම කතිකාවත ලෙස දක්වා ඇත්තේ අභයගිරි සංස්කෘත ලිපිය යි. (ක්‍රි. ව. 9 වන සියවසේ දී පමණ) එහෙත් ඊට පෙර ද කතිකාවත් සකස් කර ඇති බව, මෙතෙක් අප්‍රකටව පැවති මහසෙන් රජුගේ කතිකාවත හෙවත්



"ධම්මකම්ම" ලිපිය අනුව, සඳහන් කළ හැකි ය. එම ලිපිය ක්‍රි. ව. 3 වන සියවසට අයත් වූවකි. කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන කරුණක් වනුයේ, එමගින් ධර්මය හා විනය ඉදිරියටත් ආරක්ෂා කරගැනීමටත්, සංඝ සාමග්‍රිය රැක ගැනීමටත්, බෞද්ධ රජවරුන්ගේ යුතුකමක් ඉටුකිරීමක් වශයෙන් හා ආරාම සතු දේපළ ආරක්ෂා කොට පාලනය කිරීමත් උදෙසා සකස් කළ බව යි. මේ තුළින් පැහැදිලි වනුයේ, කතිකාවත් ක්‍රි. ව. 3 වන සියවසේ සිට ම ලාංකේය භික්ෂු සංස්ථාව තුළ ක්‍රියාත්මකව පැවති බවත්, එය අවස්ථාවට උචිත ලෙස යොදා නො ගනිමින් ක්‍රමික විකාශනයට පත්ව ඇති බව යි.

කතිකාවත් පිළිබඳව විවිධ නිර්වචන විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇත. එහෙත්, කතිකාවත් යනු භික්ෂුව, භික්ෂු ප්‍රතිරූපය තුළ සකස් කිරීමට හා ආරාම පාලනය සඳහා සකස් කළ ව්‍යවස්ථාවන් වන අතර, එය ක්‍රියාත්මකභාවයට පත් වූයේ රජුගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව ය. භික්ෂුවගේ වැරදි ප්‍රතිපත්ති පාලනය කිරීම හා අනාගත භික්ෂුව ක්‍රියාකළ යුතු ආකාරය දැක්වෙන කතිකාවත් දක්නට ලැබුණ ද, ආරාම පාලනයට පමණක් පැනවූ ව්‍යවස්ථා දැකිය නො හැකි ය. පොළොන්නරු කතිකාවත හා දඹදෙණි කතිකාවත හැර අනෙක් සෑම කතිකාවතකම භික්ෂුව නිවැරදි කිරීමට හා ආරාම පාලනයට අදාළ සැලසුම් හා පාලන ක්‍රමයන් ද දක්නට ලැබේ. එබැවින් කතිකාවත් ද ශාසන කතිකාවත් හා විහාර කතිකාවත් යනුවෙන් වර්ග කිරීමට වඩා "ශාසන කාරක කතිකාවත්" යනුවෙන් හැඳින්වීම නිවැරදි ය.

ක්‍රි. පූ. 6 වන සියවසේ දී තථාගත බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් පාලනය කිරීම සඳහා අනුගමනය කර ඇත්තේ මධ්‍යස්ථ පිළිවෙතකි. ගැටලුවක් මතු වූවායින් පසුව එකී ගැටලුව නිරාකරණය කිරීමත් නැවතත් එවැන්නක් ඇති නො වන ආකාරයට භික්ෂු සංස්ථාව සකස් කිරීමට සැලසුම් කිරීමත් සේ ම පුරෝකථනය ද බුදුන් වහන්සේගේ කළමනාකරණයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. බුද්ධ කළමනාකරණය කාලානුරූපව හා දේශානුරූපව සකස් වූවක් වන අතර ම, බුද්ධ සැලසුම්කරණය වරින්වර වෙනස් වූ අවස්ථා ද දක්නට ලැබීමෙන් ඒ බැව් පැහැදිලි වේ. බුදු දහම

CS Scanned with CamScanner
CS CamScanner

භාරතයේ ආරම්භ වන විට තවත් ආගම් 62ක් තිබුණි. බුදුන් වහන්සේට අවශ්‍ය වූයේ තම සසුන සංවිධානාත්මක ලක්ෂණයන්ගෙන් යුතු වූ සංවිධානයක් බවට පත් කිරීම යි. ඒ අනුව, තම ශ්‍රාවකයන් පවතින සමාජ රටාවේ දක්නට ලැබෙන වැරදි ලක්ෂණයන්ගෙන් ඉවත් කොට නිවැරදි ලක්ෂණයන්ගෙන් යුක්ත කිරීමත්, ඒ සඳහා වන සංවිධාන සැලැස්මක්, එක හා සමාන ව ක්‍රියා කළ හැකි ආකාරයට නිර්මාණය කිරීමත්, එම අරමුණෙහි තම සාමාජිකයන් පාලනය කිරීම උදෙසා විනය නීති හඳුන්වා දීමත් දඬුවම් දීමට තීරණය කිරීමෙන් ප්‍රජාතාන්ත්‍රවාදී පාලනයක් සිදුව ඇති හෙයින් බුද්ධ කාලයෙහි ද බුදුසසුන තුළ කළමනාකරණයක් පැවති බව නිගමනය කළ හැකි ය.

ක්‍රි. ව. 8 වන සියවසේ සිට 11 වන සියවස දක්වා වූ කාලය භික්ෂුව සකස් කිරීමේ කර්තව්‍ය සඳහා මහාවිහාර සම්ප්‍රදාය අදාළ වූ බවට මෙතෙක් නිශ්චිත සාධක සොයා ගෙන නොමැත. එහෙත් 11 වන සියවසේ දී පරාක්‍රමබාහු කතිකාවතෙන් එතෙක් ලංකාවේ බිහි ව තිබූ සියලුම නිකායන් එක් කිරීමෙන් හා ඉන් පසුව සකස් කරන ලද කතිකාවත්වල එබඳු නිකායන් ගැන සඳහන් නොවීමෙන් පරාක්‍රමබාහු කතිකාවතේ අපේක්ෂිත අරමුණු ඉටු වූ බවට සාධකයකි. ඒ අනුව, පොළොන්නරු කතිකාවත සමස්ත භික්ෂු සංවිධානය ම කළමනාකරණය කිරීම සඳහා සකස් කළ ප්‍රථම කතිකාවත වශයෙන් සැලකිය හැකි ය. එහි දියුණු ම අවස්ථාව පිළිබිඹු කරන්නේ දඹදෙණි කතිකාවතෙනි.එනම්, භික්ෂු සංවිධානය විධිමත් සංවිධාන සැලැස්මකට අනුකූලව සකස් කිරීම හා පාලනය කිරීම යි. ඉන් අනතුරුව එකී සැලැස්ම අවස්ථාවෝචිත පරිදි සකස් කර ගනිමින් භික්ෂු සමාජය සකස් කරගත් බව නිගමනය කළ හැකි ය.

කතිකාවත් මගින් භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමේ දී මූලික කොට ගෙන ඇත්තේ බුද්ධ දේශනාවන් ය. භික්ෂු ජීවිතය පණ්ඩුපලාස, සාමණේර, නවක, මධ්‍යම හා ස්ථවිර යනුවෙන් කොටස්වලට බෙදා වෙන් කොට ඒ ඒ අවස්ථාවලදී ලබා ගත යුතු අධ්‍යාපනය ද මැනවින් සකස් කොට පාලනය කර තිබේ.



සුපේශල ශික්ෂාකාමී සංඝ සමාජයක් ආරම්භ කරන්නට නම් පළමු ව කළයුත්තේ මහණකම විධිමත් ලෙස සැලසුම් කිරීම යි. ඒ අනුව, මහණ වන්නට පෙර පණ්ඩුපලාස අධ්‍යාපනය අනිවාර්ය කිරීම වඩාත් ම උචිත ය. මහණ කිරීමේ දී බුද්ධ විනයට පරිබාහිරව කරුණු අධ්‍යයනය කිරීම තුළින් අපේක්ෂා කරනු ලැබුවේ, වෙනස් ව ඇති සමාජ, ආර්ථික රටාවට ගැළපෙන සේ සකස් කිරීමට යැයි උපකල්පනය කළ හැකි ය. මෙලෙස බෙදා වෙන් කරනු ලැබුවේ අවශ්‍යතාවට අනුකූලව ලාංකේය භික්ෂු සංවිධානය විධිමත් කිරීමේ අටියෙනි.

මහණ කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙතත්, උපසම්පදාව ලබාදීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙතත් සකස් කොට ඇත්තේ බුද්ධ විනයට අනුකූලව ය. එනමුත්, මහණ කිරීම හා උපසම්පදාව එලෙස සකස් කිරීමට බලපෑ සාධක අධ්‍යයනය කිරීමේ දී තත්කාලීන අවශ්‍යතා ද ඒ තුළ අන්තර්ගතව පවතී. ලාංකේය භික්ෂු සමාජයෙහි සාමාජිකත්වය ලබා ගැනීම නම් පණ්ඩුපලාස හෙවත් මහණවීමට පෙර අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කිරීමත්, උපසම්පදාවෙන් පසු අධ්‍යාපනයක් හඳුන්වා දී තිබීමත් වැදගත් ලක්ෂණයකි. පණ්ඩුපලාස අධ්‍යාපනයක් තිබිය යුතු බව කළුදිය පොකුණ සෙල් ලිපිය අවධාරණය කරනු ලැබුවත්, පොළොන්නරු කතිකාවතෙහි එබන්දක් සඳහන් ව නැත. මෙමගින් කළුදිය පොකුණ සෙල් ලිපියෙහි දැක්වෙන ඉහත තොරතුර ඒ වනවිටත් ක්‍රියාත්මකව පැවති බව සැලකිය හැකි ය. එහෙත් නැවත වරක් දඹදෙණි යුගයේ දී එය අත්‍යවශ්‍ය කොට දඹදෙණි කතිකාවත සකස් කොට ඇත්තේ එම කාලයේ දී පිරිහීමට පත් ව තිබූ නිසා ය. කතිකාවත්වල උපසම්පදාපේක්ෂකයාගෙන් අසනු ලබන ප්‍රශ්නයන් ද මහාවග්ග පාලියෙහි දැක්වෙන ආකාරයට වඩා වෙනස් ස්වරූපයක් ගෙන ඇත. ඒ අනුව, බුද්ධ විනය තුළ උපසම්පදා කිරීමේ දී උපසම්පදා අපේක්ෂකයාගෙන් අසනු ලබන ප්‍රශ්නවලින් මිනිසෙක් ද, පුරුෂයෙක් ද, ණයගැත්තෙක් ද, මවුපියන්ගෙන් අවසර ගෙන තිබේ ද, පා සිවුරු සොයා ගෙන තිබේද ආදී ප්‍රශ්න ඇසීම කතිකාවත්වල දක්නට නො ලැබේ. එහෙත් එම ප්‍රශ්න නො ඇසුවා යැයි ද නිගමනය කළ නො හැකි ය. මන්ද බුද්ධ විනය තුළ භික්ෂුව ක්‍රියාත්මක විය යුතු

nned with CamScanner
CamScanner

හෙයින් එම ප්‍රශ්නවලට අමතරව දඹදෙණි කතිකාවතෙන් විමසිය යුතු ප්‍රශ්න ඇතුළත් කළා විය හැකි ය.

"මහලු පැවිදි කතිකාවත කියවා" යනුවෙන් සඳහන් වුව ද එබඳු කතිකාවතක් සොයා ගැනීම දුෂ්කර විය. "මහලු පැවිදි" යනු වයස අවුරුදු විස්ස ඉක්මවා ගිය යම් පුද්ගලයෙකු බුදු දහම කෙරෙහි පැහැදි මහණ වීමට පැමිණෙන්නේ නම්, ඔවුන් මහලු පැවිද්දන් ලෙස සලකන්නට ඇතැයි සිතිය හැකිය. කෙසේ නමුත්, සෑම භික්ෂුවක් විසින් ම දසධම්ම සූත්‍රයත්, අනුමාන සූත්‍රයත් කටපාඩම් කළ යුතු යැයි අනිවාර්ය කිරීමෙන් බලාපොරොත්තු වන්නට ඇත්තේ ද වඩාත් ම භික්ෂුව. භික්ෂු ජීවිතයට හුරු කිරීමේ පරමාර්ථයෙනි. ආගමික කටයුතුවලට ද යොමු වෙන ලෙස භික්ෂු අධ්‍යාපනය සකස් කොට ඇති බව, උපසම්පදාවෙන් වර්ෂ පහක් ගිය පසු ලැබිය යුතු අධ්‍යාපනයක් හඳුන්වා දීමෙන් පැහැදිලි වේ.

සාමණේර භික්ෂුවක් ලෙසින් භික්ෂු ජීවිතය ආරම්භ කරනු ලැබුව ද මාහිමි නායක තනතුර දක්වා ගමන් කිරීම සඳහා වූ සංවිධාන සැලැස්මක් හා එම තනතුරට පත්වීමට නම් නිශ්‍රයමුක්තභාවය ලබා ගැනීම අනිවාර්ය කොට තිබීමෙන් සපුනෙහි නායකත්වයක් දැරීමේ දී උගත යුතු සියල්ල ම ඒ වන විට භික්ෂුවට ලබාදීමෙන් මනා වූ භික්ෂු පාලනයක් ගෙන යාමට කටයුතු සම්පාදනය කර තිබූ නිසා අනුරපුර, පොළොන්නරු හා දඹදෙණි යුගයන්හි දී භික්ෂුවට සමාජයෙහි ඉදිරියෙන් ම සිටීමට හැකි විය. ලාංකේය භික්ෂු කළමනාකරණයෙහි තවත් වැදගත් ලක්ෂණයක් වනුයේ, ඇතැම් තනතුරු හා ග්‍රන්ථධූරයෙහි යෙදෙන භික්ෂූන් වහන්සේලා සඳහා වැටුප් හා දීමනා ලබාදීමට තීරණය කිරීම යි. බුදුන් වහන්සේ භික්ෂුවට එබන්දක් අනුදැන වදාළ නො තිබුණත් තත් කාලයෙහි භික්ෂුවගේ සේවය ලබා ගැනීම උදෙසා දිරි ගැන්වීමක් වශයෙන් මෙලෙස ක්‍රියා කිරීම කළමනාකරණයට අනුව, අභිප්‍රේරණයක් ලෙස නිගමනය කළ හැකි ය.

ලාංකේය කළමනාකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වනුයේ, භික්ෂුව සකස් කිරීමේ දී දේශීය විනය ග්‍රන්ථ



කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදීම යි. සිකකරණී, සිබවළඳ විනිස ග්‍රන්ථවල දැක්වෙන ආකාරයට භික්ෂු වත්පිළිවෙත් ක්‍රියාත්මක කරවන්නට උත්සාහ ගෙන ඇත. මෙම ග්‍රන්ථ සකස් කරගෙන ඇත්තේ බුද්ධ විනය නීති ඇසුරෙනි. සිබකරණී යනු පාතිමොක්ඛයෙහි සඳහන් සේඛියාවන්ට හෙළ බසින් ලියූ විවරණයකි. එය පාදක කරගෙන භික්ෂු පිළිවෙත් සකස් කළ බව, මිහින්තලා සෙල් ලිපියෙහි දැක්වේ.

භික්ෂූන් වහන්සේලා උදෙසා වැටුප් ගෙවීමේ දී මුදලින් ඒවා ලබා දුන්නා නොව, ප්‍රත්‍ය පහසුකම්වලින් ලබා දී ඇත. ඒ අනුව, බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට මුදල් ලබා ගැනීම හෝ පරිහරණය කිරීම තහනම් කොට ඇති පාරාජිකා පාලියෙහි (පාරාජිකා පාලිය, 580 පි.) දැක්වේ. "යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය, නිස්සග්ගියංපාචිත්තියන්ති" "යම් මහණෙක් රන් රිදී මසු කහවණු තෙමේ ගනී නම් හෝ අනුන් ලවා ගන්වා නම් හෝ ළඟ තබන ලද්දක් ඉවසා නම් හෝ නිසගි පචිති වේ" යැයි දැක් වේ. මේ අනුව, භික්ෂූන් වහන්සේලාට එබන්දක් ළඟ තබාගන්නට අවසර ලබා දී නොමැත.

කතිකාවත් සකස් කරනු ලැබුවේ භික්ෂූන් වහන්සේලා ම වුව ද, එයට අධිකාරි බලය පවරනු ලැබුවේ රජවරුන් විසිනි. මෙයින්, භික්ෂූන් වහන්සේලා බුද්ධ විනයට පිටු පා ක්‍රියා කරනු ලැබුවත්, රාජ නීතියට අනුකූලව ක්‍රියා කරවීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකි ය. බුද්ධ විනය තුළ වැරැද්දක් කළ භික්ෂුවකට දඬුවම් ලබාදීමේ දී ඒ පිළිබඳව තීරණයක් ගනු ලබන්නේ සංඝයා වහන්සේලා විසිනි. බුද්ධ විනයෙහි දඬුවම ලෙස හඳුන්වා දී ඇත්තේ උක්ඛේපනීය, පාටිසරණීය, තජ්ජනීය හා අබ්බාහන ආදිය යි. එහෙත් රාජ නියෝගය ඊට වඩා ඉදිරියට යමින් කතිකාවත්වල දැක්වෙන නියෝගයන් පිළිනොපදින භික්ෂූන් වහන්සේලා ආරාමයෙන් හෝ රටෙන් පිටමං කළයුතු බවට තීන්දු කිරීමෙන්, බුද්ධ විනයත් රාජ නියෝගයත් එකසේ ක්‍රියාත්මක කරවීමට ගත්

කතිකාවත්වල ආරාම සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙතක් සකස් කොට පාලනය කරනු ලැබිණි. ඒ සඳහා බුද්ධ කාලීන විනය තුළ පිළිගත් ප්‍රතිපත්තියක් සඳහන් නො වුවද, ඒ වන විට ලාංකේය සමාජයේ පැවති සමාජ සිරිත්, ඒ ඒ විහාරාරාම අනුගමනය කරන ලද නීති රීති උපයෝගි කොට ගෙන අනාගත වැඩපිළිවෙළ සකස් කර ඇති අතර, "කළමනාකරු" වශයෙන් ක්‍රියා කොට ඇත්තේ කතිකාවත් අයත් වන ආරාමවල වාසය කරන භික්ෂූන් වහන්සේ ය. මේ අනුව, කතිකාවත්වල කළමනාකරණයෙහි විශේෂ ලක්ෂණය වනුයේ, අනාගත සැලැස්ම කෙසේ විය යුතුද? යන්න විසඳා ගනු ලැබීමයි. එකී ගැටලුවට මැදි වූ පාර්ශ්වයන් කැඳවාගෙන ඔවුන්ගේ අදහස් හා උදහස් විමසා බැලීමෙන් අවශ්‍ය වන්නාවූ විසඳුම් සකස් කරගෙන ඇත. මෙය ද සුවිශේෂ කළමනාකරණ ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය.

එනමුත් ආරාම කළමනාකරණයෙහි එබඳු සමස්ත භික්ෂු සමාජය වෙනුවෙන් ම සකස් කළ කතිකාවතක් දක්නට නො ලැබෙන්නේ ලංකාවේ සියලුම ආරාමවල නිලධාරීන් හා සේවකයන් යොදවා නො තිබීම නිසා ය. ඒ වන විට සෑම ආරාමයක ම සේවකයන් යොදවා නො තිබෙන්නට ඇති හෙයින් පාලනය සඳහා ගෙන ඇති තීරණයන් සමස්ත ආරාමවලට ම බලපාන්නට ඇත.

ලාංකික භික්ෂු ශාසනය ආරම්භයේ දී භික්ෂූන්ට පූජා කරනු ලැබුවේ සිවුපසය සඳහා අවශ්‍ය දෑ ය. සසුන රැකීමේ වගකීම රජු වෙත පැවරී තිබුණු හෙයින්, රජවරු එම වගකීමෙන් බැහැරවීමේ අරමුණින් රජවරුන්ගේ කාර්යභාරයක් වූ රාජ්‍ය ඉඩම්වල බදු අය කර ගැනීමේ බලයත්, කෘෂිකර්මාන්තයේ දී අවශ්‍ය වන ජලය ලබා ගැනීම සඳහා තනන ලද වැව්, පොකුණු, ඇළ, දොළවල අයිතියත් ඒ ඒ විහාරාරාමවලට පූජා කරනු ලැබූහ. ඒවායින් ලැබෙන ආදායමින් තම සිවුපසය සපයා ගැනීමටත්, වෙහෙර විහාර නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමටත් භික්ෂූන් වහන්සේලා වෙත පවරනු ලැබීය. තෝනිගල සෙල් ලිපියෙහි දැක්වෙන ආකාරයට (E. Z. Vol. 1, 173 P.) ධාන්‍ය තැන්පත් කිරීමෙන් ලැබෙන පොලිය ද පරිත්‍යාග කරනු ලැබුවේ භික්ෂුවගේ ප්‍රත්‍ය පහසුකම් සපයා ගැනීමට ය. භෞතික සම්පත් පමණක් නොව ක්‍රි. ව. 5



වන සියවස වන විට රජවරු,සේවකයන් ද පරිත්‍යාග කළහ. පසුකාලය වන විට එසේ පරිත්‍යාග කරනු ලැබූ භෞතික සම්පතින් ලැබෙන ආදායම හා වියදම විධිමත් ලෙස පවත්වාගෙන යාමට හා මානව සම්පත එකී, අරමුණු ඉටුවන ආකාරයට සැලැස්මක් සකස් කොට පාලනය කිරීමට අවශ්‍ය විය. මෙබඳු වාතාවරණයක් බුද්ධ කාලයෙහි නො වීය. එහෙත් ලාංකේය සසුනෙහි පැවැත්ම උදෙසා පරිත්‍යාග කරන ලද ඉඩකඩම් ආදී භෞතික සම්පත් පිළිගැනීම හා ඒවා පාලනය කිරීම සඳහා නීත්‍යනුකූල කර ගැනීම සිදුකර ගත් ආකාරය සමන්තපාසාදිකාව වාර්තා කරයි. එය වඩාත් විධිමත් කිරීමේ වැඩපිළිවෙළක් කතිකාවත් තුළින් ක්‍රියාත්මක කොට ඇත.

ආරාම කළමනාකරණයට බලපෑවේ විහාරවලට පූජා කරන ලද දේපළවල වර්ධනය යි. එලෙස දේපළ වර්ධනය වීමත් සමග භික්ෂුව ලෞකිකකරණයට හසුවීම වැළැක්වීමත් භික්ෂු ශාසනය උදෙසා ලබා දුන් භෞතික ප්‍රත්‍යයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීමත් වැදගත් වුණි. භික්ෂුවට ලැබෙන ප්‍රත්‍යය පිළිගැනීම සඳහා ගිහියෙකු "කප්පියකාරයෙකු" වශයෙන් පත් කර ගැනීමට අවස්ථාව ලබා දුන්නත්, පසුකාලීනව ඒවායෙහි ප්‍රමාණාත්මක හා සංඛ්‍යාත්මක වර්ධනයක් සිදුවීමත්, බුදු දහම පෝෂණය කිරීම, ව්‍යාප්ත කිරීම හා ආරක්ෂා කිරීම රජුගේ කාර්යභාරය වීමත් නිසා ආරාම කළමනාකරණය සිදු කිරීම ගිහියන්ට පැවරීමට සිදුවිය. එම කාර්යභාරයන් සිදු කිරීමේ දී මනා වූ සැලැස්මක් යටතේ විධිමත් ලෙස අභිමතාර්ථයට අනුකූල වන පරිදි තනතුරු සංවිධාන ගත කිරීමේ දී නිලධාරීන් හා සේවකයන් සලසුම් කරගත් කර්මාන්තයට උචිත පරිදි පත් කර ගැනීමත්, ඒ ඒ තනතුරුවලට ගැළපෙන ආකාරයට වැටුප් හා දීමනා ලබාදීමත් සිදු කර තිබේ. මෙහි දී වැටුප් වශයෙන් ගෙවා ඇත්තේ මුදල් ම නොව ඉඩම් හා ආහාර සඳහා අවශ්‍ය වන ද්‍රව්‍යයන් ය. නූතන කළමනාකරණය තුළ නිලධාරීන් හා සේවකයන් දිරිමත් කිරීම සඳහා දීමනා ආදිය ගෙවනු ලබයි. එය "අභිප්‍රේරණය" ලෙස සැලකේ. ඒ හා සමාන ව ම අත්‍යවශ්‍ය රාජකාරි ඉටුකරන, නිරන්තරයෙන් ම එකී සේවාවන් අවශ්‍ය වන නිලධාරීන්ට හා සේවකයන්ට වැටුප්වලට අමතරව රන් කළං ලබා

Scanned with CamScanner
CamScanner

දීමට ක්‍රියා කොට ඇති බව මිහින්තලා ලිපියේ සඳහන් වෙයි. එකඟ වූ ආකාරයට තම රාජකාරිය ඉටු කිරීමටත්, එසේ ඉටු නො කරන නිලධාරීන් හා සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරයත් ආරාම කළමනාකරණය සිදු කිරීමේ දී උපයෝගී කොට ගෙන තිබෙන බව නිගමනය කළ හැකි ය. ඒ ඒ තනතුරුවලට පත් කර ගැනීම සිදුකර ඇත්තේ කුමන පදනමක් මත ද යන්න තොරතුරු සොයා ගැනීම උගහට ය. එහෙත් මෙම කාල පරාසය වන විටත් කුල ක්‍රමය මත පදනම් වූ ආර්ථිකයක් ක්‍රියාත්මක වූ හෙයින්, ඒ ඒ කුලවලින් නිපුණත්වයක් ඇති සේවකයන් පත් කර ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

භෞතික සම්පත් කළමනාකරණය කිරීමෙ දී ක්‍රි. ව. 9 වන සියවසේ දී ලියැවුණු අභයගිරි සංස්කෘත ලිපිය හා ක්‍රි. ව. 10 වන සියවසේ පමණ සකස් කළ මිහින්තලයේ පුවරු ලිපිය අවධානයක් යොමු කොට ඇත. මේ අතර කළුදිය පොකුණ ලිපිය ආරාම කළමනාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති දක්වා තිබේ. මෙයින් පසුව ක්‍රි.ව.15 වන සියවසේ දී ලියැවුණු පැපිලියාන සෙල් ලිපිය තෙක් ලියැවුණු කතිකාවත් වැඩි අවධානයක් දක්වා ඇත්තේ භික්ෂු ප්‍රතිපත්ති සකස් කිරීමට ය. පැපිලියාන සෙල් ලිපියෙන් ද කළමනාකරණය කොට ඇත්තේ සුනේත්‍රාදේවී පිරිවෙන මැනවින් පවත්වා ගෙන යාමට අවශ්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියකි. එසේ ම ඒ ඒ නිකායන්ට අයත් විහාරස්ථානයන් පාලනය කිරීමේ දී පැන නැඟුණු ගැටලුවලට විසඳුමක් වශයෙන් කතිකාවත් උපයෝගී කොට ගෙන කළමනාකරණය කරනු ලැබුවත්, ඒ තුළ විද්‍යමාන වනුයේ තත්කාලීන සමාජ න්‍යායයි. එබැවින් මෙම භෞතික සම්පත් කළමනාකරණය ක්‍රි. ව. 8 - 15 දක්වා ම ක්‍රියාත්මක වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

සේවකයන්ට හා නිලධාරීන්ට කළමනාකරණය කිරීමට සිදුවූයේ, ආරාමවල ධාතු ගෙය, බත් ගෙය හා බුදු ගෙයට ලැබෙන ආදායම හා ඒවායෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා වන වියදම මැනවින් පාලනය කොට පවත්වාගෙන යාම සඳහා ය.



ආරාම කළමනාකරණයේ දී නිලධාරීන්ට හා සේවකයන්ට වැටුප් හා දීමනා ලබා දී ඇති අතර, එසේ ලබා දීමෙ දී තනතුරේ ස්වභාවය අනුව නොව, රාජකාරියේ ස්වභාවය අනුව ලබා දී තිබේ.

යම් තනතුරක රාජකාරිය ආරාමයේ පැවැත්මට හා නිතර නිතර අවශ්‍ය වන්නේ නම් තනතුර කුමක් වුවද ඒ සඳහා උසස් තනතුරුවලට සමාන ව හෝ ඊට වැඩිපුර වැටුප් හා දීමනා ලබා දී තිබීමෙන් කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කොට ඇති බව පැහැදිලි වේ. ආරාමවල සේවය කරන සේවකයන්ගෙන් නොමිලයේ සේවය ලබා ගැනීමට උත්සාහ ගෙන නොමැත. සේවයට සරිලන දීමනාවක් ලබා දීමට කතිකාවත් මගින් සැලසුම් කොට ඇත. ජීවත්වීම සඳහා වැටුප් හෝ දීමනා ලබා දීමෙ දී ඉඩම්, කුඹුරු එම කාලවකවානුවෙහි භාවිත වූ මුදල් පමණක් නොව, ආහාර පිසීමට අවශ්‍ය වන ද්‍රව්‍ය ද ලබා දී තිබුණි. මෙමගින් සේවකයා තෘප්තිමත් කරමින් ඔවුන්ගේ සේවය වඩාත් සාධනීය ලෙස ලබා ගැනීමට උත්සාහ ගෙන තිබේ.

පාලනය කිරීම සඳහා යොදා ගන්නා ලද දඬුවම් අදාළ කරගනු ලැබුවේ තත්කාලීන සමාජයෙහි ක්‍රියාත්මක නීති බව, මිහින්තලා ලිපියෙන් අනාවරණය කරන බැවින් එම කාලවකවානුවෙහි ක්‍රියාත්මක වූ සමාජ, ආර්ථික න්‍යායන් ද මේ තුළ විද්‍යමාන වන බව උපකල්පනය කළ හැකි ය.

සංවිධාන සැලැස්මක් සකස් කිරීමෙන් අපේක්ෂා කරනුයේ ඉහළ කළමනාකරණය ගන්නා වූ තීරණයන් පහළ ම සේවකයා දක්වා ගමන් කරවීමටත්, පහසුවෙන් ස්වකීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය පිරිස ස්ථානගත කොට මෙහෙයවීමටත් ය. ඒ අනුව, මිහින්තලා ලිපිය මගින් එම ආරාමයන් හි සේවකයන් මැනවින් සංවිධානගත කොට ස්වකීය අභිලාෂයන් ඉටුකර ගත් බව පැහැදිලි වේ.

ආරාම කළමනාකරණය කිරීමට ගිහි පක්ෂයට භාර කරනු ලැබුවත්, "ප්‍රධාන කළමනාකරු" වශයෙන් භික්ෂුව පත් කිරීම අනුව, ක්‍රි. ව. 8 - 15 සියවස් තුළ භික්ෂු ශාසනයෙහි විධිමත් කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කොට තිබෙන බව නිගමනය කළ හැකි ය.

කතිකාවත් මගින් භික්ෂු සමාජ සංවිධානය පිළිබඳ කළමනාකරණය අධ්‍යයනය කිරීමේ දී ක්‍රි. ව. 10 වන සියවස දක්වා ම කතිකාවත් පිහිටුවා ඇත්තේ ඒ ඒ විහාරාරාමවල වාසය කරනු ලැබූ භික්ෂූන් වහන්සේලාට හා ආරාම පාලනය කිරීම අරමුණු කර ගෙන ය. මහාවිහාරය හා සම්බන්ධ භික්ෂූන් වහන්සේලා කළමනාකරණය කිරීමක් මෙමගින් සිදු වී නොමැත. එනමුත්, කතිකාවත් සමස්ත භික්ෂු සමාජයේත්, ගිහි සමාජයේත් පැතිකඩකි. ක්‍රි. ව. 10 වන සියවසේ සිට 15 වන සියවස දක්වා සකස් වූ කතිකාවත් සමස්ත භික්ෂු සමාජය ම කළමනාකරණය කිරීමට උපයෝගී කොට ගත් බව පැහැදිලි ය. මහාපරාක්‍රමබාහු රජතුමා විසින් කරන ලද පොළොන්නරු ගල්විහාර කතිකාවත එතෙක් පැවති මහාවිහාර, අභයගිරි හා ජේතවන යන ප්‍රධාන නිකායන් තුන ඇතුළත් ව සකස් කළ කතිකාවතක් වීමත් එහි කිසිදු නිකායකට අයත් වූවක් ලෙස සඳහන් නොවීමත් වැදගත් කොට සැලකේ. එයින් පසුව බිහි වූ ප්‍රධාන කතිකාවත් වූ දඹදෙණි කතිකාවත, ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ කතිකාවත් අධ්‍යයනය කිරීමේ දී සමස්ත භික්ෂු සංවිධානය උදෙසා ම සකස් වූවක් ලෙස පිළිගැනීමට පුළුවන.

ආරාම පරිපාලනය කිරීමට වෙන ම සමාජ කණ්ඩායමක් පත් කරනු ලැබුවත්, භික්ෂු කළමනාකාරිත්වයෙහි විශේෂත්වය වනුයේ නියමුවා බවට පත් කරගෙන ඇත්තේ භික්ෂුව වීම යි. මේ තුළින් සමාජයෙහි නායකයා වශයෙන් තවදුරටත් භික්ෂුව තබා ගැනීමට ද කටයුතු කර ඇති බව නිගමනය කළ හැකි ය.

මෙමගින් කතිකාවත් තුළ කළමනාකරණයෙහි මූලික ලක්ෂණයන් වන සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය යන ලක්ෂණයන් අන්තර්ගත වන හෙයින් එය භික්ෂු සංවිධානකරණයේ කළමනාකරණය බව පැහැදිලි ය.



# දඹදෙණි කතිකාවතෙහි දැක්වෙන සංඝ සංවිධාන සැලැස්ම



canner

CamScanner

9. ප්‍රඥාපුරස්සර කරුණායෙන් සංචොදිත හෘදය ඇතිවැ මෙසෙ නට සසුන් කවුරුන් වහල් කොටැ අපගතකලංකවැ පස්වාදහක් පවත්නා පරිද්දෙන් කෙරෙම් දොහොයි සිතා අඛණ්ඩාච්ජිද්‍රතාදි විවි-

10. ට ගුණගණාඟ සඞ්ඝත කොටැ රක්ෂිත වර්ධිත පොෂිත ශීලස්කන්ධාදී ලෞකික ගුණරත්නාලංකාරයෙන් සමලංකෘතවූ උදුම්බරගිරි නිවාසී මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහා විහාරාධිවාසී

11. භික්‍ෂුසංඝයා දැකැ ඔවුන් වහල් කොටැ බුදුන් විසින් අනුජ්ඥාත බුඩකල්ප මොග්ගලිපුත් තිස්මහාතෙරුන් වහල්කොටැ පාපභික්‍ෂු නිමමථනය කොටැ දුල්ලබ්ධි මැඬැ ශාසනම

12. ල විශොධා තෘතීය ධම්මසංගායනා කැරැවූ ධම්මාශොක මහරජහුමෙන් අනෙකශත පාප භික්ෂූන් ශාස්තෘශාසනයෙන් අපගත කොටැ ෂඩභිජ්ඥාද්‍යනෙක ගුණගණොපෙත මහා ක්‍ෂීණා

13. ශ්‍රවයන් ඇතිකල්හි පවා පූර්වරාජයන්විසින් මහොත්සාහයෙනුදු සමඟ නො කොටැ ගත හුණු තුන්නකා සමඟකිරීමෙන් එක්නකා කොටැ ජෙතවනමහාවිහාරාදි නොඑක් මහඇගි වි

14. හාර ලක්දිවැ තන්හි තන්හි කරවා එහි සහස්‍ර සංඛ්‍යාතික්‍රාන්ත මහාසංඝයා වාසකරවා නිරන්තර ප්‍රවෘත්ත ධර්මාමිෂදානයෙන් උපස්ථාන කෙරෙමින් සංඝ දශීන ප්‍රභව ප්‍රීති ප්‍රාමොද්‍ය රසා

15. ස්වාදයෙහි ලොලවැකාලානුකාලයෙහි පෞෂථාඟ ශිලස(මු) පෙතැවැ විහාරයට ප්‍රාමොද්‍යරසාස්වාදකොටැ මාවිසින් මහොත්සා

16. හයෙන් සාධිතවූ මෙ සංඝ(සා)මග්‍රිය පස්වාදහසක් අභින්නවැ පවත්නා පරිද්දෙන් මතුවන සංඝයාද අප්‍රමාදවැ ග්‍රන්ථවිදශී නාධුරඬයෙහි යෙදී අල්පෙච්ඡතාදි ගුණෙන් යුක්තවැ වසනා ප



17. රිද්දෙන් අවවාදානුශාසන කොටැ ශාසනය රක්ෂාකළමැනැවැයි යුක්ත ව්‍යක්ත ගුණොපෙතවැ කරන ආරාධනාද අසා මහා කාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ ස්ථවිරයන්මැවියි

18. න් ප්‍රමාදවිහාරීන් අවකාශ නොලබන සන්දහා ධම්මවින(ය) සසඳනකොටැ ඇදුරොල් ද නොවිහිදැ කළ කතිකාවති. ගණදෙටු තෙරවරුන් විසින් තම තමා නිසා වන අන්තේවාසික සධිවි

19. හාරිකයන් අතුරෙන් නිස දෙන්නට නිසයෙන් මිදෙන්නට යොග්‍යවැ වසන්නවුන් පමා නොවියැදී ග්‍රන්ථධුරයෙහි යොදා යැටත්පිරිසෙයින් විනයෙන් කුදුසිඛ හා පාමොක් ද සුතතින් දසධම් සූත්‍රත්‍රය අනුමාන

20. සූත්‍රය ද වනපොත් පිරිහෙළියැ නොදී ගණසංගණිකාදීන් දුරුකොටැ ග්‍රන්ථධුරයෙහි යෙහි යෙදෙන්නවුන්විසිනුදු සතතයෙන් විවෙකවත් පිරුව මැනැවැයි වදාළබැවින් තුන්වෙලෙහි ඉ

21. රියව් (සුමනා) සිල් පිරිසිදුකොටැ කාගියාසී ආදිවූ කමටහ- නෙක්හි යෙදී දෙතුන් පලගක් හුණුගන්වා දවස කඩ නො- කොට විවෙකවත් පුරවා අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ යි වදාළ බැවින් තම

22. තමා ද මෙ(කී) ගුණාඟයෙහි වෙසෙසින් යෙදී අත්වැඩ පර- වැඩ සාධමින් කී (වදාළෙන්) ග්‍රන්ථධුරයෙන් වැඩියක් කොටැ ගත නොහෙන අන්තෙවාසික සඩිවිහාරිකයන් ලවා මුල්සිඛ සෙඛියා වත

23. පොත් කරවා සිඛවළඳැවිනිස අස්වා සමසින් සමසැ ආද්‍යන්ත කොටැ සුමනා විචාළ තැනැක කියන්නට පොහොසත් කරවා දසධම් සතතයෙන් මෙනෙහි කරවා යැටකි විවෙකවතුදු

24. පුරවා ගක්තිපමණක් හදාරා නිම්කලැ චරිතානුකූල කම- ටහනක් උගන්වා විදශීනා ධුරයෙහි මා යොදා චතුසම්පජංඤ කථායෙහි වදාළ පරිද්දෙන් දවස් යවනු කොටැ පැවැත්වියැ යුතු

25. හෙරණනුදු හෙරණසිඛ සෙඛිය(ා) දසධම් සුතත් වතපොත් කොටැ අසා නොපිරිහෙළා පරිහරණකරනුකොටැ යොදා විවෙකවතුදු පුරවා හික්මැවියැ යුතු මෙවුන් හැමදෙනාමැගෙ නොහැම්මෙන වැ

26. දු මව්පිය දෙදෙනා හා මෙසෙමැ එක්කුසහොත් කණවැඳැඹු නඟුන් බූනුන් හා සබ්‍රම්සරුන් හා මෙහෙකරුවන් පිණිසැ අහර සිඟා යන ගමනක් හා මෙකීවවුන්මැ රොගී වුව බෙ-හෙදක් හා සබ්‍රම්

27. සරුන්ට බෙහෙත් පස් සිඟා යන ගමනක් හා (පැ-වරූ තැනකට) පිරිතට යන ගමනක් මුත් මෙයින් පිටත් කටයුත්තකට කාලවිකාලයෙහි ඇත්ගමට් සමු නොදියැ යුතු ගිලානාදි කෘත්‍යයෙ

28. ත් පිටතට යන්නවුන්ට සමු දෙත්හොත් අව්‍යක්තයන්ට සමු දෙන උපාධ්‍යායන්ට දුකුළා අයැත් වදාළබැවින් හුදු අව්‍යක්තයන්ටමැ සමු නොදී පොහොපවරුණු හා ආප(ත්ත්‍ය) නාපත්ති(මාත්‍ර)

29. යක් දන්නා ව්‍යක්ත සඟකෙනෙකුන් මුල්කොටැ සමු දියැ යුතු නත් ගණයෙකින් ආ සඟකෙනෙකුන් තමා සමීපයෙහි වසවත හුන් තැනැ ගණ(නෙ)රුන්ගෙන් පතක්

30. හො පැවිදි කෙනෙකුන් දැකැ මුත් නොවැසැවියැ යුතු. සථවිර නව මධ්‍යම හැම සංඝයා විසින් මැ මැන්දින් යැමැ සිති සති සම්පජංඤයෙන් යුතු නින්දි... සෙවුමින් සිරුරු

31. සතපා අලුයැමැ නැඟී කටහන්හි යෙදී හින්දැ සිටැ සක්මන් කිරිමෙන් දවස් ගෙවා පුහුණු ගත් පිරිවහා සිවුරු හැඳැ පෙරවැ දැහැටිකිස

32. නිමවා දහගබ් මාඹො අඟණවතුදු ඇදුරුවත් තෙරවත් ගිලන්වත් සෙනසුන්වත් ඇ කඳුවතුදු සපයා උවනහොත් බොජුන්හල් එළැබැ කැන්දිති වළඳා

33. බොජුන්හලැ වතාවත් නිමවා එක්බිත්තෙහි පත්පොත් බලනුවන් ගෙත්තම් රජන්නම් කරනුවන් පස බෙදනුවන් ඇ ඉක්මන් කටයුතු ඇතියවුන් මුත් සෙස්ස



34. වුන් කැඳිති වැළැඳූ ඉක්බිත්තෙහි කමටහන්හි යෙදි දවස් යවා පස්බත්හිදු කී නියායෙන් ග්‍රන්ථවිදර්ශනා ධුරයෙහි යෙදි ගිහිමිනිස් පැවිජියන් හා සංස

35. නොවැ වත්වෙලා දක්වා දවස් යවා ඉරියව් නොපොහො නා කරුණක් ඇත මුත් වත්පිරිතට ලැබී රැස්වූවන්විසිනුදු සන්නිපතිතානං වො භික්ඛවෙ ඩයං කරණියං ධම්මීවා ක

36. ථා අරියො වා තුණ්හීභාවො යි වදාළ බැවින් ධම්මකථා මනස්කාර දෙකින් පිටත් තිරශ්චීනකථා හා කාම විතර්කකයෙන් නොයෙදී පෙරැ යැමැද බණ කියනු කියවනු අස

37. නු ධරනු ධම්මකථා කිරීම් ඇ නොයිස් පියෙවින් හා විදර්ශනා ධුරයෙන් ගෙවා මැඳින් යැමැ සපත් සඳැ සති සම්පජංඤයෙන් යුත් නින්දි සෙවියැ යුතු පිටත වියැ යුතු කටයුත්තනෙකින් එළ

38. බෙන මඟී පැවිජියන් විසින් පසිලිපැල් පිළිමගෙ ඇ කැපතැනෙක්හි ලැගුම් ගත යුතු හැමැ වෙලෙහිමැ, කිසිසිතින්වත් කෙළිසිතින් වත් නොසරුප් තෙපුල් කිසිවක්හු හා නොබිණියැ යු

39. තු මවුනුදු වුව වි(ෂ) භාගයන් හා ද මලකුදු වූව ළදරු බාලයකු හාද (රහස්හි) නොබිණියැ යුතු වැඩිමහල්ලවුන් නොදන්ව මෙහෙකරුවන්ට දැහැවිලි නොවියැ යුතු වැඩිමහල්ලවුන් නොදන්ව මෙහෙකරුවන්ට දැහැවිලි නො වියැ යුතු තමා අයතියකුදු මහල්ලන් අනුනොදන්ව අන්

40. නට නොදියැ යුතු ග (ම) න් යන්නක්හු විසින් මහලු සඟුන්ගෙ නෙම් නස්නට සුදුසු පිරිකරක් තමා අත්හි ඇත මුත් අතුරෙහි වැසි අවද පියව් ගමනින් මැ නොතෙමෙන තැන් එළැඹියැ යුතු එබඳු පි

41. රිකරක් ඇත සරුප් (...වෙලෙ) වියෙකින්මැ යැ යුතු (න හි එතං න ... තුවෙව... ත... වත්තස්මා හසනං යස්මිං විහිත මත්තන් තං වට්ටති) යි වදාළ බවින් සිනාවට නිසි කරුණෙක්

42. හිදු හඬ නොවිහිදැ මුව වසා සතුටුපමණක් දැක්වියැ යුතු

තම වන වෙහෙර සන්හිඳෙ අධිකරණ බැහැර නොපහළ කට යුතු අන් වෙහෙර සන්හිඳෙන අධිකරණ තමා නො ඉසිලියැ යුතු ය

43. ල්ලේඛං අච්චජන්තේන අප්පමත්තේන භික්ඛුනා කප්පියේපි න කාතබ්බා ආමිසඤ්ඤාය ලෝලතා යි වදාළ බැවින් කැපපසයෙහිදු ලොල්බව් නොකට යුතු දහගබ් මහබො ඈ වඳිමි

44. න් ගඳ දු(ම්මල්) ඈ පුදමින් දැවුටු වළඳමින් පා කස්සෙහි ලමින් නොබිණියැ යුතු ඇත්ගම්හි ගිහිමිනිසුන් හා පසපිළිබඳ කථා ද විසභාග කථාද නොකට යුතු ඉධෙකචෙච්චා සංඝ ග

45. තොපි අවිත්තිකාරකතො ථෙරෙ භික්ඛු ඝට්ටයන්තොපි තිට්ඨති ඝට්ටයන්තොපි නිසීදති ධීතකොපි භණති බාහා වික්ඛෙපකොපි භණති කුමාරස්සපි සිරං පරාමසති යි අනා-චා

46. රනිදේශ (යෙ) හි වදාළ බැවින් සඟමැඳට එළඹියහුවිසිනුදු වෙරින් එව් සිවුරෙන් එව් නොසැටියැ යුතු මහළු සඟුන් හා බිණුවමනා කරුණක් ඇත ආදර දක්වා ඉතා නො ළංවැ නැමී සිටැ අ

47. ත් නොවනා බිණියැ යුතු කිසිතැනෙක්හිදු කොමරුන් වෙර අත්ලා නො සැනැවියැ යුතු පඨන්සෙරෙහි වසනුවනට විබෙවු නොකොටැ හැදෑරිය යුතු පබ්බාජේන්තොසොධෙත්වා පබ්බාජේ

48. ඨසොධෙත්වා උසසම්පාදෙථ සෙධෙත්වා නිස්සයං දෙථ එකො පි හි කුලපුත්තො පබ්බජ්ජව උසම්පදව ලභිත්වා ස(ක) ලම්පි සාසනං පතිඨාපෙත යු බැවින් පික්සා පැවිජි කටයුතු පිරික්

49. සා උපසම්පත්ති කට යුතු පිරික්සා නිස දිය යුතු යහන පමණක් දුහඟ සමාදන් වියැ යුතු මෙකීනාක් වතැ නොරිසින් පවතුකුදු අයුණු නොකියැ යුතු යම් කෙනෙක් මේ කළ කතිකා

50. වත්හි නොහික්මැ වරද (වා) පවතින්නම් තුන් යැලක් දක්වා



වරදට නිසි දඬුවම් කරවා අවවාදකොටැ නැවැතැද එසෙමැ පවතිත්නම් නිස නොදී මසක් දක්වා හිඳුවා විනයානුකූල පැවැ

51. ත්මක් නැතහොත් උත්කෙරෙහි නොබැඳි හැරැවියැ යුතු ගණදෙටු තෙරවරුන් විසිනුදු තමන් තමන්ට යෙදූ ධුරයෙහි පමාවැ සංඝයා හික්මවා නොලාලත්හොත් මහතෙරවරුන් යෙදූ දඬුවම් කට යුතු.

# දඹදෙණි කතිකාවත

අප බුදුන් කල්ප ශත සහස්‍රාධික චතුරසංඛ්‍යාපරිමිත කාලයක් සමතිස් පැරුම් පුරා මාරසංග්‍රාමභූමිවූ මහාබෝධිපර්‍ය්‍යංකාරූඪවැ දුර්වාර සපරිවාර මාර පරාජය කොටැ සර්වඥපදප්‍රාප්තවැ පන්සාලිස් අවුරුද්දක් චාතුර්වීපක මහාමේඝයක් සෙයින් වැඩැ සිටැ අනවරාග්‍රසංසාර වෘත්තයෙහි ක්ලේශාග්නීන් දග්ධවෙමින් සිටි සත්වයන් ධම්මාමෘත වර්ෂායෙන් නිවමින් සකල බුඬ කෘත්‍ය නිමවා කුසිනාරා නුවර අබියෙස්හි මල්ල රාජයන්ගේ සාලවනෝද්‍යානයෙහි නිරුපධිශ්ෂ නිර්වාණධාතුයෙන් පිරිනිවි සාරසිය සූපනස් හවුරුද්දක් ගිය කලැ වළගම්අභා මහරජහු දවස පටන් එක්වාදහස් දෙසිය සූපනද් හවුරුද්දක් භින්න නිකාය වැ ශාසනය පිරිහෙමින් සිටි කල්හි මහාසම්මතාදි පරම්පරානුයාත සූර්‍ය්‍යවංශෝද්භූත රාජාධිරාජ නෙක දික්හි ව්‍යාප්ත යශෝමරීචීන් විරාජමාන ශ්‍රී සංඝබෝධි ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන් සකල ලංකා තෙලෙහි ඒකරාජ්‍යාභිෂේකයෙන් අභිෂික්තවැ විජෘම්භිත පුණ්‍යර්ධි ඇති වැ රාජ්‍යසුඛානුභව කොට වසනුවන් අඥාන දුර්ඥාන මූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂවේග විහතවැ අපාය ව්‍යසනාපන්න වන ශාසනාවචර කුලපුත්‍රයන් දැකැ සුපරිශුධ බුද්ධශාසනයෙහි මා වැනි ආඥා චක්‍රවර්තියක්හු මෙවැනි කිලුටක් දැකැ දැකැ උදාසීන වුවහොත් බුදුසස්න නස්සි බොහෝ සත්හුදු අපායභාග් වෙති. පස්වාදහසක් පවත්නා බුදුසස්නට මා වහල්වුව මැනැවැයි ප්‍රඥා පුරස්සර කරුණායෙන් සඤ්චෝදිත හෘදය ඇති වැ මෙසෙසු නට සසුන් කවුරුන් වහල් කොට එවා පන්වාදහසක් පවත්නා පරිද්දෙන් පරිද්දෙන් කෙරෙම්දෝහොයි සිතා අඛණ්ඩාච්ජිද්‍රතාදි විවිධ ගුණ ගණාංග සංගත කොට රක්ෂිත වර්ධිත පොෂිත ශීලස්කන්ධාදී ලෞකික ගුණරත්නාලංකාරයෙන් සමලංකෘත වූ උදුම්බරගිරිවාසී මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහාවිහාරවාසී මහාභික්ෂු සංඝයා දැකැ ඔවුන් වහල් කොට බුදුන් විසින්

අනුඥාත මොග්ගලීපුත්තතිස් මහතෙරුන් වහල්කොට අනේක සහස්‍ර පාපභික්ෂූන් නිම්මථනය කොට දුල්බ්ධි මැඩැ ශාසන මල විශොධා තෘතීය ධම්මසංගායනා කැරැවූ ධම්මාශොක මහරජහුමෙන් අනේක ශත පාප භික්ෂූන් ශාස්තෘශාසනයෙන් අපගත කොට ෂඩභිඥාද්‍යනෙක ගුණගණෝපේත මහා කෂීණාශ්‍රවයන් ඇති කල්හිදු පවා පූර්වරාජයන් විසින් මහෝත්සාහයෙන් සමඟ කොට ගත නුහුණු තුන්නිකා සමඟ කිරීමෙන් එක්නකා කොට ජේතවන මහාවිහාරාදී නොඑක් මහඇගි විහාර ලක්දිවැ තන්හි තන්හි කරවා එහි අනේක සහස්‍ර සංඛ්‍යා ඇති මහාසංඝයා වාස කරවා නිරන්තර ප්‍රවෘත්ත ධම්මාමිෂ දානයෙන් උපස්ථාන කෙරෙමින් සංසදශීන ප්‍රභව ප්‍රීතිප්‍රාමෝද්‍ය රසාස්වාදයෙහි ලොලවැ කාලානුකාලයෙහි පෞෂථාඟ ශීල සමුපේතවැ විහාරයට එළඹැ සංඝමධ්‍යගත වැ තත් දශීන ප්‍රසූත ප්‍රීතිප්‍රාමෝද්‍ය රසාස්වාද කොට මා විසින් මහෝත්සාහයෙන් සාධිත වූ සංඝ සාමග්‍රිය පස් වාදහසක් අභින්නවැ පවත්නා පරිද්දෙන් මතුවන සංඝයා ද අප්‍රමාද වැ ග්‍රන්ථ විදශීනාධුරයෙහි යෙදී අල්පේච්ඡතාදී ගුණයෙන් යුක්තවැ වසනා පරිද්දෙන් අවවාද අනුශාසනාකොට ශාසනය රක්ෂා කළ මැනවැයි යුක්ත ව්‍යක්ත ගුණෝපෙතවැ කරන ලද ආරාධනා අසා මහාකාශ්‍යප මහාස්ථවිරවර ප්‍රමුඛ ස්ථවිරවරයන් විසින් ප්‍රමාදවිහාරීන් අවකාශ නොලබනු සඳහා ධර්ම විනය සංසන්දනය කොට ඇජරොල් නොවිහිදැ කළ කතිකාවත එම මහරජාණන් ස්වර්ගස්ථ සංවත්සරයෙහි පටන් සතිස් හවුරුද්දක් ඇතුළත ඔවුන් වැනි ශ්‍රඬාබුඬි සම්පන්න මධ්‍යස්ථ ශසන පක්ෂපාත අන්කිසි රජක්හුගේ නොපැළඹීමෙන් යටවූ දවසට වඩා පැමුණුණු අඥාන දූර්ඥාන මූලික අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂවේගාතිශයෙන් වඩා විහතවැ අපාය ව්‍යසනාපන්නවන ශාසනාවචර කුලපුත්‍රයන්ගේ බාහුල්‍යය දැකැ ඔවුන්ට විය යුතු වැඩ තකා තත්කාලානුකූල අමුතු කතිකාවතින් සරහා ලෝකශාසන විලෝපකාරී වූ දෙමළ සේනාවෙහි භයින් පුලස්ති පුරා දී පුරාතන ස්ථානයෙන් ඉගිළැ බොහෝ සේ පත්පොත් ආදී පිරිකරතුබූ තැන හැරැ ශරණානෙවෂීවැ මායා රටට පැමිණි මහාසංඝයා වහන්සේ කෙරෙහි උපන්නොඑක් විවාද මහෝත්සාහයෙන් සන්හිඳවීමෙන් හා දළඳා පාත්‍රා ධාතුන් වහන්සේ මහත් උපාය උත්සාහ ශක්තීන් ගෙනැ හැරැ නානා චිත්‍රයෙන් විචිත්‍ර කොට කරවන ලද ත්‍රෛභූමක දංෂට්‍රාධාතු මන්දිරයෙහි



වඩා හිඳුවා නිරන්තර කරන පූජා සත්කාරයෙන් හා ආඪ්‍ය දරිද්‍ර අනේක ශත ප්‍රමාණ කුලයන් සුදුසු පරිද්දෙන් රැකීමෙන් හා ලෝකශාසනයට මහෝපකාරී වූ විජයබාහු වත්හිමියන් විසින්තන්හි තන්හි කරවන ලද විහාරයන් අතුරෙන් විජයසුන්දරාරාම විහාරයෙහි වැඩැහිඳැ ශාස්තෘ ශාසනාභ්‍යුදයකාරී ශාරිපුත්‍ර මහාස්වාමීතත්කාල ශාසනානුශාසක සංඝරක්ෂිත මහාස්වාමී මේධංකර මහාස්ථවිර ප්‍රමුඛ ග්‍රාමවාසීවූද උදුම්බරගිරිනිවාසී මේධංකර මහාස්ථවිර ප්‍රමුඛ වනවාසික වූද මහාසංඝයා විසින් ධර්ම විනය සංසන්දනය කොට ඇජරොල් නොවිහිදැ කළ කතිකාවත බොහෝ සේ සංඝයාවහන්සේ පවතිමින් සිටි කල්හි එමැ විජයබාහු වත් හිමියන්ගේ අභිජාත පුත්‍ර වූ ශත්‍රැපඩික සවිශේෂ විශෝෂණයට ශරත් මාර්තකණ්ඩ මණ්ඩල වූ ජින ශාසන ක්ෂීර සමුද්‍ර සමුල්ලාසයට පූර්ණචන්ද්‍රානුකාරිත්වයෙහි සාතිශය සාමර්ථ්‍ය ඇති පරාක්‍රමබාහු මහරජාණෝ තමන්ගේ පුණ්‍යර්ධි ප්‍රභාවයෙන් නොයෙක් ද්‍රවිඩ කේරළ යාවකාදී වියවුල් සන්හිඳුවා සකල ලංකාතලය හස්ත ගතකොට රාජ්‍ය ශ්‍රී අනුභව කෙරෙමින් ශ්‍රී වර්ධන පුරාදි නානා ස්ථානයෙහි ප්‍රතිමාගෘහ ප්‍රාසාද චංක්‍රමණ ප්‍රාකාර ගොපුරාදීන් සමෘඬ වූ සංඝාරාම කැරැ වීමෙන් හා බොහෝ සංඝයාවහන්සේට චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය ප්‍රදානයෙන් හා විසිතුරු කොට කරවන ලද රජතමය චෛත්‍යාභ්‍යන්තරයෙහි නානා රත්නවිභූෂිත ස්වර්ණකරණ්ඩයෙහි දළඳා පාත්‍රා ධාතුන් වහන්සේ වඩා ස්තතායෙන් කරන ලද පුෂ්පධූපාදි පූජායෙන් හා තමන්ට ද බොහෝ ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්ට ද අපරිමිත පුණ්‍යරාශි වර්ධනය කෙරෙමින් වසනුවෝ ඒ ඒ තැන ප්‍රමාදව වසන ශාසනාවචර බොහෝ පුද්ගලයන්ගේ ශාසන පරිහානිකරවූ අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති බාහුල්‍යය දැනැ වත්හිමියන් වහන්සේ විසින් මහෝත්සාහයෙන් සෙමෙහි තබාලූ ශාසනය මා දවස මෙලෙස වීම අනුචිතවේදැයි සිතා ග්‍රාමරණ්‍යවාසී කාරක සංඝයා වහන්සේ රැස් කරවා සංඝ මධ්‍යගතවැ කල්‍යාණධ්‍යාශයෙන් යෙදී ශාසනාභිවෘද්ධිය පිණිස ආරාධනා කොළෝය. ඒ අසා ශාසනොපස්තම්භකාරී අර්ථානුගත වනරතනාභිධාන බුඩවංශ මහා ස්ථවිරපාදයන්ගේ ප්‍රධාන ශිෂ්‍ය තත්කාල ශාසනානුශාසක ආරණ්‍යක මෙධංකර මහාස්වාමි ප්‍රමුඛ ග්‍රාමරණ්‍යවාසී කාරක මහා සංඝයාවහන්සේ විසින් පූර්ව කතිකාවත් බහා අමුතුකළ කතිකාවත මෙසේ දත යුතු.

CS CamScanner

"පබ්බාජෙන්තො" සොධෙත්වා පබ්බාජෙථ සොධෙත්වා උපසම්පා දෙථ සොධෙත්වා නිස්සයං දෙථ එකොපි හි කුලපුත්තො පබ්බජ්ජංච උපසම්පදං ච ලභිත්වා සකලම්පි සාසනං පතිඨාපෙති යි වදාළ බැවින් ප්‍රවුජ්‍යාපේක්‍ෂ වැ ආ කුලපුත්‍රයෙකු ඇත. ඔහු ඇණවුම් සකස්කඩ සතර බණවර ධම්පියා පුහුණුකරවා ලියන කියවනසේ සකසා උගත්වා ගණ සංගණිකා හස්සාරාමතාදියෙන් තොරකොට වත පිළිවෙත යොදා එදා මහණවූ කෙනෙකුන් කෙරෙහිද බලවත් ආදර ගෞරව ඇතිකොට කිසි නුගුණයක් නොඅසන ලෙස ශික්ෂිත කොට වඩා යටත් පිරිසෙයින් තෙර තුන්නමක් ඇතුළුවූ සෙසු උපයුක්ත සංඝයා මධ්‍යයෙහි ජාතිගෝත්‍ර විචාරා විධානයෙහි සිටියවුන් දැක්වූ කල උන් විසින් සියල්ල විචාරා රෝග බලා ලීම කියවීම් බලා නායක තැන් දක්වා සියල්ල සැලකොට කුලදෝෂයක් ක්‍රියා දෝෂයක් නැතැයි දන්නා සඟ කෙනෙකුන් ප්‍රතිඥා කළ කල ගම්වාසයට යටත් පිරිසෙයින් දොළොස් හැවිරිදි වයස්වූ හවුරුද්දට හා වනවාසයට තුදුස් හැවිරිදි වයස් වූ හවුරුද්දට වැදවූ කල නායක තැනින් උපධ්‍යාය විය යුතු තැනට සුදුසු අවවාද කියා පාවාදිය යුතු.

නො සම්මතයේ මහණකළ තෙරුන් වහන්සේ කෙරෙන් මහණ කළ නම අනික් තැනක ලිය යුතු, නැත උත්තේ දඬුවම් කැරවිය යුතු. ප්‍රතිඥාවිරෝධයක් දුට විනය විරෝධයට සුදුසු සංවාස සම්භෝග වළකා උත්තේ දඬුවම් කරවා බඩතුරු සුදුසු කෙනෙකුට පාවාදිය යුතු.

උන් විසින් පණ්ඩුපලාසයා කාගියාසී සේඛියා චතුපාරිසුධිසිල සතර කමටහන් පුහුණු කරවා අස්වා ශික්ෂිත කොට පණ්ඩුපලාසයන් කෙරෙහි බුදුන් වදාළ ලෙස පිළිපැද කල්කිරුණු කල ඒ ගෙණෙහි සංඝයා රැස්කරවා මහණ කතිකාවත කියවා ගුණ උපන්කළ මහණ කටයුතු.

උපජ්ඣායමූලිකා පබ්බජ්ජාච උපසම්පදාච උපජ්ඣායො ච තත්ථ ඉස්සරෝ න ආචරියෝ යතු හෙයින් තමහට භාර බැවින් අප්‍රමාදව උන් අභිසමාචාරයෙහි විශේෂයෙන් යොදා හෙරණසිඛ යෙහි කී පරිද්දෙන් හික්මවා ග්‍රන්ථ විදර්ශනා ධුරයෙහි අප්‍රමාදකොට වස්වා මතු බුදුසස්න රක්නා ලෙස වර්ධනය කටයුතු.



හවුරුද්දකට අඩුකලක් සමීපයෙහි විසුවද බොහෝ දෙනා දන්නා පරිද්දෙන් සැපත් හැර සැදැහැයෙන් පැවිදිවියටිවැ ආ කෙනෙක්වූ නම් ඇණවුම් සකස්කඩ සතර බණවර ධම්පියා පුහුණු කරවා පෙර කී ලෙස ම ජාතිගෝත්‍ර විචාරා රෝග බලා නායක තැන් දක්වා වඳවා කතිකාබණ පුහුණු කරවා පැවිදි දියයුතු.

පසුව හෙරණසිඛ වනපොත් කොට එයින් කාගියාසී සතර කමටහන් සේඛියා චතුපාරිසුඩි සීලයත් සකස් කොට වනපොත් තබා පොහොයෙන් පොහොයේ වනපොත් දී සිල්ගත යුතු.

පසුව කල්බලා සමාදන්වූ ධුතාංගයෙන් යටත් පිරිසෙයින් තුනක් විවර රැකැ තමහට නිසි වත්පිළිවෙත් නොපමාව වැඩියෝ නම් යටත් පිරිසෙයින් හවුරුද්දක් බඩතුරේ විසූනම් ග්‍රන්ථ විදර්ශනාධුරයෙහි අප්‍රමාද වූ නම් ඒ ගෙණෙහි සංඝයා මධ්‍යයෙහි මහලු පැවිදි කතිකාවත කියවා ගුණ උපන් කල මහලු පැවිදි කටයුතු. එවටම සංඝාදිසේසය ද පටිග්ගහණ සිඛය ද ඉගැන්විය යුතු.

උපසම්පදාව නම් ශාසනස්ථිතියට මුල්වූ ගරුකර්මයක් බැවින් තත්කාලශාසනානුශාසක තැන් මැදැවැ හෝ එතැන් විසින් ඇණවන ලද ව්‍යක්ත විනයධරයන් ඇතිවැ රාජසම්මතයෙන් මිස නානා ස්ථානයෙහි උපසම්පදාව නොකටයුතු.

හෙරණුන්ට හෙරණසිඛ වනපොත් කොට අසා නිමවනතුරු මහලු පැවිද්දන්ට මහලු පැවිදි බණ වනපොත් කොට අසා නිමවනතුරු සන්නිකාවචර කටයුතු බැවින් ඔබ්බකට සමු නොදියයුතු.

මහලු පැවිද්දන් විසින් මුල්සිඛ කතිකාබණ සකස්කොට වනපොත් තබා පොහොයෙන් පොහොයේ වනපොත් දී සිඛවළඳ විනිස අසා නිමවා සමසින් සමඟ ආද්‍යන්තකොට සමනා විචාළ තෙනක් කියන ලෙස සකස් කොට සිතට නඟා පරිහරණය කටයුතු.

නිශ්‍රයමුක්ත බාහුශ්‍රැතයට සුදුසු බණ සටීකාකොට අසා නිමවා කල්පිරුණහොත් ගුරුන් විසින් උන්ගේ ධුතාංගධාරත්වාදී බොහෝ ගුණ කියා නායක තැනට පාවා දුන් කල උභය ප්‍රාතිමෝක්ෂ කුදුසිඛ අත්ථසඞ්ග්‍රහ පරිහරණය කරන ව්‍යාකරණ

සුතුරු ධාතුපාඨාත්පියෙහි අසම්මුඪවැ ඉගෙන වනපොත් දුන් කළ කංඛාවිතරණියෙන් තුන් තැනක් හා ඉතිරි සත් පොතින් එකි එකී තැන් පරික්ෂා ගෙනැ නිශ්‍රය මුක්තාංග වනපොත් ගෙනැ මෙසේ ගුණ නුවණ පරික්ෂා කොට නිශ්‍රය මුක්ත සම්මුති දිය යුතුී සම්මුති ලත්පසු එතැන් පටන් ප්‍රාතිමෝක්ෂාදි යටකි බණ වන පොත් ලබා කලින් කල සඟ මැද වනපොත් දි යුතු.

"භවිස්සන්ති භික්ඛවේ භික්ඛු අනාගතමද්ධානං අභාවිතකායා අභාවිතසීලා අභාවිත චිත්තා අභාවිත පඤ්ඤා තෙ අභාවිතකායා සමානා අභාවිතසීලා අභාවිත චිත්තා අභාවිත පඤ්ඤා අඤ්ඤෙ උපසම්පදාදෙස්සන්ති. තෙපි භවිස්සන්ති අභාවිතකායා අභාවිත සීලා අභාවිත චිත්තා අභාවිත පඤ්ඤා" යනාදීන් වදාළ බැවින් භාවිතකායත්වාදියෙන් යෙදී "භවිස්සන්ති භික්ඛවෙ භික්ඛු අනාගත මද්ධානං අභාවිතකායා - පෙ - අභාවිත පඤ්ඤා තෙ අභාවිතකායා සමානා - පෙ - අභාවිත පඤ්ඤා ථේරා භික්ඛු බාහුලිකා භවිස්සන්ති සාථලිකා ඔක්කමනේ පුබ්බංගමා පවිවෙකේ නික්ඛිත්තධුරා තේසං පච්ඡිමා ජනතා දිඨානුගතිං ආපජ්ජන්ති" යනාදීන් වදාළ බැවින් බාහුලික සාථලිකාදි වීමෙන් පශ්චිම දෘෂ්ටානුගතියට නොපමුණුවා හැමලෙසින් ගුණවත්වැ සිල්වත්වැ පර්ෂද්‍රපස්ථාපක බාහුශ්‍රැත්‍යයෙන් සම්පන්නවැ විසුවහොත් උන්ගේ ධූතාංගධරත්වාදී බොහෝ ගුණකියා ගුරුන් විසින් නායක තැනට පාවාදුන් කල යටත් පිරිසෙයින් තෙර බණ සටිකා කොට අසා නිමි පස්වනු හවුරුද යටකී උභය ප්‍රාතිමෝක්ෂාදි වනපොත් ගෙනැ පරිජි පචිති දෙපොතින් තුන් තැන් හා ඉතිරි පස් පොතින් එකි එකි තැන් පරික්ෂා ගෙනැ ස්ථවිරාංග වනපොත් ගෙනැ මෙසේ ගුණ නුවණ බලා ස්ථවිර සම්මුතිදී ගණ පරිහරණයෙහි යෝග්‍යවුවහොත් ගණ පාවාදිය යුතු.පසු යටකී උභය ප්‍රාතිමෝක්ෂාදී බණ වනපොත් නොපිරිහෙළා කලින් කල සඟ වනපොත් දිය යුතු.

ස්ථවිර නව මධ්‍යම ඇම්දෙනා විසින් මැ අනුමාන සූත්‍රය හා දසධම්ම සූත්‍රය දවසකට එක් විටෙක වී නමුත් බාධා නොකොට මෙනෙහි කටයුතු.



කලෙක කටයුතු අවවාද පමණක් පවා තකා උපායාන්තරයෙන් නොතරමුන්ගේ ප්‍රවේශ පරිත්‍යාගය පිණිස "අනුජානාමි භික්ඛවේ අඨංගේහි සමන්නාගතං භික්ඛුං භික්ඛුනෝවාදකං සම්මන්නිතුං සීලවා හොති" යනාදීන් වදාරා දුකසේ සුදුස්සවුන් සොයා බලන පරිද්දෙන් තබා වදාළ බැවින් මේ විනය යුක්තීන් ප්‍රාතිමෝක්ෂ සංවරශීලය ඛණ්ඩිභාවයට නොපමුණුවා රක්ෂණඛයෙන් සමන්නාගතවැ මිච්ඡාජීවක පටිසේධක වෛද්‍යනාදී රහිත ආචාරයෙන් ද ශ්‍රද්ධා සම්පන්න කුලාදී ගොචරයෙන් ද සම්පන්න සත්පුරුෂ සංසේවා සදාදරයෙන් පිටකත්‍රය ඉගැන්ම නැතිවැ පිටත්‍රය පරිහානියෙන් ශාසන පරිහානිවෙමින් සිටි බැවින් සද් ගුරුන් කෙරෙන් සාත්ථකථා පිටකත්‍රය ඉගැන්මෙන් බහුශ්‍රැතව ඒ ශ්‍රැතය අනන්‍යාකායත්වැ ළෙහිලා ධැරීමෙන් ශ්‍රැතධරවැ ඒ ධාරිතය චිරකලායෙනුදු අවිනාශනයෙන් ශ්‍රැත සන්නිචයවැ

"පියෝච ගරුභාවනියෝ වත්තාච වචවනක්ඛමෝ
ගම්භීරං ච කථං කත්තා නො චඨානෙ නියෝජයේ යි"

කියන ලද පරෝපදේශක ගුණයෙන් නොපිරිහී අචල කායවාක් සමාචාරයෙන් සමෘද්ධවැ බාහුලික සාථලිකාදී නොවැ කම්මාරාම භස්සාරාම නිද්දාරාම ගණසංගණිකාරාමයෙන් විරතවැ විවේකකාමීවැ

"අත්තානමේව පඨමං පතිරූපේ නිවේසයේ
අථඤ්ඤ මනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ" යි

වදාළ ලෙසින් පිළිපැද මධ්‍යස්ථවැ නායක තැනට අනුකූලවැ වසන කෙනෙකුන් විසි පස් පිරුණ හොත් තුන් රජයේ සංඝයාගේ අනුමතියෙන් ත්‍රි සිංහලයට එකාතපත්‍රවැ රජ කරන මහරජාණන් ලවා වැඩවා මහා ස්ථවිර පදෙවිය දී ගම්වාසයට මාහිමියන් වහන්සේට ඉක්බිති කොට තිබිය යුතු.

මෙකී ගුණනුවණ ඇතිවැ ආරණ්‍යක සියල්ලන්ට වඩා ආරණ්‍යක ප්‍රතිපත්තියෙහි යෙදී සිටිලු ආරණ්‍යක සංඝයාට ආදර්ශවැ සිට උන් ඒ ඒ පිළිවෙත යොදාලියහෙන තෙනක් යටකී පරිද්දෙන් මහතෙර කොට වනවාසයට මාහිමියන් වහන්සේට ඉක්බිතිකොට තිබියයුතු.

බහුනායකත්වය නම් ශාසන විලෝපනයට ඒකාන්ත හේතු බැවින් මේ මහතෙර දෙතෙන මුත් අන් කිසියම්ම තෙනක් මහතෙර නොකටයුතු. මාහිමිතෙන අයාමෙක වුවමනාවී නම් මෙ දෙතෙනින්ම යෙදෙන තෙනක් එලෙසින් මාහිමි කටයුතු.

ගුණනුවණ ඇති දරුගම් වටනා පස ආදියේ නුහුණු ලාභ ගරුක නොවන ශාසන පක්ෂපාත තුන් රජයෙහි සංගමු ගණවැසි ගම් ප්‍රසිද්ධ බැවින් ඒ ගම්හි අඛණ්ඩ සන්තතින් ආ ශික්ෂිත තෙර තනතුරු පත් කෙනකුන් නායක තෙන අදහසින් සංඝ සම්මුති රාජ සම්මුතීන් අයතැනට පැමිණවිය යුතු.

මෙ තරම්වූ තෙනක් නිශ්‍රයමුක්ත වුවද මුළ කැමති වුවද අයතැන් වැළතට හා මාතෙරුන් මුළ නැදි පිරිවෙන් ආදි වූ බලවත් පිරිවෙන ද සංඝ සම්මුති රාජ සම්මුතින්ම තැකිය යුතු.

සෙසු නොයෙක් දරුගම් වටනා පස ඇති පිරිවෙනට සුදුසු ගුණ නුවණ ඇති බඩතුරු ආභිසමාචාරිකයෙහි යොදා හික්මවිය ගෙන තෙරනිසමුක්ත කෙනෙක්ම නායකතැන් දක්වා ලිය යුතු.

ගණදෙටු තෙරුන් විසින් තම තමා නිසා වාසය කරන අන්තේවාසික සද්ධිවිහාරිකයන් අතුරෙන් නිසදෙන්නට නිසයෙන් මිදෙන්නට යොග්‍යවූ වසනවුන් ග්‍රන්ථධුරයෙහි යොදා යටත් පිරිසෙයින් යටකී උභයප්‍රාතිමෝක්ෂාදිය පිරිහෙළිය නොදී ගණ සංගණකාදින් දුරුකොට ග්‍රන්ථ ධුරයෙහි යෙදෙන්නවුන් විසිනුදු සතතයෙන් විවේකයත් පිරුව මැනවැයි වදාල බැවින් තුන්වේලෙහි ඉරියවු සමනා කාගියාසි ආදිවූ කමටහනෙක්හි යෙදී අත්වැඩ පරවැඩ සැධිය යුතු කී පරිද්දෙන් ග්‍රන්ථධුරයෙන් වැඩියක් කොටගත නොහෙන අන්තේවාසික සද්ධිවිහාරිකයන් ලවා යටකී විවේකවත් පුරවා ශක්ති පමණින් හදාරා නිමිකල චරිතානුකූල වූ කමටහන් උගන්වා විදර්ශනාධුරයෙහි යොදා චතුසම්පජඤ්ඤ කථායෙහි වදාළ පරිද්දෙන් කැරවිය යුතු.

ස්ථවිර නව මධ්‍යම හැමදෙනා විසින් ම වැදූ මවුපියන් දෙන්නාට හා ඔවුන්ගේම කුසෙහි ඔත්තවුන් ඇත ඔවුන්ට හා තමා හා එක කුසෙහි හොත් කනවැන්දඹු නඟුන් බුනුන්ට හා



සබ්‍රම්සරුන් මෙහෙකරුන් පිණිස අහර සිඟායන ගමනක් හා මෙකිවුන් රෝගීවුව උන්ට බෙහෙත් හා සබ්‍රම්සරුන්ට බෙහෙත් පස සිඟා යන ගමනක් හා පැවරූ තෙනකට පිරිතට යන ගමනක්මුත් අනුකිසි කටයුත්තකට කාල විකාලයෙහි ඇත්ගමට නොයායුතු. ගිලානාදී කෘත්‍යයෙන් සමු දෙත්හොත් අව්‍යක්තයන්ට සමුදෙන ආචාර්යය උපාධ්‍යායන්ට දුකුළා අවැත් වදාළ බැවින් පොහෝ පවුරුණු ආපත්ති අනාපත්ති මාත්‍රයක් දන්නා ව්‍යක්ත සඟ කෙනෙකුන් මුල්කොට සමුදිය යුතු. ඔවුනොවුන්ට රක්ෂාවන ලෙස වැඩිමාලු තෙනක් ඇතිවමුත් බාලයන් හැර ගෙනැ ඒ ඒ තෙනට නොයා යුතු.

නන් ගණයෙකින් ආ සඟකෙනෙකුන් තමා කෙරෙහි වස්වත් හොත් ගෙණෙහි තෙරුන්ගෙන් සම්මතයක් හෝ පත්කඩක් හෝ පැවිදි කෙනකුන් දැකමුත් නොරැඳ විය යුතු.

කටයුත්තකින් එළඹෙන මඟී පැවිද්දන් විසින් පසිලිපැල් පිළිමගේ ඈ කැපතෙනෙක්හිම ලැඟුම් ගත යුතු.

හැම වේලෙහිම කිපි සිතින්වත් කෙළනා සිතින්වත් කිසිවක්හු හා නොබිණියයුතු.

මවුනුදු වුව පිළිසන් තෙනකවත් පිළියෙහිවත් විසභාගයන් හා තනිවැ සිට නොබිණිය යුතු.

යටත් පිරිසෙයින් මවුන් කන තුබූ පතකුදු භාණ්ඩාගාරික ශීර්ෂයෙන් පටිසාමනය නොකටයුතු.

වැඩිතරම් කටයුත්තකමුත් දෙමසින් වඩා ආචාර්ය උපාධ්‍යායන් කෙරෙන් වියෝ වැ සෛවරීවාස නොකටයුතු.

සම්මතයක් ලද තෙනක්මුත් ඒ ඒ තෙන අසම්මත වැ බණ නොකිය යුතු.

ගෘහස්ථයන්ට සොලෝ ආදිය බැඳ නොකිය යුතු.

කාව්‍ය නාටකාදී ගර්හිත විද්‍යා තමා නුගතයුතු. අනුනුන් නුගැන්විය යුතු.

වැඩිමහල්ලන් නොදන්වා මෙහෙකරුවන්ට දැහැවිලි නොවියයුතු.

තමා අයති දෙයකුදු මහල්ලන් අනු නොදන්වා අනුන්ට නොදිය යුතු.

ගමන් යන්නක්හු විසින් මහලු සබ්‍රම්සරුන්ගේ තෙමී නස්නට නිසි පිරිකරක් අත්හි ඇත්මුත් අතුරෙහි වැසි ඇතද පියවි ගමනින්ම නොතෙමෙන තෙනකට එළඹියයුතු එබඳු පිරිකරක් ඇතද සරුප් වෙලෙවියකින්ම යායුතු.

"කෝමාරකමිදං භික්ඛවේ අරියස්ස විනයේ අතිවේලං යදිදං දන්තවිදංසකං හසිතං" යි වදාළ බැවින් සිනාවට නිසි කරුණෙක්හි බාලයන්සේ දත් වැහැරැ හඬ විහිද සිනානොසී මුව වසා සතුටු පමණක් දැක්විය යුතු.

තමා වසන වෙහෙර සන්හිඳෙන අධිකරණ බැහැරට නොපහළ කටයුතු. අන්වෙහෙර සන්හිදෙන අධිකරණ තමා නොඉසිලිය යුතු.

"සල්ලේඛං අචිවජන්තේන අප්පමත්තේන භික්ඛුනා
කප්පියෙපි න කාතබ්බා ආමිසත්තාය ලොලතා" යි
වදාළ බැවින් කැපපසයෙහිදු ලොල්බව නොකටයුතු.
දහගබ් මහබෝ අමදිමින් ගඳ

දුම්මල් ඈ පුදමින් දැහැටු වළඳමින් පා කස්සේ ලමින් පබිට නොබිණියයුතු.

ඇත්ගම්හි ගිහිමිනිසුන් හා පස පිළිබඳ කථාද පිටත් කථාද නොකටයුතු.

"ඉධේකච්චො සඞ්ඝගතෝපි අචිත්ති කාරකතො ථෙරේ භික්ඛු ඝට්ටයන්තෝපි තිසීදති ඨිතකොපි භණති බාහා වික්ඛේපකෝපි භණති - පෙ - කුමාරකස්සපි සිරං පරාමසතී" යි අනාචාර නිර්දේශයෙහි වදාළ බැවින් සඟ මැදට එළඹියහු විසින් සබ්‍රම්සරුන් වෙරින් එව් සිවුරෙන් නොඝැටියයුතු මහලු සඟුන්

අෂ්ටවිධවූ කඨිනනෝද්ධාර මාතෘකාව ද පඤ්චවිධ ආනිසංසය ද සකස්කොට ඉගෙනැ උගන්වා පැවැත්තයුතු.

වැඩිතරම් ලාබයක් ලද තැන් විසින් ඒ ලාභයෙන් අන්තේවාසිකාදීන්ට සිවුපසයෙන් එාසු කොට පර්යාප්ති ප්‍රතිපත්තියෙහි යොදා තමාත් බුදුස්නත් රක්නාලෙස කරත්මිස ක්‍රයවික්‍රය කොට කැප අකැප දෙය රැස්කොට තමාත් ඇසුරුකළවුනුත් නොනැසියයුතු.

දැස්දස් කෙත්වත් වැවු ගෙරි මී ආදියක් පිළිගන්නාකල ලජ්ජි පෙගල ශික්ෂාකාමී නුවණැති කෙනෙක් හා කථාකොට එතැන් කී පරිද්දෙන් පිළිගතයුතු.

උපාසකවරුන්ගේ පසය වළඳාවත් නොවළඳාවත් කෙළින් සිවුරු අටපිරිකර ආදී කිසිවක් ගෙන්නම් රැඳීම් ආදී කොට නොදිය යුතු.

ගම ගෙවල් පිළගෙන එකරැයකුදු වාසය නොකටයුතු
සිවුරු ආදි කිසිවක් ක්‍රයවික්‍රය නොකටයුතු

යම් කෙනෙකුන්ගේ ප්‍රමාදයෙක් පෙනේ නම් ඇමදෙනා එක්වැ ගෙනැ උන් ප්‍රමාදයෙන් වළක්නා ලෙස කරත්මුත් දෙපක්ෂයව ගෙනැ උන්ටත් සස්නටත් අවැඩවන ලෙස නොකටයුතු

උපාසක ජනයාට පිළියම් ආදි ආවර මේවර කොට කුල දූෂණය නොකට යුතු වටවිල් ආදි කස් ලෝ වට ලෝහ භාණ්ඩ සාංඝික කොට විහාරයේ තබා අනුභව කරත්මිස යන එන තෙනට ගෙනැගොස් පරිභෝග නොකටයුතු.

සිරක්නා සිරක්නී උපාසක උපාසිකාවරුන්ට ගුණසාගරය දානපතිය යනාදී නම් තිබීමෙන් පොලොබාගෙන එතෙන පටන් යම්ම ලාභයක් අනික් තෙනකට පිරි නැමුවාත් නොනැමුවාත් තමාටම එළවන නියායෙන් කොට ජීවිකා කිරීමෙන් තමාත් තමා ඇසිරු කළවුනුත් නොනැසිය යුතු.

හුදලු වැ පොරෝ ආදිය පුද්ගලික කොට පරිහරණය නොකට යුතු. දෝලි ආදි යානයන් පුද්ගලික කොට අනුභව නොකටයුතු.



නොයෙක් විකාර ඇති කිලිලවට අඳුන්කරඬු ආදිය පරිහරණය නොකටයුතු. මොනර පිල් ආදියෙන් පිරියම් කළ වහන් ඒ නිරවශේෂ කොට හැරැමුත් පරිභෝග නොකටයුතු.

කුලදරුවන් මහණ කරවම්හයි ශාසනමය නොදන්නා සැදැ ඇති කුලයන් පෙලොබාගෙන සිවුරු පිළි ආදිය ලැබගෙනැ ඉන් සිවුරු කොට හෝ නොකොට හෝ මහණකරවා ගෙනැ එතැන් පටන් සිවුරු පිළි දුන්නුන් දෙමාපිය තනතුරේ තබා දීමෙන් කැමෙන් සුවඳුක් බැලීම් ආදිය කරවා මහණවූ සඟුනුත් තමාත් පශ්චිම ජනතාවත් නසා ශාසන දූෂණය නොකටයුතු.

මහලු සබ්‍රම්සරුන් කෙරෙහි පිරියයුතුවත් බුදුන් වදාළ ලෙස පුරා වාස කටයුතු. අන්තේවාසික සද්ධි විහාරිකයන් විසින් ආචාර්ය උපාධ්‍යයන්ට කළමනා වත් නොපමාව කටයුතු. ගිලන්වූව උන්ට කළමනා වතුත් ආචාර්යඋපාධ්‍යායන් නොපමාව කටයුතු.

මහලු පැවිදි තෙර නිසමුක්ත පිරුවන් මුළු පූජාකරවම්හයි තුසුදුසු පරිද්දෙන් නොඑක්දෙන සමාදන්කරවා වියන් පිලි බෙර ආදිය නොසැපවිය යුතු.

චීවරාදියෙහි ආශායෙන් මහණ මහලු පැදිකොට අනුන්ට නොදියයුතු.

ගිහිපටිසංයුත්තය නම් ගිහින් ක්‍ෂමාකරවා දෙසුව මනා බැවින් යටත් පිරිසෙයින් සමීපයෙහි වසන අභියුකත්යාටත් ජාත්‍යාදීන් සටා නොබිණිය යුතු.

අරුණින් පරිච්ඡින්නවූ යම්ම විනයසූත්‍රාන්තගත පිළිවෙතක් පුරණ කළ කාර්යාවසානයෙහි යටත් පිරිසෙයින් එක් දෙපැයකින් අරුණු නැගෙන ලෙසමුත් අරුනෝද්ගමනා සන්නයෙහි නොකටයුතු.

යම් තෙනෙක ලැගුම් ගෙයක් කරවා ඉඳුන්හොත් විහාර පරික්ෂේපය හා ග්‍රාම පරික්ෂේප මධ්‍යයෙහි යටත් පිරිසෙයන් දෙක-ටසනක් පමණ අවසර හැරැ කරවාගෙන විසිය යුතු. එසේ වසන කලක් ඇතුළෙහි පිටත සිටියවුන් ඔවුනොවුන් නොපෙනෙන සේ ඒ ඒ නෙතික් මැඩගෙන වැද්ද නොඇතිසේ ඝන කොට උස් නොව

පරික්ෂේප කරවා නොවේලෙහි දොරටුවෙන් වදනා කෙනකුන් තෙරුන්වහන්සේ දක්වා මිස නොවදනා ලෙස කටයුතු.

රජ යුවරජ ආදි ග්‍රහස්ථයන් සමීපයෙහි සබ්‍රම්සරුන්ගේ ගුණ නුවණ කියා පස නොඑළ විය යුතුවචරාදියෙහි ආශායෙන් මහණ මහලු පැදිකොටඅනුන්ට නොදියයුතු. එසේ එළවූ පසය උන්විසිනුත් දැනැ නොවැළඳියයුතු.

යටත්පිරිසෙයින් තමා නිසා වසන මිනිසකුත් ප්‍රඥප්තිශික්ෂා පදයෙන් හෝ අවවාද ශික්ෂා පදයෙන් හෝ තෙලේ නොවටනේයයි කීකල ඌ කෙරෙහිවත් ඌ කී ධර්මයෙහිවත් අනාදර නොකටයුතු.

මාතුපිතුපලිබෝධයකින් හෝ එතෙන ංනොසන්හිඳෙන කිසි රෝගයකින් හෝ ග්‍රන්ථ විදර්ශනා ධූරයක් නොලබන්නෙක් හෝ අනික් ලජ්ජීපේශල නුවණැති තෙර කෙනෙකුන් සමීපයට සමු ඉල්වූ අන්තේවාසික සඬිවිහාරිකයන්ට බාධා නොකොට වැස තොපගේ කටයුතු සපයා ගනුවයි අවවාද කොට සමුදිය යුතු.

ඔවුනොවුන් කෙරෙහි රෝෂයක් ඇතිවැ එක දවසකුත් නොවසම්හයි සිහි නුවණ එළවා විසිය යුතු.

මහණකොට ගන්නා කැමති වැ අකුරු කරවත් මිස උපාසකවරුන්ගේ දරුවන් අකුරු කරවා පරිහරණකොට උන් දෙන පසය නොවැළඳිය යුතු.

උපන් රෝගය නිසා යකුන් කෙළවීම් බලිතිබීම් බලිපත් කියවීම් ආදී නොසරුප් දෑ නොකටයුතු.

බොහෝ කලක් නට පැවිදි ඇතිවැ ග්‍රහස්ථ ප්‍රවුජිතයන්ගේ වැඳීම් ඉවසා උන් දෙන පසය නිර්හීනව අනුභවකොට නට හිරි ඔතප් ඇතිවැ විඝ්‍රූ කෙනෙක් එම වෙස සිටවත් ගමට ගොස් අවුත් වත් හෙරණ පැවිද්දදෙහි සිටිනා කැමති වූ නම් බොහෝ කලක් ආසේවිත පාපයෙන් විරමණය බැරි බැවින් උන් මහණ නොකළමනා නියාව දතයුතු. හෙරණ පැවිදි කෙනෙක් එසේම විඝ්‍රූ නම් උන් නැවත හෙරණ පැවිද්දත් මහලු පැවිද්දත් ලදින් ඵක පියති යනු සැක කටයුතු බැවින් උන් කෙරෙහි උදාසීන විය යුතු.



මණ්ඩනසීලිනොව බැලූ බැලුවනට රිසියෙන කායවාක් සමාචාරයෙන් යෙදී විසිය යුතු.

තමා යෙහෙන පමණක් ධූතාංග සමාදන් විය යුතු. ත්‍රිවිධ සන්තෝෂයෙන් එක්තරා සන්තෝෂයකින් සන්තුෂ්ට විය යුතු. ඇති ගිල ගුණාදි ගුණ පතළ කිරීමයයි කියන ලද මහේච්ඡතාවද නැති ගුණ පහළ කිරීම කරන පාපෙච්ඡතාවද ලද ලද දෙයක් තබා අනිකෙක අනිකෙක තෘෂ්ණාවයයි කියන ලද අත්‍රිච්ඡතාවද විශේෂයෙන්ම දුරු කට යුතුවචරාදියෙහි ආශායෙන් මහණ මහලු පැදිකොටඅනුන්ට නොදියයුතු. එක්විසි අන්වේෂණයකද දෙතිස් වැදෑරුම් තිරශ්චීන කථාද සත්විසි මදයද සිල් වෙළාගන්නා සූතිස් යෝධයන්ද පුහුණු-කොට චනපොත් තබා ඒ පාපයෙන් දුරුව විසිය යුතු.

ස්ථවිර නව මධ්‍යම හැම සංඝයා විසින්ම චතුසම්පජඤ්ඤයෙන් යුක්ත නිදිසෙවුමින් සිරිරු සතපා අලුයම නැඟී සිල්බලා කමටහන්හි යෙදී හිඳ සිට සක්මන් කිරීමෙන් දවස් යවා පුහුණුගත් පිරිවා සිවුරු සතසා හැඳ පෙරවැ දැහැටි කිස නිමවා දහගබ් මහබෝ අඟනා චතුදු ඇඳුරුවත් තෙරවත් ගිලන්වත් සෙනෙසුන්වත් ඈ චතුද්‍ර සපයා උපනහොත් බොජුන්හල් එළබැ කැඳිති වළඳා බොජුන්හල්වත් සපයා ඉක්බිති පත්පොත් බලනුවන් ගෙත්නම් රජන්නම් කරනු වන් ඈ ඉක්මන් කටයුත්තක් ඇත්තවුන් මුත් සෙස්සවුන් කැඳිති වැළඳූ ඉක්බිත්තෙහි කමටහන්හි යෙදී දවස් යවා පස්බත්හිඳූ කි තියායෙන් ග්‍රන්ථ විදර්ශනා ධූරයෙහි යෙදී ග්‍රහස්ථ ප්‍රවුජිතයන් හා සංසඬ්නොවැ චත්වේලා දක්වා දවස්යවා ඉරියවු නොම-ප්‍රාර්තනා කරුණක් ඇත්මුත් වත් පිරිනට එලැබී රැස්වූවත් විසිනුදු "සන්නිපති තානං වො භික්ඛවෙ වයං කරණීයං ධම්මිවාකථා අරියෝවා තුණ්හිභාවෝ"යි වදාළ බැවින් ධම්මකථා මනස්කාර දෙකින් පිටත් තිරශ්චීන කථා හා කාමවිතර්කාදී පාපවිතර්කයෙහි නොයෙදී පෙර යමද බණ කියන කියවන අසන ධම්මකථා කිරීම් ඈ නොසිස් පියොවින් හා විදර්ශනා ධූරයෙන් ගෙවා මැදින්යම සැපත් සඳ චතුසම්පජඤ්ඤයෙන් යුත් නිදි සෙවිය යුතු.

පොහොයෙන් පොහොය හැමදෙනාම කතිකාවත කියවිය යුතු. මේ කතිකාවත යම් කෙනෙක් දැනැ දැනැ නොපවතිත් නම්

ගණදෙටු තැන් විසින් ආපතතිකර දෙයට ආපත්ති දෙස්වා දඬුවම් කරවා සෙසු ආචාර විපත්තියටද දඬුවම් කරවා නැවත එලෙස නොකරන ලෙසට තරයේ අවවාදකොට සබ්‍රම්සරුන් නිවන් අවසන් කොට ඇති උභයලෝකාර්ථ සිද්ධිය වන ලෙස කටයුතු.

කතිකාවත නිමි.

ලජ්ජින්වහන්සේ නිසා බුදුසසුන් ඨකෙති දන්නා සංඝ පරිණායකතැන් එක්තැන්ව මහලු පැවිදි කැමති හෙරණ පැවිද්දන් සංඝ මධ්‍යයට එළවා උපාධ්‍යායන් විසින් මුත් උපසම්පදාවට සුදුස්සෝයයි ප්‍රතිඥාකොට පාවාදුන්කල මෙසේ විචාර ගතයුතු.

"මේ පැවිද්දෝ සම්පූර්ණ විංශතිවර්ෂයෝද? බුද්ධාදිරත්නත්‍රයෙහිද තමන් විසින් පිරියයුතු ශික්ෂායෙහිද ශ්‍රද්ධාසමපත්තීන් යෙදී වෙසෙද්ද? සුවචයොද? යටත්පිරිසෙයින් අවුරුද්දක් පමණ කල් තමන් ගුරුන් නොහැර වෙසෙමින් සිටියෝ ද? තමන් විසින් සමාදන් වූ ගුණධර්ම ඛණ්ඩාදිග භාවයට නොපමුණුවා සොත්සාහීව රක්ෂාකෙරෙද්ද?තමන් යහෙන පමණක් ධුතාංග සමාදානය කොට වෙසෙද්ද? හෙරණසිඛ වනපොත්කොට අසා නිමවූද? කතිකාබණ වනපොත් කොට අසා නිමවූද? මහලු සබ්‍රම්සරුන් කෙරෙහි පිළිපදනා වත් දැනැ සිතතබා ඒවූ පරිද්දෙන් වෙසෙද්ද? අදින්නාදාන පාරාජිකායෙන් සංසයක් නූපදවා විසූද? උපන් අධිකරණයක් වෙහෙසනොදී ප්‍රකාශකෙරෙද්ද? කලහකාරී නොවෙද්ද? මණ්ඩනසීලී නොවෙද්ද? චතුර්විධ ප්‍රත්‍යයෙහි වදාළ සන්තෝෂයෙන් තමන්ට සුදුසුලෙස සන්තුෂ්ටවෙද්ද? ගුරුන් ආදීන්ට කළමනා වත් පිළිවෙත් සරුවෝද? බැලුවනට රිසියෙන කායවාක් සමාචාරයෙන් යෙදී වෙසෙද්ද? තමන්ට ප්‍රතිනියතවූ ග්‍රන්ථධුර විදර්ශනාධුරයෙහි නොපමාව වෙසෙද්ද? ග්‍රන්ථධූර පුරන්නෝත් ඇසිල්ලක් විදර්ශනාධුරත් පුරා වෙසෙද්ද? රාජභට නොවෙද්ද? සිවුරු නොහළුවෝද? විචාරයෙන් මහණවූද? ජාතිගොත්‍ර විරෝධයෙක් නැද්ද? නිරෝගියෝද? කතිකා බණ වනපොත් නියාදැ" යි මෙසේ විචාරා තුන්හවුරුද්දක් උපාධ්‍යායන් සමීයෙහි වසමහයි ප්‍රතිඥාකරවා උන්ට මහලු පැවිදි දී ශාසනාභිවෘඩි කටයුතු.



මහණවන පඬුපලාසයන් අවුරුද්දක් සමීපයෙහි වස්වා මහණ කරනකල ගෙණෙහි සංඝයාවහන්සේ ගස්කරවා සඟමැදට එළවා ගුණකියා පාවාදුන්කල මෙසේ විචාරාගතයුතු.

මේ දරු ප්‍රත්‍යයෙහි ලොල්බවක් නැත්තෝද? ලදදෙයකින් යැපෙද්ද? කලහකාරීනොවෙද්ද? පචශීලය අඛණ්ඩකොට රක්‍ෂා කෙරෙද්ද? මහා සංඝයාවහන්සේ කෙරෙහි ආදර ගෞරව ඇත්තෝද? නුසුදුසු කාරියෙක නොයෙදී වෙසෙද්ද? ක්‍රිඩාපර නොවෙද්ද? අකුරුකීමෙහි නොපමාව වෙසෙද්ද? කතිකා බණ පුහුණුකොට නිම වූදැයි විචාරා ගුණකියා ගෙණෙහි සංඝයා පාවාදුන්කල මහණ කටයුතු.

ආචායර්‍ය උපාධ්‍යායන් විසින් නිසබණ තෙරබණ පරීක්ෂා දෙන්නවුන් ගුණ කියා නායකතැන් සමීපයට එළවූකල වස් පිරිණි දැයි විචාළයුතු. පාරාජිකා සංඝාදිසෙසයෙක් ඉපැද නොසන්හුන් වස්තුයෙක් නැද්දැයි විචාළයුතුවවරාදියෙහි ආගායෙන් මහණ මහලු පැදිකොටඅනුන්ට නොදියයුතු. ඇසූ බණ විචාළයුතු. වනපොත්බණ විචාළයුතු. ඇසූබණ සටීකාකොට ඇසුයේ ඇද්දැයි විචාළයුතුවවරාදියෙහි ආගායෙන් මහණ මහලු පැදිකොටඅනුන්ට නොදියයුතු. අසන තැන් කී ගුරුන් විචාළයුතු. සිලි හා පරිනිර්වාණ සූත්‍රය ඇසුයේ ඇද්දැයි විචාළයුතු. මෙසේ විචාරා වනපොත් ගතයුතු. බණ තුන් තුන් තැනින් වනපොත් ගෙනැ කකිතාවූ පරිද්දෙන් පරීක්ෂාගෙනැ ශාසනාභිවෘද්ධි කටයුතු.

# අභයගිරි සංස්කෘත ලිපිය

1. (ඵ*)කෙකශ්ච ශ්‍රාමණේරඃ තෘෂ්වපි ගාමෙෂු
ප්‍රත්‍යෙකංප්‍රත්‍යෙකං ස්ථාප්‍යඃ පාලිකා තත්‍ර ප්‍රත්‍යෙ

2 කං විගුණාන නව්වරිකා විහාරෙ නවකම්මිකෘතොරපි
තථායතත්‍රයෙ නියුක්තාසත්තත්‍රාවිනාශසෙතරෙවදෙයඃ

3. නියමං පඤ්චොපදංසාඃ ප්‍රස්ථාදධං දධි ප්‍රස්ථප්‍රමිතෙන
සෘතෙන විංශතිඃ පාලිකාඃ ත්‍රිභිභික්ෂුභිලිහසි -

4. කාපණිශාලායාං වාහ්‍යාං ශ්‍රාමණෙරාභ්‍යාං සහ නිවසදහිලී
හසිකාම් උරුල් ගොණුම් විවර නව කම්ණෙ නියු -

5. ක්තාංශ්ච ග්‍රාමාත් සම්‍යගාලොච්‍ය තත්‍ර තත්‍ර ලාභාත් -
තෙස් තෙඃ කුටුම්බි හිරධිෂ්ඨිතම් විහාරම්ප්‍රවෙශ්‍ය වර්ෂ
පරිසමාප්තෞ තත්‍ර තත්‍ර

6. සමස්තමායං ව්‍යයං ශෙෂඤ්ච කර්මිහිර්ගණකෙශ්ච
සඞ්ඝානු ඥාතෙෂු භික්ෂුෂු. පදර්ශ්‍ය පරිශුද්ධ
පරිවාරකෙර්යථා සු -

7. ඛමත්‍ර විහාරෙ විහර්තව්‍යං, යෙ යෙ තත්‍රාපරිශුද්ධාස්තෙස්
තෙස් තත්තද්ද්‍රව්‍යන්දෙයං සඞ්ඝෙනාපි අවශ්‍යමෙව
තද්ග්‍රහීත -

8. ව්‍යම්, එවං හූණලා පර්ණශාලායාං ස්ථිතෙරපි භික්ෂු -
හිරම්බිල ග්‍රාමෙ හූණාලායාං උලවන්තරී බණ්ට ග්‍රා -

9. මෙ ච තථෛව, කීරා පල්ලායයො'රපි තථෛව,
සුහග්‍රාමෙපි තථෛව භික්ෂුභිඃ පූර්වවදෙව කර්තව්‍යම්,
තදකුර්වතාම්

10. පූර්වොක්තඑව දොෂඃ, පඤ්ජිකා සථවිරෙරෙව පදාලායිකා
නිරූපණියා, ඉහ දෙශෙ අන්‍ය විහාරොපසම්පන්නා -



11. නාන්තත්‍ර ග්‍රාසවාසෞ පරිත්‍යජ්‍ය තත්ප්‍රතිබද්ධවිහාර -
කර්මා කු (ර්වතා) මෙව නිවාසො, නාන්‍යෙෂාං.
ඉහ වීපෙ පාදමාත්‍ර -

12. ක්ෂේත්‍රලාභිනාමපි නග්‍රාසො නවාසඃ මිථ්‍යාජීවිනා නව -
(ස්තව්‍යං). (ස්ත්‍රීපොෂ) කෙණ න වස්තව්‍යම්, අන්‍යත්‍ර
මාතාපි -

13. තෘභ්‍යාම්, ලාභාර්ථං ස්නෙහාර්ථං වා තාම්බූලාදිකං රාජකුල -
(ම්ප්‍රෙෂයතාපි) (න ව) ස්තව්‍යං, අන්‍යවිහාර සාහාය්‍යං කුර්වතා -

14. පි න වස්තව්‍යම් නිශ්‍රයාදවිමුක්තෙඃ ස්ථවිරෛරපි (සහ --)
(නිවස) ද්භිර්නවස්තව්‍යම්, යන්නිශ්‍රිත්‍ය (නිවස) ද්භිඃ

15. කෘතො දොෂස්තමනිවාරයතා නිශ්‍රයදාත්‍රාපි වස්තව්‍යං දො
ෂං කුර්වතාන්තෙවාසිනා, උපසම්පද්‍යා -

16. ත්‍රදෙශෙ කාෂායං පරිත්‍යජ්‍ය පුනඃ ප්‍රව්‍රජිතෙන න වස්ත -
ව්‍යං (ව්‍ය ---- ස්ව) දාරක ව්‍යාජෙනාපි කුර්වතාපි න වස්තව්‍යං,

17. කිම්පුනඃ කෘෂිවණිජ්‍යාදිකම්, යත්කිඤ්චිල්ලොක විරුද්ධං ය -
(ච්ජාස) න විරුද්ධඤ්ච කුර්වතාපි න වස්තව්‍යං අන්‍ය
විහාරා -

18. න්තර්ද්ධාරිතෙන න වස්තව්‍යං ප්‍රාප්තකර්මදානමකුර්වතා න ව -
(ස්තව්‍යං)සත්‍ර විඝාතං කුර්වතාපි න වස්තව්‍යං සඞ්ඝකායවී
-

19. විඝාතෙපි සත්‍ර විඝාතො න කර්තව්‍යඃ.අධිකපා(ථෙයලා -)
හිතාපි තණ්ඩුලාදිකං නොත්කර්ෂයිතව්‍යං, පරස්ප -

20. ර විවාදෙප්‍ය,ධර්මවාදිනා න වස්තව්‍යං අනනු ----- ණ ----
(පි) න වස්තව්‍යං, අසත්‍යාරාමස්‍ය සම්භො -

21. ග ග්‍රාමාදෞ යෙෂාං භික්ෂුණාං ශ්‍රාමණෙරාණාම් වා
ඥාතයඃ (සන්ති තෙර්යතිහි) රපි න වස්තව්‍යම්, ඉහාරාමෙ

22. යෙෂාම්වා ආරාමෙ සම්භොගාදෞ කුටුම්බිහිර් ගණකෙන

ක(ර්මකාරකාණාම් ?) පුත්‍රාදෙ‍ෟ නාම ක්‍රියතෙ තෛරපි

23. න වස්තව්‍යඃ. යස්මින් ග්‍රාමෙ කෞජ්ත කද්ධම් දණ්ඩාංශ්ච ප්‍රතිනි (වර්තයන්ති)......... පුනස්තෙෂාන් දොෂම් විනා වාරි -

24. යෛඃ කර්මකරෛර්වා ක්‍ෂෙත්‍රාදි කුට්ටුමහිභ්‍යො නාපනෙයං,එවං සර්වත්‍ර ග්‍රාමෙෂු (තත්‍ර) ස්ථඃ සංඝෙන කුට්ටු මබිහිශ් ච රක්‍ෂ-

25. ණියාඃ,නවකම්ග්‍රාමෙ චතුරඃ ශිලාකුට්ටකාඃ තක්‍ෂකාශ්ච ෂට්ඃතෙ සචේ (ස්නෙ)................

26. කර්මණිනිපුණඃ (1*)තෙෂාමද්ධාධිකමෙකං කිරික්‍ෂෙත්‍රම්ප්‍රත්‍යෙකම්ප්‍රත්‍යෙකං ජීවිතාර්ථං (දෙයං) න ........ වාට්ටී

27. කුධාන්‍යවාපනාය සර්ලී වෛකා ප්‍රත්‍යෙකනදෙයා. එෂාමෙකස්‍ය දත්තප්‍රමාණං (ජීවිතදානං කා) රකස්‍ය කර්ම (කාර) -

28. යතො දෙයම්. තථා විතීයස්‍යාපි ජීවිතදානකාල එව කර්මා දිකම්ප්‍රති නි ((රික්ෂ්‍ය ප) ඤ්ජිකා පුස්තකෙ අයි -

29. නිබාතස්‍ය තස්‍යනාම තත්තත්කර්මචාහිලිඛ්‍ය දාතව්‍යම්, ආරාමාභ්‍යන්තර කම් (කාරකෛඃ) පඤ්චකෞලිකෙරෙව ප -

30. රිච්ජිද්‍ය කම් ග්‍රහීතව්‍යම් පරිශුද්ධිශ්ච තෛරෙව දාතව්‍යා. පඤ්ච දිනාධිකම්මාස (වයං) කම්කරණෙ නියතං. පරි -

31. පාට්‍යාන්තදකුච්තාඩ්කාරකාණාම් වාරිකාණඩිකම්කඃ තාඤ්ච දොෂඃ. තද්දොෂමපරිහරතාමෙකුච්තාමකාරය -

32. තාං වෘත්ති විච්ජේඃද කායඃ.පරිවහණස්‍යාපි අන්තබ්හිශ් ච රක්‍ෂකුශලස්‍ය පදාලාං වර්ජම්ප්‍රත්‍යෙකං ප්‍රතිග්‍රා -

33. මං කිරි කිරික්‍ෂෙත්‍රඤාතව්‍යං.සමර්තථස්‍ය නාන්‍යස්‍ය.චාතුර්මහා නිකායෙෂු පඤ්චවිංශතිඃස්තප -

34. ස්විනඃ තෙන ශතත්නෛවාසිකානං.චත්වාරිංශත් ශාස්ත්‍රා භියුක්තාස්තපස්විනඃ, නිකායභෙදම්විනාපි ගෘහිත නිශ්‍රයාඃ .

# අනුරාධපුර V වන කසුප්ගේ පුවරු ලිපිය

1. මඟුල් සිහසුන් රක් ගල් තල අරය් වජන් බෙරසිනය්නෙන් රුපු
වරණත් ඇඩි මන්ද සින්දැ සී පැරැක්මෙන්

2. වැජැම්බැ අනත් අපිරිසෙය් සොමී නිමල ගුණ වතුරෙන් ජියල් සත්
- හය් සසුන් අරියු ලක්දිව් පොළොව් මෙහෙ -

3. සත පරපුරෙන් හිමි මපුරුම් බුද්දස් සිරි සඟ්බොයි අබහය්
මහරජ්හට් ජා සඟ් බඩය් අප බිසෙව්

4. රැජ්නැණියන් කුස්හි හෙවැ දුනු සැණැහි මෙ යුවරජ් බිසෙව් සිරි
පැමැණැ යස තෙජ් හිර් සන්ද්නෙන් ලොව් පහ -

5. යස් සිය වික්මෙන් සතුරන් මැඩැ පළ නිමල කිත් වතුරෙන් ලො
වත් පතුල් දෙබිසෙවැ ජා සලමෙය්වන් අබ -

6. හය් මහරජ්යුතාර් මිරිසිවිටි සඟ්සෙන්අරම් කසුබ් රජ් මහවෙහෙර්
කරය් අරි පන්සියන් වසවය් සුලබ්

7. සතර් පසයෙන් පුජය් සසුන් කොත් හුවය් ඇතිනකරැ මඟුල්
මහවෙයැ දකුණ් දෙර් අසන්හි රජ්වෙද්හල්

8. කරය් රොව් බිය සමය් පොදෙනවුලු පුලුඩාවුලුයෙන් කෙත් කම්
සුලබ් කොට් සිරිලක් ළොන්දුර්වය් සාබිය නි -

9. වය් රට් සොයය් සැත් බිය නෙරැ නන් ජැයින් නන්සෙය් බුද්
බන්ද් කරය් සියල් ඉසිරැයෙන් පුජය් දුසැණෙ -

10. න් බුද්රුවන් අරියය් ධමුරුවන් කවරිසෙයකින් පුජනෙමි හො
යන අදහස් පුරය් අභිධම් දෙසුන් කසුන්

11. පත් අරවය් මහපුජැ කොටසසුන් සිටිවමි යන සිත්
දොල්නෙන් ඇජර පය හමුයෙහි එමෙ ධම්දෙසුන් වියක් -

12. හන් කළ සිය බස්නෙන් බුද් ගුණ වැනූ රිවි අන්වයෙන් බට් සැහැ
කුල කොත් ඔකා රජ්කුලට් තලාවික් අප පුරුමු -



13. වො තුමන් සත්ලැඟු සවන හවුරුදුයෙහි අබහය්ගිරි වෙහෙරැ
කපාරාමුළට් සල්මෙය්වන් පවු කරය් සඟුන්

14. වයවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබදි අවසට් මෙ
සිරිත් තැබැවුහු අබයහ්ගිරි වෙහෙර්හි

15. ඉසා සෙය් ගිරි වෙහෙර්හි ඉසා බද් තුවාක් ඇත් වෙහෙරැ ගම්බිමට්
ඉසා මෙහිමෙ අබැදි තුවාක් වෙහෙර්හි ඉසා

16. රජ්මහවෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා මෙහෙණි
වර්හි ඉසා සඟ් සතු පුගුල් සතු ලාභ

17. යෙහි ඉසා බප් තුවාක් ගම්බිමට් රජ්කොල් කැමියන් වැදැ වැරියන්
ගැල් ගොන් මීවුන් නොගන්නා ඉසා ගස්කො -

18. ළ් නොකපනු ඉසා මෙලාට්සි නොවද්නා ඉසා මිනී කෙටූ
කෙනෙකුන් ඇත ගමට් වැදැ ඔවුන් මැ ඉල්ලත්මුත් සෙසු

19. එහි නොපහළ් සෙසු කුඩීනට් අනියා නොකරනු ඉසා දෙදෙ
හවුරුද්දෙන් ගොස් රජ්කොල් සම් දරුවන් රට් ඉල්ලා

20. (පස්) මහා සාවද්දැ වරප් ඉල්ලත්මුත් සෙසු වරද් නො ඉල්ලනු ඉසා
පෙරෙ කැමියන් ගම් දන්නා සෙ දඬගෙනැ

21. පැට්වූ වරදට් වටාලා දඬ නොගන්නා ඉසා ඇත්වෙහෙරැ ගම්
බිමන් ගත් හැමැ ද්ඬ ඇත්වෙහෙරැ කම් න

22. වාමට් දෙනු ඉසා පෙරෙ නොවන් විරි තැනට් පෙරෙ
නාට්ටියම් නොවද්නා ඉසා රට් පටවන්නට් ගිය රජ්කොල්

23. සම්දරුවන් ගත් දඬැ ගිගිරියක් ඇත සම්දරුවන් දඬ නායකයන්
හිඳැ විචාරකොට හැරියැ යුතුවක්

24. හර්නා ඉසා මිනී කොටා සඟුන් වත් තැනට් වත් කෙනෙකුන් ඇත එහි
පහළවනුද් ඔවුනුප් විචාරකොට් දම්බ -

25. දිව් යවන්නට් හර්නා ඉසා සෙසු බියෙන් වත් කෙනෙකුන් ඇත
ගෙ දඬ නොගන්නා ඉසා දෙස් නො යවනු ඉ -

26. සා රජ්කොලෙන් බහා බුජ් සස්නෙහි අනුසසැ බැඳැ දූත් පමණු
උදහසැ නො ගන්නා ඉසා කැමිකම් කළවුන් ග -

CS Scanned with CamScanner

CamScanner

27. ම් පාවට වැළැහුවන් සඟුන් කරා වන විචාරකොට් ගත යුතු
ණයක් ගනුත් මුත් සෙසු නිඟා නොකරනු ඉසා සඟු
28. ත් වාසකරන අවසැ රදෙලෙන් යවාදිහි මිනිස්නට් තවා තැන් නො
ගෙනැ දෙනු ඉසා සඟ්කල් අවස් පුඟුල් නොකර -

29. නු ඉසා අපිළිසරණ වත්හිමියන් ඉසා ලාභ ලදුවන් ඉසා අවස්
ලදුවන් ඉසා කළහ යන වරදක් අතපුවා -
30. ත් මුළැ සඟුන් හිඃදැ නිමවනු ඉසා සඟුන්විසින් නො නිමත්
සම්දරු වත් හා මුල් වැ විචාරකොට් නිමවා පත් පත්
31. සෙයින් දඬුවම් කරනු ඉසා සඟුන් හම්බු ආමා කරන විවාදයක් ඇත
සම්දරුවන් යවා සඟුන් සමාහි -

32. ත කොට් හම්බු ගන්වත් මුත් බලකරින් හම්බු නො ගන්වනු
ඉසා මෙකී දැයින් එකකුද් රදොල් නො යෙ -

33. ද්මෙන් කළ කෙනෙකුන් ඇත කළවුන් මෙහෙයින් පහකරනු ඉසා
රදෙල් යෙද්මෙන් කළ එය්කැරුණ් වෙහෙරට්

34. රජ් කොලොත් පයලක් දී හම්බු ගන්වනු ඉසා සඟුන් සිධාන්ත
පියා බැහැර් වැඩිය (න්) පෙරෙ සිරිත් දඩ දී හ -
35. ම්බු ගන්වනු ඉසා අබහය්ගිරි වෙහෙර පිළිම ගෙහි ඉසා දාගබ්හි
ඉසා මහ බොගෙහි ඉසා රුවන් පහාහි ඉ -
36. සා බත්ගෙයි ඉසා ඇතුල්කොට් මෙතුවාක්තැන් දෙමුලැ සැඟැ
තනින් ස අවසින් ඉල්ලා හවුරුදු නිමියනැ ලෙකම්
37. කොට් මහ සඟ් මැඳැ අස්වනු ඉසා සෙගිරි ද් දෙමුළැ සැඟැ
තනින් ඉල්ලා හවු(රු)දු නිමියිනැ ලෙකම් කොට් මහසැඟැ

38. අස්වනු ඉසා මහණ් කරත් පිරිත් සතර් බණ්වර් පිණිස්වුවන්
මහණ්කරනු ඉසා මහණ්වන්නවුන් අතින් යම්
39. කවරි වතක් නො ගන්නා ඉසා ගතුවන් දුනුවන් ඒ අවසැ
නොවසවනු ඉසා එක් අවසැ නැයන් සතර් දෙනෙකු නො ව
-

40. සවනු ඉසා දෙමුළැ බප්තුවක් අවසට් දායකයන් කළ නියත
පමණින් වත් සිරිත් නො ඉක්මැ වසැඟින් සඟුන්
41. එල්වනු ඉසා අවස් දන්නාසෙ පිණිස්වා පෙල් හදාළ



වත්හිමියන් නො වැසැගිනිප් උනු නැතැට් එල්වනු ඉසා(ව)
42. ද්දි තනට් වනැ කියෙන හිමියන් ගන්නා ඉසා නො සමඟ්වැ
වසන පමණින් වඩා වත් සිරිත් ඉක්මැ වන් වත්හිමි
43. යනුප් එයට් පසවූ වත්හිමියනුප් ඒ අවසැ නොවසවනු ඉසා උදහ
සින් දම්බදි යැවූ වත්හිමියනුද්

44. අවස වතින් පහකල වත්හිමියනුද් ඔවුන් පහල කළ අවසට් වටාලා
නො වැද්දදෙනු ඉසා ඔවුන් ගෙනැ

45. වද්නාට් වියො කළ වත්හිමියනුද් ඒ අවස්හි නො වසවනු ඉසා
කර්වල් හලැ බද් ගොත් අත්නට දුන් කැමි -

46. යනුද් තුමනට් ගත් කැමියනුද් මෙහෙයින් පහ කරනු ඉසා ඇත්
වෙහෙර බද් තුවාක් ගම් බිමින් තුමනට්

47. දුන් දසකැර මුත් වැසර් පැත් පමණු නො ගන්නා ඉසා
ගොවිකම් නො කරනු ඉසා මහනෙත්පා වහදු දෙ අ -
48. වසටද් මෙ සිරිත් කරනු ඉසා මෙහිද් සෙසු අවසැද් උනුපොවා
මහණ් නො කරනු ඉසා මහකපාරා පිරිවෙනැ

49. පිරිවෙන් ලදුවනට් පිඩපසයට් එක් දවසකට් අමුණක් සාල්
ඉසා සතර් අකක් රන් සා හවුරුදු නිමි
50. යත සිවුර් මිලයැට් රන් දහසක් ඉසා මෙහෙකරුවනට් වැලිග
මු දෙ පයල ඉසා මෙහි බද් මිනිසුන් මෙහෙ -
51. යට් ඉසා පිරිවෙන් ලද්දන් තමනට් පිරිකැපු මෙ පසමුත් පිරිවෙනැ
ඇතුල් බැහැරි යම් කවරි පසයක් තු -

52. මනට් පිරිබොකළ සඟුන් සම්දරුවන් හිඳැ විචාරකොට්
අවසින් පහකරනු ඉසා පිරිවෙන් ලද්දන් තමනට් -
53. පිරිකැපු වතින් මුත් ඉතිරිතුවාක් දැයින් සඟුන් දසන් වටා කම්
නවාම් පුජ සිතුවම් කොට් වැඩියාක් ඇත ගම් ග -
54. න්නා ඉසා අභියුක්ත බති හිමිපුරන් පෙරෙ සිරිත් සෙ වටනු
ඉසා පිරිවෙන් ලද්දන් සඟුන් සැමැඟින් දක්වා

55. දූත් අපිළිසරණ සතර් දෙනකු හා ගොරොකුන් සතර දෙනකු අතුළ්
වැ දෙඅසනින් අට් දෙනකු පිරිවෙන් ඉල්ලා

56. හවුරු නිමියතැ ලෙකම් කොට් මහ සඟැ අස්වනු ඉසා.

# වෙස්සගිරිය පුවරු ලිපිය අංක 1

1. මඟුල් සිහසුන් රක් ගල් තල අරා වදන් බෙරසී (නා)
2. තෙන් රුපු වරණන් ඇඩි මන්ද සිඳැ සී පැරැක්මෙන් වැ (ජ)
3. ම්බැ අනත් අපිරිසෙ සොමි නිමල ගුණ වතුරෙන් (දි)
4. යළ් සනහය් සපුන් අරියු ලක්දිව් පොළො මෙහෙස
5. න පරපුරෙන් හිමි මපුරුම් බුද්දස් සිරිසග් බොය් අ
6. බහය් මහරජ්හට් දා දෙවා රැජ්න කුස්හි හෙවැ දූ -
7. නු සැණැහිමෙ යස තෙද් හිර් සන්ද්නෙන් ලොව් පහය -
8. ය් ඇපා මහයා සිරි වින්දැ පිළිවෙළනෙන් රජ්වැ ලොව් ර
9. ක්නා මපුරුම් බුද්දස් අබයන් සලමෙවන් දපුළ ම -
10. හරජ්නු සත් ලැඟු දෙවන හවුරුද්දයෙහි නිකින්නි
11. යැ අව දසපක් දවස් මුලසොවෙහෙර් සඟ් වැ -
12. ල්ලෙ වන්පුල්ලා උපාසක වීරංකුරා අරමැ මහ ස -
13. ඟ් වත්හිමියනට් ලබ් සකර් දෙමින් දෙසියක් කළ -
14. ත්ද් රත් දී මෙ රනට් හවුරුදුපතා වසා පවරන දෙපො
15. හොයැ එක්නට් විසි අවුල්පතක් දෙනු කොට් ඉසා හ -
16. ම්බු දිහි හම්බු ඔනා කොට් ඉසා මෙකුන් මැ ලහා බතට්
17. දූන් සැටක් ඉසා මෙකුන්මෙ හවුරුද් අවසානයෙ -
18. හි වසැගින් එක්කෙනෙක්නට් සිවුර් දෙනුකොට් දූ -

19. න් විස්සක්ඉසා පහායැ බුද්නට වැට් තෙලට් දු -

20. න් දසකළන්දක් ඉසා මස්පතා මැන්දිමසැ පොහො දව -

21. ස් වසැගින් එක්කෙනෙක්නට ඇකෙකැ සකුර් හා

22. ඇකැ ගිතෙල් හා දෙනුකොට් දුන් විසි කළන්දක් ඉසා

23. මෙ හැමැ කටැයුතු කළ කළමනා කාලයෙහි නොකටැ දී ව -

24. ලැකු වත් හිමියන් මෙ අවසැ වාසලාභයෙහි නො

25. හිමි වැ යනු ඉසා මෙ කතිකා මහසඟුන් රැක්කැ යුතු.

## කළුදිය පොකුණ සෙල් ලිපිය

1. ............................................ [ඔකාවස්] රජ්-පරපුරෙ [න් බට]

2. ............................................ [උදා] මහරජ්-හු පිණිසැ කැත-කුල-සරා-අම්බුර් [හි]

3. ............................................ විදුරා-රජ්න කුස්-හි දැනැ

4. ............................................චුර්දිවයුර්-පරපුරෙ..............................

5. - 8 [කියවිය නොහැකිය]

